dinamina.lk
@dinaminanews

දිනමිණ

The Dinamina
1909 ඇරැඹී ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත



ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ බිනර පුර පැලවිය ලත් බුධ දින කාණ්ඩය 111 පත්‍රය 209 පිටු 36 මිල රු.30 web: www.dinamina.lk ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 19 වැනිදා බදාදා

20 වැනි සංශෝධනය අද කැබිනෙට්ටුවට

රෝෂන් තුෂාර

ජනෙන් දෙකක බහුතර බලයක් ලබා දෙමින් ජනතාව බලාපොරොත්තු වූ නව ව්‍යවස්ථා සම්පාදනයට මුලපුරන 19 වැනි ව්‍යවස්ථාවේ අඛණ්ඩතා ඒකාබද්ධ කිරීමේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පත්‍රිකාව අද (19) කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන බව අධිකරණ ඇමැති ජනාධිපති නීතීඥ එම්. යූ. එම් අලී සබ්‍රි මහතා ඊයේ දිනමිණට පැවසීය.

20 වැනි සංශෝධනය මඟින් සිදු කරන වෙනස්කම් පිළිබඳව කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අනාවරණය කරන බවද හෙතෙම අවධාරණය කළේය. 20 වැනි සංශෝධන සංදේශයට කැබිනට් අනුමැතිය ලැබුණු පසුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තවදුරටත් සාකච්ඡා කරන බවද මහජනතාවට අදාළ පාර්ශ්වයන්ට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රජාතන්ත්‍රවාදීව හා විනිවිදභාවයෙන් 20 වැනි සංශෝධනය සම්මත කර ගන්නා බවද ඒ මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

රනිල් සහ යහපාලන මැති ඇමැති 10කට නොනීසි

රෝෂන් තුෂාර

කැබිනට් මණ්ඩලයේ අනුමැතියෙන් පිහිටුවූ දූෂණ විරෝධී කමිටුව යොදා ගෙන නඩු පවරා දේශපාලන පළිගැනීම් කළේ යැයි චෝදනා එල්ලවී ඇති හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු පසුගිය ආණ්ඩුවේ මැති ඇමැතිවරුන් දස දෙනකුට ලබන 07 දා පෙනී සිටින්නැයි නියෝග කරමින් දේශපාලන පළි ගැනීම් පිළිබඳ සොයා බැලීමේ ජනාධිපති කොමිසම ඊයේ (18) නොනීසි නිකුත් කළේය. පිට 02

ප්‍රවාහනය දියුණු කිරීම බස් රථය සෝදන තැනින් අරඹන්න

නුවන් කොඩිකාර

ප්‍රවාහන සේවාව නහා සිටුවීමේ පළමු පියවර ලෙස මගීන්ට හොඳ මානසිකත්වයකින් බස් රථයේ හෝ දුම්රියේ ගමන් කිරීමට හැකි පසුබිම සකසන්නැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා බලධාරීන්ට ඊයේ (18) උපදෙස් දුන්නේය.

ඉතා කුඩා ආරම්භයකින් ලොකු වෙනසක් කළ හැකි බවත් බස් රථය සෝදා පිරිසිදු කර මගීන්ට අසුන්ගෙන යෑමට සැලසීම හෙටම පටන් ගන්නා"ලෙසත් ජනාධිපතිවරයා මෙහිදී උපදෙස් දුන්නේය.

ගමනාගමන මණ්ඩලය බස් ධාවනය සේවාවක් ලෙස පවත්වාගෙන ගියද පාඩු නොලබන ආයතනයක් විය යුතුයැයි ද හෙතෙම කීවේය.

ප්‍රවාහන අමාත්‍යාංශයේ සහ වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි, මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ ඉදිරි සැලසුම් පිළිබඳව ජනාධිපති කාර්යාලයේ ඊයේ (18) පැවති සාකච්ඡාවේදී ජනාධිපතිවරයා එසේ ප්‍රකාශ කළේය. පිට 02

නිවාස සංවර්ධන අධිකාරියේ මූල්‍ය වංචාවකට නිලධාරීහු 4ක් කොටු වෙති

උපාලි කරුණාරත්න පිට 10

නොරොච්චෝලේ විදුලි උත්පාදනය නවතී

මාරවිල සමූහ - මිහිර විජේසේකර පිට 10

ඊයේ සිට දින 4ක් දිනකට පැයක් විදුලිය කපයි

අනුර ප්‍රේමලාල් සහ මහින්ද අලුත්ගෙදර

ජාතික සැපයුම යථා තත්ත්වයට පත් වන තෙක් ඊයේ (18) සිට ක්‍රියාත්මක වන පරිදි දින 4ක් දිනකට පැයක කාලයක් රට පුරා විදුලිය විසන්ධි කරන බව ලංකා විදුලිය බල මණ්ඩලය ප්‍රකාශ කරයි. ඒ අනුව සමස්ත ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි කලාප හතරකට බෙදෙන් කොට පස්වරු 6 සිට 7 දක්වාත්, පස්වරු 7 සිට රාත්‍රී 8 දක්වාත්, රාත්‍රී 8 සිට 9 දක්වා සහ රාත්‍රී 9 සිට 10 දක්වාත් විදුලිය විසන්ධි කරන බව ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති ඉංජිනේරු විජිත හේරත් මහතා පවසයි. පිට 02

හිටපු රාජ්‍ය ඇමැති රුවන්ගෙන් ජනපති කොමිසමට පැය පහක ප්‍රකාශයක්

පාස්කු ඉරුදින ප්‍රහාරය පිළිබඳ සෙවීමේ ජනාධිපති කොමිසමේ පොලිස් ඒකකය විසින් හිටපු ආරක්ෂක රාජ්‍ය ඇමැති රුවන් විජේවර්ධන මහතාගෙන් ඊයේ (18) පැය පහකට ආසන්න කාලයක් ප්‍රකාශ සටහන් කරගනු ලැබීය.

පාස්කු ප්‍රහාරය පිළිබඳ විමර්ශනය සිදු කරන ජනාධිපති කොමිසම කළ දැනුම් දීමක් මත ඔහු කොමිසමේ පොලිස් ඒකකය හමුවට ඊයේ (18) උදෑසන 9. 30ට පමණ පැමිණ ඇති අතර, වෙන වෙනම ස්ථාන දෙකකදී පස්වරු 2. 20 පමණ වන තෙක් ප්‍රකාශ ලබාදී තිබේ.

නාගරික සංවර්ධනයේ සැලසුම් නිලධාරියා අල්ලස් දැලේ

සීගිරිය විශේෂ

කුඹුරු ඉඩමක් ගොඩ කර ගැනීම සඳහා රුපියල් 50,000ක අල්ලස් මුදලක් ලබා ගැනීමට උත්සාහ කළ නාගරික සංවර්ධන අධිකාරියේ දඹුල්ල කාර්යාලයේ සැලසුම් නිලධාරිවරයා ඊයේ (18) දඟවල් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ. මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරියේ දඹුල්ල ප්‍රධාන කාර්යාලයේ සැලසුම් නිලධාරී චන්ත ආරියරත්න නමැති අයෙකි. පිට 02

පිල්ලෙයාන්ට ප්‍රේමලාල්ට මංගල සැසියට එන්න අවසර

බුද්ධිකා ඉඹුලාන පිට 02

කොරෝනා රෝගීහු 79ක් සුවය ලබති

සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් - 19 ආසාදනය වී රෝහල්ගතව සිටි පුද්ගලයන් 79ක් පූර්ණ සුවය ලබා ගෙවිගිය පැය 24 තුළදී රෝහල්වලින් පිටව ගොස් ඇති බව වසංගත රෝග විද්‍යා අංශය පවසයි. පිට 02

ඉතිහාසයේ පළමු වරට පාර්ලිමේන්තුවේ යූඇන්පිය නෑ

අසේල ලියනගේ

හෙට රැස්වෙන පාර්ලිමේන්තුව තුළ එක්සත් ජාතික පක්ෂයේ නියෝජනයක් සිදු නොවන තත්ත්වයක් උදා වී ඇත. පිට 02

පසුගිය මාස 18 දී ළමා අපයෝජන සිද්ධි 12,968ක්

කුමුදු හෙට්ටිආරච්චි පිට 10

කඩාවැටුණු මූල්‍ය ආයතන 3ක තැන්පත්කරුවන්ට වන්දි ගෙවන්න කෝටි 2,000ක්

ජයසිරි මුණසිංහ

කඩාවැටුණු මූල්‍ය ආයතන 3ක සුළු තැන්පත්කරුවන් වෙනුවෙන් වන්දි ගෙවීමට ශ්‍රී ලංකා මහ බැංකුව රුපියල් කෝටි 2,000ක (රුපියල් බිලියන 20) මුදලක් මේ වන විට මහජන බැංකුවට ලබා දී ඇත. පිට 02

කොරියාවේ රැඳී සිටින 1600ක් ළඟදීම ලංකාවට



අනුර ප්‍රේමලාල්

දෙවා ගිවිසුම් කාලය අවසන් වී කොරියාවේ තවදුරටත් රැඳී සිටින ශ්‍රී ලාංකිකයින් 1600 දෙනා මාස දෙකක් ඇතුළත ලංකාවට ගෙන්වා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව කම්කරු ඇමැති තිමල් සිරිපාල ද සිල්වා මහතා පවසයි. පිට 02

මුදල් විශුද්ධිකරණ පනත යටතේ නාකොටික් නිලධාරීන් 6කට නඩු

සිරන්ජනි කුමාරි

පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශයේ නිලධාරීන් හය දෙනකුට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඊයේ (18) මුදල් විශුද්ධිකරණ පනත යටතේ කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය හමුවේ නඩු පැවරිය. පිට 02

පොඩි ලැසීගේ ඥාතියා නාකොටික් නිලධාරීන් හා එක්ව මත්ද්‍රව්‍ය ජාවාරම මෙහෙයවලා

සිරන්ජනි කුමාරි

පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ වැටලීම් නිලධාරීන් හා පාතාල සාමාජිකයන් එක්ව සිදු කළ මත්ද්‍රව්‍ය ජාවාරම මෙහෙයවා ඇත්තේ පාතාලයේ පොඩි ලැසිගේ ඥාතියකු වන උදර සම්පත් තමැත්තා විසින් බවට ස්වාධීන සාක්කි සහිතව තොරතුරු හෙළි වී ඇතැයි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලිප පිරිස් මහතා කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් ලංකා ජයරත්න මෙණේවිය හමුවේ ඊයේ (18) පැවැසීය. දකුණු පළාතේ ප්‍රබල පාතාල සමාජිකයකු වන උදර සම්පත් තමැත්තා පොඩි ලැසිගේ ඥාතියකු වන බවටත් මොහු විසින් මෙම මත්ද්‍රව්‍ය ජාවාරම සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු මෙන්ම මූල්‍ය කටයුතු සිදු කොට ඇති බවට තොරතුරු අනාවරණය වී ඇති බවටත් වැඩිදුර වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් කරමින් ඔහු සැදහත් කළේය. පිට 02

මෝටර් රථයකින් ගෙන ගිය මිලියන 156ක ව්‍යාජ නෝට්ටු සමඟ තිදෙනෙක් අත්අඩංගුවට

චන්ද්‍රිකා පෙරේරා

ව්‍යාජ ලෙස මුද්‍රණය කරන ලද රුපියල් මිලියන 156ක නෝට්ටු තොගයක් මෝටර් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි පුද්ගලයන් තිදෙනකු එම රථය සහ මුදල් නෝට්ටු සමඟ විශේෂ කාර්ය බළකාය විසින් පෙරේදා (17) මුල්ලේරියාව ගල්වාන ප්‍රදේශයේ දී අත්අඩංගුවට ගෙන තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරුවන් ජාඇල, අංගොඩ සහ මුල්ලේරියාව ප්‍රදේශවල පදිංචි අවුරුදු 34, 36, සහ 42 වයස්වල පසුවන්නන් බව පොලීසිය පවසයි. පිට 02

තොරතුරු දැනගැනීමේ පනත අහෝසි වන්නේ නම් විරෝධය පළ කරනවා

ශිවන්ති ප්‍රනාන්දු

ආණ්ඩුව ගෙන ඒමට සූදානම් වන 20 වැනි සංශෝධනයෙන් තොරතුරු දැනගැනීමේ පනත අහෝසි වන්නේ නම් ජනතාව සම්බන්ධ කර ගනිමින් එයට විරෝධය පළ කරන ක්‍රියා මාර්ග බිම් මට්ටමට ගොස් ක්‍රියාත්මක කිරීමට සමගි ජන බලවේගය සූදානම් බව එම පක්ෂයේ මන්ත්‍රී හේෂා විතානගේ මහතා පවසයි. පිට 02

නාගරික සංවර්ධනයේ සැලසුම් නිලධාරියා අල්ලස් දැලේ

සීගිරිය විශේෂ

කුඹුරු ඉඩමක් ගොඩ කර ගැනීම සඳහා රුපියල් 50,000ක අල්ලස් මුදලක් ලබා ගැනීමට උත්සාහ කළ නාගරික සංවර්ධන අධිකාරියේ දඹුල්ල කාර්යාලයේ සැලසුම් නිලධාරිවරයා ඊයේ (18) දඟවල් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ. මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරියේ දඹුල්ල ප්‍රධාන කාර්යාලයේ සැලසුම් නිලධාරී චන්ත ආරියරත්න නමැති අයෙකි. පිට 02

තොරතුර අප්‍රේල් 9 දා ලැබුණැයි පූජිත් කිවුවත් මම අප්‍රේල් 7 දා බුද්ධි තොරතුර දැනුම් දුන්නා

රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂ ජනපති කොමිසමට කියයි

පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරය පිළිබඳ පූර්ව දැනුම්වත් කිරීමේ බුද්ධි තොරතුර එවකට පොලිස්පති පූජිත් ජයසුන්දර මහතාට ලැබුණේ අප්‍රේල් 09 වැනි දින යැයි පැවසුව ද, අප්‍රේල් 07 වැනි දින තමන් දුරකතනයෙන් පොලිස්පතිවරයා අමතා එම බුද්ධි තොරතුර පිළිබඳ දැනුවත් කළ බව රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා ජනාධිපති කොමිසම හමුවේ ඊයේ ප්‍රකාශ කළේය. පිට 02

රේඩියෝ ගුරුවරයා ශිෂ්‍යත්ව පෙරහුරු ප්‍රශ්න පත්‍රය අද දිනමිණ සමඟ

9 වැනි පාර්ලිමේන්තුවේ මංගල සැසිවාරය වෙනුවෙන් පාර්ලිමේන්තුව හා සබැඳි වටිනා තොරතුරු ඇතුළත් විශේෂ අතිරේකය

හෙට දිනමිණ සමඟ

ගොවිසෙත	සුපිරි වාසනා	ලග්න වාසනාව	කෝටිපති කප්රුක	සංවර්ධන වාසනාව	ජයෝදා	ශනිදා වාසනාව	සුපර් බෝල්	ජාතික සම්පත	අද කෝටිපති	වාසනා සම්පත	දරු දිරි සම්පත
2020 - 08 - 10	2020 - 08 - 10	2020 - 08 - 04	2020 - 07 - 26	2020 - 07 - 31	2020 - 08- 04	2020 - 08 - 01	2020 - 07 - 26	2020 - 08-05	2020 - 08 - 04	2020 - 08 - 10	2020 - 07 - 30
දිනුම් වාරය - 2505	දිනුම් වාරය - 1525	දිනුම් වාරය - 2882	දිනුම් වාරය - 603	දිනුම් වාරය - 354	දිනුම් වාරය - 1678	දිනුම් වාරය - 3345	දිනුම් වාරය - 1182	දිනුම් වාරය - 1043	දිනුම් වාරය - 1001	දිනුම් වාරය - 1603	දිනුම් වාරය - 013
16 47 60 74	10 41 47 57	07 11 55 60	35 38 61 70	22 23 40	01 06 36 52	26 45 56 62	27 54 73 74	8 5 4 5 2 2	07 33 49 52	26 37 44 69	04 12 33 63
අක්ෂරය W	සුපිරි අංකය -14 සෙකන්ඩ් චාන්ස් 3 8 2	ලග්නය-වෘෂභ	ඉංග්‍රීසි අක්ෂරය- W	දෛව අංකය - 02 අක්ෂරය- L	අක්ෂරය-I	අක්ෂරය - Y	අක්ෂරය -C	අක්ෂරය -C	අක්ෂරය - K	අක්ෂරය - V	අක්ෂරය - U

පිල්ලෙයාන්ට-ප්‍රේමලාල්ට මංගල සැසියට එන්න අවසර

බුද්ධිකා ඉඹුලාන

මඩකලපුව බන්ධනාගාරයේ රඳවා සිටින සිවනේසතුරෙයි චන්ද්‍රකාන්ත් හෙවත් පිල්ලෙයාන්ට හෙට (20) නව වැනි පාර්ලිමේන්තුවේ මංගල සැසිවාරයට සහභාගිවීම සඳහා මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණය මගින් අවසර ලබාදී ඇත.

මෙවර මහ මැතිවරණයේ දී ටී. එම්. වී. පී. පක්ෂයෙන් තරග කර ඔහු මඩකලපුව දිසුත්‍රික්කයේ වැඩිම මනාප හිමි කර ගත්තේය.

මේ අතර රත්නපුර දිස්ත්‍රික්කයෙන් මෙවර මහ මැතිවරණයට තරග කරමින් මනාප ඡන්ද 142,037ක් ලබා ගත්, දනට වැලිකඩ බන්ධනාගාරයේ මරණ දණ්ඩන සිර දඬුවම් විඳින ප්‍රේමලාල් ජයසේකර, මෙවර පාර්ලිමේන්තුවේ මංගල සැසිවාරයට සහභාගිවීම සඳහා තමන්ට අවසර ලබා දෙන ලෙස බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා මගින් අධිකරණ අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර තිබිණි.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතා පැවසුවේ ඊයේ (18) වනතුරුද අධිකරණයෙන් ඒ සඳහා අවසර ලබාදීමක් තමන් වෙත නොලැබුණු බවයි. පිල්ලෙයාන් මහතා රක්ෂිත බන්ධනාගාරගත කර ඇත්තේ 2005 වසරේ දී මඩකලපුව ශාන්ත මේරි දේවස්ථානයේ නත්තල් පූජාවට සහභාගිව සිටි පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝශප් පරරාජසිංහම්ගේ ඝාතනය සම්බන්ධයෙනි.

01 වැනි පිටුවෙන්...

ප්‍රවාහනය දියුණු...

පෝස්ටර් ඇලවීම නතර කිරීමට ගත් කුඩා තීරණයෙන් රටේ සියලු නගර පවිත්‍රව තබා ගැනීමට හැකි වූ බව පෙන්වා දුන් ජනාධිපතිවරයා සෑම ක්ෂේත්‍රයකම සංවර්ධනය ඉතා කුඩා තැනකින් ඇරඹිය හැකි බව කියා සිටියේය.

මෝටර් රථයෙන් පැමිණ එය නතර කොට තබා බස් රථයෙන් සේවා ස්ථානයට ගමන් කිරීමේ ක්‍රමය (Park & drive) කඩිනමින් ක්‍රියාත්මක කර මාර්ග තදබදය විසඳීමේ අවශ්‍යතාව ජනාධිපති රාජපක්ෂ මහතා අවධාරණය කළේය. ග්‍රාමීය ප්‍රදේශවල බස් රථ ධාවනය පිළිබඳව රජයේ සහ පෞද්ගලික දෙඅංශයම අවධානය යොමු කළ යුතු බව ජනාධිපතිවරයා විසින් පෙන්වා දුන්නේය. "දුම්රිය සහ බස් රථ ඒකාබද්ධ සේවා සහ බස් රථ ඒකාබද්ධ ධාවන කාලසටහන නොපමාව ආරම්භ කළ යුතුයි. ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා මූලිකව විසඳුම් දිය යුතු ක්ෂේත්‍ර හඳුනාගැනීම අවශ්‍යයි. ඉදිරි පස් වසර තුළ ප්‍රවාහන සේවාව නගාසිටුවීමට දිගු සහ කෙටිකාලීන සැලසුම් සකස් කළ යුතුයි. නියම කරගත් ඉලක්ක වෙත ළගා වෙනවාද යන්න විමර්ශනය කිරීම ඉතා වැදගත් යැයි ජනාධිපතිවරයා පැවැසීය.

ජනතාවට වඩා හොඳ සේවාවක් සැලසිය හැකි පරිදි දුම්රිය මැදිරි අළුත්වැඩියා කිරීමට ද තීරණය කළ බවත් කොළඹ කොටුව සහ තවත් දුම්රිය ස්ථාන 04ක් ආදර්ශයක් ලෙස කඩිනමින් නවීකරණය කරන බවත් ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ මහතා කීවේය.

දුම්රිය සංඛ්‍යාව වැඩි කිරීමෙන් වැඩි පිරිසකට කැලණිය වැලි දුම්රියෙන් ගමන් කිරීමට හැකි වන බව ඇමැතිවරයා සඳහන් කළේය. ගමනාගමන මණ්ඩලයට අයත් පුහුණු සහ නඩත්තු ආයතනවල සේවය පෞද්ගලික අංශයට ද විවෘත කිරීමෙන් ලාභ ඉපැයීමට ඇති හැකියාව රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම මහතා පෙන්වා දුන්නේය. කාර්යක්ෂම මගී ප්‍රවාහන සේවාවක් සඳහා රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයටම පෙර ගෙවුම් කාඩ්පත් ක්‍රමය කඩිනමින් හඳුන්වාදීමට තීරණය කෙරුණු අතර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව දූෂණ සහ අක්‍රමිකතාවන්ගෙන් තොර ආයතනයක් බවට පත් කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග දීර්ඝ වශයෙන් සාකච්ඡා කරනු ලැබිණි.

හොඳ තත්ත්වයේ ඇති සාමාන්‍ය බස් රථ අධිවේගී මාර්ගයේ ධාවනයට එක් කිරීමෙන් අඩු මුදලකට මගීන් විශාල පිරිසකට ගමන් පහසුකම් සැලසීමේ හැකියාව ජනාධිපතිවරයාගේ අවධානය යොමු විය.

ජනාධිපති ලේකම්, ආචාර්ය පී.බී. ජයසුන්දර, මුදල් ලේකම් එස්.ආර්. ආටිගල, ප්‍රවාහන ලේකම් එන්.බී. මොන්ටි රණතුංග යන මහත්වරු සහ ප්‍රවාහන අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශ යටතේ ඇති ආයතන ප්‍රධානීහු, පෞද්ගලික බස් සංගම් නියෝජිතයෝ සාකච්ඡාවට එක්ව සිටියහ.

තොරතුරු දැනගැනීමේ...

සමගි ජන බලවේගය පක්ෂ කාර්යාලයේ ඊයේ (18) පැවති මාධ්‍ය හමුවකට සහභාගී වෙමින් හෙතෙම මේ බව පැවසීය. සංශෝධනය විය යුතු ඇතැම් කාරණා 19 වැනි සංශෝධනයේ තිබෙන්නේ නම් ඒවා සංශෝධනය කළ යුතු නමුත්, එහි සාධනීය ලක්ෂණ සංශෝධනය කිරීමට ඉඩ නොදෙන බව කී හේෂා විතානගේ මහතා වැඩිදුරටත් මෙසේද කීය. ආණ්ඩුව ගෙන එන 20 වැනි සංශෝධනය හරහා රටේ ජනතාවට වාසි තත්ත්වයක් නිර්මාණය නොවෙනවා නම්, ඒක දේශපාලන වාසි පිරිමහගන්න දෙයක් නම් සමගි ජන බලවේගය එයට කොන්දේසි විරහිතව විරුද්ධ වෙනවා. ඒ වෙනුවෙන් පාර්ලිමේන්තුවේ සිට අත් ඔසවන්නේ නැතිව කතා කරමින් පමණක් නොසිට බිමට ගිහිල්ලා ජනතාවත් එක්ක විරුද්ධ වෙන්න අපි පක්ෂයක් විදිහට කටයුතු කරනවා.

ඊයේ සිට දින...

පද්ධතියේ ජනන සැපයුම යථා තත්ත්වයට පත් වන තෙක් මේ විදුලි විසන්ධි කිරීම සිදු කිරීමට සිදු වන බව පවසන සභාපතිවරයා හදිසියේ සිදු වූ සමස්ත විදුලි පද්ධතියේ බිඳවැටීමත් සමඟ රටේ විදුලි අවශ්‍යතාවෙන් සියයට 45ක පමණ දයකත්වයක් ලබාදෙන නොරොච්චෝල බලාගාරයේ සිසිලන පද්ධතියේ ඇති වූ තාක්ෂණික දෝෂය හේතුවෙන් විදුලි සැලයීම අඩාල වී තිබෙන බවද කියා සිටී.

මේ අතර, විදුලි සැපයුමේ දෛනික ඉල්ලුම අනුව අවශ්‍ය වුව හොත් පමණක් දිවා කාලයේදී ද කලාප අනුව විදුලිය විසන්ධි කිරීමට සිදු වන බව විදුලිබල මණ්ඩලය පවසයි. ඒ අනුව කලාප 4ක් සඳහා පෙරවරු 10.00 සිට පැය එකයි මිනිත්තු 45 බැගින් පස්වරු 5.00 දක්වා දිවා කාලයේ විදුලිය විසන්ධි කරන අතර, ඒ කලාපය සඳහා පෙරවරු 10.00 සිට 11.45 දක්වාත්, බී කලාපයේ පෙරවරු 11. 45 සිට පස්වරු 1. 30 දක්වාත්, සී කලාපයේ පස්වරු 1. 30 සිට 3.15 දක්වා සහ ඩී කලාපයේ පස්වරු 3. 15 සිට 5.00 දක්වාත් විදුලිය විසන්ධි කරයි.

ඊට අමතරව පස්වරු කාලයේ දී ඒ කලාපයේ පස්වරු 6.00 සිට 7.00 දක්වා ද බී කලාපයේ පස්වරු 7.00 සිට පස්වරු 8.00 දක්වා ද සී කලාපයේ රාත්‍රී 8.00 සිට 9.00 දක්වා සහ ඩී කලාපයේ රාත්‍රී 9.00 සිට 10.00 දක්වා ද විදුලිය විසන්ධි කරනු ඇත. වැඩිදුරටත් සඳහන් කළේ දනට අක්‍රියව පවතින නොරොච්චෝලේ විදුලි බලාගාරයේ විදුලි ජනන පද්ධතිය යළිත් යථාවත්වීමට දින 04ක කාලයක් ගත වන බවයි.

කොරෝනා රෝගීහු...

කන්දකාඩු ප්‍රතිකාර මධ්‍යස්ථානයෙන් 72ක් ද, වැලිකන්ද මූලික රෝහලෙන් 7ක් ද ලෙස මේ 79 දෙනා පූර්ණ සුවය ලබා තිබේ.

වෛරසය ආසාදිත බවට සැක සහිත 74ක් රෝහල්ගතව ප්‍රතිකාර ලබන බවත් සමස්තයක් ලෙස රෝගීන් 2,900ක් මේ වන විට වාර්තා වී ඇති බවත් වසංගත රෝග විද්‍යා අංශය පවසයි.

ආසාදිතයන් 2,755ක් මේ වන විට පූර්ණ සුවය ලබා ඇති අතර, ආසාදිතයෝ 134ක් රෝහල්ගතව ප්‍රතිකාර ලබති.

ඉතිහාසයේ පළමු වරට...

නිදහස් ශ්‍රී ලංකාවේ පළමු අගමැතිවරයා බිහිකළ එක්සත් ජාතික පක්ෂය මෙලෙස පසුබෑස ඇත්තේ මෙවර පාර්ලිමේන්තු මැතිවරණයෙන් හිමිවූ ජාතික ලයිස්තු මන්ත්‍රීධුරයට අපේක්ෂකයකුගේ නමක් යෝජනා නොවීම නිසයි.

පසුගියදා පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂයට කිසිදු මන්ත්‍රී ආසනයක් ජයග්‍රහණය කිරීමට නොහැකි විය. නමුත් එක් ජාතික ලයිස්තු මන්ත්‍රීධුරයක් හිමිවිය. එම මන්ත්‍රීධුරය සඳහා අපේක්ෂකයෙකු පත්කරගැනීම සඳහා සිරිකොත පක්ෂ මූලස්ථානයේදී එක්සත් ජාතික පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලය රැස්වූ නමුත් මෙතෙක් එම මන්ත්‍රීධුරය පිළිබඳව එකඟතාවයකට පැමිණ නොමැත.

අවමංගල්‍ය දැන්වීමයි

උපත 1965 10 05

විපත 2020 08 16

ලේක්හවුස් ආයතනයේ සහකාර පුස්තකාලාධිපතිනිය ලෙස සේවය කරමින් සිටි, මිරිස්වත්ත මැදවත්ත පාරේ විසූ,

දීපිකා චාන්දනී මල්ලවආරච්චි මහත්මිය

අභාවප්‍රාප්ත විය

අවසන් කටයුතු 2020.08.19 බදාදා දින සවස 6.00 ට ගම්පහ කසගහවත්ත ආදාහනාගාරයේදී සිදුකෙරේ.

112/3, ගම්පහ පාර, මිරිස්වත්ත (කැප්පෙටිපොල මහ විද්‍යාලය ඉදිරිපිට)

01 වැනි පිටුවෙන්...

පොඩි ලැසීගේ...

සංවිධානාත්මක ලෙස මත්ද්‍රව්‍ය ජාවාරම සිදු කළ සැකකරුවන් සාද දමමින් අයිස් මත්ද්‍රව්‍ය භාවිතා කරමින් මෙම ජාවාරමේ නිරත ව ඇති බව පැවසූ සොලිසිටර් ජනරාල්වරයා නීතියේ රැකවරණ සහිතව මෙම ජාවාරම සිදු කර ඇති බවත් එය ඔප්පු කිරීමේ අභියෝගය තමන් බාර ගන්නා බවට සදහන් කළේය.

සිද්ධියට අදාළ නඩුව ඊයේ (18) යළි කැඳවූ අතර අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ රඳවා ඇති සැකකරුවන් කොවිඩ් 19 උවදුර හේතුවෙන් අධිකරණයට ඉදිරිපත් නොකරන බවට බන්ධනාගාර අධිකාරිවරයා විසින් අධිකරණයට ලිපියක් මගින් දැනුම් දි තිබිණ.

සිද්ධියට අදාල විමර්ශන වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් කරමින් රජයේ සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා පැවසුවේ හෙරොයින් 5ග්‍රෑම් ක් සමග අත්අඩංගුවට ගනු ලැබූ ටයිල් චමින්ද නැමැති විසින් පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශයේ උප පොලිස් පරීක්ෂක උදර සම්පත් යන අය තමන් පෙර දින හෙරොයින් ලබා දුන් පුද්ගලයා බවට හඳුනා ගැනිමත් සමඟ මෙම ජාවාරම සම්බන්ධ තොරතුරු අනාවරණය වූ බවය.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් විහඟ නම් සැකකරුවෙකු අත්අඩංගුවට ගත් බවත් ඔහු සතුව තිබි වාහන හතරක් මෙන්ම ඔහුගේ රියදුරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන දනට රුදවුම් නියෝග මත රඳවා සිටින බව පැවසීය.

කේ.එස් 8210 දරන මොටර් රථයේ මාතර ප්‍රදේශයේ හුදකලා ප්‍රෙද්ශයකට ගොස් හෙරොයින් පටවා රජයේ වාහන මගින් ආරක්ෂාව සහිතව අධිවේගී මාර්ගයේ හික්කඩුව ප්‍රදේශයට පැමිණ බලපිටියට කිලෝ 20ක් ලබා දී ලක්ෂ 130 ගනුදෙනුවකින් පසු පාර්ලිමේන්තු ප්‍රදේශයේ කිඹුලාඇල දී ඉතිරි හෙරොයින් කිලෝ 10 ලබා දි ඇති බවට තොරතුරු අනාවරණය වි ඇති බව පැවසීය.

මෙහිදි සැකකරුවන් වෙනුවෙන් පෙනි සිටි ජනාධිපති නිතිඥ අජිත් පතිරණ මහතා පැවසුවේ සාක්කි නොමැතිව සැකකරුවන් තිකරුනේ බන්ධනාගාරගත කර ඇති බවත් අතිතයේ ද මෙසේ සැකකරුවන් රක්ෂිතබන්ධනාගාරගත කර සාක්කි නිර්මාණය කිරිම සම්බන්ධ නඩු රහස් පොලිසියේ තිබු බවය.

සැකකරුවන් සම්බන්ධ නිතිමය කරුණු ලිඛිතව අධිකරණයට දන්වන ලෙස දන්වූ මහෙස්ත්‍රාත්වරිය සැකකරුවන් මේ මස 31 වන දින දක්වා රක්ෂිතබන්ධනාගාරගත කරන ලෙස නියම කරමින් එදිනට සැකකරුවන් අධිකරනයට ඉදිරිපත් කරන ලෙසට බන්ධනාගාර අධිකාරීවරයාට නියෝග කළාය.

මම අප්‍රේල් 7දා...

ජනාධිපති කොමිසම හමුවේ පෙරේද (17) 12 වැනි දිනටත් සාක්ෂි දෙමින් නිලන්ත ජයවර්ධන මහතා වැඩිදුරටත් පැවසුවේ ප්‍රහාරයට සති දෙකකට පෙර සහ ප්‍රහාරය එල්ලවීමට පෙර දින රාජ්‍ය බුද්ධි සේවය වගකිවයුතු පාර්ශ්ව දැනුවත් කර ඇති බැවින් පාස්කු ප්‍රහාරය වළක්වා ගැනීමට නොහැකි වූයේ රාජ්‍ය බුද්ධි සේවයේ දුර්වලතාව නිසා යැයි කිව නොහැකි බවයි.

එහිදී පාස්කු ප්‍රහාරය පිළිබඳ රාජ්‍ය බුද්ධි සේවයට ලද පළමු පෙරදැනුවත් කිරීම පිළිබඳ ප්‍රශ්න කළ අවස්ථාවේ ජයවර්ධන මහතා කියා සිටියේ, ඉකුත් වසරේ අප්‍රේල් මස 04 වැනිදු මෙරට වෙලාවෙන් පෙ. ව. 10. 40ට පමණ විදෙස් බුද්ධි සේවයක තොරතුරුකරුවකුගෙන් "වට්ස් ඇප්" පණිවිඩයක් ලෙස තමන්ට පළමු පූර්ව දැනුවත් කිරීමේ බුද්ධි තොරතුර ලද බවයි.

පසුව අදාළ පණිවිඩය පොලිස් පරීක්ෂක හිමාලි මහත්මිය මගින් රාජ්‍ය බුද්ධි සේවයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාට සහ සහකාර අධ්‍යක්ෂවරයාට යොමු කර ඒ පිළිබඳ සොයා බලා වාර්තාවක් ලබාදීමට තමන් නියෝග කළ බව ජයවර්ධන මහතා ජනාධිපති කොමිසම හමුවේ සඳහන් කළේය.

එසේම මේ තොරතුර බුද්ධි තොරතුරක් බවට පත් කර ගැනීමට එහි විය හැකිභාවය සොයා බැලීම සඳහා රාජ්‍ය බුද්ධි සේවයේ විශේෂ කණ්ඩායමක් නැගෙනහිර පළාතට යැවූ බවද නිලන්ත ජයවර්ධන මහතා පැවසුවේය.

පසුව අප්‍රේල් මස 05 වැනිදු දහවල් කාලය වන විට මුල් තොරතුර ලබාදුන් තැනැත්තාගෙන් සහ තවත් තොරතුරුකරුවන්ගෙන් ප්‍රහාරය පිළිබඳ පූර්ව දැනුවත් කිරීමේ තොරතුරු ලිඛිතව ගෙන්වා ගත් බව නිලන්ත ජයවර්ධන මහතා සාක්ෂි දෙමින් කියා සිටියේය.

මෙහිදී රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය නිලන්ත ජයවර්ධන මහතා සහ හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා අතර අප්‍රේල් 06 වැනිද දුරකථන සංවාද 04ක් සිදුව ඇති බව පෙන්වා දෙමින් විමසා සිටියේ එහිදී මේ පළමු බුද්ධි තොරතුර පිළිබඳ ආරක්ෂක ලේකම්වරයා දැනුවත් කළේ ද යන්නය.

එයට පිළිතුරු දෙමින් ජයවර්ධන මහතා පැවසුවේ අප්‍රේල් 04 වැනිද තමාට ලද පළමු තොරතුරු පිළිබඳ තවදුරටත් තහවුරු කර ගැනීම් සිදු කරමින් සිටි බැවින් අප්‍රේල් 06 වැනිද තමන් ඒ පිළිබඳ තම අධීක්ෂණ නිලධාරියා දැනුවත් නොකළ බවය.

කෙසේ වෙතත් මේ බුද්ධි තොරතුර පිළිබඳ තමන් ඉකුත් වසරේ අප්‍රේල් 07 වැනිද පෙ. ව. 8.55කට එවකට පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා දුරකථනයෙන් අමතා දැනුවත් කළ අතර, එදිනම මුල් තොරතුර කිසිදු වෙනස්කමකට භාජනය නොකොට Top Secret යනුවෙන් සඳහන් කර ජාතික බුද්ධි ප්‍රධානියාට යොමු කළ බව ජයවර්ධන මහතා සාක්ෂි දෙමින් කියා සිටියේය.

අප්‍රේල් 09 වැනිද වන විට තමන්ට නැගෙනහිර පළාතට යැවූ නිලධාරීන්ගේ සහ නියෝජ්‍ය සහ සහකාර අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තා ලැබී තිබූ බැවින් වැඩි දුර වාර්තාවක් සකස් කර පොලිස්පතිවරයාට යොමු කළ බව නිලන්ත ජයවර්ධන මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

මෙහිදී රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය විමසා සිටියේ, පළමු බුද්ධි තොරතුරේ වැදගත් පල්ලි ඉලක්ක වන බව සඳහන්ව තිබීම සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවය ගත් පියවර කුමක් ද යන්නය.

කෙසේ වෙතත් මෙහිදී අප්‍රේල් 04 ද ලද පළමු බුද්ධි තොරතුරට අදාළව අප්‍රෙල් 05 වැනිද සහකාර අධ්‍යක්ෂවරයා විසින් නිලන්ත ජයවර්ධන මහතාට ලබාදෙන ලද වාර්තාව කොමිසමේ අවධානයට ලක්වූ අතර, එහි වැදගත් පල්ලියක් ලෙස පාස්කු ඉරුදින මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල වූ කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය සිතියමක ලකුණු කර තිබීම විශේෂත්වයක්.

එසේම සහකාර අධ්‍යක්ෂවරයාගේ අදළ වාර්තාව තුළ ගෝල්ෆේස් ප්‍රදේශයේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සහ බම්බලපිටිය සහ කොල්ලුපිටිය ප්‍රදේශවල පිහිටි ප්‍රධාන පල්ලි කිහිපයක් ද වැදගත් පල්ලි ලෙස සටහන් කර තිබිණි.

කෙසේ වෙතත් වැඩි දුර සාක්ෂි ලබාදීමේ දී නිලන්ත ජයවර්ධන මහතා සඳහන් කළේ, සහරාන් හෂීම් නැමැත්තාට ප්‍රහාරයක් එල්ල කිරීමේ හැකියාව ඇති බව තමන් 2018 වර්ෂයේ පමණ සිට වගකිවයුත්තන් දැනුවත් කර තිබුණ ද, 2019 අප්‍රේල් 04 වන විටත් සහරාන් හෂීම් ප්‍රහාරයකට සූදානම් වන බවක් පිළිබඳ රාජ්‍ය බුද්ධි සේවයට පැහැදිලි තොරතුරු නොතිබූ බවය.

මෙහිදී ජනාධිපති කොමිසමේ සාමාජික විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරුවරයා ප්‍රශ්න කර සිටියේ, තොරතුරු ලැබී තිබියදීත් රාජ්‍ය බුද්ධි සේවය එහි වියැකිභාවය පිළිබඳ සොයා බලමින් සිටිය දී ත්‍රස්තවාදීන් බෝම්බ පුපුරුවා හැරීම රාජ්‍ය බුද්ධි සේවයේ දුර්වලතාව නොවේ ද යන්නය.

එයට පිළිතුරු ලබා දෙමින් නිලන්ත ජයවර්ධන මහතා පැවසුවේ, පාස්කු ප්‍රහාරයට සති දෙකකට පෙර තමන් වගකිවයුතු අංශ දැනුවත් කළ බවත්, ප්‍රහාරය එල්ලවීමට පෙර දිනයේ හෙට ගහනවා යැයි දැනුම් දුන් බවත්, පළමු ප්‍රහාර 06න් පසු තව 02ක් තියෙනවා යැයි ද, පල්ලියක් අසල බෝම්බ පැටවූ ලොරියක් නවතා ඇතැයි ද තමන් තොරතුරු සැපයූ බවය.

එසේම ලබාදිය හැකි සෑම තොරතුරම පවසා දෙවැනි ප්‍රහාරයක් සිදුවීම වැළැක්වීමට රාජ්‍ය බුද්ධි සේවය කළ හැකි සියලු දේ කළ බව ජයවර්ධන මහතා ජනාධිපති කොමිසම හමුවේ කියා සිටියේය.

එබැවින් තමන්ගේ ද වැරදි තිබිය හැකි වුවද, රාජ්‍ය බුද්ධි සේවය ලෙස සැපයිය හැකි සියලු තොරතුරු සපයා ඇති පසුබිමක රාජ්‍ය බුද්ධි සේවයේ ක්‍රියාකලාපය දුර්වල යැයි පැවසීම පිළිගැනීමට නොහැකි බව ජයවර්ධන මහතා ජනාධිපති කොමිසම හමුවේ සඳහන් කළේය.

මේ අතර රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා 13 වැනි දිනටත් මේ වන විට ජනාධිපති කොමිසම හමුවේ සාක්ෂි දෙමින් සිටියි.

කඩාවැටුණු මූල්‍ය...

ඒ අනුව ශ්‍රී ලංකා තැන්පත් රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රම යටතේ ද ෆිනැන්ස් පීඑල්සී, ඊ. ටී. අයි. ෆිනැන්ස් ලිමිටඩ් සහ ස්වර්ණමහල් ෆිනැන්සියල් සර්විසස් පීඑල්සී යන ආයතනයන්හි රුපියල් ලක්ෂ හයක උපරිමයකට යටත්ව ගනුදෙනුකරුවන් හට වන්දි මුදල් ගෙවීමට මහ බැංකුවේ නිරාකරණ හා බලගැන්වීමේ දෙපාර්තමේන්තුව කටයුතු සම්පාදනය කොට තිබේ.

ඉහත කී ආයතන 3 හි මුදල් තැන්පත් කොට ඒවා නැවත ලබාගැනීමට නොහැකි වූ, කාලයක් තිස්සේ දුක්විඳි සුළු පරිමාණ තැන්පත්කරුවන්ගේ ඉල්ලීම්වලට කන්දෙමින් ඔවුන්ට සහනයක් සැලසීමට ශ්‍රී ලංකා තැන්පත් රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ තම දෙපාර්තමේන්තුව පියවර ගත් බව මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් සඳහන් කළේය.

මුදල් මණ්ඩලය විසින් 2017 ජූනි 16 වැනිදු පැවති එහි අංක 21/2017 දරන රැස්වීමේදී තීරණය කරන ලදුව, නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුවට අනුබද්ධව පැවති බලගැන්වීමේ ඒකකය වැඩිදියුණු කරමින් 2018-01-01 සිට බලාත්මක වන පරිදි නිරාකරණ සහ බලගැන්වීමේ දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබූ බව ද එම නිලධාරියා සඳහන් කළේය.

මේ වන විට සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් සහ ස්ටැන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනැන්ස් ලිමිටඩ් සහ ටී.කේ.එස්. ෆිනැන්ස් ලිමිටඩ් යන ආයතන ත්‍රිත්වයේද තැන්පත්කරුවන්ට තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ වන්දි ගෙවීම් සිදුකරමින් පවතී.

රනිල් සහ...

දූෂණ විරෝධී කමිටුවේ ලේකම් ආනන්ද විජේපාල හා පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසයේ සහකාර පොලිස් අධිකාරී සේරසිංහ ඇතුළු තවත් නිලධාරීන් 5 දෙනකුට එදින කොමිසම හමුවේ පෙනී සිටින ලෙසට නියෝග නිකුත් කළේය.

හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ, හිටපු අධ්‍යක්ෂවරුන් වන මංගල සමරවීර, රවුෆ් හකීම්, සරත් ෆොන්සේකා, හිටපු මන්ත්‍රී ආර්. සම්බන්දන්, එම්. ඒ. සුමන්තිරන්, ජාතික ජනබලවේගයේ අනුර කුමාර දිසානායක, ජනාධිපති නීතිඥ ජේ. සී. වැලිඅමුණ, ආචාර්ය ජයම්පති වික්‍රමරත්න, මලික් සමරවික්‍රම හා කමිටු ලේකම් ආනන්ද විජේපාල මහත්වරුන්ට මෙම නොතිසි නිකුත් කළේය.

මූල්‍ය අපරාධ කොට්ඨාසයේ පී. කේ. සේරසිංහ, සජිත් රත්නායක, එස්. ගුණවර්ධන, තිලක් සමරනායක පොලිස් නිලධාරීන්ට හා දිවි නැඟුම හිටපු අධ්‍යක්ෂ හේවාහැටගේ සුමනපාල යන වගඋත්තරකරුවන්ටද නොතිසි නිකුත් කෙරිණි.

දූෂණ විරෝධී කමිටුවේ සාමාජික හිටපු අධිකරණ ඇමැති ආචාර්ය විජයදස රාජපක්ෂ මහතා එම කමිටුවට සහභාගී වී නොමැති බැවින් හා එම කමිටුව ව්‍යවස්ථා විරෝධී, නීති විරෝධී කමිටුවක් බවට කොමිසමේ සාක්ෂි ලබා දී ඇති බැවින් වගඋත්තරකාර පාර්ශ්වයක් ලෙස නම් නොකරන ලෙස කොමිසම දන්වා සිටියේය.

2015 අප්‍රේල් 22 දින හිටපු ආර්ථික සංවර්ධන ඇමැති බැසිල් රාජපක්ෂ මහතා ඇතුළු තමන්ට සාවද්‍ය කරුණු මත නඩු පැවරීමට පැමිණිලි යොමුකර දේශපාලන පළිගැනීම් සිදු කළේ යැයි පවසමින් හිටපු දිවි නැඟුම අධ්‍යක්ෂ හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් කිත්සිරි රණවක මහතා ගොනු කළ පැමිණිලි පහක් සලකා බැලීමෙන් පසුව මෙම නොතිසි නිකුත් කෙරිණි.

සාවද්‍ය කරුණු මත දේශපාලන පළිගැනීම් කිරීමෙන් සිදුවූ අගතියට හා අපකීර්තියට රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු වගඋත්තරකාර පාර්ශ්වයන්ගෙන් වන්දි අයකර දෙන ලෙස රණවක මහතා කොමිසමෙන් ඉල්ලා සිටියේය.

දේශපාලන පළිගැනීමෙන් තමන්ට අහිමි වූ රාජ්‍ය සේවා කාලය වසර තුනක් හා මාස හතරක් බව පැවසූ රණවක මහතා, එම කාලය තුළ අහිමි වූ රුපියල් හතළිස්හය ලක්ෂ අසූතුන්දහසක හිඟ වැටුප් හා නීතිඥවරුන්ට වැයවූ රුපියල් ලක්ෂ විස්සක මුදල නැවත අයකර දෙන ලෙස ද රණවක මහතා ඉල්ලා සිටියේය.

කොරියාවේ රැඳී සිටින...

කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ලෝකයේ ඇති වූ ගුවන් ගමන් නතරවීම නිසා මෙම පිරිසට ලංකාවට පැමිණීමට නොහැකිව මේ වන විට මාස කිහිපයක් කොරියාවේ රැඳී සිටිති. මෙම පිරිස ලංකාවට ගෙන්වා ගන්නා තුරු කොරියාවේ රැකියා සඳහා යාමට නියමිත ඊළඟ ලාංකික ශ්‍රමිකයන් කණ්ඩායම එරටට යැවීමට නොහැකිව සිටින බවද මෙහිදී අනාවරණය විය.

එම නිසා කොරියාවේ මේ පිරිස දිවයිනට ගෙන්වා ගෙන ඔවුන් නිරෝධායනය කිරීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පුහුණු මධ්‍යස්ථාන යොදා ගන්නා බවත්, ඔවුන්ට ආහාර හා සියලු පහසුකම් කාර්යාංශය මගින් ලබා දීමට කටයුතු කරන බව ද ඇමැතිවරයා මෙහිදී සඳහන් කළේය. ඒ සඳහා ශ්‍රී ලංකන් ගුවන් සේවයේ විශේෂ ගුවන්යානා යොද ගනිමින් මාස දෙකක් තුළ මේ පිරිස ගෙන්වා ගන්නා බව ද ඇමැතිවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

ඊයේ (18) කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනයේ (HRDK) ශ්‍රී ලංකාවේ නේවාසික නියෝජිත කිම් වොන් සොක් (Kim Won Seok) මහතා සමග අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා කම්කරු අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවක දී මේ බව සඳහන් කළේය.

මෝටර් රථයකින්...

ඔවුන් සමග අත්අඩංගුවට ගත් නෝට්ටු තොගය බන්ඩල් 128ක් ලෙස සකසා බෑගයක අසුරා මෙසේ ප්‍රවාහනය කරමින් සිට ඇත. එම නෝට්ටු බන්ඩල්වල උඩට සහ යටට පමණක් ව්‍යාජ පන්දහසේ නෝට්ටු දෙකක් තබා තිබී ඇති අතර ඒවායේ එක් පැත්තක පමණක් පන්දහසේ නෝට්ටුවක් ලෙස පිටතට පෙනෙන ආකාරයෙන් මුද්‍රණය කර තිබෙන බව පොලිසිය වැඩිදුරටත් කීය. රුපියල් මිලියන 156ක වටිනාකමකින් යුතු නෝට්ටු තොගයක් ලෙස අසුරා ඇති මේ බන්ඩල්වල මැද ඇත්තේ පන්දහසේ නෝට්ටු ප්‍රමාණයට සැකසූ කඩදසි සුදු කොළ බව ද පොලිසිය පැවසීය.

විශේෂ කාර්ය බළකායට ලැබුණු තොරතුරක් අනුව මාර්ගයේ ගමන් ගත් අදළ මෝටර් රථය පරීක්ෂාවට ලක්කිරීමේදී මේවා සොයා ගෙන තිබේ.

මුදල් නෝට්ටු ලෙස සකසා රැගෙන ගිය මේ බන්ඩල් තොගය මුදල් ලෙස පෙන්වා කිසිවකු රවටා රහසිගත ව්‍යාපාරයකට යෙදවීමට සූදනමක් තිබුණේ ද යන්නත්, මීට වසර ගණනකට පෙර පාතාල කණ්ඩායම් පවත්වාගෙන ගිය "මුදල් ඩබල් කිරීමේ" හොර ජාවාරම නැවත ක්‍රියාත්මක වීමක් ද යන්නත් හඳුනා ගැනීම සඳහා පොලිසිය මේ පිළිබඳ පරීක්ෂණ ආරම්භ කර ඇත.

නාගරික සංවර්ධනයේ...

ගලේවෙල වාසලකෝට්ටේ ප්‍රදේශයේ පදිංචිකරුවකු ගෙන් මේ නිලධාරියා රුපියල් 50,000ක අල්ලස් මුදලක් ඉඩම ගොඩ කිරීම සඳහා ඉල්ලා ඇති අතර, එම පුද්ගලයා අල්ලස් කොමිසමේ නිලධාරීන් වෙත පැමිණිලි කිරීමෙන් පසුව නිලධාරි කණ්ඩායමක් දඹුල්ල කාර්යාලයට ගොස් මුදල ලබා දෙන අවස්ථාවේ අත්අඩංගුවට ගෙන තිබේ.

මේ නිලධාරියා අත්අඩංගුවට ගැනීමත් සමඟ එම කාර්යාලයේ සේවක සේවිකාවන් දැඩි ලෙස නොසන්සුන්කාරී ලෙස හැසිරෙන්නට වී තිබේ. මේ ගොඩනැගිල්ලේම දඹුල්ල මහ නගර සභාව ඉඩම් කාර්යාලය නාගරික සංවර්ධන අධිකාරිය යන කාර්යාල තුනම පවත්වාගෙන යන අතර, එම සෑම අංශයකම නිලධාරීන් පැමිණ දැඩි නොසන්සුන් ආකාරයෙන් හැසිරෙන අයුරු දක ගැනීමට හැකි විය.

මුදල් විශුද්ධිකරණ...

පොලිස් සැරයන් රුවන් පුෂ්ප කුමාර හා පොලිස් පරීක්ෂක සමන් කුමාර ජයසිංහ යන දෙදෙනාට අමතරව පොලිස් පරීක්ෂක උදර චතුරංග, පතිරණහේවාගේ සුමේධ ,වාසල මුදියන්සේලාගේ උපාලි රත්නායක, නිරෝශ් මධුශංක ද සිල්වා,රණසිංහආරච්චිගේ අතිල් ශාමන්ත හා වඩුතන්ත්‍රිගේ රුවන් අල්විස් යන අයට එරෙහිව මෙසේ මුදල් විශුද්ධිකරණය යටතේ නඩු පැවරිණ.

මත්ද්‍රව්‍ය ජාවාරමෙන් සැකකරුවන් ලක්ෂ 48 ක් උපයාගෙන ඇති බවට සඳහන් කරමින් මහාධිකරණය හමුවේ කරුණු වාර්තා කිරීමෙන් අනතුරුව තහනම් නියෝග ගෙන ඇති බව සඳහන් කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සැකකරුවන් ඉඩම් මිලටගෙන ඇති අතර ඥතින් නමින් ගිණුම් පවත්වාගෙන ගොස් ඇති බව සඳහන් කළේය.

පොලිස්පතිවරයාගේ නියෝගයකට අනුව මුදල් විශුද්ධිකරණ පනත යටතේ විමර්ශනයක් පැවැත්වූ බව සඳහන් කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කෝටි 10කට ආසන්න දේපලක් සම්බන්ධ තොරතුරු අනාවරණය වී ඇති බව සඳහන් කෙළේය.

පොලිස් නිලධාරීන් ලෙස සේවය කරමින් මත්ද්‍රව්‍ය ජාවාරම් කරුවන් සමග සබඳතා පවත්වා නීතිවිරෝධී මුදල් උපයා ගත් බව පවසමින් මෙමෙ නඩු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පවරා තිබිණ.

දේශීය රථවාහන ක්ෂේත්‍රයේ නව පෙරළියක් ඇතිකරමින් ශ්‍රී ලංකාවේ ප්‍රථම ඔටෝ ගෑස් වාහන පරිවර්තන ව්‍යාපාරය ආරම්භ කළ ලාෆ්ස් ඔටෝ ලංකා සමාගම, ලාෆ්ස් ගමන් මගේ මුල් පියවරයි.

වසර 25ක් පුරා ජාත්‍යන්තරවද සාර්ථකත්වය හිමිකරගනිමින් දිනෙන් දින වර්ධනය වූ ලාෆ්ස් සමූහ ව්‍යාපාරය අද වන විට බලශක්ති, පරිභෝජන භාණ්ඩ වෙළෙඳාම, කර්මාන්ත, සේවා, හෝටල් සහ සංචාරක සේවා, ප්‍රවාහන සහ සැපයුම් කටයුතු වැනි ක්ෂේත්‍ර 20ක් පුරා විහිදෙමින්, 3500ක ස්ථිර කාර්යමණ්ඩලයක් සමග වාර්ෂිකව ඩොලර් මිලියන 300ක ආදායමක් උපයයි.

ශ්‍රී ලාංකීය වටිනාකම්වලට නිතැතින්ම මුල් තැන දෙමින් ආර්ථික මෙන්ම සාමාජයීය වශයෙන් මුළු ශ්‍රී ලංකාවම බලගන්වන ශක්තිය වීම ලාෆ්ස් අපේ අරමුණයි.

අපේ අනාගත අරමුණු

ජයග්‍රහණ රැසක් අත්කරගත් අප ආයතනයෙහි මීට වසර 25කට පෙර, ආරම්භයේදී සතු වූ එකම ධනය වූයේ අපගේ සාරධර්ම පිළිබඳ දැඩි විශ්වාසයයි. වසර ගණනාවක් පුරා, අප විවිධ කර්මාන්ත වලට සාර්ථකව විවිධාංගීකරණය වී දේශීය සිට විදේශීය වෙළෙඳපොළ දක්වා ව්‍යාප්ත වී ඇත. ඔටෝ ගෑස් පරිවර්තනය, වාහන දුම් පරීක්ෂණ වැනි කර්මාන්ත, ක්ෂේත්‍රයේ ප්‍රථමවරට ස්ථාපිත කිරීම සහ දකුණු ආසියාවේ විශාලතම LPG අන්තර් නැව්ගතකිරීමේ පර්යන්තය ඉදිකිරීමටද අප සමත් විය.

2020 දී, ලාෆ්ස් නව පරිච්ඡේදයක අපේ ගමන ආරම්භ කළෙමු. අපගේ සියලු පාර්ශවකරුවන් සඳහා ගෝලීය ව්‍යවසායක් ගොඩනැගීම සහ රටට සමෘද්ධිමත් අනාගතයක් ඇති කිරීමේ ඉදිරි දැක්ම ඊළඟ වසර 25 තුළ ළඟාකර ගැනීම අපගේ ඒකායන බලාපොරොත්තුවයි.

අප පිළිබඳ ඔබ තුළ ඇති අසමසම විශ්වාසය සහ ශක්තිය, පසුගිය වසර 25 තුළ අපගේ සාර්ථකත්වයට රුකුලක් වූ අතර, ඒ වෙනුවෙන් රටවැසි සියලුම දෙනාට කෘතඥතාවය පිරිනමන්නෙමු. ඔබ දක්වන නොසැලෙන සහයෝගය අපගේ සියලුම ජයග්‍රහණ වලට හේතුවයි. අනාගතයේදී, සැමදෑ මෙන් ඔබ අප සමග විශිෂ්ටත්වයේ මාර්ගය විවර කරමින් වර්ධනය වනු දැකීම අපගේ එකම අභිප්‍රායයි.

LAUGFS HOLDINGS

www.laugfs.lk

දිනමිණ
The Dinamina
1909 ඇරැඹී ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 19 වැනිදා බදාදා

තරුණයනි! රජය වගකීම් ඉටු කොට ඇත

හරියටම තවත් දින දහතුනකින්, එනම්; සැප්තැම්බර් දෙවනද ලක්ෂ එකහමාරක් රාජ්‍ය සේවයට එක් වෙති. ලක්ෂ එකහමාරකට රැකියා ලබා දුන් අවස්ථාවක් අපේ ඉතිහාසයේ මෙතෙක් සටහන් වී නැත. රැකියා ලැබෙන්නේ රාජ්‍ය අංශයේ වීම තවත් විශේෂත්වයකි. කුමන පැත්තකින් බැලුව ද රාජ්‍ය අංශයේ රැකියා සුරක්ෂිතය. රැකියාලාභියාගේ ජීවිතය ද ඒ අනුව හැම අතකින්ම සුරක්ෂිත වෙයි. සැප්තැම්බර් 02 ද රාජ්‍ය සේවයට එකතු වන පිරිස හරියටම ගණනය කළ හොත්, එක්ලක්ෂ පනස්එක්දහසකට ටිකක් වැඩිය. මේ පිරිස තෝරාගෙන ඇත්තේ කිසිදු දේශපාලන බලපෑමකින් තොරවය. තරුණ ශ්‍රමය රටේ නිෂ්පාදන ක්‍රියාවලියට බද්ධ කිරීම වැඩසටහනෙහි මූලික අරමුණ වෙයි.

අපේ තරුණයන්ගේ විරැකියාව පිළිබඳ ගැටලුව 1959 සිට සංවාදයට ලක් වී ඇත. පර්යේෂණ දත්ත අනුව බැලුවහොත් 1959-1960 කාලයේ තරුණ ශ්‍රම බලකායෙන් 10.5%ක් සේවා වියුක්තියට අයත් විය. මේ තත්ත්වය 1970 දී 13.3%ක් ලෙසද 1980 දී 15.3%ක් ලෙස ද වර්ධනය වී ඇත. සේවා වියුක්තියට අදාළ තරුණ පරම්පරාව ශීඝ්‍රයෙන් ඉහළ යෑම ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික දේහයේ ප්‍රධාන රෝග කාරකය බවට පත් වී තිබිණි. මීට වගකිවයුත්තේ රාජ්‍ය පාලනය කළ නායකයන් බව අමූතුවෙන් කිව යුතු නැත. රටේ අවශ්‍යතාවලට ගැළපෙන ආර්ථික වැඩසටහන් සැලැසුම් කිරීමට අතීත නායකයන් සමත් වී නැත. එහි ප්‍රතිඵලය වූයේ රටේ දිළිඳුකම ශීඝ්‍රයෙන් ඉහළට යෑමය. 2000 පමණ වන තුරු ද ශ්‍රී ලංකාව හැඳින්වූයේ අසමත් රාජ්‍යයක් හැටියටය.

වත්මන් ජනාධිපතිවරයාගේ ආර්ථික දර්ශනයෙහි කැපී පෙනෙන ලක්ෂණයක් තිබේ. එනම්, දිළිඳුකම පිටුදැකීම, රැකියා සම්පාදනය හා නිෂ්පාදන ක්‍රියාවලිය එකට බද්ධ කොට ආර්ථික සංවර්ධන අපේක්ෂා ඉටු කර ගැනීමය. වඩාත් පැහැදිලිව කිවහොත් දිළිඳු ප්‍රජාව නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීමෙන් ඉලක්ක දෙකක් ජයගත හැකි බව ජනාධිපතිවරයා විශ්වාස කරයි. පළමු ඉලක්කය තරුණ පරම්පරාවේ විරැකියා ගැටලුව විසැඳීමය. දෙවන ඉලක්කය රටේ දිළිඳුකම තුරන් කිරීමය. ලෝක බැංකුවේ සභාපතිවරයකු වූ රොබට් මැක්නමාරා 1990 ස්වකීය වාර්තාවේ සඳහන් කර ඇත්තේ අන්ත දුගීභාවය මිනිස් සමාජයේ ගෞරවයට බලවත් කැළලක් බවය. රාජ්‍ය පාලකයන්ගේ අවධානය ඒ කෙරෙහි යොමු විය යුතුය.

ගෝඨාභය රාජපක්ෂ මහතාගේ දර්ශනයට අනුව දිළිඳුකම හැකියාවක් හෙවත් සුදුසුකමක් හැටියට පරිවර්තනය කර ගත යුතුය. අපේ මෙතෙක් ඉතිහාසයේ කිසිදු පාලකයකු දිළිඳු පවුල් තෝරාගෙන එම පවුල්වල සාමාජිකයන්ට රැකියා ලබා දුන්නේ නැත. අධ්‍යාපන සුදුසුකම්, බාහිර සුදුසුකම් හා දේශපාලන සුදුසුකම් සෑම රැකියාවක් සඳහාම මූලික වශයෙන් සොයා බැලිනි. ලක්ෂයකට රාජ්‍ය අංශයේ රැකියා ලබාදීමට ජනාධිපතිවරයා තීන්දු කළේ දිළිඳුකම පමණක් සුදුසුකම හැටියට සලකමින්ය. එය අපේ දේශපාලන ඉතිහාසයේ වැදගත් තීරණයක් සේම සන්ධිස්ථානයක් හැටියට ද සැලැකිය හැකිය. පවුල් ලක්ෂයක් දිළිඳුකමේ රේඛාවෙන් ඉහළට ඔසොවා තැබීම ආර්ථිකයේ ද පෙරැළිකාර අවස්ථාවකි.

අන්තර්ජාතික මූල්‍ය ආයතන රැසක සංවර්ධන උපදේශනය වන්නේ දිළිඳු රටවල් හා දියුණු වෙමින් පවතින රටවල් ස්වකීය රාජ්‍ය අංශය හැකිතාක් හකුළා දැමිය යුතු බවය. එලෙසම විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රමයෙන් අහෝසි කළ යුතු බවය. ශ්‍රී ලංකාවේ ධනපති ආණ්ඩු මෙය පිළිගනු ලැබූව ද මහින්ද රාජපක්ෂ ආණ්ඩුව එය පිළිගත්තේ නැත. නිදහසින් පසුව අපේ රාජ්‍ය අංශය ශක්තිමත් කළ නායකයකු ලෙස මහින්ද මහතා හැඳින්වීම නිවැරැදිය. ඉන්පසු රාජ්‍ය අංශය කෙරෙහි විශ්වාසය තැබූ නායකයා වත්මන් ජනාධිපතිවරයා ය. මැලේසියාව සංවර්ධිත රාජ්‍යයක් බවට පත් කළ මහතිර් මොහොමඩ් මහතා ද පළමුව සිදු කළේ එරට රාජ්‍ය අංශය ශක්තිමත් කොට එය කාර්යක්ෂම තත්ත්වයට ගෙන ඒමය.

කොවිඩ්-19 ලෝක වසංගත තත්ත්වය යටතේ ලෝක ආර්ථිකය විශාල පසුබෑමකට මුහුණ දී ඇත. මේ තත්ත්වය යටතේ එකිනෙක රටවලට අලුත් ආර්ථික උපායමාර්ග සොයා යෑමට සිදු වී තිබේ. පවතින පසුබිම තුළ රාජ්‍ය නායකයන්ට අලුත් අභියෝගවලට මුහුණ දෙන්නට සිදු වී ඇත. ඔවුන්ගේ දැක්ම, ක්‍රියාකාරිත්වය හා තීරණ ගැනීමේ හැකියාවට අනුව රටවල්වල අනාගතය විසඳෙනු ඇතැ'යි සිතන්නට පුළුවන. ගෝඨාභය රාජපක්ෂ මහතා ඉදිරිපත් කර ඇති 'සෞභාග්‍යයේ දැක්ම' වැඩපිළිවෙළ විශ්ලේෂණය කළ හොත් එය ශ්‍රී ලංකාවේ අනාගත අපේක්ෂා සමඟ හොඳින් බද්ධ වන බව පෙනී යයි. අප ඉදිරියෙහි ඇති අභියෝග ජයගත හැකි තර්කානුකූල මාර්ග ද එහි තිබේ.

රැකියා ලක්ෂ එකහමාර දෙස ආපසු හැරී බලන විට ඒ මගින් ආර්ථිකයේ ප්‍රසාරණයක් ඇතිවිය යුතුය. එක අතෙකින් නිෂ්පාදන ක්‍රියාවලිය දියුණු විය යුතුය. තව අතෙකින් පවුල්වල ආදායම් ඉහළ ගොස් ඔවුනට යහපත් ජීවිත ලැබිය යුතුය. ආර්ථික සංවර්ධනයේ අවසන් ඉලක්කය වන්නේ රටක ජනතාවට තෘප්තිමත් ජීවිත ලැබීමය. ජනතාවගේ ආදායම් මාර්ග ඇතිරෙන හා විරැකියාව ඉහළ යන ආර්ථිකයක් දියුණු ආර්ථිකයක් වන්නේ නැත. දියුණු ආර්ථිකයක මූලික ලක්ෂණයක් වන්නේ රැකියා සුලභ වීමය. අමෙරිකාව, එංගලන්තය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, ජපානය, දකුණු කොරියාව පමණක් නොව, මැදපෙරදිග රටවල් ද රැකියා බහුල ආර්ථිකයන්ගෙන් සමන්විතය. කොවිඩ්-19 නොවන්නට අදටත් එම රටවල රැකියා බහුලය. ශ්‍රී ලංකාවද රැකියා බහුල ස්ථානයක් බවට පත් කර ගත හැකිය.

සැප්තැම්බර් 02 ද සිට රාජ්‍ය සේවයට එකතු වන පිරිසට වචනයක් කිව යුතුය, රජය සිය වගකීම ඉටු කර තිබේ. ඔබ ඔබේ වගකීම හා යුතුකම ඉටුකළ යුතුය. එවිට ශ්‍රී ලංකාව නියම ආර්ථික පිල්ලට වැටෙනු ඇත.



පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයන අංශයේ හිටපු මහාචාර්ය
ආර්.ඒ.ඩබ්ලිව්. රණසිංහ

බලාපොරොත්තු සහ අලුත් ආණ්ඩුවේ කාර්යභාරය

නිදහසින් පසු ගෙවුණු වසර 72 තුළ ශ්‍රී ලංකාවේ මහ මැතිවරණ දහසයක් පවත්වා තිබේ. ඒ අනුව මෙම අගෝස්තු මස 20 වැනි දින රැස්වීමට නියමිතව තිබෙන්නේ මෙරට 9 වන පාර්ලිමේන්තුවයි. වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බලාත්මක කිරීමෙන් අනතුරුව මේ රැස්වන්නේ නවවන පාර්ලිමේන්තුව වන අතර මින් ඉහත පාර්ලිමේන්තු හා සැසඳීමේදී මෙය ඉතා සුවිශේෂී එකකි. සමානුපාතික ඡන්ද ක්‍රමය හඳුන්වා දෙමින් එදා ජේ.ආර් ජයවර්ධන මහතා ප්‍රකාශ කළේ කිසිදු දිනක කිසිදු තනි පක්ෂයකට තුනෙන් දෙකක බලයක් ලබාගත නොහැකි බවයි. එය පුස්සක් බවට පත් කරමින් ජනපති ගෝඨාභය රාජපක්ෂ හා අගමැති මහින්ද රාජපක්ෂ මහතා බැසිල් රාජපක්ෂයන්ගේ සංවිධාන ශක්තිය ද නිවැරැදි ලෙස යොදා ගනිමින් තනි පක්ෂයක් ලෙස මන්ත්‍රී ආසන 145ක් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ වෙන ලබාගෙන තිබේ. ඔවුන් හා මතවාදී ලෙස සමාන්තර ගමනක් යන දේශපාලන පක්ෂ දිනාගත් ආසන ද සැලකූ විට තුනෙන් දෙකකට වඩා වැඩි මන්ත්‍රී ආසන සංඛ්‍යාවක් සහිත පාර්ලිමේන්තුවක් අගමැති මහින්ද රාජපක්ෂ මහතාට ලැබී ඇත.

නව පාර්ලිමේන්තුව

සෞභාග්‍යයේ දැක්ම අත ඇතිව සුබවාදී අනාගතයකට බලාපොරොත්තු දල්වා අරඹා ඇති නව ගමනට මිලියන 7කට ආසන්න ජන්දදායකයන් සංඛ්‍යාවක් ආශීර්වාදය පළ කර තිබේ. එද ජනාධිපතිතුමන් ඉල්ලා සිටි පරිදි ජනතාව ඔවුන්ගේ යුතුකම ඉහළින්ම ඉටු කර ඇත. දැන් එළැඹ තිබෙන්නේ ජනාධිපතිතුමන් ඇතුළු නව පාර්ලිමේන්තුව ජනතාව වෙත කෘතගුණ සැලකීමේ වාරයයි. මෙවර මහ මැතිවරණයේ දී ජනතාව දැල් වූ බලාපොරොත්තු නැවත ස්මරණය කොට ඒ පිළිබඳ වගකීමට සහ වගවීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීම නව පාර්ලිමේන්තුවේ මූලිකම කාර්යභාරයයි. එම බලාපොරොත්තු ඉටු කර ගැනීමේදී එතෙක් හීලෑ නොවූ අශ්වයින් මෙන් හැසිරුණු මැති ඇමතිවරුන් එක්වරම නායකත්ව මට්ටමේ විනයකට හා හික්මවීමකට ඇතුළු කරගැනීම ජනාධිපතිතුමා සහ අගමැතිතුමා ඉදිරියේදී ඇති අභියෝගයකි.

යහපාලනය විසින් කඩා බිඳහෙලා තිබූ ආර්ථිකය සහ සමාජය කොරෝනා වයිරසය විසින් බිමට සමතලා කළ තත්ත්වයක් තුළ රටක් ලෙස නැවත හිස එසවීමට ටික කලක් ගතවනු ඇත. ඒ සඳහා නාස්තිය හා දූෂණය අවම කොට ජනතාවගේ සකලවිධ අවශ්‍යතා පූරණය කිරීම සඳහා ජාතික නිෂ්පාදන ක්‍රියාවලිය වේගවත් කිරීමට අවශ්‍ය තරුණ කැබිනට් මණ්ඩලයක් ද පත්කරගෙන තිබේ. මෙවර මැතිවරණයෙන් රජයට 2/3 ජනවරමක් ලැබුණ ද එකී ජනවරමට සාධාරණය ඉටු කිරීම සඳහා ඇති කැබිනට් අමාත්‍යාංශ ගණන 28කට සීමා කර තිබීමත් පැවරූ අමාත්‍යාංශ පිළිබඳ නිවැරැදි වටහා ගැනීමක් නොමැතිකමින් ඇතැම් රාජ්‍ය ඇමතිවරුන්ගේ පැහැදීමක් නොවීමත් පමණක් නොව තම අමාත්‍යාංශය තුළ තම අභිමතය සහ අණසක පතුරුවා කටයුතු කිරීමට නොහැකි වීමත් නිසා ඇතැම් ඇමැතිවරුන් තුළ නොසතුටක් මතුව තිබේ.

ඇමැතිවරු බලාපොරොත්තු වූ පරිදි තමන්ගේ හිතවතුන් අමාත්‍යාංශ තුළට ගෙන ස්වාභිමත ගමනක් යෑම අවහිර වී ඇත්තේ දැනටමත් පත්කොට ඇති නිලධාරීන් ඉවත් කිරීම නහනම් වී ඇති බැවිනි. එකී නිලධාරීන් සමඟ ඇමැතිවරුන් සුහදශීලී ආකල්පයකින් කටයුතු නොකළ හොත් එයම පරිපාලන අකාර්යක්ෂමතාවකට මංපෙත් විවර කරනු නොඅනුමානය.

සාර්ථක ගමනක්

දැණුම්මත් සහ අත්දැකීමෙන් පරිණත ජ්‍යෙෂ්ඨයින් සිටියදී තාරුණ්‍යය කෙරෙහි බලාපොරොත්තු දල්වා තිබීම කාර්යක්ෂම වූ දේශපාලන හා පරිපාලන ගමනකට බලාපොරොත්තු තැබුවත් ක්‍රියාවෙන් ලද අද්දැකීමද වැදගත් බව අප තේරුම් ගත යුතුය. ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ඇති ඒ පිළිබඳ ඇල්මක් ඇති බොහෝ දෙනෙකුට පවරා ඇති වගකීම් දෙස බලන විට සාර්ථක ගමනක ආරම්භයක් සටහන් වී ඇතැයි සඳහන් කළ යුතුය.මේ ගමනේ ආරම්භය සහ කෙළවර කළ යුතු අවසානය තුළ වත්මන් පාර්ලිමේන්තුවේ වගකීම හා කාර්ය භාරය කුමක්දයි තීක්ෂ්ණය කර ගැනීමේ දී 2019 ජනපති වරණයේ දී මෙන්ම 2020 මහ මැතිවරණයේදීත් අති බහුතර බලයක් දීමෙන් මෙරට ජනතාව අපේක්ෂා කළේ කුමක් ද යන්න ගැඹුරින් වටහා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. නව රජයකට අසීමිත බලයක් දීම යනු පැවැති රජයට එරෙහිව ගොඩනැඟුණු ජනතා අසහනයේ සහ පීඩනයේ ප්‍රකාශයක් ලෙස වටහා ගතහොත් 1970,1977, 2005 සහ 2010 යන මැතිවරණ ප්‍රතිඵල ඔස්සේ එය පැහැදිලි කරගත හැකිය. නිදහසින් පසු යුගයේ එනම් 1952 සිට 1977 දක්වාම බඩගෝස්තරයෙන් තීරණය කළ දේශපාලනය 2005 ත් පසු ජීවිතය,නිදහස හා සාමය උදෙසා යොදු ගැනීමට මෙරට වැසියන් පෙලඹීම සුවිශේෂ කරුණක් සේ හඳුනා ගැනීමට පුළුවන. 2010 ජනාධිපතිවරණ සහ මහමැතිවරණ ප්‍රතිඵල ද 2019 ජනාධිපතිවරණ සහ 2020 මහමැතිවරණ ප්‍රතිඵලය ද කියවිය යුත්තේ ජීවිතය ඉල්ලා සිටි ජනතාවගේ ප්‍රකාශ ලෙසිනි. ජාතික ආරක්ෂාව හැල්ලු කොට බලය වෙනුවෙන් අත්තවාදය සහ තුස්තවාදය පෝෂණය කරමින් රටේ ජනතාව එකී අත්තවාදයේ ගොදුරු බවට පත් කළ යහපාලනය පිළිබඳ තිබූ ද්වේෂ සහගත කළ කිරීම නව රජයට ලබා දුන් අතිබහුතර ජනවරමේ ප්‍රකාශනය බව අප තේරුම් ගැනීම වැදගත්ය.

ජාතික ආරක්ෂාව තහවුරු කිරීම නව රජයේ ප්‍රමුඛතම වගකීම වන්නේ යහපාලනය විසින් නොසලකා හළ ජාතික ආරක්ෂාව පිළිබඳ සහනිකය ජාතිය වෙත නැවත ලබාදීම කළ යුතුම දෙයක් බැවිනි. වත්මන් ආරක්ෂක සේවා සංයුතිය දෙස බලන විට ඒ සහනිකය පිළිබඳ බලාපොරොත්තුව මල්පල ගැන්වෙමින් තිබේ.ඒ අතර පාසකු ප්‍රහාරයේ වගකිව යුත්තන් පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි තිබිය දී පවා ඔවුන්ට නිදැල්ලේ සිටීමට ඉඩහැර තිබීම ප්‍රහාරයේ විත්දිතයින්ගේ කනස්සල්ලට හේතු වී තිබේ.ඒ වගකීමෙන් රජයට ගැලවිය නොහැක්කේ අති උතුම් මැල්කම් රංජිත් හිමිපාණන් ඇතුළු කතෝලික ජනතාව මෙන් ම කම්පිත වූ සිංහල, දෙමළ හා මැදහත් මුස්ලිම් ජනතාව ද දැඩි දල්වා සිදුවන්නේ කුමක්දයි බලා සිටින බැවිනි.

බහුතර ජනවරම

ජාතික ආරක්ෂාව තහවුරු කළ හැක්කේ අත්අඩංගුවට ගන්නා අවි ආයුධවලින් හෝ තුස්තයින්ගේ සංඛ්‍යාවෙන් නොවේ. ඒ සඳහා වන මහා පෙලඹුම් කාරකය වන අත්තවාදී මත පතුරුවන සියලු මූලයන් මුලිනුපුටා දැමීමෙන් පමණි. ජාතික ආරක්ෂාවට ඇති අතෙක් තර්ජනය ද

වත්මන් ආණ්ඩුව බලයට ගෙන ආවේ සිංහ කොඩිය පෙරටු කොටගත් ශ්‍රී ලාංකික ජාතිකත්වය පිළිබඳ සටන් පාඨය සමඟිනි. එහෙත් එය අවසන් වූයේ අති බහුතර සිංහල බෞද්ධයන්ගේ ආශිර්වාදය හිමි වූ ආණ්ඩුවක් බිහි වීමෙනි.

හොඳින් වටහා ගැනීම අත්‍යාවශ්‍ය කාරණයකි. රාජ්‍ය නායකයන්ට තර්ජනය කිරීමට තරම් ශක්තිමත් වූ පාතාලයක් තිර්මාණය වී තිබීම සුළුවෙන් තැකිය නොහැකිය. යහපාලන සමයේ මෙන්ම ඊට පෙර ද පාතාලය වැඩුණේ දේශපාලන බාප්පලා ඇසුරේ බව රටම දන්නා කරුණකි. එද ආරක්ෂක ලේකම්වරයා ලෙස පාතාලය හඹා ගොස් මූලිනුපුටා දමීමට වත්මන් ජනාධිපතිවරයා දරූ ප්‍රයත්නය කුමන්ත්‍රණකාරීව බලයට පැමිණි යහපාලනය නිසා අතර මඟ නතර වුවත් අද ඒ ක්‍රියාවලිය නැවතත් පණගන්වා තිබීම දුන් ජනවරමට ඉටු කරන්නා වූ සාධාරණයක් ලෙසින් අගය කළ යුතුය. එහෙත් පාතාලය සමඟ අත්වැල් බැඳගත් දේශපාලන සංස්කෘතිය ද හමාර කිරීමේ නෛතික හා භෞතික වැඩපිළිවෙළකට නොයා මේ ක්‍රියාවලිය සාර්ථක කරගැනීමට නොපුළුවන. සියලු ඇද දිග හැර නැඹීමට ශ්‍රී ලාංකික ජනතාවට ලැබුණු අවසාන අවස්ථාව මෙය බව පොහොට්ටුවට ඡන්දය දුන් අය මෙන්ම නොදුන් අයද තේරුම් ගත යුතුය.

ජාතික සම්පත්

ජාතිය සුරක්ෂා කළ හැක්කේ ජාතියේ පරිමාව ගණනය කිරීමෙන් පමණකි. ජන සංඛ්‍යාව,ජන සංයුතිය, ඉඩකඩම් හා ජාතික සම්පත් පිළිබඳ ගණනයකින් පසු පවත්නා තත්ත්වයත් සහ සංවර්ධන ඌණතා හඳුනා ගැනීම තිවැරැදි ගමනකට අත්වැල් සපයන බව අමූතුවෙන් කිව යුතු නැත.පසුගිය රජය සමයේ මේ රටේ භාවිත වන කිසිදු භාෂාවක් නොදත් ජන වර්ගයක් ඇති බවටත් ඔවුන් ඡන්ද මධ්‍යස්ථාන කරා එහෙ මෙහෙ ප්‍රවාහණය කළ බවටත් ආරංචි පැතිරුණි. එය එසේ වී නම් පුරවැසියන් නොවන ජන කොටස් විසින් කරන බලහත්කාර මැදිහත් වීම්වලින් මේ රටේ ජන සංයුතියට, පොදු සම්පත්වලට පමණක් නොව ජනමතයට ද දැඩි බලපෑමක් සිදු විය හැකිය. එය සුළුකොට තැකිය හැකි නොවේ. එසේම විවිධ වර්ගයේ පාසල්, පල්ලි, කෝවිල් පමණක් නොව කොල්ලකාගත් රජයේ ඉඩම්වල අනවසරයෙන් ඉදිකළ ගොඩනැගිලි සහ ඒ සඳහා සකසා ගත් ප්‍යාජ ඔප්පු තිරප්පු, පුද්ගල හැඳුනුම්පත් ආදියත් තර්ජනයට ලක්ව ඇති පුරාවිද්‍ය හා පූජා භූමි සහ රක්ෂිත වනාන්තර ආදී සියල්ලක් පිළිබඳවත් ගණනය කර ගැනීම වැදගත්ය. එය ජාතියේ තරම හඳුනා ගැනීමට මෙන්ම අනාගත ගැටුම්වලින් ජාතිය මුද ගෙන සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ මාර්ගය පුළුල් කිරීමට හේතුවනු ඇත.

මෙතෙක් බිහිවූ සියලු ආණ්ඩු කළේ පැවැති ආණ්ඩුවේ ප්‍රතිපත්ති සහ ව්‍යූහයන් කෙතරම් ජාතියට හිතකර වුවත් ඒවා මූලිනුපුටා දමා තම අභිමතයට ගැලපෙන ප්‍රතිපත්ති සහ ව්‍යූහයන් ඇති කිරීමයි. අතිශයින්ම නාස්තික ක්‍රියාවක් වන මෙයට මූලික හේතුව වන්නේ ප්‍රතිපත්ති සම්පාදකයින් වූ මැති ඇමැතිවරු ප්‍රතිපත්ති විද්‍යාව නොදන සිටීමයි. ප්‍රතිපත්ති සම්පාදකයා බහු විෂය දැනුමැත්තකු (Multi Disciplinery Knowledge) විය යුතුය. එවැනි දැණුමකින් ප්‍රතිපත්ති සම්දපානය කිරීමේදී අරඹා ඇති සාධනීය දෙයක් වල් බිහිවීමට ඉඩ දෙනු වෙනුවට නතර කළ තැනින් නැවත ආරම්භ කිරීමේ ඵලදයිත්වය වෘද්ධික න්‍යාය විසින් ඉගැන්වෙයි. ඒ නිසා ආණ්ඩු මාරුවත් සමඟ ප්‍රතිපත්ති මාරුව සිදුවිය යුත්තේ වෘද්ධික න්‍යායානුකූලව බැවින් ජාතික ප්‍රතිපත්ති (National Policies) සම්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම වත්මන් පාර්ලිමේන්තුවට පැවරෙන භාරදූර කටයුත්තක් වෙයි.

වත්මන් ආණ්ඩුව බලයට ගෙන ආවේ සිංහ කොඩිය පෙරටු කොටගත් ශ්‍රී ලාංකික ජාතිකත්වය පිළිබඳ සටන් පාඨය සමඟිනි. එහෙත් එය අවසන් වූයේ අති බහුතර සිංහල බෞද්ධයන්ගේ ආශිර්වාදය හිමි වූ ආණ්ඩුවක් බිහි වීමෙනි. එසේ වුවත් අප දැන් ගොඩනැගිය යුත්තේ ලාංකික ජාතිය බැවින් ඊට එරෙහි වන සියලු අන්තවාදී සහ වර්ගවාදී මූලයන් උදුරා දැමීම අත්‍යාවශ්‍යය. එකම රටක්, එකම ඉතිහාසයක්, එකම නීතියක්, එකම කොඩියක් හා එකම අධ්‍යාපනයක් සහිත ගමනක් සඳහා ජාතියට නායකත්වය දීම නව රජයට පැවරෙන අනුල්ලංඝනීය වගකීම වන්නේ මේ ඒ සඳහා ලැබී ඇති අවසාන අවස්ථාව මෙය බැවිනි.

ගැමි ආර්ථිකය

ශක්තිමත් ජාතියක කොඳුනාරටිය වන්නේ ඒ රටේ ආර්ථිකයයි. ඒ තුළ ගැමි ආර්ථිකයට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. මෙසේ කිරියෙන් පැණියෙන් ඉතිරෙන ගැමි ආර්ථිකයකින් පළමුව ගම හද දෙවනුව රට හැදීමේ අලුත් බලාපොරොත්තු දැල්වූ වත්මන් ආණ්ඩුව දේශීය අමුද්‍රව්‍ය සහ සම්පත් උපයෝජනයට පියවර ගෙන තිබේ. එය ඇතැමෙකුගේ අනුවණ උපහාසයට ලක්ව තිබුණත් සිදුවිය යුත්තේ එයයි. එමගින් දේශපාලනඥයින් වරප්‍රසාදලාභීන් කරනු වෙනුවට ජනතාව වරප්‍රසාදලාභීන් කිරීමට පියවර ගෙන තිබීම ප්‍රශංසනීයය. එහිදී, මැත ඉතිහාසයේ පහළ වූ හොඳම ජනතායකයා ජාතියේ පිනෙන් නොව ආශිර්වාදයෙන් කැන්ද ගෙන විත් ඒ නායකත්වයේ ගුණ පරාක්‍රමයන් දකින අපහට, යුරෝපය තැනිගැන් වූ මහා අධිරාජයකු වූ නැපෝලියන් බොනපාට් කළ ප්‍රකාශයක් මතකයට නැගේ. හෙතෙම වරක් මෙසේ කියා තිබුණේ "සිංහයකු යටතේ සටන් කරන බලු හමුදාවක් වුවත් සිංහයන් සේ සටන් කොට සටන ජය ගනු ඇත. එහෙත් බල්ලකු ගේ නායකත්වය යටතේ සටන් කරන සිංහ හමුදාවකට වුවත් සිදුවන්නේ බල්ලන් සේ සටන් බිමේ මිය යෑමටය" යනුවෙනි. යහපාලනය සමඟින් වත්මන් පාලනය සසඳන විට නැපෝලියන්ගේ කියමන අපට කෙතරම් ගැලපේදැයි සිතීම අපහසු වන්නේ නැත. ඒ නිසා ඇරඹූ ගමන සාර්ථක කර ගැනීමට නම් ඉහළ නායකත්වයේ සිට පහළම ස්තරය දක්වා වූ නව රජය හොබවන ජනතාවාදී නායකයින්ට අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ ගේ අනුශාසනාව මතක් කරදීම යෝග්‍යය. ඒ ඔබලා මේ රටේ භාරකරුවන් මිස අයිතිකරුවන් නොවන බව සිතා කටයුතු කරන ලෙසයි.



ඉටිපන්දමකි එළි කෙරුවේ අඩක්	රැය
විදුලිය නොමැති විය රටටම අටක්	පැය
පාඩුව ලෙස කෝටි ගණනක් වෙලා	වැය
ණය බර වැඩි කරන කරුණක් වෙයි ද	මෙය

ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් හදන්න රාජ්‍ය අමාත්‍යාංශ ව්‍යුහය සකස් කළා

ජනපති කියයි

නුවන් කොඩිකාර

ආර්ථිකයේ අයිතිය ජනතාවට හිමි වන, ජනතා කේන්ද්‍රීය ජාතික ආර්ථිකයක් ගොඩනැඟීම අරමුණු කොට ගෙන මෙවර රාජ්‍ය අමාත්‍යාංශ ව්‍යුහය සකස් කළ බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පැවසීය.

කොවිඩ්-19ත් සමඟ දැඩි අර්බුදයකට මුහුණ පා ඇති සෙසු රටවල් යථා තත්ත්වයට පත්වන තෙක් දේශීය ආර්ථිකය දියුණු නොකර ඉදිරියට යා නොහැකි බවද ජනාධිපතිවරයා කීවේය.

රාජ්‍ය අමාත්‍යාංශ විෂය පථය සමාලෝචනය ආරම්භ කරමින් ජනාධිපති කාර්යාලයේ පෙරේදා (17) පැවති සාකච්ඡාවකදී හෙතෙම මේ බව සඳහන් කළේය.

බතික්, අත්යන්ත්‍ර රෙදි සහ දේශීය ඇඟලුම් නිෂ්පාදනය විෂය කොට රාජ්‍ය අමාත්‍යාංශයක් නිර්මාණය කිරීමට හේතු ජනාධිපතිවරයා මෙහිදී පැහැදිලි කළේය.

ඇඟලුම් කර්මාන්තය රටේ සමස්ත අපනයනයෙන් 43%ක් නියෝජනය කරනවා. අපනයන ආදායමට වාර්ෂිකව ඉන් එක්ක-රත මූදල අමෙරිකානු ඩොලර් බිලියන 5ක්. රැකියා සැපයීමේදී සහ ප්‍රාදේශීය සංවර්ධනයේදී ඇඟලුම් කර්මාන්තය පුරෝගාමී මෙහෙවරක් ඉටු කරනවා. එය ශක්තිමත් කරමින් බතික් සහ අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදනය දියුණු කිරීම රජයේ ප්‍රධාන අරමුණක් බව මෙහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ජනපතිවරයා කියා සිටියේය.

බතික් සහ අත්යන්ත්‍ර කර්මාන්තය නගාසිටුවීමට සියලු අංශ ආවරණය කෙරෙන සැලැස්මක් සකස් කරන ලෙස ද ජනාධිපතිතුමා උපදෙස් දුන් අතර, එය සාර්ථක කර ගැනීමෙන් ඉදිරි පස් වසරේ ඇඟලුම් නිෂ්පාදකයන්ට ඉහළ ස්ථාවරත්වයක් අත්කර ගත හැකි බවද රාජපක්ෂ මහතා පැවැසීය.

"සළු සල" වැනි ආයතන මඟින් බතික් සහ අත්යන්ත්‍ර රෙදි පිළි නිෂ්පාදකයාට වෙළෙඳ පොළක් සකසා දිය හැකි බවද ජනාධිපතිවරයා පෙන්වා දුන්නේය.

කර්මාන්ත ඇමැති විමල් වීරවංශ, රාජ්‍ය ඇමැති දයාසිරි ජයසේකර, ජනාධිපති ලේකම්, අචාර්ය පී.බී. ජයසුන්දර, භාණ්ඩාගාර ලේකම් එස්. ආර්. ආටිගල යන මහත්වරුන් හා බතික්, අත්යන්ත්‍ර රෙදි සහ දේශීය ඇඟලුම් කර්මාන්තය ආශ්‍රිත ආයතන ප්‍රධානීන් සහ ව්‍යවසායකයන් ඇතුළු පිරිසක් මේ සාකච්ඡාවට එක්ව සිටියහ.

ආර්ථිකයේ අයිතිය ජනතාවට

කොරෝනා අර්බුදයෙන් සෙසු රටවල් යථා තත්ත්වයට පත් වන තුරු දේශීය ආර්ථිකය දියුණු නොකර ඉදිරියට යන්න බැහැ

බතික් - අත්යන්ත්‍ර රෙදි දේශීය ඇඟලුම් නිෂ්පාදනයට මුල් තැනක්

අවශ්‍ය ඖෂධවලින් සියයට 50ක් මෙරටදී නිපදවීමට පියවර ගන්නවා

රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන

සන්ධ්‍යා කරුණාරත්න

මෙරටට අවශ්‍ය ඖෂධවලින් සියයට 50ක් ඉදිරි වසර තුන ඇතුළත දේශීයව නිෂ්පාදනය කරමින් තත්ත්වයෙන් උසස් ඖෂධ රෝගීන්ට ලබාදීම අමාත්‍යාංශයේ අරමුණ බව ඖෂධ නිෂ්පාදන, සැපයීම හා නියාමන රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන මහතා පැවසුවේය.

ඖෂධ ජාවාරම් නතර කිරීම සඳහා නීතිමය වශයෙන් ඖෂධ ක්ෂේත්‍රයේ සිදු විය යුතු නිවැරදිකම් හා වෙනස්කම් වෙනුවෙන් පෙනී සිටීමට තමා පියවර ගත්තා බව ද ඇමැතිවරයා ප්‍රකාශ කළේය.

අහිතව රාජ්‍ය අමාත්‍ය ධුරයේ වැඩ බාර ගනිමින් සෞඛ්‍ය අමාත්‍යාංශ පරිශ්‍රයේ දී ඇමැතිවරයා මේ බව පසුගියද (14) පැවැසුවේය.

ඇමැතිවරයා මෙසේද කියා සිටියේය. කැබිනට් මණ්ඩලය සහ අමාත්‍ය මණ්ඩලය පත් කිරීමේදී ජනාධිපතිවරයා විද්‍යානුකූල පදනමකින් සිදු කර තිබෙනවා. ඖෂධ නිෂ්පාදනය, බෙදා හැරීම හා නියාමනය පිළිබඳ වගකීම පළමුවැනි වතාවට වෙනමම රාජ්‍ය අමාත්‍යාංශයක් විදියට ජනාධිපතිවරයා හඳුන්වාදී තිබෙනවා. සුදුස්සාට සුදුසු තැන ලබාදීමට, අධ්‍යාපන සුදුසුකම්වලට සුදුසු තැන ලබාදීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට ස්තුතිවන්ත විය යුතුයි. ඉදිරි වසර කිහිපයේ මා සතුව විශාල වගකීමක් තිබෙනවා. පසුගිය වසර හතර පහ තුළ ඖෂධ මාෆියාවක් රටේ ක්‍රියාත්මක වුණා. ඖෂධවල මිල අඩු කරන බව පවසමින් ජනතාව රැවටීම සිදු කළා. තත්ත්වයෙන් උසස් ප්‍රමිතියෙන් යුතු ඖෂධ සියල්ල රටින් ඉවත් කර, බාල ඖෂධ මෙරටට හඳුන්වා දීමේ කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක වුණා. ඉන් ජනතාව පීඩාවට පත් වුණා. එය නිවැරදි කිරීමට අප අපේක්ෂා කරනවා. මෙරටට අවශ්‍ය ඖෂධවලින් සියයට 50ක් ඉදිරි වසර තුනේදී නිෂ්පාදනයට කටයුතු කරනවා. ප්‍රතිකාරවලට යොදු ගත්තා සේලයින් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා සාකච්ඡා ආරම්භ කර තිබෙනවා. ඊට අවශ්‍ය නිෂ්පාදනාගාරයක් ඉක්මනින්ම ස්ථාපිත කරනවා. සාධාරණ මිලකට ඖෂධ ලබාදීමට පියවර ගනිමින් පවතිනවා. ඖෂධ මිල අඩු කරනවා.

සිදු වූ මහා ජාවාරම හා ජනතාව රැවටීමට ලක් කිරීම, ප්‍රමිතියෙන් යුතු ඖෂධ රටින් ඉවත් කිරීම, ටෙන්ඩර් පිරිනැමීමේදී අවසන් අවස්ථාව තෙක් සිට වැඩි මිලකට ඖෂධ මිලදී ගැනීම සඳහා ඇමැති පියවරු මෙන්ම පුතුන් ද මැදිහත්ව කටයුතු කළ කාලයක් තිබුණා. ඒ කාලය දැන් අවසන්.

ඖෂධ සම්බන්ධයෙන් නීතියේ තිබෙන හිඩැස් වසා දමීමට ජනාධිපතිවරයාගේත්, අගමැතිවරයාගේත් උපදෙස් ලබා ගනිමින් රටට සාධාරණයක් ඉටු කිරීමට අප පියවර ගන්නවා. ඖෂධ නියාමනය පසුගිය කාලයේ නිවැරදි ලෙස සිදු වුණේ නැහැ. ඒවා නිවැරදි කරමින් ජනතාවගේ අයිතිවාසිකම් සුරැකීමට අප කටයුතු කරනවා. මෙම අවස්ථාවට සෞඛ්‍ය ලේකම් මේජර් ජෙනරාල් සංජීව මුණසිංහ මහතා ඇතුළු නිලධාරීහු සහභාගී වූහ.

ආර්ථික - වාණිජ - ආරක්ෂාව සංවර්ධනය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවකට අමෙරිකාවේ සහාය

තානාපති ඇලයිනා අගමැති හමුවේ කියයි

කොවිඩ් පාලනයට ගත් ක්‍රියාමාර්ග ගැන පැසසුම්

ජාතික ආරක්ෂාව නව ආයෝජන හා ව්‍යාපෘති ප්‍රති-තුස්තවාදය-මත් ජාවාරම කෙරෙහිත් විශේෂ අවධානය

ආර්ථික, වාණිජ, පාලන, ආරක්ෂාව හා සංවර්ධනය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමඟ සහයෝගීතාව වැඩි දියුණු කර ගැනීම උදෙසා අමෙරිකා එක්සත් ජනපදය සහාය දක්වයි.

ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති ඇලයිනා ටෙප්ලිට්ස් මහත්මිය අරලියගහ මන්දිරයේදී අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා සමඟ පෙරේදා (17) පැවති සාකච්ඡාවේදී මේ බව ප්‍රකාශ කළාය.

අද්විතීය ප්‍රතිඵලයක් ලද අති සාර්ථක ව්‍යාපාරයක් ලෙසට ටෙප්ලිට්ස් මහත්මිය හඳුන්වන්නට යෙදුණු මැතිවරණ ජයග්‍රහණය වෙනුවෙන් ආරම්භයේදී ඇය අග්‍රාමාත්‍ය තුමන් හට සුබ පැතුවාය.

'පසුගිය පරිපාලනය ප්‍රතික්ෂේප වීමක්' මෙවර ප්‍රතිඵලයෙන් දැකගත හැකි බවද, නිදහස්, සාධාරණ හා සාමකාමී වාතාවරණයක් තුළ මැතිවරණය පැවැත්වූ බවද ඇය පැවසුවාය.

නව රජය සමඟ වැඩ කිරීමට අපේක්ෂාවෙන් සිටින බවද අමෙරිකානු තානාපතිනිය මෙහිදී පැවසුවාය.

නව රජයේ ප්‍රමුඛතා පිළිබඳ කළ විමසීමට පිළිතුරු වශයෙන්, කොවිඩ් 19 වසංගතයේ බලපෑම හේතුවෙන් ආර්ථික ප්‍රකෘතිකරණය වත්මන් ප්‍රමුඛතාව වී ඇති බව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ප්‍රකාශ කළේය.

කොවිඩ් 19 පැතිරීම පාලනය කිරීම සම්බන්ධයෙන් ලද ජයග්‍රහණය වෙනුවෙන් රජය තිසැකයෙන්ම ප්‍රශංසාවට ලක් විය යුතු බව තානාපති ටෙප්ලිට්ස් මහත්මිය කීවාය.

ශ්‍රී ලාංකිකයන් සඳහා පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා නිර්මාණය කිරීම සඳහා උදව් කිරීම ඇතුළුව, එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව අතර ආර්ථික සබඳතා තහවුරු කිරීම ද එක්සත් ජනපදයේ ප්‍රමුඛතාවක් බව ඇය සඳහන් කළාය.

රැකියා අවස්ථාවන් සඳහා තරුණ ප්‍රජාව මනා ලෙස සුදුනම් කිරීමට රට පුරා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට එක්සත් ජනපද සහයදීම අවශ්‍යම කරුණක් බව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා පැවසීය.

හොඳින් උගත් ශ්‍රම බළකායක් පැවතීම ශ්‍රී ලංකාවට ඇති ප්‍රබල වාසියක් බව මෙහිදී තානාපතිනිය කීවාය.

රටේ ඇතැම් ප්‍රදේශවලට සුරක්ෂිත පානීය ජල අවශ්‍යතාව පවතින බවත්, නිදන්ගත වකුගඩු රෝගය සඳහා අනාරක්ෂිත පානීය ජලය ප්‍රධාන හේතුවක් වී ඇති බවත් අගමැතිවරයා පෙන්වා දුන්නේය.

සාකච්ඡා කළ අනෙකුත් කරුණු අතර, ශ්‍රී ලංකාවට නව ආයෝජන රැගෙන ඒම, ප්‍රජාතන්ත්‍රවාදී ආයතන හා පාලනය සම්බන්ධ ව්‍යාපෘති සඳහා උපකාර ලබා දීම, ප්‍රති-තුස්තවාදය, මිනිස් හා මත්ද්‍රව්‍ය ජාවාරම් මෙන්ම අන්තර්ජාතික අපරාධ සඳහා පිළියම් යෙදීම සම්බන්ධයෙන් සුවිශේෂී අවධානයක් යොමු විණි. ආරක්ෂක ක්ෂේත්‍රයේ සහයෝගීතාව යන කරුණු ද මෙහිදී අවධානයට යොමු විය.

රටට හිතකර - දේශීය ව්‍යාපාරිකයා සුරකින ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් අවශ්‍යයි

ආණ්ඩුවේ තීරණය අගයන බව විද්වත් ජාතික පෙරමුණ කියයි

අනුර ප්‍රේමලාල්

රටට හිතකර, දේශීය ව්‍යාපාරිකයා සුරකින ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් අවශ්‍ය බව ආණ්ඩුව ප්‍රකාශ කිරීම විද්වත් ජාතික පෙරමුණ අගය කරන බව එහි ප්‍රධාන ලේකම් ඉංජිනේරු කපිල රේණුක පෙරේරා මහතා ප්‍රකාශ කරයි.

ඒ මහතා මේ බව සඳහන් කළේ ඊයේ (18) විද්වත් ජාතික පෙරමුණ කැඳවා තිබූ මාධ්‍ය හමුවකට එක්වෙමිනි. එය විද්වත් සංගම් ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වූ ලේකම්වරයා මෙසේද කීය. වෙළෙඳාම පිළිබඳ රටට ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍ය බව යහපාලන ආණ්ඩුවේ එවිකා, සිංගප්පූරු වැනි රටට අහිතකර ගිවිසුම් නිසා අපට හොඳ අවබෝධයක් ලැබුණා. එමෙන්ම එම රජය ජාතික වෙළෙඳ ප්‍රතිපත්තිය කියෝ ව්‍යාජ වෙළෙඳ ප්‍රතිපත්තියක් එද එළි දක්වූවා. එද රටට අහිතකර ගිවිසුම් රැසක් ගැන සාකච්ඡා වුණා. ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළා. ඒ වෙනුවෙන් දැන් ජනතාවට පිළිතුරු දී තියෙනවා. කුමණ ආණ්ඩුවක් වුණත් රටට සතුරු ලෙස කටයුතු කළොත් එජාපයට අත් වූ ඉරණම තමයි අත්වන්නේ. නව රජයේ වෙළෙඳ ඇමැති ලෙස පත් වූ ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතාට ස්තුතිය පළ කරනවා. ඉකුත් ආණ්ඩුව සමයේ ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් අවශ්‍ය බවට අප කැගැසුවත් වැඩක් වුණේ නෑ. දැන් ඇමැතිවරයාම අපව කැඳවා ජාතික ප්‍රතිපත්තියක් සකස් කරන්න දායක වෙන්න කියා ඉල්ලා සිටිනවා. මේ සඳහා මූලික සාකච්ඡාවක් දැනටමත් පැවැත්වුණා. ඒ වෙනුවෙන් කැබිනට් පත්‍රිකාවක් දැමීමට ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා අපට පොරොන්දු වුණා.

අප එදා මහජන කොමිෂන් සභාවක් පිහිටුවමින් තනියම ක්‍රියා කළා. අද ඒ සඳහා මාවතක් සකස්වෙන අවස්ථාවක් ලෙස පෙන්වා දෙන්න පුළුවන්.

විද්වත් වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණේ ජාතික සංවිධායක ආචාර්ය සුනිල් ලියනාරච්චි මහතා- එදා අප රටට අහිතකර වෙළෙඳ ගිවිසුම් පැමිණෙන විට විරෝධය පාමින් අරගල කළා. ඒ චිතරක් නොවේ වත්මන් මහා බැංකු අධිපති මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතාගේ ප්‍රධානත්වයෙන් මහජන අදහස් විමසන කොමිසමක් පවත්වා අදහස් ලබා ගත්තා. ඉන් සකස් කළ වාර්තාවත් අප සතුව තිබෙනවා. එයත් අප ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාටත්, ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතාටත් ලබා දුන්නා. ඒ මහතා වැඩ භාරගත් විගස තමන්ගේ ප්‍රමුඛ කාර්ය ලෙස මෙම ජාතික වෙළෙඳ ප්‍රතිපත්තිය සකස් කිරීමට මූල පිරීම ගැන ස්තුතිය පළ කරනවා.

දේශීය ව්‍යාපාරිකයා ආරක්ෂා කරන්න අවශ්‍යයි නැත්නම් සමතුලිත බව නැති වනවා. එක පිරිසක් පමණක් රටේ සාරය උරාගෙන වැජඹෙන ක්‍රමය නැති කරන්න ඕනේ. ඉන් ජනතාවට ලැබෙන ප්‍රතිලාභයක් නෑ.

විද්වත් වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණේ සහකාර ලේකම් විශේෂඥ වෛද්‍ය සාරද කන්තන්ගර මහතා ද මෙහිදී අදහස් දක්වීය.

සියලු මැති ඇමැතිවරුන්ට ශීඝ්‍රයෙන් වැඩ කිරීමේ කාලය ඇවිත්

කාගේත් ආදරයට ලක් වූ චමල් රාජපක්ෂ වැනි අයකු මේ අමාත්‍යාංශයට පත් වීම ගැන සතුටු වෙනවා

ආරක්ෂක ලේකම් කමල් ගුණරත්න

අසේල ලියනගේ

අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල භෞතික හා පරිපාලන ප්‍රතිසංස්කරණ කිරීමට අවශ්‍ය නම් ඒ වෙනුවෙන් විෂය භාර ඇමැතිවරයා ලෙස තමා පෙනී සිටින බව රාජ්‍ය ඇමැති චමල් රාජපක්ෂ මහතා ප්‍රකාශ කළේ.

අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය ඇමැති චමල් රාජපක්ෂ මහතා මේ බව ප්‍රකාශ කළේ පෙරේදා (17) දින අභ්‍යන්තර ආරක්ෂක අමාත්‍යාංශයේ වැඩ භාරගැනීමේ අවස්ථාවට එක්වෙමිනි. සර්ව ආගමික වතාවත්වලින් අනතුරුව පිරිත් සජ්ඣායනා මැද ඒ මහතා සිය පත්වීම් ලිපිය අත්සන් කළේය.

වත්මන් රජයේ සියලු මැති ඇමැතිවරුන්ට ශීඝ්‍රයෙන් වැඩ කිරීමේ කාලය ඇවිත් තිබෙනවා. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂාවට විශේෂ අවදානයක් ලබාදී තිබෙනවා. පොලිසිය, ආපදා කළමනාකරණය, ස්වදේශ කටයුතු පිළිබඳ වගකීම ජනාධිපතිවරයා මට භාරදී තිබෙනවා. රටේ අභ්‍යන්තර ආරක්ෂාව කඩ නොවන පරිදි ජනතාවගේ එදිනෙදා ජීවිතය ආරක්ෂා කළ යුතුයි. ඒ වගේම ජනතාවගේ අවශ්‍යතා ඉකිරීමට පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමට අවශ්‍යයි. එම භාරදූර කාර්යන් සියල්ල මා හට ජනාධිපතිවරයා පවරා තිබෙනවා.

අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල භෞතික හා පරිපාලන ප්‍රතිසංස්කරණ කිරීමට අවශ්‍ය නම් ඒ වෙනුවෙන් විශය භාර අමාත්‍යවරයා ලෙස මා සෘජුව පෙනී සිටිනවා. ජනතාවගේ කටයුතු කාර්යක්ෂම විය යුතුයි. ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ තිබෙන ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල සේවය ජනතාවට ලැබෙන්න ඉතා පරක්කු බව ජනතාව පවසනවා. අපි එම සේවා කර්යක්ෂම කළ යුතුයි. ඒ සඳහා නිසි වැඩපිළිවෙළක් අපි ක්‍රියාත්මක කරනවා.

ග්‍රාමීය මට්ටමෙන් ඉඩම් ප්‍රශ්න රැසක් රටතුළ මතුවී තිබෙනවා. ඒවා සියල්ල අපි විසඳිය යුතුයි. රජයේ ඉඩම් බලහත්කාරයෙන් අල්ලාගැනීම් සිදුවී තිබෙනවා ඒවා නැවැත්විය යුතුයි. මේවා පිළිබඳව අපි වගකීමෙන් සොයාබැලිය යුතුයි. ඉඩම් ප්‍රශ්න විසඳීමට ඇති යල් පැනගිය නීති ප්‍රතිසංස්කරණය කර මේ ප්‍රශ්න විසඳිය යුතුයි. වර්තමානයේ ශ්‍රී ලංකා පොලීසියට ජනතාවගෙන් සතුටුදායක ප්‍රතිචාරයක් ලැබෙන්නේ නෑ. නමුත් ශ්‍රී ලංකා පොලීසියේ දක්ෂ අවංක නිලධාරීන් පිරිසක් සිටිනවා. රජයේ සේවකයන් අවංකව රාජකාරී කළ යුතුයි. රාජ්‍ය සේවකයන් තෘප්තිමත් කළ යුතුයි. එසේ තෘප්තිමත් නොකළොත් ඔවුන්ට ජනතාවගේ ප්‍රශ්න විසඳන්න බෑ. අපි ඔවුන්ව තෘප්තිමත් කරනවා. එම නිසා අවංකව සේවය කර ජනතාවගේ ප්‍රශ්න විසඳීමට මැදිහත් වන ලෙස මා රාජ්‍ය සේවකයන්ගෙන් ඉල්ලා සිටිනවා.

මා හට ලබාදී ඇති අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සියල්ල හදිසි අවස්ථාවකදී එකට එකතුවී ක්‍රියාත්මක විය හැකි ආයතනයි. ආරක්ෂක අංශ, පොලීසිය, ආපදා කළමනාකරණය කියන්නේ හදිසි අවස්ථාවකදී එකට එකතුවන ආයතන. ඒ සඳහා හොඳම නිදසුන තමයි සුනාමි විපත. එම අවස්ථාවේදීත් එම ආයතන ජනතාවට විශාල සේවයක් කළා. එම නිසා මේ ආයතන දියුණු කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ගොවියාගේ කෘෂිකාර්මික නිෂ්පාදන ගොවියා තෘප්තිමත් වන ලෙස අලෙවි කිරීම පිළිබඳව අපි සිතිය යුතුයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අනෙකුත් ආයතන එකතු වී ගොවියා වෙනුවෙන් පෙනී සිටිය යුතුයි. ජනාධිපතිවරයාගේ සෞභාග්‍යයේ දැක්ම රටේ ක්‍රියාත්මක කිරීමට අපි බැඳී සිටිනවා. ජනතාවගේ ගැටලු විසඳමින් ජනතාවාදී වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කළ යුතුයි.

ආරක්ෂක ලේකම් කමල් ගුණරත්න මහතා -

අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ආයතන කීපයක් පවරා තිබෙනවා. සියලු දිස්ත්‍රික් ලේකම් කාර්යාල, සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ශ්‍රී ලංකා පොලීසිය, පොලිස් අභ්‍යාස ආයතනය, රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ආගමන විගමන දෙපාර්තමේන්තුව, රාජ්‍ය නොවන සංවිධන සඳහා වන මහලේකම් කාර්යාලය, ව්‍යවසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ආපදා සහන සේවා මණ්ඩලය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පරීක්ෂණ ආයතනය ඇතුළත් කර තිබෙනවා.

ආපදා තත්ත්වයන් පිළිබඳ පුරෝකතනය වන පරිදි නවීන තාක්ෂණය අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම, ආපදා අවදානමක් සහිත ප්‍රදේශ සහ එම ප්‍රදේශවල ජනතාවගේ දත්ත ගබඩාවක් ස්ථාපනය කිරීම යන වැඩකටයුතු සඳහා අපි මූලිකත්වය ගෙන කටයුතු කරනවා. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව කාගේත් ආදරයට ලක්වූ, නවක කථානායකවරුන්ට ආදර්ශයක් වූ චමල් රාජපක්ෂ මහතා වැනි පුද්ගලයකු මේ අමාත්‍යාංශයට පත්වීම පිළිබඳව අපි සතුටු වෙනවා. ශ්‍රී ලාංකික ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් වැඩකිරීමට ශක්තිය ලැබේවා කියා රාජ්‍ය නිලධාරීන් ලෙස අප ප්‍රකාශ කරනවා.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ශවේන්ද්‍ර සිල්වා, අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් හා එහි ආයතන ප්‍රධානීහු රැසක් මේ අවස්ථාවට සහභාගී වූහ.

ඡායාරූපය - සාලිය රූපසිංහ

රථවාහන තදබදයට විසැඳුම් ලබාදීම ප්‍රවාහන අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණයි

රාජ්‍ය ඇමැති **දිලුම් අමුණුගම**

නිමල් රාජපක්ෂ

රථවාහන තදබදයට විසැඳුම් ලබාදීම ප්‍රවාහන අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණයි. එහි ප්‍රථම වැඩසටහන මහනුවරින් ආරම්භ කිරීමට තියමිතයි. ඒ සඳහා මහනුවර නගරයේ තිබෙන රථ වාහන තදබදය අවම කිරීම සඳහා බෝගම්බර,පේරාදෙණිය හා මහනුවර යන ප්‍රදේශවල මහල් හයකින් යුතු ප්‍රධාන රථගාල් තුනක් කඩිනමින් ආරම්භ කරන බව වාහන නියාමනය, බස්රථ ප්‍රවාහන,දුම්රිය මැදිරි හා මෝටර්රථ කර්මාන්ත රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම මහතා පවසයි.

ඇමැතිවරයා මේ අදහස් පළ කළේ පෙරේදා (17) පෙරවරුවේ සිය ධුරයේ වැඩ බාරගත් අවස්ථාවේදීය.

මෙහිදී අදහස් දැක්වූ ඇමැතිවරයා,ජනාධිපතිතුමාගේ උපදෙස් මත මේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රය වෙනම තලයකට ගෙන යාම ප්‍රධාන අරමුණයි. මෙතෙක් මේ රටේ සිදු නොවූ මෝටර් රථ නියාමනය කිරීම සඳහා ජනාධිපතිතුමාගේ උපදෙස් මත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මත කරනවා. දේශීය දුම්රිය මැදිරි හා දේශීය මෝටර්රථ කර්මාන්ත කිහිපයක් ආරම්භ කිරීමට තම අමාත්‍යාංශයේ ප්‍රමුඛතාව ලබා දෙනවා.

දුම්රිය මැදිරි ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන්න නාවික හමුදාවත් සමඟ ඒකාබද්ධව වැඩසටහනක් ජනාධිපතිතුමා ආරම්භ කර තිබෙනවා. දේශීය වශයෙන් දුම්රිය මැදිරි නිෂ්පාදනය කර අපනයනය කරන්න අදහස් කරනවා. මේ දුම්රිය මැදිරි නිෂ්පාදනය කිරීමේ දී ,නාවික හමුදාවට අමතරව පෞද්ගලික අංශයටත් දොරවල් විවෘත කරනවා. දුම්රිය මැදිරි පසුගිය කාලේ රුමේනියාවෙන් ගෙන්වා තිබෙන්නේ. නමුත් ලාංකිකයෝ ඉන්නවා රුමේනියාවේ මේ මැදිරි නිෂ්පාදනය කළ .ඒ අය ගෙන්වා කටයුතු කරන්නත් ඉදිරියේදී පියවර ගැනීමට අදහස් කරනවා. බොහෝ ව්‍යාපෘති ආරම්භ කිරීමේදී ප්‍රමාද වන්නේ අනුමැතිය ගන්න තිබෙන ප්‍රමාදය නිසයි. ජනාධිපතිතුමා උපදෙස් දී තිබෙන්නේ සියලු නීති සරල කර දිනකින් දෙකකින් අනුමැතියක් ලාබගෙන අදාළ සමාගම්වලට අදාළ ව්‍යාපෘති සඳහා ලබාදෙන ලෙසයි.

දුම්රිය දෙපාර්තමේන්තුවේ තාමත් තිබෙන්නේ සුද්දගේ කාලේ පැරණි වේගසීමායි. එය එන්න එන්න පහලට යන්නේ. නමුත් මහින්ද රාජපක්ෂ මහතාගේ කාලේ දුම්රිය මාර්ග කිහිපයක් දිර්ඝ කළා.කඩිනමින් මහනුවර සිට විදුලිදුම්රිය ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් සකස් කරනවා. පොදු ප්‍රවාහනයේ මාර්ග තදබදය නොමැති එකම වාහනය දුම්රියයි.මෙය වැඩි දියුණු කරන්න ජනාධිපතිතුමාගේ විශාල උනන්දුවක් තිබෙන බවද පැවසුවේය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමතිවරයා, ඉදිරියේදී මෝටර් රථ නියාමනය කිරීමට පියවර ගැනීමට නියමිතයි .මන්ද සියලුම මෝටර් රථ නියාමනය සිදු නොකරත් අනවශ්‍ය නීති රීති පනවා තිබෙන ඒවා පිළිබඳව අවධානය යොමු කළ යුතුයි. මීට අමතරව පාසල් වැන් රථ හා ත්‍රී රෝද රථ සඳහාද නිතිය ක්‍රියාත්මක කරන බවද රාජ්‍ය ඇමතිවරයා පැවසුවේය.

ප්‍රවාහන ආමාත්‍යාංශයේ නිලධාරීහු රැසක් මේ අවස්ථාවට සහභාගී වූහ.

ඡායාරූපය - තිලක් පෙරේරා.

රට රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්ගේ තොරතුරු ඇතුළත් දත්ත ගබඩාවක් සකසනවා

රාජ්‍ය ඇමැති **පියංකර ජයරත්න** වැඩ භාරගනිමින් කියයි

රාජ්‍ය ඇමැති පියංකර ජයරත්න මහතා සුබ මොහොතින් සිය රාජකාරී කටයුතු ආරම්භ කළ අයුරු. කම්කරු ඇමැති තිමල් සිරිපාල ද සිල්වා, අමත්‍යාංශ ලේකම් ඇතුළු පිරිසක් ද මෙහි වෙති.

අනුර ප්‍රේමලාල්

විදෙස්ගතව විවිධ රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයෝ සහ ඔවුන්ගේ තොරතුරු ඇතුළත් අංග සම්පූර්ණ දත්ත ගබඩාවක් සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය ඇමැති පියංකර ජයරත්න මහතා පවසයි.

ඒ මඟින් එම ශ්‍රමිකයන්ට හෝ එම පවුල්වලට අවශ්‍ය කිසියම් සහනයක් හෝ මැදිහත්වීමක් ක්ෂණිකව ලබා දීම මේ වැඩසටහනේ අරමුණ බව රාජ්‍ය ඇමැතිවරයා කීවේය. ඊයේ (17) නාරාහේන්පිට සිය අමාත්‍යාංශයේ දී සුබ මොහොතින් රාජකාරී ආරම්භ කරමින් පැවති මාධ්‍ය හමුවේදී ඒ මහතා මේ බව සඳහන් කළේය.

එහිදී තවදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා කියා සිටියේ, මෙරට ආර්ථිකය පෝෂණය කරන ප්‍රධාන අමාත්‍යාංශයක වගකීම තමාට ලැබීම පිළිබඳව අතිශයින් සතුටුවන බවය. ඒ පිළිබඳ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාටත් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාටත් සිය ස්තුතිය පුද කරන බව පැවසීය. ලබා දෙන ඕනෑම අමාත්‍යාංශයක් දක්ෂ ලෙස මෙහෙය වන තිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමාගේ නායකත්වය යටතේ කටයුතු කරන්න ලැබීම භාග්‍යයක් බවද රාජ්‍ය ඇමැතිවරයා කීය.

සාම්ප්‍රදායික විදේශ රැකියා වෙළඳපොළ සමඟ නව තාක්ෂණය සහිත නිපුණතා පූර්ණ ශ්‍රමිකයන් විදේශ ශ්‍රම වෙළඳපොළ සඳහා යොමුකිරීම අප අමාත්‍යාංශයේ අරමුණයි. එසේම, සාම්ප්‍රදායික විදෙස් වෙළඳපොළ ඇති රට වලට අමතරව, වෙනත් නව තාක්ෂණික ශ්‍රම වෙළඳපළ වෙත ශ්‍රමිකයන් යැවීමටත්,තවමත් ලාංකික ශ්‍රමිකයන් ග්‍රහණය කර නොගත් රටවල් සඳහා ද ශ්‍රමිකයන් යොමු කිරීමට කටයුතු කරන බව ද රාජ්‍ය අමාත්‍යවරයා කරුණු අනාවරණය කළේය.

කම්කරු ඇමැති තිමල් සිරිපාල ද සිල්වා, හිටපු ඇමැතිවරුන් වන සරත් ගුණරත්න, දයාශ්‍රිත තිසේරා, අමාත්‍යාංශ ලේකම් මාපා පතිරණ යන මහත්වරුන් ද, රාජ්‍ය අමාත්‍යාංශ නිලධාරීහු ද, පුත්තලම් දිස්ත්‍රික්කයේ දේශපාලන අධිකාරියේ නියෝජිතයෝ රැසක් මේ අවස්ථාවට සහභාගී වූහ.

නව අධ්‍යාපන ක්‍රම හඳුන්වා දෙමින් අධ්‍යාපනයේ දැවන්ත සංවර්ධනයක් කරනවා

රාජ්‍ය ඇමැති **විජිත බේරුගොඩ**

නව අධ්‍යාපන ක්‍රම හඳුන්වා දෙමින් රටේ අධ්‍යාපනයේ දැවන්ත සංවර්ධනයක් සිදු කරන බව දහම් පාසල්, භික්ෂු අධ්‍යාපන, පිරිවෙන් හා බෞද්ධ විශ්වවිද්‍යාල රාජ්‍ය ඇමැති විජිත බේරුගොඩ මහතා පවසයි.

දිවයින පුරා පිහිටි ජාතික පාසල් නැවත ශක්තිමත් කරන අතර නව ජාතික පාසල් දහසක් ආරම්භ කිරීමට කටයුතු කරන බවද රාජ්‍ය ඇමැතිවරයා සඳහන් කරයි. මෙසේ අලුතින් ආරම්භ කරන ජාතික පාසල් දහසෙන් 03 ක් මොණරාගල දිස්ත්‍රික්කයට ලබා දීමට කටයුතු කරන බවත්, මඩුල්ල, සියඹලාණ්ඩුව, සෙවණගල ප්‍රදේශවල එම පාසල් ස්ථාපිත කිරීම අදියර වශයෙන් සිදුකෙරෙන බවත් රාජ්‍ය ඇමැතිවරයා පවසයි.

පළාත් ආණ්ඩුකාරවරුන්, පළාත් අධ්‍යාපන නිලධාරීන් සමඟ අධ්‍යාපන අමාත්‍යාංශයේ පෙරේදා (17) පැවැති සාකච්ඡාවකදී ඇමැතිවරයා මේ බව සඳහන් කළේය.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වූ අධ්‍යාපන රාජ්‍ය ඇමැති විජිත බේරුගොඩ මහතා,

මේ වන විට දිවයින පුරා පිහිටි සියලු පාසල්වල අඩු පාඩු අපි හඳුනාගනිමින් සිටිනවා. මේ ගැටලු පියවරින් පියවර විසඳන්නේ කෙසේද කියා ඉන් අනතුරුව අපට තීරණය කළ හැකියි. අපි හඳුනාගත් ගැටලු පියවරින් පියවර විසඳනවා. ඒ සඳහා කම්ටු පත් කිරීමට බලාපොරොත්තු වෙනවා. ජාතික පාසල් සංවර්ධනය කිරීම නව ආණ්ඩුව යටතේ සිදු කරනවා.

ජාතික පාසල් 373ක් දිවයින පුරා පිහිටා තිබෙනවා. මේ පාසල්වලට දරුවන් ඇතුළත් කිරීමේ දැඩි තරගකාරිත්වයක් තිබෙනවා. ජාතික පාසල් දහසේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් මේ තරගකාරිත්වයට විසඳුම් ලබා ගැනීමට හැකි වනු ඇතැයි අප විශ්වාස කරනවා. අපි සෑම දරුවකුටම සමාන අධ්‍යාපනයක් ලබා දීමටයි මේ නව වැඩසටහන් මාලාවෙන් උත්සාහ කරන්නේ. ඉදිරියේදී නව අධ්‍යාපන ක්‍රම හඳුන්වා දෙමින් රටේ අධ්‍යාපනයේ දැවන්ත සංවර්ධනයක් සිදු කරනවා.

ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සැකසීමට අවධානය

ශ්‍රී ලංකාවේ වෙළෙඳ කටයුතු සඳහා නිසි නියාමනයක් කිරීමේ අවශ්‍යතාව සපුරා ගැනීම වෙනුවෙන් ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම පිළිබඳ සාකච්ඡාවක් ඉකුත්ද (17) වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතාගෙත් ප්‍රධානත්වයෙන් එම අමාත්‍යාංශයේ දී පැවැත්විණි.

මේ සඳහා වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම් භද්‍රානි ජයවර්ධන මහත්මිය, පාරිභෝගික අධිකාරියේ සභාපති මේජර් ජෙනරාල් ඩී.එම්.එස්. දිසානායක, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපති විශේෂඥ වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය මහත්ම මහත්මීන් ඇතුළු වෘත්තියවේදීහු සහභාගි වී සිටියහ.

එහිදී සියලු කරුණු සලකා බලමින් සුදුසුකම්ලත් විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක දායකත්වයෙන් මෙම ජාතික වෙළෙඳ ප්‍රතිපත්තිය සකස් කිරීමට තීරණය විණි.

වෙළෙඳ ප්‍රතිපත්තියක් සැකසීමේ තීරණය අගයනවා

වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණ

අසේල ලියනගේ

නව වෙළෙඳ ප්‍රතිපත්තියක් සැකසීම සඳහා අභිනව වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා ගෙන ඇති තීරණය අගය කරන බව වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණ පවසයි.

එම පෙරමුණ මේ බව ප්‍රකාශ කළේ ඊයේ (18) කොළඹදී විශේෂ මාධ්‍ය හමුවකට එක්වෙමිනි.

පසුගිය වසර කිපයේ අදූරදර්ශී සහ අත්තනෝමතික ලෙස වෙළෙඳ ගිවිසුම්වලට එළඹීම නිසා ශ්‍රී ලංකාවේ වෙළෙඳමට අගතියක් සිදු වූ බව ශ්‍රී ලංකා මහ බැංකුව පෙන්වා දෙන බවත්, ඒ සඳහා ප්‍රධාන හේතුව වී ඇත්තේ ද ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් නොමැතිවීම බවත් වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණේ ලේකම් කපිල රේණුක පෙරේරා මහතා පවිය.

ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් නොමැතිවීම පිළිබඳ පසුගිය යහපාලන රජයේ වෙළෙඳ ඇමැති මලික් සමරවික්‍රම මහතාට කිපවරක් තම පෙරමුණ දන්වා සිටිය ද ඒ සඳහා කිසිදු තැකීමක් නොකළ බව රේණුක පෙරේරා මහතා කීය.

වෙළෙඳ ඇමැති බන්දුල ගුණවර්ධන මහතා අභිනව වෙළෙඳ ඇමැති වශයෙන් දිවුරුම් දුන් සතියේදීම ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් බිහිකිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට තම පෙරමුණට පොරොන්දු වීම වෘත්තිකයන් ලෙස අගය කරන බව ඒ මහතා වැඩි දුරටත් ප්‍රකාශ කළේය.

ජෝර්දානයේ හා කටාර්හි සිටි ශ්‍රී ලාංකිකයෝ 305ක් එති

මහින්ද අලුත්ගෙදර

ජෝර්දන් සහ කටාර් රාජ්‍යවල සිටි ශ්‍රී ලාංකිකයන් 305 දෙනෙකු ඊයේ (18) අලුයම මෙරටට පැමිණ තිබේ.

ජෝර්දනයේ සේවය සඳහා ගොස් සිටි ශ්‍රී ලාංකිකයන් 285දෙනෙකු සහ විදේශීය වාණිජ නැවිවල සේවය කළ ශ්‍රී ලාංකිකයන් විසිදෙනකු කටාර් රාජ්‍යයේ සිට පැමිණි බව ගුවන් තොටුපළ ආරංචිමාර්ග පවසීය.

මෙලෙස පැමිණි සියලුදෙනා පී.සී.ආර් පරීක්ෂණ සඳහා භාජනය කිරීමට ගුවන් තොටුපළ බලධාරීන් පියවර ගෙන ඇත.

මේ අතර එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සිට පැමිණි පුද්ගලයන් පස්දෙනෙකු සහ ඕමානයේ සිට පැමිණි පුද්ගලයන් දෙදෙනකු කොරෝනා ආසාදිතයන් ලෙස හඳුනාගෙන තිබේ. ඒ අනුව මෙරට සමස්ත කොවිඩ්-19 ආසාදිතයන් සංඛ්‍යාව 2900 දෙනකු වන අතර, නේවාසිකව ප්‍රතිකාර ලබන සංඛ්‍යාව 213 දෙනකු බව වාර්තා වෙයි.

මේ අතර විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් මෙරටට ගෙන්වා ගැනීමේදී විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියා සඳහා යොමු වූ පුද්ගලයන්ට ප්‍රමුඛත්වක් ලබාදෙන බව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පවසයි.

කොවිඩ් වසංගත ව්‍යාප්තිය හේතුවෙන් විදෙස් ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් මෙරටට ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරමින් සිටින බවද එම කාර්යාංශය කියා සිටී.

ජයවර්ධනපුර සරසවියෙනන් පී.සී.ආර්. පරීක්ෂණ කළමනාකරණයට නව මෘදුකාංගයක්

සන්ධ්‍යා කරුණාරත්න

ජාතික බෝ වන රෝග විද්‍යායතනයේ ස්ථාපිත කර ඇති අණුක චිකිත්සක විද්‍යාගාරයේ පී.සී.ආර්. පරීක්ෂණ තොරතුරු කළමනාකරණය සඳහා පරිගණක නව මෘදුකාංගයක් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ප්‍රථම වරට හඳුන්වාදී තිබේ.

රුපියල් මිලියනයකට අධික වටිනාකමකින් යුක්ත මෙම මෘදුකාංගය රෝහල වෙත නොමිලේ පරිත්‍යාග කිරීම ඊයේ (17) සිදු කළ බව ජාතික බෝවන රෝග විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෛද්‍ය හසිත අත්තනායක මහතා 'දිනමිණ'ට පැවසීය.

කොවිඩ් - 19 රෝගීන් වාර්තා වූ පසුගිය කාලයේ දින 100 ක් වැනි කෙටි කාලයකදී පී.සී.ආර්. පරීක්ෂණ 10,000ක් මෙම අණුක චිකිත්සක විද්‍යාගාරයෙන් සිදු කළ බවත්, එම පරීක්ෂණ තොරතුරු විශ්ලේෂණය කර පර්යේෂණවලට හා සම්මතකරණයන්ට ලක් කිරීමේදී අදාළ පරීක්ෂණයන්හි තොරතුරු විධිමත්ව නිසි ලෙස කළමනාකරණය ඉතා වැදගත් බවත් ඔහු කීය.

එම අවශ්‍යතාව නව මෘදුකාංගය භාවිතයෙන් සපුරා ගත හැකි යැයි ද, නව මෘදුකාංගයේ සාර්ථකතාව අනුව ඉදිරියේදී ඩෙංගු රෝගීන්ගේ පරීක්ෂණ තොරතුරු කළමනාකරණයට ද යොදා ගැනීමට පියවර ගන්නේ යැයි ද ඔහු කීය.

පාතාල 'සුදා' අල්ලයි

චන්ද්‍රිකා පෙරේරා

පාතාල කල්ලියක ප්‍රබල සාමාජිකයකු වන, මිනිමැරුම් ඇතුළු විවිධ අපරාධ රැසකට සම්බන්ධ "අතුරුගිරියේ සුදු" සමඟ අපරාධවලට යොදු ගත් බව කියන ව්‍යාජ ලේඛන සහිත යතුරුපැදි දෙකක් විශේෂ කාර්ය බළකායේ බුද්ධි නිලධාරීන් විසින් පෙරේදා (17) අත්අඩංගුවට ගෙන තිබේ.

මෙසේ අත්අඩංගුවට ගත් 37 හැවිරිදි සැකකරු පාතාල කල්ලි නායකයකු වන අතුරුගිරියේ ලලියාගේ ගෝලයකු බවට හෙළිව ඇති බව පොලීසිය පැවසීය.

මේ වන විට ඉන්දියාවට පලා ගොස් සිටින බව කියන අතුරුගිරියේ ලලියා අංගොඩ ලොක්කා සමඟ එක්ව විවිධ අපරාධ රැසක් සිදු කර ඇති බවත්, ඒවාට මොහුද සම්බන්ධ වී ඇති බවත් පොලීසියට තොරතුරු ලැබී තිබේ.

හිටපු ඇමැතිවරයකුගේ නිවෙසට වෙඩි තැබීමේ සිද්ධිය ද අත්අඩංගුවට ගෙන ඇති මේ සැකකරු සම්බන්ධ බවට හෙළිව ඇතැයි පොලීසිය කීය.

ඒ අනුව වර්ෂ 2017 පෙබරවාරි මස දී කළුතර බන්ධනාගාර බස් රථයකට පහරදී පුද්ගලයන් හතක් ඝාතනය කිරීමේ සිද්ධියට ද අංගොඩ ලොක්කාගේ සහ ලලියාගේ කණ්ඩායම සමඟ මෙසේ අත්අඩංගුවට ගත් සැකකරු හවුල් වී ඇති බවට අනාවරණය වී තිබේ. මීට අමතට සැකකරු මිනිමැරුම් සිද්ධි දෙකකට සම්බන්ධ බවට මේ වන විට අනාවරණය වී ඇත. සැකකරු සමඟ අත්අඩංගුවට ගෙන ඇති යතුරු පැදි දෙකට අදාළ ලියකියවිලි ව්‍යාජව සකසා ඇති බවද හඳුනා ගෙන තිබේ. විශේෂ කාර්ය බළකායේ අණදෙන නිලධාරී නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මහතාගේ උපදෙස් අතුරුගිරිය හෝකන්දර උතුර ප්‍රදේශයේ කළ වැටලීමකදී සැකකරු අත්අඩංගුවට ගෙන තිබේ.

මෙසේ අත්අඩංගුවට ගත් ප්‍රදීප් කුමාර නොහොත් අතුරුගිරියේ සුද, නමැති සැකකරු සහ යතුරු පැදි දෙක වැඩිදුර පරීක්ෂණ සඳහා අතුරුගිරිය පොලීසියට බාරදී තිබේ.

හිටපු ඇමැති තොණ්ඩමන්ගේ බංගලාවේ ගින්න ගැන පොලීසියෙන් පුළුල් පරීක්ෂණ

සුභාෂිණී සේනානායක

ලංකා කම්කරු කොංග්‍රසයේ නායක සහ හිටපු අමාත්‍ය දිවංගත ආරුමුගන් තොණ්ඩමන් මහතාට අයත් කොත්මලේ රම්බොඩ වැවන්ටත් වත්තේ පිහිටි බංගලාවේ හටගත් ගින්න සම්බන්ධයෙන් කොත්මලේ පොලීසිය පුළුල් පරීක්ෂණයක් ආරම්භ කර තිබේ.

මෙය තොණ්ඩමන් මහතාගේ පවුලට අයත් පාරම්පරික නිවසක් වන අතර, ඊයේ (18) දින අලුයම 2ට පමණ හටගත් ගින්නෙන් එම බංගලාවේ කොටසක් සම්පූර්ණයෙන්ම ගිනිගෙන විනාශ වී ඇති බවත්, එම ගින්න පැය තුනකින් පමණ නිවා දැමූ බවත් පොලීසිය කියා සිටියේය.

එම ගින්න හටගත්තා අවස්ථාවේ එම බංගලාව බාරව මුරකරුවකු පමණක් සිට ඇති අතර, පැතිර යමින් තිබූ ගින්න නුවරඑළිය මහ නගර සභාවේ හා හැටන් දික්ඔය නගර සභාවේ ගිනි නිවීමේ ඒකකය හා කොත්මලේ පොලීසියේ නිලධාරීන් එක්ව පාලනය කර ඇත.

ගින්නෙන් බංගලාවේ තිබූ පැරණි ගෘහ භාණ්ඩ රැසක් විනාශ වී ඇති අතර, ගින්නට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත.

ගින්න පිළිබඳ අංශ කිහිපයක් ඔස්සේ පුළුල් පරීක්ෂණ පවත්වන බව කොත්මලේ පොලීසිය පැවැසීය. ගින්නෙන් වූ අලාභය මෙතෙක් තක්සේරු කර නැත.

කැලෑවක සඟවා තිබූ ගිනි අවි 6ක් සොයා ගනී

චන්ද්‍රිකා පෙරේරා



පලෙයි සහ හම්බෙගමුව ප්‍රදේශවල සඟවා තිබුණු මෙරට නිෂ්පාදිත ගිනි අවි හයක් සමඟ සැකකරුවකු විශේෂ කාර්ය බළකාය පෙරේදා (17) අත්අඩංගුවට ගෙන තිබේ.

එදින සිදු කළ වැටලීම් දෙකකදී මේ ගිනි අවි අත්අඩංගුවට ගෙන ඇති බව පොලීසිය පැවසීය. ඒ අනුව එදින දහවල් 2.30ට පමණ පලෙයි කෝවිලයවල් කැලෑවක තිබී මෙරට නිෂ්පාදිත ගිනි අවි පහක් සොයාගෙන තිබිණි. ඒවා සඟවා ඇති සැකකරුවන් පිළිබඳ මෙතෙක් අනාවරණය වී නැති අතර වැඩිදුර පරීක්ෂණ සඳහා පලෙයි පොලීසියට බාර දී ඇත.

එදිනම රාත්‍රී හම්බෙගමුව කණ්ඩියපිටවැව ප්‍රදේශයේ කළ වැටලීමකදී මෙරට නිෂ්පාදිත තවත් ගිනි අවියක් සමඟ එක් සැකකරුවකු අත්අඩංගුවට ගෙන වැඩිදුර පරීක්ෂණ සඳහා හම්බෙගමුව පොලීසියට බාරදී ඇත.

උතුරේ ජලාශවලට අලුතින් මත්ස්‍ය පැටවු

බුද්ධිකා ඉඹුලාන

උතුරු පළාතේ ජලජීවී වගාව සංවර්ධනය යටතේ ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මඟින් උතුරු පළාතේ ඉරණතිවු, කවුදරමුණේයි, මුණරාම් පිඩිඩි, ඉලුප්පේයිකඩවයි, විඩතල්තිවු හා තයාරු ඇතුළු ජලාශ සියල්ලට කොඩුවා මත්ස්‍ය පැටවුන් ඇතුළු මිරිදිය මත්ස්‍ය පැටවු මුදහැරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. ධීවර ඇමැති ඩග්ලස් දේවානන්ද මහතාගේ උපදෙස් පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මකය. රට පුරා වැව් හා ජලාශවලට මිරිදිය මසුන් වගාව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ජලජීවී වගා සංවර්ධන ආයතනය මඟින් ආරම්භ කර ඇති අතර, ඒ අනුව රට පුරා ජලාශවල මිරිදිය මත්ස්‍ය වගාව සඳහා අවශ්‍ය පැටවු දැමීම සිදු කර ඇත. මේ අනුව රට පුරා වැවු හා ජලශවල ඉස්සන් හා මිරිදිය මත්ස්‍ය පැටවුන් නිදහස් කිරීම හරහා මිරිදිය ධීවර ජනතාවට විශාල මත්ස්‍ය අස්වැන්නක ඉලක්කයක් සපුරාගත හැකි වේ.



අපට විස්කි බෝතලයක් බොන්න දුන් ශානි අබේසේකර

රෝෂන් තුෂාර

සීඅයිඩියේදී විස්කි බෝතලයක් බොන්න දුන් ශානි අබේසේකර මහතා 'ප්‍රදීප් එක්නැලිගොඩ' අතුරුදන් කළේ ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නියෝගය මත බවට ප්‍රකාශයක් දෙන්නැයි බලපෑම් කළ බව යුද හමුදා බුද්ධි නිලධාරී කර්නල් ප්‍රබෝධ සිරිවර්ධන මහතා දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයා බැලීමේ ජනාධිපති කොමිසම හමුවේ සාක්ෂි දෙමින් ඊයේ (18) පැවසීය.

කිසි දිනක මත්පැන් පානය නොකරන තමන් එම විස්කි බී ඇති බවට නිගමනය කළ ශානි මහතා 'තම වසර තිස්පහක සේවා කාලය තුළ පුද්ගලයන් තිහක් එල්ලුම් ගස් යවා ඇති බවත්, තව පස්දෙනෙක් අඩු බවත් පවසා එක්නැලිගොඩ අතුරුදන් කළේ 'ගෝඨා' යැයි කීවොත් ප්‍රශ්නයක් නැතුව ගෙදර යා හැකි බවට සඳහන් කළ බව ද කීවේය.

එක්නැලිගොඩ මාධ්‍යවේදියා අතුරුදන් කිරීම සම්බන්ධයෙන් යුද හමුදා බුද්ධි නිලධාරීන් අත්අඩංගුවට ගෙන සාවද්‍ය කරුණු මත නඩු පවරා දේශපාලන පළිගැනීමක් කර ඇති බවට සඳහන් කරමින් ගොනු කළ පැමිණිල්ලේ සාක්ෂි ලබා දෙමින් සිරිවර්ධන මහතා එසේ පැවසීය.

කොමිසමේ සභාපති හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න, හිටපු අභියාචනාධිකරණ විනිසුරු චන්දූ, ජයතිලක හා හිටපු පොලිස්පති චන්දූ, ප්‍රනාන්දු මහත්වරුන් ඉදිරියේ සාක්ෂි ලබා දුන්නේය.

නීතිඥ ලාල් කුලරත්න මහතා ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු දුන් යුද හමුදා බුද්ධි නිලධාරී කර්නල් ප්‍රබෝධ සිරිවර්ධන මහතා සාක්ෂි දෙමින් මෙසේ ද පැවසීය.

ප්‍රදීප් එක්නැලිගොඩ මාධ්‍යවේදියා අතුරුදන් කර මරා දැමීම සම්බන්ධයෙන් මා ඇතුළු තවත් බුද්ධි නිලධාරීන්ට 2015 වසරේදී හෝමාගම අධිකරණයේ නඩු පැවරුවා. 2015 අගෝස්තු 24 දී අපව අත්අඩංගුවට ගත්තා. එවකට මම යුද හමුදා ගිරිතලේ කඳවුරේ බුද්ධි නිලධාරියකු ලෙස කටයුතු කළා. 1992 වසරේ සිට යුද හමුදා බුද්ධි නිලධාරියෙකු ලෙස කටයුතු කළ මා රණශූර පදක්කම දෙවරක් ලබාගෙන තිබෙනවා. අවසන් සටනේ 56වැනි සේනාංකයේ බුද්ධි නිලධාරියා ලෙස කටයුතු කළා.

අපව අත්අඩංගුවට ගත් පසුව ශානි අබේසේකර මහතාට යොමු කළ ඔහු, අපෙන් ඇහුවා එක්නැලිගොඩ අතුරුදන්වීම ගැන, ගෝඨාභය මහතාගේ අණ පරිදි මගේ අණ දෙන නිලධාරි දුතිනත් කර්නල් ශම්මි කුමාර මහතා එය කළා නේද කියා ඇහුවා. අපව සී අයිඩියට ගෙන ගියේ මොකද කියා දැනගෙන හිටියේ නැහැ. ත්‍රස්තවාදී පනත යටතේ අත්අඩංගුවට ගෙන රඳවා ඉන්නවා කියා ඒ වන විට මාධ්‍යවල ප්‍රචාරය වුණා. ඒ අනුව කරුණු අවබෝධ කර ගත්තා.

එක්නැලිගොඩ අතුරුදන් වීම ගැන සියලු දෙරතුරු දන්නවා කියා ශානි මහතා කිව්වා. එය සත්‍යාථ කර ගැනීම සඳහා ප්‍රකාශයක් දෙන්න කියා ශානි මහතා කිව්වා. මේ අතුරුදන් කිරීම ගෝඨාභය මහතාගේ ඉල්ලීම පරිදි කළා කියා කියන්න කිව්වා.

ගෝඨාභය මහතා ගැන කරුණු දන්නවා නම් ඔහුව අත්අඩංගුවට ගන්න පුළුවන් නේද? කියලා මා ශානි මහතාගෙන් ඇහුවා. එවිට ශානි මහතා මට කිව්වා තොරතුරු දන්නවා. ඒවා සත්‍යාථ කරන්න ප්‍රකාශයක් දෙන්න කියා. ශානි මහතා මාව අත්අඩංගුවට ගත්තේ එක්නැලිගොඩ අතුරුදහන් කළා යැයි කියන චෝදනාවටයි.

අපට විරුද්ධව යුද හමුදාවේ බුද්ධි තොරතුරු ලබා දුන් කොටි සාමාජිකයන්ගෙන් ඒ වනවිට ප්‍රකාශ සටහන් කරගෙන තිබුණා.

කොමිසම - ඔබ කොහෙද හිටියේ?

සාක්ෂිකරු - මම මතුගම කුකුලේගඟ තේවාසික පුහුණුවක් ලැබුවා. එම පුහුණු සහතිකය හා ගමන් විස්තර කොමිසමට ඉදිරිපත් කරනවා.

ගෝඨාභය මහතාගේ අණ පරිදි එක්නැලිගොඩ අතුරු දන් කළා කියා කොහොමද දන්නේ කියා මම ශානි මහතාගෙන් ඇසුවා.

ඒ වනවිට අවසන් සටනේදී මා අත්අඩංගුවට ගෙන යුද හමුදාවේ බුද්ධි තොරතුරු ලබාගත් (ද්විත්ව ඔත්තුකරුවන්) කොටි සාමාජිකයන් මේ බව ප්‍රකාශ කර තිබෙනවා කියා ශානි මහතා කිව්වා. කොටි සාමාජිකයන් තුන්දෙනකු ප්‍රකාශ ලබා දී නිදහස ලබාගෙන තිබුණා.

ශානි මහතා ඉල්ලා සිටි පරිදි වැරැදි ප්‍රකාශයක් ලබා දෙන්න මම අකමැති වුණා. එවිට ශානි මහතා කිව්වා එහෙමනම් අනෙක් අයට දෙන කෝස් එක දෙන්න වෙනවා. ඒ පොසිඩියර් එකේම යමු නේද කියලා.

සමූහ මංකොල්ල අංශයේ ස්ථානාධිපති ලෙස පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා මහතා කටයුතු කළා.

සීඅයිඩියේ අත්අඩංගුවේ පසුවනවිට අපට ශානි මහතා පහත් අන්දමින් සැලකුවා. අපට විස්කි බෝතලයක් ලබාදී පසුව රාත්‍රී 9.30 යළිත් ප්‍රකාශ සටහන් කරන්න එන්න කිව්වා. අප බුද්ධි නිලධාරීන් පස්දෙනා විස්කි බෝතලය බිව්වේ නැහැ. ශානි මහතා ගිහුවා අප බීලා කියලා. මම කවදාකවත් මත්පැන් බොන්නේ නැහැ. ඊට පසුව ශානි කිව්වා එයාගේ සේවා කාලය වසර තිස් පහයි. තිස්දෙනෙක් එල්ලුම්ගස් යවා තිබෙනවා තව පස්දෙනයි ඉන්නේ කිය. එහෙත් මා ප්‍රකාශයක් කළේ නැහැ.

රාඳවුම් නියෝග මත ඉන්නකොට මාව එක් දිනක් රාත්‍රියේ ගෙදරට ගෙන ගියා. මාගේ තාත්තාට හා බිරිය මුණගැසී ප්‍රේමතිලක කියන පොලිස් නිලධාරියා අපේ තාත්තට ප්‍රකාශයක් කළා. අපි දන්නවා මේ සර් මේකට සම්බන්ධ නැති බව, පොඩි ප්‍රකාශයක් කළා නම් මේකෙන් නිදහස් වෙන්න පුළුවන් කියා ඔහු කිව්වා. ඉන්පසුව ඔවුන් එල්.ටී.ටී.ඊ. බුද්ධි මෙහෙයුමක් සම්බන්ධයෙන් වූ එච්. එච්. කියන බුද්ධි සටහන මගේ මේසය උඩ තිබියදී අරගත්තා. එය පසුව එක්නැලිගොඩ ඝාතන සැලසුම් කියා අධිකරණයට ඉදිරිපත් කළා.

එක්නැලිගොඩ අතුරුදහන් කළා යැයි කියන දිනයේ මම කුකුලේ ගඟ සාමසාධක පාසලේ තේවාසික පුහුණුවකට සහභාගී වුණා. 2010 ජනවාරි 17 සිට 2010 පෙබරවාරි 5 දක්වා මා සිටියේ එහෙයි.

2010 ජනාධිපතිවරණ සමයේදී පවුල් ගහක් පිළිබඳ කාටුන් ඇන්ද එක්නැලිගොඩව ගෝඨාභය මහතාගේ උපදෙස් පරිදි අතුරුදහන් කර තිබෙනවා කියා ප්‍රේමතිලක නිලධාරියා ප්‍රකාශ කළා.

අපව අත්අඩංගුවට ගත්තේ ප්‍රදීප් එක්නැලිගොඩ අතුරුදහන් කිරීම සම්බන්ධවයි. එහෙත් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළේ මනුෂ්‍ය ඝාතනයක් සම්බන්ධවයි.

ප්‍රදීප් එක්නැලිගොඩ මාධ්‍යවේදියෙක් ගැන මම දන්නේ නැහැ. මේ අත්අඩංගුවට ගැනීම දේශපාලන පළිගැනීමක් ලෙස මා දකිනවා. යුද හමුදා බුද්ධි අංශය ගෝඨාභය මහතා හෝ වෙනයම් දේශපාලන පක්ෂයක් වෙනුවෙන් වැඩ කරන්නේ නැහැ. යුද හමුදාවේ අණ දෙන්නා යුද හමුදාපති පමණයි. මේ අත්අඩංගුවට ගැනීමෙන් යුද හමුදා නිලධාරියකු වූ මා පීඩාවට පත් වුණා. අපහාසයට ලක් වුණා. මේ කටයුතු සඳහා විශාල මාධ්‍ය ප්‍රචාර පවා ලබා දුන්නා.

වැඩිදුර විභාගය පසුවට කල් තැබිණි.

දේශපාලන පළි ගැනීම් පිළිබඳ සොයා බලන ජනපති කොමිසම

එක්නැලිගොඩ අතුරුදන් කළේ 'ගෝඨාභයගේ නියෝගය මත' යැයි කියන්න කීවා

යුද හමුදා බුද්ධි නිලධාරී කර්නල් ප්‍රබෝධ සිරිවර්ධන

පන්නිපිටිය තලවතුගොඩ මීමනගොඩ දෙපානම

කුඹුරු ඉඩම් ගොඩ කිරීමේ නීති විරෝධී ව්‍යාපාරයක්

පන්නිපිටිය, තලවතුගොඩ, මීමනගොඩ සහ දෙපානම ප්‍රදේශවල කුඹුරු ඉඩම් ගොඩ කිරීමේ නීති විරෝධී ව්‍යාපාරයක් සම්බන්ධයෙන් තොරතුරු වාර්තා වේ.

මේ ව්‍යාපාරයට ඇතැම් ව්‍යාපාරිකයන් ද සම්බන්ධ වී ඇති අතර වගා කළ හැකි කුඹුරු ගොඩ කරමින් ඒවා විකුණා අයුතු ලාභයක් ලැබීම මේ ව්‍යාපාරයේ අරමුණ වී තිබේ.

ගොවීන් කුඹුරු වපුරා අස්වැන්නක් ලබා ගත් ඇතැම් ලියැදි පුරන් වන්නට තබා ටික කලකින් ගොඩ බෝග වගා කිරීමත්, පසුව ඒවා පුරවා ගොඩනැඟිලි හා ව්‍යාපාර ස්ථාන ඉදි කිරීමත් මේ ව්‍යාපාරයට සම්බන්ධ පුද්ගලයන් විසින් සිදු කරයි.

ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ඇතැම් නිලධාරීන් ද මේ ව්‍යාපාරයට සම්බන්ධ බව ප්‍රදේශවාසීන් පවසන අතර මේ ගැටලුව ජනාධිපතිවරයාගේත්, කෘෂිකර්ම ඇමැතිවරයාගේත් අවධානයට යොමු විය යුතු බවට ප්‍රදේශවාසීන්ගේ මතය වේ.

ඉඩම් ගොඩ කිරීම නිසා ප්‍රදේශයේ සුළු ගංවතුර තත්ත්වයන් ඇති වන බවත්, ප්‍රදේශයේ ඇතැම් දේශපාලකයන් ද මේවාට සම්බන්ධ බවට ජනතාවට සැකයක් පවතින බවත් ප්‍රදේශවාසීහු පවසති.

'දරුවෝ සුරකින මහ පවුරක් වෙමු' 21 දා නිදහස් චතුරශ්‍රයේදී

'දරුවෝ සුරකින මහ පවුරක් වෙමු' මානෘකාව යටතේ දීප ව්‍යාප්ත දරුවන් සුරැකීමේ වැඩසටහන ආරම්භ කිරීමේ සමාරම්භක උළෙල මේ මස 21 වැනිදා සවස 5ට නිදහස් චතුරශ්‍ර පරිශ්‍රයේදී පැවැත්වේ.

දරු පරපුර අනාරක්ෂිතව දුෂණයට, හිංසනයට සහ අපහරණයට ලක් වෙමින් ඇති බව මැතකදී ප්‍රකාශිත දත්ත හා තොරතුරුවලින් අනාවරණය වී ඇත. කාන්තා සවිය හා අර්බන් සිටිසෙන්ස් මේ තත්ත්වය වෙනස් කරමින් දරුවන් වෙනුවෙන් යහපත් පරිසරයක් ගොඩනැඟීමට සක්‍රිය දායකත්වයක් ලබා දෙමින් මේ වැඩසටහන ආරම්භ කරයි.

දරුවන් ආරක්ෂා කිරීමට එහි සැබෑ තත්ත්වය පුළුල්ව දැනුවත් කරමින්, ආයතනික හා පෞද්ගලික ජාල සවිමත්ව ගොඩනඟා අයහපත් තත්ත්වය මැඩ පැවැත්වීම කාන්තා සවිය සහ අර්බන් සිටිසෙන්ස්හි අරමුණ වේ.

එජාපයට අන්තර්කාලීන නායකයකු පත් කරන බවට පළ වන පුවත්වල කිසිදු සත්‍යතාවක් නෑ

එක්සත් ජාතික පක්ෂ මාධ්‍ය ඒකකය

ශිරෝමි අබයසිංහ

එක්සත් ජාතික පක්ෂයට අන්තර්කාලීන නායකයකු පත් කරන බවට ඇතැම් සමාජ ජාලවල පළ වන ප්‍රවෘත්තිවල කිසිදු සත්‍යතාවක් නැතැයි එක්සත් ජාතික පක්ෂ මාධ්‍ය ඒකකය සඳහන් කරයි.

මහ මැතිවරණයෙන් පසුව පක්ෂය ප්‍රතිසංවිධානය කර ඉදිරියට ගෙන යෑමට ආරම්භ කළ සාකච්ඡා තවදුරටත් ක්‍රියාත්මක වන බව පවසන මාධ්‍ය ඒකකය ඉහත සාකච්ඡාවල ප්‍රතිඵල ලෙස තරුණ නායකයන් අට දෙනකුගේ පමණ නම් ඉදිරිපත් වී ඇතැයි ද ප්‍රකාශ කරයි.

එක්සත් ජාතික පක්ෂය වැනි දේශපාලන සංවිධානයක නායකත්වයට පත්වන තැනැත්තා නායකත්වයේ ස්ථාවර බවක් ඇති කරගැනීමට අඩුම තරමින් වසර හතරක් පහක් ගත වන බවට පක්ෂ අභ්‍යන්තරයේ අදහස් හුවමාරු වෙමින් තිබෙන බව ද එම මාධ්‍ය ඒකකය වැඩිදුරටත් කියයි.

මත්ද්‍රව්‍ය කාර්යංශයේ වැටලීම්වලට ව්‍යාජ මුදල් යොදාගැනීමේ සිද්ධියේ

සැකකරුවන්ගෙන් නැවත ප්‍රකාශ ලබාගැනීමට නියෝග

සිරන්ජනි කුමාරි

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ වැටලීම් සඳහා කාලයක් පුරා ව්‍යාජ මුදල් 5000 තෝට්ටු යොදාගැනීමේ සිද්ධිය සම්බන්ධයෙන් සැකකරුවන්ගෙන් නැවත ප්‍රකාශයක් ලබාගැනීමට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් ලංකා ජයරත්න මෙනවිය ඊයේ (18) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අවසර ලබා දුන්නාය.

සිය වැටලීම් සඳහා ව්‍යාජ තෝට්ටු යොදා ගත් බවට සැකකරුවන් විසින් ලබාදී ඇති ප්‍රකාශය පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ස්ථානාධිපතිවරයා විසින් ප්‍රතික්ෂේප කරමින් කිසිදු දිනෙක එවැනි ප්‍රතිපාදන ලබා නොදුන් බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කටඋත්තරයක් ලබාදී ඇත. එබැවින් සැකකරුවන්ගෙන් නැවත ප්‍රකාශයක් ලබාගැනීමට අවසර ලබාදෙන ලෙසට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයෙන් කළ ඉල්ලීම සලකා මහේස්ත්‍රාත්වරිය මේ නියෝගය නිකුත් කළාය.

සැකකරුවන් රඳවා සිටින අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ අධිකාරිවරයා වෙත මේ මස 21 වැනි දින අදාළ සැකකරුගේ ප්‍රකාශ ලබාගැනීමට අවශ්‍ය කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන ලෙසට නියෝග කළාය.

ව්‍යාජ 5000 තෝට්ටු ළඟ තබාගැනීමේ චෝදනා යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය විමර්ශන ඒකකය විසින් පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ පොලිස් නිලධාරීන් දෙදෙනකු එරෙහිව පැවරූ නඩු දෙකක් යළි අධිකරණය හමුවේ කැඳවූ අවස්ථාවේදී මේ නියෝගය කළාය.

සිද්ධියට අදාළව සැකකරුවන්ගෙන් ප්‍රශ්න කළද මේ මුදල් මුද්‍රණය සම්බන්ධයෙන් කරුණු කිසිවක් අනාවරණය කර ගත නොහැකි වූ බවත්, එකම අංකය යටතේ මේ මුදල් මුද්‍රණය කර ඇති බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට දැන්විය.

මත්ද්‍රව්‍ය ජාවාරම් සිද්ධිය සම්බන්ධයෙන් දැනට රක්ෂිත බන්ධනාගාරගතව සිටින පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ පොලිස් කොස්තාපල් (85372) වන්නිආරච්චිලාගේ ලක්ෂාන් සමීර සහ පොලිස් කොස්තාපල් (87226) හේමුදියන්සේලාගේ ලලින් ජයවර්ධන දෙදෙනාට එරෙහිව ව්‍යාජ මුදල් ළඟ තබාගැනීමේ චෝදනාව මත නඩු පවරා ඇත.

මත්ද්‍රව්‍ය ජාවාරම් සිද්ධිය සම්බන්ධයෙන් සිදු කරන ලද සෝදිසියකදී ලක්ෂාන් සමීර යන අයගේ ලොකර් එකේ තිබී ව්‍යාජ මුදල් තෝට්ටුවක් 31ක් ද, ලලින් ජයවර්ධන සතුව තිබී ව්‍යාජ මුදල් තෝට්ටුවක් ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සොයා ගෙන තිබේ.

සැකකරුවන් විසින් සිය රාජකාරී භාණ්ඩ තබාගැනීමට මේ ලොකර් භාවිත කරන බවත්, විමර්ශනයට අදාළව සොයා ගත් මේ තෝට්ටු සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙතම විමර්ශනයක් ආරම්භ කර ඇති බවත් මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය අධිකරණයට කරුණු දක්වමින් සැකකරුවන් දෙදෙනාට එරෙහිව නඩු දෙකක් අධිකරණය හමුවේ පැවරිය.

මොවුන්ට මේ මුදල් ලැබුණේ කෙසේද? යම් අපරාධමය වරදක් සිදු කිරීමට මේවා භාවිත කර ඇද්ද? යන්න පුළුල්ව විමර්ශන සිදු කරන බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණය හමුවේ සඳහන් කළේය.

රැඳවූවකුට දීමට රැගෙන ආ ඇඳුම් අතර සැඟවූ

මත්කුඩු සමඟ කාන්තාවක් අත්අඩංගුවට

බුද්ධිකා ඉඹුලාන

මහර බන්ධනාගාරයේ සිටින සිරකරුවකුට ලබාදීමට රැගෙන ආ ඇඳුම් අතර තිබූ කොට කලිසමක වාටියේ සූක්ෂ්ම ලෙස සඟවා තිබූ මත්ද්‍රව්‍ය සමඟ කාන්තාවක් එම බන්ධනාගාර නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

හෙරොයින් ළඟ තබාගැනීමේ චෝදනා මත අධිකරණයෙන් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට නියමව මහර බන්ධනාගාරයේ සිටින මේ සැකකරුගේ බිරිය යැයි පැවසෙන කාන්තාවක් මේ මත්ද්‍රව්‍ය රැගෙන විත් ඇති අතර එම මත්කුඩු කුඩා පැකට් දෙකකට වෙන් වෙන් වශයෙන් ඔතා කලිසමේ වාටියේ සඟවා තිබී ඇත.

මේ කාන්තාව ද මෙයට පෙර සොරකම් කිරීමේ වරදට බන්ධනාගාර ගතව සිට මෙයට සය මසකට පෙර නිදහස ලබා ඇති තැනැත්තියක බව මහර බන්ධනාගාර අධිකාරී ජගත් විරසිංහ මහතා කියයි.

පසුගිය 15 වැනි දා සිට රැඳවියන් හමුවීමට අමුත්තන්ට අවසර ලබාදීමත් සමඟම මෙවැනි තහනම් ද්‍රව්‍ය බන්ධනාගාරයට පැමිණීමට ඉඩ ප්‍රස්තා ඇති බැවින් බන්ධනාගර නිලධාරීන් දැඩි සෝදිසි කිරීම් සිදු කරන බව ද අධිකාරිවරයා පවසයි.

අනුරාධපුර ශික්ෂණ රෝහලෙන් මේ වසරේ මුල් මාස අටේ ඒඩිස් රෝගීන් 9ක් වාර්තා වෙලා

ලිංගික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී හේමා වීරකෝන්

බී. එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

අනුරාධපුර ශික්ෂණ රෝහලේ ලිංගික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානයේ මේ වසරේ මුල් මාස අටේ පමණක් මාරාන්තික එච්. අයි. වී. (ඒඩ්ස්) රෝගීන් නව දෙනකු පමණ හඳුනාගෙන තිබෙනවා. එය පසුගිය වසරට සාපේක්ෂව වැඩිවීමක්. එම රෝගීන්ගෙන් බහුතරය පිරිමින්.යැයි ලිංගික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී හේමා වීරකෝන් මහත්මිය අනාවරණය කළාය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දක්වූ ඒ මහත්මිය මෙසේ ද කීවාය.

මේ වයිරසය ශරීරයට ඇතුළු වූ පසුව ප්‍රතිශක්තිකරණ පද්ධතිය ක්‍රම ක්‍රමයෙන් දුර්වල කරනවා. ශරීරයේ ඇති වන රෝගවලට එරෙහිව සිදු කරන ක්‍රියාකාරිත්වය ද අඩු කරනවා. මේ වයිරසය බොහෝ විට අවුරුදු 08ක් 10ක් ගත වනතුරු ආසාදිත පුද්ගලයාට හඳුනාගැනීම අපහසුයි. මෙරෝගය හඳුනාගැනීම මුලිත්ම සිදු නොවුණොත් ප්‍රතිකාර නොලැබී මිය යෑම සිදු විය හැකියි.

අනුරාධපුර ශික්ෂණ රෝහලේ ස්ථාපිත කර ඇති ලිංගික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානයේ හඳුනා ගත් පිරිස අතර පිරිමින් අතර සමලිංගික සබඳතා පැවැත්වීම නිසා වයිරසය ආසාදනය වූ පුද්ගලයන් පස් දෙනකු සිටිනවා. HIV ආසාදිත රෝගීන්ට දෙනු ලබන සියලුම ප්‍රතිකාර අනුරාධපුර ලිංගික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානයෙන් නොමිලේ ලබාගෙන රෝගී දිවියක් ගත කළ හැකියි.

යම් කෙනකු සමඟ අනාරක්ෂිත ලිංගික සබඳතාවක් පවත්වා ඇත්නම් අනුරාධපුර ලිංගික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානයට පැමිණ තොපමාව රුධිර පරීක්ෂාවක් සිදු කරගැනීමෙන් HIV ආසාදිත නොවන බවට තහවුරු කර ගත හැකියි. කිසිදු රෝගියකුගේ පෞද්ගලිකත්වයට හානි සිදු නොවන අයුරින් අප කටයුතු කරනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පිටින් තීන්දු තීරණ ගැනීම ව්‍යවස්ථා විරෝධීයි

පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂා විතානගේ

ශිවන්ති ප්‍රනාන්දු

තුනෙන් දෙකේ බලයක් ලැබුණද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පිටින් තීන්දු තීරණ ගැනීම ව්‍යවස්ථා විරෝධී ක්‍රියාවක් වන බව සමඟි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂා විතානගේ මහතා පවසයි.

ඒ මහතා මේ බව පැවැසුවේ එම පක්ෂ මූලස්ථානයේ ඊයේ (18) පැවති මාධ්‍ය හමුවකට සහභාගි වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'වැරැදි පණිවිඩ නිර්මාණය කරමින් ඒවා ජනගත කිරීමට උත්සාහ කරන මාධ්‍ය සහ සමාජ ජාල පිළිබඳව ජනතාව දැනුවත් කිරීම විපක්ෂයේ වගකීමක් කියලා අප විශ්වාස කරනවා. 2020 මහ මැතිවරණයෙන් විශාල ජයග්‍රහණයක් පොදුජන පෙරමුණ ලබා තිබෙනවා කියන එක අවිවාදයෙන් තොරයි. මේ රටේ ව්‍යවස්ථා ප්‍රකාරව ඒ ජනවරම රට පාලනය කරන්න ලැබුණු ජනවරමක් කියන එක නායකයන්ට මේ වන විට අමතක වෙලා. කරන ප්‍රකාශවලින් ඒක අපට දැනෙනවා. තුනෙන් දෙකක් නොවෙයි, හයෙන් පහක බලයක් ලැබුණත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පිටින් තීන්දු තීරණ ගැනීම සහ කටයුතු කිරීම ව්‍යවස්ථා විරෝධී ක්‍රියාවක්. මේ රටේ ජනතාව ඒකට කිසිදු බලයක් ලබාදී නෑ. මෛත්‍රීපාල සිරිසේන මහතා 19 වැනි සංශෝධනය ගෙන එන වෙලාවේ පරිසර, මහවැලි, ආරක්ෂක අමාත්‍යාංශ ඒ මහතාගේ යටතේ තබා ගත්තා. ඒක ඒ මහතාගේ ධුර කාලයෙන් පසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට පමණක් එම ඇමැති ධුර දැරීමට හැකියි කියන ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක තමයි අප අද ඉන්නේ. අද මේ නිර්මාණය වෙලා තිබෙන්නේ ඒ පාර්ලිමේන්තුව. ආරක්ෂක අමාත්‍යාංශය ජනාධිපතිවරයා යටතේ තිබෙනවා. එහි වරදක් නෑ. බැලූ බැල්මට ප්‍රශ්නයක් නෑ කියා කවුරු හරි කියයි. මොකද ඒ මහතාට තුනෙන් දෙකේ බලයක් තිබෙනවා. මේ ගැන විමර්ශනය කළොත් ව්‍යවස්ථාපිතව එතැන යම්කිසි වැරැද්දක් සිදු වන බව පේනවා. ජනාධිපතිවරයාට එය දැරිය හැකියිද කියන ප්‍රශ්නය නිර්මාණය වෙනවා. ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල ආදී වශයෙන් ආරක්ෂක අමාත්‍යාංශය යටතට නොගැලපෙන ආයතන රාශියක් මේ වන විට එකතු කරගෙන තිබෙනවා. අප ජනතාවට කියනවා රටේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයක් එනවා කියලා කතාවක් තිබෙන බව. අප අහනවා මේ රට ආ පස්සටද යන්න ඕනෑ කියලා. ඒ මහින් ස්වාධීන කොමිසන් සභා වැනි ඉතා සාධනීය පියවර අකුලා ගත්තාවද? එහෙම නැතිව 19 වැනි ව්‍යවස්ථාව වෙනස්කම්වලට භාජනය කරනවාද? මේ වෙලාවේ කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා ජනාධිපතිවරයා වුණාට ඇමැතිවරුන් පත් කිරීමේ සර්ව බලධාරියා වෙන්නේ අග්‍රාමාත්‍යවරයා. ඒ නිසා ඉදිරියේදී මේ කරුණු ගැන මහින්ද රාජපක්ෂ මහතාත් අවධානය යොමු කළ යුතුයි.

මේ දවස්වල මාධ්‍යවලත් සමාජයේත් ඇමැති මණ්ඩල පත් කිරීම ගැන අවඥ සහගත ලෙස බලනවා. පාලනය කරන පක්ෂය තමන්ට අවශ්‍ය පරිදි අමාත්‍යාංශවල විෂය පථය බෙදුවාට වැඩක් නෑ. 78 ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු මේ රටේ කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ ඇමැතිවරයෙක් සිටියා. ඒත් මේ ඇමැති මණ්ඩලයේ මේ මොහොතේ කාන්තා සහ ළමා කටයුතු පිළිබඳව ඇමැතිවරයෙක් නෑ. මහින්ද රාජපක්ෂ රජය කාන්තා කටයුතු පිළිබඳ ඇමැති ධුරය එක වරක් ඇමැතිවරයකුට භාරදී තිබුණා. එහෙම නම් ඒ විෂයයන් දෙක කා යටතේද පාලනය වෙන්නේ? සියයට 52ක් ජීවත් වන කාන්තාවන් හා ළමයින් වෙනුවෙන් අමාත්‍යාංශයක් පිහිටුවිය යුතුව තිබෙනවා. පාර්ලිමේන්තුවට කාන්තා මන්ත්‍රීවරියන් 12ක් තේරී සිටිනවා. මේක සමාජයටත්, අපටත් ප්‍රශ්නයක්.

අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වැඩ බාර ගනී

අධිකරණ අමාත්‍යාංශයේ නව ලේකම් ධුරයට පත් නීතිඥ ප්‍රියන්ත මායාදුන්නේ මහතා සිය ධුරයේ රාජකාරී කටයුතු ඊයේ (18) පෙරවරුවේ අධිකරණ අමාත්‍යාංශයේදී ආරම්භ කළේය.

ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධාරියකු වන ඒ මහතා, එම විශ්ව විද්‍යාලයේම කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිධරයෙකි.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධිය හැදෑරූ ඒ මහතා කැලණිය විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ උපාධිධරයකු ද වේ.

ජනමාධ්‍ය අමාත්‍යාංශය, ආර්ථික කටයුතු අමාත්‍යාංශය, වෙළෙඳ අමාත්‍යාංශය යන අමාත්‍යාංශයන්හි අතිරේක ලේකම්වරයකු ලෙස කටයුතු කර ඇති ඒ මහතා මීට පෙර රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යන අමාත්‍යාංශවල ලේකම්වරයා වශයෙන් ද ධිවර අමාත්‍යාංශය, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය යන කැබිනට් අමාත්‍යාංශවල ලේකම්වරයා වශයෙන් ද කටයුතු කර ඇත.

කොම්පොස්ට් තනමින්

නිවැරැදි උපදෙස්

සැවොම එක්ව

සරුසාර වගාව

වස විස නැති ගමක් හදන

පදවියේ ගැමි ලියෝ

නිමල් පද්මසිරි

පත්මා මායාදුන්න

දයා කුමාරි

සුදර්ශන ගම පදවියට ආසන්න සුන්දර ගම්මානයකි. කෘෂිකර්මාන්තය වෙනුවෙන් විශේෂ කාලයක් කැප කරමින් ජීවත්වන සුදර්ශන ග්‍රාමවාසීන් විසින් පසුගියද රටටම ආදර්ශවත් ක්‍රියාවකට මුල පුරන ලද්දේ මහින්ද රාජපක්ෂ මහතා දිවුරුම් දීමේ දිනය සටහන් කිරීමටය. ග්‍රාමීය ආර්ථිකය නහා සිටුවීමෙන් රට සශ්‍රීක කිරීම එහි මූලික සංකල්පය බවට පත්ව තිබුණි.

රට තුළ අග්‍රාමාත්‍යවරයෙක් හෝ මැති ඇමැතිවරයකු දියුරුම් දීමෙදී වෙනත් ග්‍රාමවලින් ඇසෙන රතිඤ්ඤ, හඬ වෙනුවට පදවි වැවේ නොකිලිටි සුළඟ පහසින් පෝෂණය වූ සුදර්ශන ගම්මානයෙන් ඇසුණේ රටේ අනාගතය වෙනුවෙන් එකිනෙකා එක්වූ ජයග්‍රහණයේ හඬකි. එම ගම්මානයේ කාන්තාවන් පනස් දෙනකු එක්ව තම පරිසරයෙන් ඉවතලන ද්‍රව්‍ය යොදු ගනිමින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් ඇරඹීමට මුල පිරුහ. ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම යථාර්ථයක් කරගනු පිණිස ගෙවතු වගාවන් සඳහා එක්වූ සුදර්ශන ග්‍රාමයේ කාන්තාවන් මේ වන විට ගෙවතු වගා පතහක් සාර්ථකව තිම කොට තිබේ. එම ගෙවතු වගාවන්ට අවශ්‍ය කාබනික පොහොර එම ගම්මානයේම සියලු දෙනාගේ දායකත්වයෙන් නිෂ්පාදනය කිරීම මෙම නව ව්‍යාපෘතියෙහි අරමුණ වී තිබේ.

සැබෑවටම එය ඇගයිය යුතු ක්‍රියාවලියකි. තම ගම සශ්‍රීක වූ විට නිරායාසයෙන්ම තම රට සශ්‍රීක වේ. ඒ කටයුතු එමෙන්ම මෙම කාබනික වගාවන් පරිභෝජනය කිරීම හරහා අනාගත පරම්පරාව බෝ නොවන රෝග රැසකින් සුරක්ෂිත කරගැනීමට හැකියාව ලැබේ. සෑම ගම්මානයක් සෞඛ්‍යාරක්ෂිත වීම හරහා රටෙහි සෞඛ්‍යාරක්ෂිත බව රැකෙයි. මෙම කටයුත්ත අප විසින් ඇගයීමට ලක් කරන්නේ ඒ නිසාමය.

මෙම ප්‍රජාමූල ව්‍යාපෘතිය පිළිබඳ සුදර්ශන ගමෙහි පත්මා කියන්නේ අපූරු කතාන්දරයකි.

ඇත්තටම රටක ආදර්ශවත් අග්‍රාමාත්‍යවරයා ලෙස මහින්ද රාජපක්ෂ මහතා දිවිරුම් දෙන අවස්ථාවේ අප කරන්න ඕන රටට වැදගත් වැඩක්. මහින්ද රාජපක්ෂ මැතිතුමා විශාල වැඩි ජන්ද ගණනක් අරගෙන රටේ අග්‍රාමාත්‍යවරයා ලෙස ජනාධිපතිතුමා ඉදිරියේ දිවුරුම් දෙනවා. ඒ අවස්ථාව තිමිත් කොට ගෙන පදවිය සුදර්ශන ගමේ කාන්තා අපි කාබනික පොහොර හැදීම ආරම්භ කළා. බොහෝ කාලයක් වැවේ ජපන් ජබර තිබුණා. අපේ කිරි හරක් ගොම ටික වැව් පිටිවල අපතේ ගියා ගෙදර කුස්සියේ ඉවතලන දෑ පරිසරයට මුදු හැරියා.

මේ අතරෙදී අපිට ග්‍රාමීය සමාජ සංවර්ධන ආයතනය මඟින් අප විඥාණ කළ සියලු දේ ප්‍රයෝජනයට ගෙන සල්ලි කරන හැටි කියා දුන්නා. අද අපේ ගෙවතුවලට දාන්න කාබනික පොහොර නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කළා. අද ගොම ටික, පිදුරු ටික, ජපන් ජබර ටික, ඇල්බිසියා කොළ ටික, කොහොඹ කොළ ටික, ඒ වගේම අපේ ගෙවත්ත තුල ඇති ඉවතලන සියල්ලම එකතු කර කාබනික පොහොර හදා සල්ලි උපයන හැටි ගැන අපි දැනුම්වත්.

මේ ටික කියලා දුන්නාම අපට ලොකු ලැජ්ජාවකුත් ඇති වුණා. මේ දක්වා අපි මොනතරම් සම්පත් නාස්ති කළාද කියලා.දැන් අපට තේරෙනවා මේ සියල්ලම සල්ලි කියලා. අපි මේ ගම වෙනුවෙන් අපට ඒ දේ කියලා දුන්න අයට අපේ ගෞරවය පුදකරනවා. ඒ වගේම රටේ අනාගතය ශක්තිමත් කිරීමට සහ වස විසෙන් තොර රටක් හොඳනැඟීමට අපේ දායකත්වය ලබා දෙනවා. ඒ කතාව රටට සහ අනාගතයට ශක්තියකි.

ඩබ්ලිව්.එම්.එම්.ජී.එම්. දයා කුමාරි මහත්මිය මෙම ව්‍යාපෘතිය පිළිබඳ දක්වන්නේ මෙවැනි අදහසකි.

අපේ ගෙදර වටේම තිබුණු කසළ ටික සහ වැව අවලස්සන කළ ජපන් ටික අරගෙන කාබනික පොහොර නිෂ්පාදනය කළා. මහින්ද රාජපක්ෂ මහතා අග්‍රාමාත්‍ය ධූරයේ දිවිරුම්දෙන දිනය ඒ සඳහා යොදගත්තේ අපේ ගම සංවර්ධනයේ අරුණ දකින ඉතිහාසගත දිනය මතක තිබෙන්නටයි.

මේ ක්‍රියාවලිය නිසා ඉදිරියේදී වැවත් ලස්සන වේවි අපේ ගෙදර වටේමත් ලස්සන වේවි. අපටත් ආදායමක් ලැබේවි. ඒ වගේම පදවිය සුදර්ශන ගමේ කාබනික පොහොර යෙදූ එලවළු රට පුරා ප්‍රචලිත වේවි. ඒ හරහා තවත් ගමක් හදන්නට අපට ආදර්ශයක් වන්නට හැකිතම් එය අවට ආඩම්බරයක්.

මෙම අතිශ්‍ය ව්‍යාපෘතිය සඳහා උපදේශන දායකත්වය සපයන ලද්දේ ග්‍රාමීය සමාජ සංවර්ධන ආයතනයයි. එහි විධායක අධ්‍යක්ෂ නිමල් පද්මසිරි මහතා මෙම ව්‍යාපෘතිය පිළිබඳ දක්වන්නේ මෙවැනි අදහසකි.

සුදර්ශන ගමේ කාන්තාවන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍ය යේ දැක්ම යථාර්ථයක් කරමින් කාබනික පොහොර සැකසීම ආරම්භ කළා. ඔවුන් මේ සඳහා අපේ රට හදන අගමැතිවරයා දියුරුම් දුන් දිනය තෝරාගැනීම සුවිශේෂ කරුණක්. මෙවැනි දිනයක් සිහි ගන්වමින් කාන්තාවන්ගේ ආර්ථිකය දියුණු කරන වැඩ පිළිවෙලක් ආරම්භ කිරීම මුළු රටටම ආදර්ශයක්. ජනාධිපතිතුමා ගොවි ජනතාවට කාබනික පොහොර ටික දෙන්න හදනකොට අපි ඒ කාබනික පොහොර ටික ගමෙන්ම නිෂ්පාදනය කරලා දෙන්න ඕන. ඒක තමයි අපේ යුතුකම වෙන්නේ. ජනාධිපතිතුමා බලාපොරොත්තු වන්නේ ඉදිරියේදී ශ්‍රී ලංකාවේ ජනතාවට වස විෂ නැති ආහාර වේලක් ලබා දෙන්න. අද වන විට මේ සුදර්ශන ගමේ කාන්තාවන් කාබනික ගෙවතු හදනවා. මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට දායක වන පදවිය සුදර්ශන ගමේ කාන්තාවන්ට අප ස්තුති කරන්න ඕන. අප ආයතනය ඒ සඳහා මඟ පෙන්වමක් කළා. කාන්තාවන් හරිම දක්ෂයි.අදින් පසු මෙම ගමේ ගෙවල් පනහක් මුල්කර ගෙන කාබනික පොහොර නිශ්පාදය ආරම්භ කරනවා.ඒ හරහා රට සශ්‍රීක කිරීමට ලැබීම අප සියලුදෙනාගේම ජයග්‍රහණයක්.

එම කතාව සැබෑවකි. ගමක් හැදේ නම් පළාතක් සශ්‍රීක වේ. පළාතෙන් පළාත සරුසාර වීමෙන් රටකට රන් අරුණාලෝකය උදවේ. සෞභාග්‍යයටත් රටක් බලාපොරොත්තු වන අප සැම ඒ වෙනුවෙන් පෙළ ගැසෙමු.

සටහන සහ ඡායාරූප
හිඳෝගම සමූහ

සේයාරූවට 181යි

ලෝක ඡායාරූප දිනය අගෝස්තු 19 (අදට) යෙදී ඇත.
ඡායාරූපය ලෝකයට හඳුන්වා දී අදට වසර 181 සපිරේ.

ජෝෂප් මික්පෝ

ලුයිස් ඩැගියුස්

ඕ.පී. ෂර්මා

පැරණි කැමරාව

ලෝක ඡායාරූප දිනය සැමරීම ආරම්භ කෙරුණේ මීට වසර විසි නවයකට පෙර 1991 වසරේ දීය. මේ දිනය ලොවට හඳුන්වාදීමට පුරෝගාමී වූයේ ඉන්දීය ජාතික ඡායාරූප ශිල්පියකු සහ ගුරුවරයකු වූ ආචාර්ය ඕ.පී.ෂර්මා තමැත්තෙකි. ආසියානු කලාපයේ පුද්ගලයකු විසින් මෙම ජගත් ක්‍රියාවලිය සිදුකිරීම ශ්‍රී ලංකාවාසි අපටත් ආඩම්බරයකි.

ශ්‍රී ලංකාවිදී ලෝක ඡායාරූප දිනය සැමරීම

ලෝක ඡායාරූප දිනය අගෝස්තු 19 වැනි දින ශ්‍රී ලංකාවිදී සමරනු ලබන්නේ රාජ්‍ය අනුග්‍රහයෙනි. සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ඡායාරූප උපදේශක සභාවේ සංවිධානයෙන් කොළඹ පදනම් ආයතනයේදීය. අගෝස්තු 19 වැනිදු සවස 4.00 ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් සහ ඇමැති විදුර වික්‍රමනායක, අග්‍රාමාත්‍ය ලේකම් ගාමිණී සෙනරත්, උපදේශක මණ්ඩලයේ සභාපති සහ ජාතික රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ, ප්‍රසන්න හෙත්තායක යන මහතුන්ගේ සහභාගිත්වයෙන් සැමරුම් උත්සවය ආරම්භ කෙරේ. විශේෂ ආරාධිත දේශනය සිදු කරනු ලබන්නේ ශ්‍රීපාලි මණ්ඩපයේ ආචාර්ය වියුඩර් විරසිංහ මහතා විසිනි. තම ජීවිතය ඡායාරූප ශිල්පය වෙනුවෙන් කැප කළ හා ඡායාරූප කර්මාන්තයේ යෙදෙන ප්‍රජාව වෙනුවෙන් අනුපමේය මෙහෙයයත් කළ කලාකාමීන් පිරිසක් වෙනුවෙන් සම්මාන ඇගැයීමකට ලක් කිරීම විශේෂ සිදුවීමකි. වසර හැත්තෑවකට ආසන්න කාලයක් ඡායාරූප කලාව පෝෂණය කළ ගුණදාස හෙට්ටිආරච්චි මහතා වෙත ජීවිත කාලයටම ලැබෙන එකම සුවිශේෂී "ඡායාරූපාභිමානී" සම්මානයෙන් පිදුම් ලබන්නේය. මීට අමතරව ඡායාරූප තරගයක් සහ ප්‍රදර්ශනයක් මෙවර පැවැත්වෙන්නේ ඔන්ලයින් ක්‍රමයටය. අන්තර්ජාලය ඔස්සේ රැස් කරන ලද ඡායාරූප විනිශ්චය කර සම්මාන දීම මෙම අවස්ථාවේ සිදු කෙරෙන තවත් විශේෂ අංගයකි.

නවෝත්පාදන

මෙම සුවිශේෂී දිනය සැමරීමට හේතුව වන්නේ ඡායාරූපයක්, එනම් සැබෑ ලෝකයේ වස්තූන් ඒ ආකාරයෙන්ම සටහන් කර ගැනීමට හැකියාව ලැබෙන ආකාරයේ ක්‍රියාවලියක් සිදු කිරීමයි. ප්‍රංශයේ විද්‍යා ඇකඩමිය විසින් මෙම නවෝත්පාදනය ඊට වසර දෙකකට පෙර එනම් 1937 දී ඩැගියුරේ නම් පුද්ගලයෙකුගෙන් මිලදී ගත්තකි. එම වෙළෙඳ ගිවිසුමේ සඳහන් වූයේ විශ්‍රාම වැටුපක් ලෙස වසරකට ෆ්‍රෑන්ක් 6000ක් ඩැගියුරේ වෙනත් තවත් ෆ්‍රෑන්ක් 4000ක් මිය පරලොව ගිය ජෝෂප් නිප්ස් නැමැත්තාගේ උරුමයේ නඩත්තුව සඳහා ගෙවිය යුතු බවයි.

ලෝක ඡායාරූප දිනය සැමරීම සඳහා පාදක වූ තොරතුරු සොයා බැලිය යුතුය. ඊට වසර එකසිය අසූ තුනකි. ඡායාරූපයක ආරම්භය සිදු වන්නේ 1826 වසරේදීය. ප්‍රංශ ජාතික නවෝද්පාදකයකු වශයෙන් නම් දරා සිටි ජෝෂප් මික්පෝ නිප්ස්ගේ ස්ව උත්සාහයෙනි. Heliography හෙවත් ආලෝකයෙන් ඇඳීම පිළිබඳ දැනුවත්වීමක් තිබූ නිසා රිදී ලවන සහ බිටුමින් ආලේපනයෙන් මෙම රූප සටහන් කර ගැනීමට උත්සහ ගත්තේය. කැමරාවක් යොදු ගනිමින් සැබෑ ලෝකයේ වස්තූන් විශාල කාල පරාසයක් යොදු ගනිමින් රූ සටහන ලබා ගත්තත්, ආලෝකයට නිරාවරණයේදී නැවත අඳුරු පැහැ ගැන්වීම නිසා නිසි ප්‍රයෝජනයක් ගැනීමට නිප්ස්ට නොහැකි විය. නමුත් රූපයක් සටහන් කර ගැනීමට මූලික පියවර ඔහු විසින් සොයා ගනු ලැබිය. එය ලෝකයේ පළමු වැනි ඡායාව ලෙස සැලකුණි. (2 වෙනි රූපය-. "ලේ ග්‍රාස් කවුළුවේ දර්ශනය" Le Gras) පරීක්ෂණ කිහිපයක් සිදු කළත් සංවේදි පටය හෝ කඩදාසිය අඳුරු පැහැය වීම ඔහුට විශාල ප්‍රශ්නයක් විය. හෙතෙම මේ ක්‍රියාවලිය තවදුරටත් සිදු කිරීම සඳහා ලුයිස් ජැකියුස් මැන්ඩේ ඩැගියුරේ නැමැත්තකු සමඟ සහයෝගයෙන් පර්යේෂණ කටයුතු සිදු කළේය. නිතර නිතර මත ගැටුම් නිසා මේ දෙපොළ වසර දහයක කාලයක් සඳහා අවබෝධතා ගිවිසුමක් අස්සත් කිරීමට කටයුතු කළේය. අවාසනාවකට මෙන් ජෝෂප් නිප්ස් 1833 දී මිය පරලොව ගියේය.

1860 - 1890 අතර ශ්‍රී ලංකාවේ ඡායාරූපයක්, පොලොන්නරුවේ ගල් විහාරය

තම මහන්සියේ ප්‍රතිඵල සඳහා ඩැගියුරේ විසින් ඩැගුයුරියෝටයිප් නමින් හදුන්වා 1839 ජනවාරි 07 වැනිදු ප්‍රංශයේ විද්‍යා ඇකඩමියට මෙම තවෝද්පාදනය විකුණා දැමූයේ වසරක් පාසා තමාටත් නිප්ස්ටත් විශ්‍රාම වැටුපක් ලැබෙන ආකාරයටය.

ජනගත වූ දිනය

ප්‍රංශ රජය විසින් පේටන්ට් බලපත්‍රය ලබා ගත් අතර ප්‍රංශයේ 25 වැනි අග්‍රාමාත්‍ය ෆ්‍රෑන්කොයිස් අරගෝ විසින් ප්‍රංශ ඇකඩමී ඩෙස් සයන්ස් සහ ඇකඩමී ඩෙස් බියුක්ස් ආර්ට්ස් වෙත ඉදිරිපත් කරමින් ඒ පිළිබඳ පැහැදී 1939 අගෝස්තු මස 19 වැනි දින ඩැගුයුරියෝටයිප් නිෂ්පාදනය ලෝක ජනතාව වෙත ත්‍යාගයක් ලෙස පිරිනැමුවේය. ඡායාරූපයක ක්‍රියාවලිය ජනගත වූ දිනය අගෝස්තු 19 දින ලෙස සැලකෙන්නේ ඒ නිසාය.

හිරු එළිය උපයෝගී කරගනිමින් සැබෑ ලෝකයේ වස්තූන් රූගත කිරීමේදී ගත වන කාලය හෙවත් අනාවරණ කාලය විනාඩියෙන් පංගු දක්වා අඩු කිරීමේ ක්‍රමයක් ඉංග්‍රීසි ජාතික විද්‍යඥයකු සහ තවෝත්පාදකයෙකු වූ විලියම් හෙන්රි ටැල්බට් විසින් හදුන්වා දෙන ලදී. කඩදාසියක් මත පදනම් වූ කැලෝටයිප් සෘණ ඵලක හා ලුණු මිශ්‍රිත ක්‍රියාවලියන්ගෙන් යුත් ක්‍රමයක් ලෙස මෙය හැඳින්විය. මෙතෙක් ඩැගුයිරේගේ ක්‍රමයට තරගකාරීත්වයක් ඇති කළ මෙම ක්‍රියාවලිය අනාවරණ කාලය විනාඩි ගණනක් වෙනුවට තත්පර කිහිපයක් දක්වා අඩු කෙරිණි. මේ අනුව කැමරාවල ක්‍රියාකාරීත්වය තත්පර ක්‍රමයකට වෙනස් විය. අඩු වියදම සහ කාලය කෙටි විය. ඡායාරූප අනාවරණයට විදුරු තහඩු ආදේශ කිරීම මත විශාල ප්‍රගතියක් ලැබුණි.

ලෝක ඡායාරූප දිනය යෝජනා කිරීම

ඕ. පී. ෂර්මා, 1937දී ලෝක ප්‍රසිද්ධ ටජ්මහල් පිහිටා ඇති අග්‍රා නුවර දී උපත්තෙකි. ලක්නව්හි ක්‍රිස්තියානි පාසලක ඉගෙනුම ලැබූ හෙතෙම ලක්නව් විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් ලබා ගත්තේය. භෞතික විද්‍යා අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරමින් ඡායාරූප ශිල්පය වෙත සිත යොමු කළ ඔහු 1958දී දිල්ලි අගනුවරට සංක්‍රමණය වූවේය. සිය බිරිඳ චිත්‍රා සහ එකම පුතා අශිමි සමඟ ජීවත් වන්නේ දිල්ලි අගනුවරට යාබදවය. සිය ආදරණීය බිරිය 2017 දී මිය පරලොව ගියාය. චිත්‍ර ශිල්පය සහ ඡායාරූප ශිල්පය ඉතා ගැඹුරින් ප්‍රගුණ කළ හෙතෙම වෘත්තීය වශයෙන් ඡායාරූප උගැන්වීමෙහි යෙදුණි. ඒ සඳහා ඔහු දිල්ලියේ "ත්‍රිවේනි කලා සංගම්" නමැති අධ්‍යාපන ආයතනය තෝරා ගත්තේය. මීට අමතරව කැමරා ඉමේජ් ඉන්ස්ටිට්යුට්හි අධ්‍යක්ෂ පදවිය දැරීය. ඡායාරූප කලාව තමන් වෙත උගැන්වූ ටී. කාසිනාත් ගුරුවරයා සහ තවත් ජේෂ්ඨයෝ නිතරම සිහිපත් කරන්නේය. 1991 වසරේදී ඉන්දියානු ජාත්‍යන්තර ඡායාරූප කවුන්සලය විසින් ලෝකයේ පළමු වතාවට අගෝස්තු 19 දින ඉන්දියාවේ නව දිල්ලි අගනුවරදී ජාත්‍යන්තර ඡායාරූප දිනය සැමරීම සන්සිටුහන් කරන ලදී. ෂර්මාගේ ජාත්‍යන්තර ක්‍රියාවලි සහ ගෞරවණීයත්වයට භාජනය වූවෙකි. ආචාර්ය උපාධියකින් පිදුම් ලැබූවෙකි. ඉතිහාසය පිළිබඳ දැනුවත් වීම සහ අදාළ සාහිත්‍යය කියවීම නිසා ෂර්මාට ජාත්‍යන්තර ඡායාරූප සැමරුම් දිනයක සංකල්පය තම සිතට ගොඩ නැගෙන්නට ඇත.

ශ්‍රී ලංකාව ඡායාරූප කර්මාන්තය වෙත පැමිණ ඇත්තේ 1860 පමණය. එයට හේතු වූයේ බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් ලෙස පැවැතීමයි. ඒ අනුව එකල සිට වර්තමානය දක්වා ඡායාරූප කර්මාන්තය දියුණුව පවති. ඊටත් වඩා වටිනාකමක් ඇත්තේ ඓතිහාසික වටිනාකමකින් යුත් පැරණි ද ඒ ආකාරයෙන්ම දකබලා ගැනීමට අපට හැකිවීමයි. ඓතිහාසික පසුබිමකින් යුත් නගර වන පොලොන්නරුව, අනුරාධපුරය, සීගිරිය, මහනුවර, දඹුල්ල මෙන්ම තවත් බොහෝ ස්ථාන ආවරණය කරමින් ඡායාරූප විශාල ප්‍රමාණයක් රූගත කර ඇත. ඒවා මේ දක්වා සංරක්ෂණය කර ඇති ස්ථාන බොහෝය. ජන ජීවිතය, පරිසරය, රැකියාව, ජීවන තත්ත්ව ඇතුළු විවිධ මානෘකා යටතේ ඡායාරූපගත කිරීම එකල සිදු කර ඇත. පුරාවිද්‍යා වටිනාකම් ඇති ඡායාරූප සහ පැරණි ඡායාරූපවල එකතුවක් කොළඹ කෞතුකාගාරයේ තැන්පත්ව පවති. රජය මැදිහත්වීමෙන් ඡායාරූප කලාව වෙනුවෙන් කලා මණ්ඩලය යටතේ ඡායාරූප අනු මණ්ඩලයක් ආරම්භ කෙරුණේ 1985 වසරේදී වෝල්ටර් ලද්දුවහෙට්ටි මහතාගේ ප්‍රධානත්වයෙනි. එවකට ඔහු සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් සේවය කළේය.

ප්‍රථම වර්ණ ඡායාරූපය

ලෝකයේ ප්‍රථම වතාවට වර්ණ ඡායාරූපයක් බිහි කරනු ලැබුයේ 1861 වසරේ තෝමස් සුතෝන් විසිනි. කළු සුදු ඇලේපිතයට අවස්ථා කිහිපය තුළ රතු, කොළ, සහ නිල් වර්ණ පැහැ පෙරණයන් එක් කරමිනි. එය එතරම් සාර්ථකත්වයක් පෙන්වූයේ නැත.

*ඔන්ලයින් ක්‍රමයට ලෝක ඡායාරූප දිනය සැමරුම

ඔස්ට්‍රේලියානු ඡායාරූප ශිල්පියකු වන කෝර්ස් ආරා, 2010 වසරේ දී පළමු වරට අගෝස්තු 19 වැනි දින අන්තර් ජාලය හරහා ඔන්ලයින් ක්‍රමයට ලෝක ඡායාරූප දිනය සැමරුමක් සංවිධානය කළේය. ලෝකයේ රටවල් සීයයක් පමණ එක්ව ඡායාරූප 270 ප්‍රදර්ශනයට ඉදිරිපත් කර තිබුණි. ඔවුන් නිව්යෝක්, ලන්ඩන්, ටෝකියෝ, පැරිස්, බීජිං, මොස්කව් සහ බර්ලින් වැනි නගර හරහා ගැලරි සමඟ එක්ව ඔන්ලයින් අකාරයට සම්බන්ධ කිරීමට අදහස් කරයි.

ලෝකයේ මුල් වරට සෙල්ෆි ඡායාරූපයක් සඳහා ලෙන්ස් කැප ඉවත් කර අනාවරණය සිදු කළේ 1839දී ඇමරිකන් ජාතික රොබට් කොර්ලස්ය. එය ප්‍රථම ආලෝකයට නිරාවරණය කළ හැකි කාවද්වාරය සහිත වූවකි. ඩිජිටල් ඡායාරූපයක් අනාවරණය කරනු ලැබුයේ 1957 වසරේදීය. මෙම ඡායාවට පෙර ඩිජිටල් කැමරාවක් නිර්මාණය කළේ කොඩැක් ඉංජිනේරුවෙකු වූ රසල් ක්‍රිෂ් නැමැත්තාය.

අනිල් ලසත් පෙරේරා
පන්නිපිටිය විශේෂ

නවක වධය කරන්නන්ට කිසිදු ලිහිල්හාවයක් දෙන්නෑ

අධ්‍යාපන ඇමැති, මහාචාර්ය ජී.එල්. පීරිස්

නවක වදය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී කිසිදු ලිහිල්හාවයකින් තොර ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ වැදගත්කම පිළිබඳව අධ්‍යාපන අමාත්‍ය, මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා විසින් අවධාරණය කළේය.

අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා, මෙරට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ කරුණු සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිලධාරීන්, විශ්වවිද්‍යාල උපකුලපතිවරුන් සහ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන් සමඟ වෙන් වෙන් වශයෙන් පැවැත්වූ සාකච්ඡාවේදී මෙම කරුණු අනාවරණය විය.

ඒ අනුව, විශ්වවිද්‍යාල කොමිෂන් සභාව සමඟ පැවැත්වූ සාකච්ඡාවේ දී කෝවිඩ් 19 හමුවේ වසා දැමුණු විශ්වවිද්‍යාල නැවත ආරම්භ කිරීම සහ එහි කටයුතු තිසියාකාරව පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කර තිබේ.

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන් සමඟ පැවැත්වූ සාකච්ඡාවේ දී නවක වදය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකර ඇත. නවක වදය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ලිහිල්හාවයකින් තොර ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ ඇති වැදගත්කම පිළිබඳ අමාත්‍යාංශය අවධාරණය කර තිබේ. තවද, නව ලොවට ගැළපෙන පරිදි විෂය නිර්දේශ සකස් කිරීම, රැකියා අපේක්ෂාවන් බලගැන්වීම සඳහා භාෂා පුහුණු වැඩසටහන් පැවැත්වීම, වෘත්තීය උපදේශනය සඳහා ක්‍රමානුකූල ප්‍රතිපාදන ඇති කිරීම සහ විශ්වවිද්‍යාල පද්ධතියෙන් පිටත පුද්ගලයන් විශ්වවිද්‍යාල පාලක මණ්ඩල සහ කවුන්සිලවලට පත් කර ගැනීමේ දී සලකා බැලිය යුතු නිර්ණායක කවරේ ද යන්න සම්බන්ධව ද සාකච්ඡා කර තිබේ.

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පීඨාධිපතිවරුන් සමඟ පැවැත්වූ සාකච්ඡාවේ දී වර්තමානයේ අත්‍යවශ්‍ය කරුණක්ව පවතින විෂය නිර්දේශ සහ ඉගෙනුම් ක්‍රමවේදයන්හි සිදුවිය යුතු වෙනස්කම් කළ යුතු ආකාරය පිළිබඳ අදහස් ලබා ගැනීමට මවුපියන්, ගුරුවරුන්, සිසුන්, ආදී ශිෂ්‍ය සංගම් සහ අදාළ අනෙකුත් පාර්ශ්ව සමඟ මුළු රට ම නියෝජනය වන පරිදි අදහස් විමසීමේ සැසිවාර පැවැත්වීමේ ඇති වැදගත්කම පිළිබඳ කරුණු මතු කරමින් අමාත්‍යවරයා අදහස් දක්වා තිබේ.

දහම් පාසල්, භික්ෂු අධ්‍යාපන, පිරිවෙන් හා බෞද්ධ විශ්වවිද්‍යාල රාජ්‍ය ඇමැති විජිත බේරුගොඩ මහතා ද, විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ සභාපති ජ්‍යේෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා ඇතුළු විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ සාමාජිකයන් පිරිසක් ද , උපකුලපතිවරුන් හා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පීඨාධිපතිවරු ද මෙම සාකච්ඡා සඳහා සම්බන්ධ වූහ.

නිවාස සංවර්ධන අධිකාරියේ මූල්‍ය වංචාවකට නිලධාරීහු 4ක් කොටු වෙති

උපාලි කරුණාරත්න

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සිදු වී තිබෙන මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් නිලධාරීන් සිව් දෙනෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

මේ පිළිබඳව අදහස් දක්වමින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රේණුක පෙරේරා මහතා සඳහන් කළේ, පසුගිය කාලයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ දේශපාලන මෙහෙයුම් මත කරන ලද ක්‍රියාකාරකම් අනුව බරපතල වංචාවක් සිදු වී තිබෙන බව පෙනී ගිය බැවින් ඒ පිළිබඳව රහස් පොලීසියට පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවයි. වංචාවන් පිළිබඳව සිද්ධි ගණනාවක් තිබෙන බවද කී සභාපතිවරයා එක් සිද්ධියක් සම්බන්ධයෙන් සිවි දෙනෙකු අත්අඩංගුවට ගැනීම සිදු වී තිබෙන බවද පැවසීය.

මිලියන හයසිය පහහක පමණ මුදලක් අවභාවිතය සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂණ සිදුකළ බවද පැවසූ සභාපතිවරයා මේ වන විට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයේ නව දෙනෙකුගේ සේවය අත් හිටවා ඇති බව ප්‍රකාශ කළේය.

නොරොච්චෝලෙ විදුලි උත්පාදනය නවතී

මාරවිල සමූහ - මිහිර විජේසේකර

පවතින තාක්ෂණික දෝෂයක් හේතුවෙන් නොරෝච්චෝලෙ ලක්විජය බලාගාරයෙන් ජාතික විදුලි පද්ධතියට විදුලිය ලබා දීම නැවතී ඇති බවත් එය යථා තත්ත්වයට පත්වීමට දින 4කට ආසන්න කාලයක් ගත වනු ඇති බවත් ලංකා විදුලි බල මණ්ඩලයේ මාධ්‍ය ප්‍රකාශක සුලක්ෂණ ජයවර්ධන මහතා පවසයි.

මේ හේතුව නිසා නැවත සිසිලන පද්ධතියට ජලය පුරවා යථා තත්ත්වයට සිසිලන පද්ධතිය සකස් කිරීමට සිදුවන බවද ඒ හේතුවෙන් අඩුම වශයෙන් දින 4කට ආසන්න කාලයක් ගත වනු ඇති බවත් හෙතෙම කියා සිටී. ජාතික විදුලි පද්ධතිය තුළ පෙරේදා (17) ඇතිවූ තාක්ෂණික දෝෂයත් සමඟ රට පුරා සමස්ත විදුලි පද්ධතියම ඇණ හිට තිබුණි.

ජාතික පද්ධතියට නොරෝච්චෝලෙ ලක්විජය බලාගාරයෙන් 45% ක විදුලිය ලබා දීම සිදුවන අතර, මෙහි විදුලිය නිෂ්පාදනය නැවතීමත් සමඟ ජාතික අවශ්‍යතාව සැපයීමේදී බාධා එල්ල වනු ඇති බවට සඳහන් වේ.

කංජිපානි ඉම්රාන්ට වැන්දේ යැයි කියන නියාමක සේවයට වාර්තා කර නෑ

බුද්ධිකා ඉඹුලාන

බ්‍රස්ස බන්ධනාගාරයේ රඳවා සිටින කංජිපානි ඉම්රාත් නමැති විශේෂ ගණයේ සිරකරුවාගේ සිරකුටිය අසලට ගොස් ඔහුට වැන්දේ යැයි කියන බන්ධනාගාර නියාමකයා වවුනියාව බන්ධනාගාරය වෙත මාරු කර යවා සතියක කාලයක් ගත වී ඇතත් මේවන තුරුද ඔහු එම බන්ධනාගාරයේ සේවයට වාර්තා කර නැතැයි බන්ධනාගාර මූලස්ථානය පවසයි.

මෙම නිලධාරියා පසුගිය 11 ද බ්‍රස්ස බන්ධනාගාරයේ සිට වවුනියාව බන්ධනාගාරය වෙත මාරු කර ඇති අතර ඔහු මෙම 15 ද ට පෙර එහි සේවයට වාර්තා කළයුතුව තිබිණි.

එහෙත් මෙම නිලධාරියා දිගින් දිගටම අසනීප නිවාඩු දමා සේවයට වාර්තා නොකර සිටින බව බන්ධනාගාර මූලස්ථානයේ ප්‍රකාශකයෙක් දිනමිණ කීය. මෙම නිලධාරියා බ්‍රස්ස බන්ධනාගාරයේදී කංජිපානි ඉම්රාත් නැමති විශේෂ ගණයේ සිරකරු සිටින සිරකුටිය අසලදී එම සිරකරුට වදින ආකාරය දක්වෙන වීඩියෝවක් පිළිබඳව තොරතුරු පසුගියද ආරක්ෂක ලේකම්වරයා විසින් ද අනාවරණය කරතලදි .

බන්ධනාගාර දෙපාර්තමේන්තුව මේ පිළිබඳව පරීක්ෂණයක් ද ආරම්භ කර තිබේ

තොරතුරු දැනගැනීමේ පනත අහෝසි වන්නේ නම් විරෝධය පළ කරනවා

මන්ත්‍රී හේෂා විතානගේ

ශිවන්ති ප්‍රනාන්දු

ආණ්ඩුව ගෙන ඒමට සූදානම් වන 20 වැනි සංශෝධනයෙන් තොරතුරු දැනගැනීමේ පනත අහෝසි වන්නේ තම් ජනතාව සම්බන්ධ කරගනිමින් එයට විරෝධය පළ කරන ක්‍රියා මාර්ග බිම් මට්ටමට ගොස් ක්‍රියාත්මක කිරීමට සමගි ජන බලවේගය සූදානම් බව එම පක්ෂයේ මන්ත්‍රී හේෂා විතානගේ මහතා පවසයි.

සමගි ජන බලවේගය පක්ෂ කාර්යාලයේ ඊයේ (18) පැවති මාධ්‍ය හමුවකට සහභාගි වෙමින් හෙතෙම මේ බව පැවසීය.

සංශෝධනය විය යුතු ඇතැම් කාරණා 19 වැනි සංශෝධනයේ තිබෙන්නේ තම් ඒවා සංශෝධනය කළ යුතු නමුත්, එහි සාධනීය ලක්ෂණ සංශෝධනය කිරීමට ඉඩ නොදෙන බව කී හේෂා විතානගේ මහතා වැඩිදුරටත් මෙසේද කීය.

ආණ්ඩුව ගෙන එන 20 වැනි සංශෝධනය හරහා රටේ ජනතාවට වාසි තත්ත්වයක් නිර්මාණය නොවෙනවා නම්, ඒක දේශපාලන වාසි පිරිමහගන්න දෙයක් නම් සමගි ජන බලවේගය එයට කොන්දේසි විරහිතව විරුද්ධ වෙනවා. ඒ වෙනුවෙන් පාර්ලිමේන්තුවේ සිට අත් ඔසවන්නේ නැතිව කතා කරමින් පමණක් නොසිට බිමට ගිහිල්ලා ජනතාවත් එක්ක විරුද්ධ වෙන්න අපි පක්ෂයක් විදිහට කටයුතු කරනවා.

එජාප නායකත්වය භාර ගෙන ජයග්‍රහණය කරා මෙහෙයවනවා

රුවන් විජේවර්ධන

ශිරෝමි අබයසිංහ

එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය භාර ගෙන පක්ෂය යළි ජයග්‍රහණය කරා මෙහෙයවීමට තමා සූදානම් බව එහි නියෝජ්‍ය මහ ලේකම් රුවන් විජේවර්ධන මහතා පවසයි. පක්ෂයේ සියලු දෙනාගේම සහයෝගය ලබා ගෙන පක්ෂය යළි ප්‍රතිසංවිධාන කිරීමට තමා බලාපොරොත්තු වන බව සඳහන් කළ විජේවර්ධන මහතා ප්‍රතිසංවිධාන කටයුතු සම්බන්ධයෙන් තමා වාර්තාවක් සකස් කර ඇති බවත් ඉදිරියේ දී එය පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට ඉදිරිපත් කරන බවත් කීය.

තමා නායකත්වයට පත් වීම ගැන පක්ෂයේ කිසිවකුගේ විරුද්ධත්වයක් නොමැති බවත් කෘත්‍යාධිකාරී මණ්ඩලය, හිටපු මන්ත්‍රීවරුන් සහ පසුගිය මැතිවරණයට තරග කළ සියලු අපේක්ෂකයන්ගේ අදහස් ලබා ගෙන පක්ෂය යළි ගොඩ ගැනීමට තමාට හැකි බවත් රුවන් විජේවර්ධන මහතා පැවසීය.

ඉදිරියේ දී පැවැත්වීමට නියමිත පළාත් සභා මැතිවරණයට එක්සත් ජාතික පක්ෂය තරග කරන බවත් මේ අවස්ථාවේදී ජයග්‍රහණය කිරීම අමාරු කටයුත්තක් වුවත් පක්ෂය ප්‍රතිසංවිධාන කිරීමෙන් පසු සැලකිය යුතු ජයග්‍රහණයක් කිරීමට හැකි බව තමාට විශ්වාස බවද ඒ මහතා කීය.

රුවන් විජේවර්ධන මහතා මේ බව සඳහන් කළේ ඉකුත් සති අන්තයේ සිරිකොත පක්ෂ මූලස්ථානයේ පැවති රැස්වීමකින් පසු මාධ්‍ය වෙත අදහස් දක්වමිනි.

ගුවන් තොටුපළ කඩිනමින් විවෘත කර සංචාරකයන්ට පැමිණීමට අවස්ථාව සැලසා දෙනවා

සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග

නිමල් රාජපක්ෂ-මහින්ද අලුත්ගෙදර

ගුවන් තොටුපළ කඩිනමින් විවෘත කර සංචාරකයන්හට මෙරටට පැමිණීමට අවස්ථාව ලබාදීමට රජයේ අවධානය යොමුව තිබේ.

ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ කැබිනට් මණ්ඩලය දැනුවත් කොට විශේෂ කැබිනට් පත්‍රිකාවක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන බව සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

සංචාරක කේෂ්ත්‍රයේ නියුතු සංවිධාන 49ක නියෝජිතයන් සමඟ ඊයේ (18) පැවැති විශේෂ සාකච්ඡාවක දී ඇමැති ප්‍රසන්න රණතුංග මහතා මේ බව සඳහන් කළේය.

කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ දී පැවැති මෙම රැස්වීමට මුදල් අමාත්‍යාංශයේ, මහ බැංකුවේ හා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු ද සහභාගී වූහ.

ඇමැති ප්‍රසන්න රණතුංග මහතා මෙහිදී කියා සිටියේ ඉතා ඉක්මනින් රට සංචාරකයන්ට විවෘත කිරීමට අපේක්ෂා කරන බවයි. ගුවන්තොටුපළ කඩිනමින් විවෘත කිරීම සම්බන්ධයෙන් රජය අවධානය යොමුකර ඇති බවත්,සංචාරකයන්ට රට විවෘත කිරීමත් ගුවන්තොටුපළ විවෘත කිරීමත් එක හා සමාන බැදුණු කාරණා දෙකක් බවත් ඇමතිවරයා කීවේය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දක්වූ ප්‍රසන්න රණතුංග මහතා මෙසේද කීවේය. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ලෝකයේ වැඩි වශයෙන්ම බිඳ වැටුණු කේෂ්ත්‍රයක් තමයි සංචාරක කේෂ්ත්‍රය. එය නැවත නගා සිටුවීම ලේසි පහසු කටයුත්තක් නෙවෙයි. කොවිඩ් 19 නිසා සංචාරක කේෂ්ත්‍රයේ නියුතු වූවන්ට සහන සැලසීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. මැතිවරණ

කොමිසම එහි ගෙවීම් කටයුතු ද සීමා කළා. අපි එහි ගෙවීම් නැවත ආරම්භ කලත් එහි කිසියම් ප්‍රමාදයක් තිබෙන බව පේනවා. සති දෙකක් තුළ මෙම සහන සැලසීමේ වැඩසටහනේ තිබෙන අඩුපාඩු මහඟරවීමට වහාම පියවර ගත යුතුයි. තවදුරටත් මෙම සහන සැලසීමේ වැඩපිළිවල ප්‍රමාද කරන්න එපා. මෙරට සංචාරක කේෂ්ත්‍රයට අදාල ආයෝජන අවස්ථා පුළුල් කිරීමට රජය

තීරණය කර තිබෙනවා. ඒ අනුව සංචාරක කේෂ්ත්‍රයේ ආයෝජන අවස්ථා පුළුල් කිරීමට අවශ්‍ය සෑම පියවරක්ම අපි ගන්නවා. සමහර මූල්‍යායතන සංචාරක කේෂ්ත්‍රයේ නියුතු වූවන්ට රජය ලබාදෙන ලීසිං හා ණය පහසුකම් ලබා නොදෙන බවට අපට තොරතුරු වාර්තා වී තිබෙනවා. එවැනි ආයතන සම්බන්ධයෙන් අපි මහ බැංකුවට වාර්තා කරනවා. මොකද රජය විසින් ලබා

දුන් සහනයක් කිසිවෙකුටත් නොදී ඉන්න බෑ.එකිනෙකාට චෝදනා කරමින් පහුගිය කාලයේ සිදු වූ දේවල් ගැන කතා කර කර ඉදලා වැඩක් නෑ. දැන් අපි වැඩ කරන්න ඕනෑ. ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවට ඉතා ඉක්මනින් ගුවන්තොටුපල විවෘත කරලා සංචාරකයන් මෙරටට ගෙන්වා ගැනීමට අවශ්‍යයි. අපේ වගකීම තමයි ඉතා ඉක්මනින් එය ඉටුකර දීම.

සංචාරක අමාත්‍යාංශයේ ලේකම් එස්.හෙට්ටිආරච්චි මහතා අදහස් දක්වමින් ,සංචාරක කේෂ්ත්‍රයේ අසිරුම කාලය තමයි මේ ගෙවන්නේ. අපට සංචාරක කේෂ්ත්‍රයේ සපූරා ගතයුතු ඉලක්ක රාශියක් තිබෙනවා.කොවිඩ් 19 වසංගතය නිසා සංචාරක කේෂ්ත්‍රය බිඳවැටුණා. එය නතා සිටුවීම් සඳහා අපට කෙටි කාලීන හා දිගු කාලීන විසඳුම් අවශ්‍ය වෙනවා. ඒ දිගු කාලීන හා කෙටි

කාලීන විසඳුම් අප මේ වනවිට හඳුනාගෙන තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කිරීමට සංචාරක කේෂ්ත්‍රයේ නියුතු සියඑදෙනාගේ සහය අවශ්‍යයි.

සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිනී කිමාලි ප්‍රනාන්දු මහත්මියද මෙහිදී කතා කළාය.

ඉදිරි පස් අවුරුදු සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය සියලු පහසුකම් ආයතනවලට ලබා දෙනවා

රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ

උපාලි කරුණාරත්න

තම අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන වලට ඉදිරි පස් අවුරුදු සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය කරන මූල්‍යමය සහාය ඇතුලු සියලු පහසුකම් ලබාදීමට කටයුතු කරන බව ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ මහතා පැවසීය.

රාජ්‍ය ඇමැතිවරයා එසේ ප්‍රකාශ කළේ ඊයේ(18) කොළඹ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රගති සමාලෝචන රැස්වීමට සහභාගි වීමට පෙර මාධ්‍ය වෙත අදහස් දක්වමිණි.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වූ රාජ්‍ය ඇමැතිවරයා-

පසුගිය කාලයේ මූල්‍ය අවභාවිතා කළ පුද්ගලයන් ඒවාට වගකිව යුතුයි. හිටපු ඇමැතිවරයාද ඒ සම්බන්ධයෙන් වග කියන්න ඕනෙ. එම කටයුතු පිළිබඳව සොයා බැලීම අප දැන් නීතිමය රාමුවක් තුළ ක්‍රියාත්මක වෙනවා. එය මේ වන විට වැරදිකරුවන් අත්අඩංගුවට ගැනීම්, බන්ධනාගාර ගත කරන තත්ත්වයට පැමිණ තිබෙනවා. මේවා ගැන අප අඩබෙර ගහන්නෙ නැහැ.

වත්මන් රජය වේගවත් සංවර්ධනයක් ක්‍රියාත්මක කරනවා. නිවාස දහතර දහසේ ඉලක්කය සම්පූර්ණ කිරීමට පසුගිය මාස තුන් හතර තුළ නිවාස පත්දහසකට ආසන්න ප්‍රමාණයක් ඉදි වෙමින්, වැඩ නිමවෙමින් තිබෙනවා. ඉතිරි නිවාස වලට අවශ්‍ය මුදල් සහ අවශ්‍ය දේ ලබාදීම පිළිබඳව අප සාකච්ඡා කරනවා.

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය යථාර්තයක් බවට පත් කිරීම සඳහා සුදුසු වටපිටාවක් මේ වන විට ඇති වී තිබෙනවා. අප ඉදිරි පස් අවුරුද්දේදී අපේ සැලසුම් ක්‍රියාත්මක කරමු. ඒ සඳහා අවශ්‍ය දේ, පහසුකම් ලබාදීමට අප කටයුතු කරනවා.

අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ටත් උපාධි රැකියා දෙන්න

ප්‍රේමනාත් සී දොළවත්ත රජයෙන් ඉල්ලයි

අසේල ලියනගේ

උපාධිධාරී රැකියා 50,000ක් ලබාදීමේ වැඩසටහන යටතේ දැනට රැකියාවක නිරතවී සේවක අර්ථ සාධක අරමුදලට දායකවී සිටින අයදුම්කරුවන්ට ද රැකියා අවස්ථා ලබාදෙන ලෙස ජනාධිපතිවරයාගෙන් සහ අගමැතිවරයාගෙන් ලිඛිතව කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී දොළවත්ත මහතා ඊයේ (18) දින ඉල්ලා සිටියේය.

අභ්‍යාසලාභී පුහුණුව සඳහා ලබාදී ඇති ඇතැම් පත්වීම් එම අභ්‍යාසලාභීත් විසින් රැකියාවක නිරතවී සේවක අර්ථ සාධක අරමුදලේ දායකත්වය හිමි වීම නිසා අවලංගු කර ඇති බවට තමාට කිහිපදෙනකු පැවසූ බවත් ඔවුන් ඉදිරිපත් කරන සාධාරණ කරුණු සලකා බලා ඔවුන්ට ද රැකියා අවස්ථා ලබාදෙන ලෙස දෙලවත්ත මහතා රජයෙන් ඉල්ලා සිටියි.

උපාධිය අවසන් කිරීම දක්වා මවුපියන්ට බරක් වී උපාධිය ලබාගත් පසුවත් මවුපියන් මතම යැපීමට නොහැකි බැවින් කුමන හෝ රැකියාවක නිරත වී පවුලට බරක් නොවී සිටීමේ චේතනාවෙන් රැකියාවේ නිරත වී සිටි උපාධිධාරීන් ද ඉහත අවලංගු කර ඇති පත්වීම් අතර ඇති බව ඒ මහතා පෙන්වා දෙයි. රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ අධ්‍යාපනයට සුදුසු රැකියාවක් ලැබෙන තෙක් දෛනික පදනම මත හෝ කොන්ත්‍රාත් පදනම මත සාමාන්‍ය මට්ටමේ ආයතනවල රැකියාවල නියුතුව සිටින ලද උපාධිධාරීන් ද මෙකී අවලංගු කර ඇති පත්වීම් අතර ඇති බවද ඒ මහතා එම ලිපියේ සඳහන් කර ඇත.

එම කරුණු මත ඔවුන්ගේ අභ්‍යාසලාභී පත්වීම් අවලංගු කිරීම සාධාරණ නොවන හෙයින් ඔවුන් හට සාධාරණයක් ඉටු කර දෙන ලෙස දෙලවත්ත මහතා රජයෙන් ඉල්ලා සිටියි.

සම්පායෝ ඇතුළු නිලධාරීහු යළි රිමාන්ඩ්

මීගමුව බන්ධනාගාරයේ හිටපු අධිකාරී අනුරුද්ධ සම්පායෝ ඇතුළු සැකකාර බන්ධනාගාර නිලධාරීන් සිව් දෙනා තවදුරටත් රක්ෂිත බන්ධනාගාරගත කිරීමට ඊයේ (18) මීගමුව මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය.

එම නිලධාරීන් අද (18) මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලබන අගෝස්තු 31 වැනි දා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට මහේස්ත්‍රාත්වරයා නියෝග කර තිබේ.

මීගමුව බන්ධනාගාරයේ හිටපු අධිකාරී අනුරුද්ධ සම්පායෝ මහතා පසුගිය 02 වැනි දා පොලීසියට භාරවීමෙන් පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් අත්අඩංගුවට ගනු ලැබිය. අනතුරුව ඔහු අගෝස්තු 4 වැනි දින අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාර ගත කෙරිණි.

පසුගිය මාස 18 දී ළමා අපයෝජන සිද්ධි 12,968ක්

ළමා ආරක්ෂණයේ නඩු 851ට බසී

නීතිපති දෙපාර්තමේන්තුව

කුමුදු හෙට්ටිආරච්චි

වසර එතහමාරක කාලයක් තුළ පොලීසිය විසින් උපදෙස් පතා ඉදිරිපත් කර තිබූ ළමා අපචාර හා හිංසා සම්බන්ධ නඩු 12968ක විමර්ශන අවසන් කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව කටයුතු කර ඇති බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධරිණී රජයේ නීතීඥ නිශාරා ජයරත්න මෙණෙවිය පැවසුවාය .

නීතිපති උපදෙස් වෙනුවෙන් නවකත් ඉතිරිව ඇත්තේ ළමා අපචාර හා හිංසා සම්බන්ධ නඩු ගොනු 851ක ප්‍රමාතයක් පමණක් බව සඳහන් කරන රජයේ නීතීඥ නිශාරා ජයරත්න මෙණෙවිය ඉතිහාසයේ ප්‍රථම වතාවට එය නීතිපති දෙපාර්තමේන්තුවේ ළමා අපචාර අංශය විසින් තබන ලද වාර්තාවක් බවද පැවසුවාය.

නීතිපති දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ගේ කැපවීම හා නීතිපතිවරයාගේ නිසි මගපෙන්වීම ඊට හේතුවූ බවද නිශාරා ජයරත්න මෙණෙවිය වැඩිදුරටත් පැවසුවාය.

තවද නීතිපතිවරයාගේ උපදෙස් අනුව නඩු 6149කට සම්බන්ධ සැකකරුවන්ට මහාධිකරණ හමුටෙව් නඩු පැවරී අතර මහේස්ත්‍රාත් අධිකරණ හමුවේ නඩු 2447 පැවරී ඇත.

2019 ජනවාරිමස හා 2020 ජූලි මාසය තුළ සිදුකල මෙම උඩත ගොනු නිරීක්ෂණයන් අනතුරුව සැකකරුවන් 4372 ක් නිදහස් කිරීමටද නීතිපතිවරයා පොලිසියට උපදෙස් ලබාදී ඇති බව රජයේ නීතීඥ නිශාරා ජයරත්න මෙනෙවිය වැඩිදුරටත් පැවසුවාය.

ඉවත දමන මත්පැන් බෝතල් හා කෑන් ප්‍රතිචක්‍රීකරණයට

සුරාබදු දෙපාර්තමේන්තුවෙන් වැඩපිළිවෙළක්

අනුර ප්‍රේමලාල්, අසේල ලියනගේ

ඉවත දමන මත්පැන් බෝතල් හා කෑන් ආපසු මිළට ගැනීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සුරාබදු දෙපාර්තමේන්තුව කටයුතු කර තිබේ.

ශ්‍රී ලංකාව තුල වාර්ෂිකව ඉවත දමන මිලියන ගණනක් වූ මත්පැන් බෝතල් හා කෑන් පරිසරයට බැහැර කිරීම හේතුකොට ගෙන ඇතිවන පරිසර දූෂණය වැළැක්වීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා තිබේ.

මෙම තීරණය ගෙන ඇත්තේ පසුගිය වර්ෂයේ සංඛ්‍යා ලේඛණවලට අනුව මත්පැන් සහිත ධාරිතාවන්ගෙන යුතු විදුරු බෝතල් මිලියන 300කට අධික ප්‍රමාණයක් සහ ලෝහ කෑන් මිලියන 160ක් පමණ වසරක දී අලෙවි වන අතර එම විදුරු බෝතල සහ ලෝහ කෑන් වලින් වැඩි ප්‍රමාණයක් නැවත භාවිතයකින් හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීමකින් තොරව පරිසරයට එකතු වීම තිරීක්ෂණය කර තිබේ.

මෙම විදුරු බෝතල නැවත භාවිතය සඳහා එකතු කර ගැනීම පිණිස මත්පැන් කර්මාන්තකරුවන් විසින් ඒවා මත නැනපතු මුදලක් තබාගැනීම සිදු කරන ලද නමුත් එම මත්පැන් බෝතලයක සාපේක්ෂ වටිනාකම අඩුවීම, ඒවා එකතු කිරීමේ හා ප්‍රවාහනය කිරීමේ අපහසුව හා ඒවායේ භූගෝලීය විසිරීම යන හේතූන් මත එම බෝතල් නැවත එකතු කිරීම දුෂ්කර වී තිබේ.

හිස් මත්පැන් කෑන් අලෙවි කරන මත්පැන් වෙළඳ බලපත්‍රලත් ස්ථාන ආශ්‍රිතව එම කෑන් තැලීමේ සරල යන්ත්‍ර සවිකිරීමට යෝජනා වී ඇති අතර ඒ අනුව හිස් කෑන් එම යන්ත්‍ර මගින් තලා ආපසු භාරදී මුදල් ලබාගත හැකි ක්‍රමවේදයක් හදුන්වා දීමට යෝජනා වී ඇත.

සමෘද්ධිලාභීන් ඉලක්ක කරගෙන රටේ සමස්ත ආර්ථිකය සවිබල ගන්වනවා

ඇමැති ශෙහාන් සේමසිංහ

සමන්ති මිරියගල්ල - කඩුවෙල සමූහ

සමෘද්ධිලාභීන් ඉලක්ක කර ගත් ආර්ථිකය සවිබල ගැන්වීමේ වැඩසටහන රටේ සමස්ත ආර්ථිකයට ගැලපෙන ලෙස ගොඩනැංවීම තම අමාත්‍යාංශයේ වගකීම බව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් ඇමැති ශෙහාන් සේමසිංහ මහතා පැවැසීය.

ඇමැතිවරයා මේ බව පැවැසුවේ පෙරේදා (17) බත්තරමුල්ල, සෙත්සිරිපායේ පිහිටි අමාත්‍යාංශයේදී සිය ධුරයේ වැඩ භාරගැනීමේ අවස්ථාවට එක් වෙමිනි.

මුදල්, බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු නාගරික කටයුතු නිවාස ඇමැති, අගමැති මහින්ද රාජපක්ෂ මහතා ද මේ අවස්ථාවට සහභාගී විය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

"අද අපට රටේ ආර්ථිකය ගොඩ නංවන්න විශාල වගකීමක් තිබෙනවා. ඒ වගේම ජනතා කේන්ද්‍රීය ආර්ථික අභිලාස ඉටු කරන්න තිශ්චිත වගකීමක් පවරලා තිබෙනවා. ක්ෂුද්‍ර මූල්‍ය ආයතන, සේවා පහසුකම් ශක්තිමත් කිරීම, ස්වයං රැකියා අවස්ථා පුළුල් කිරීම, කුඩා හා මධ්‍ය පරිමාණ ප්‍රවර්ධනය, දේශීය නිෂ්පාදන පුළුල් කිරීමේ වැඩසටහන් සෞභාග්‍යයේ දැක්ම යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනවා. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට සහන ලබාදීමට කටයුතු කිරීමේ දී හඳුනා ගත් මූලික ගැටලුවක් ලෙස කර්මාන්ත කරගෙන යෑමේදී සේවා සැපයීමට එක් මධ්‍යස්ථානයක් නොමැතිකම හඳුන්වා දිය හැකියි. ඒ වෙනුවෙන් එක් සේවා මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීමටත්, ආබාධිත තැනැත්තන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ඔවුන් සවිබල ගැන්වීමටත් කටයුතු කරනවා. පසුගිය යහපාලන කාලයේ නිලධාරීන් වශයෙන් ඔබ විශාල තෛතික ගැටලු රැසකට මුහුණ දී තිබෙනවා. නිවැරැදිව ගත්තා තීරණවලදී ඔබ ආරක්ෂා කිරීමට අප බැඳී සිටිනවා. ඒ සඳහා සහයෝගය සහ ශක්තිය අප වෙත ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා."

උතුරු මැද පළාතේ ප්‍රධාන සංඝනායක නුගේතැන්තේ පඤ්ඤතන්ද හිමියන් ඇතුළු මහා සංඝරත්නය ද, මුදල් අමාත්‍යාංශයේ ලේකම් එස්. ආර්. ආටිගල, සමෘද්ධි අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම් අශෝකා අලවත්ත, සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ බන්දුල තිලකසිරි මහත්ම මහත්මිහු ද මේ අවස්ථාවට එක්ව සිටියහ.

ලක්ෂ හැත්තෑවක් ජනතාව වේල් දෙකක් බඩගින්නේ සිටී නම් කුමන දේශපාලනයක් කළත් වැඩක් නෑ

රාජ්‍ය ඇමැති අරුන්දික ප්‍රනාන්දු

ශිවන්ති ප්‍රනාන්දු

නිදහස ලැබ වසර හැත්තෑවක් ගෙවී තිබියදීත් ලක්ෂ හැත්තෑවක් ජනතාව වේල් දෙකක් බඩගින්නේ සිටින්නේ නම් කුමන දේශපාලනයක් කළත් පලක් නොවන බව වැවිලි කර්මාන්ත රාජ්‍ය ඇමැති අරුන්දික ප්‍රනාන්දු මහතා පැවැසුවේය.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව පැවැසුවේ ඊයේ (18) සිය ධුරයේ වැඩ භාරගැනීමෙන් අනතුරුව පැවති මාධ්‍ය හමුවේදීය.

වැවිලි කර්මාන්ත කැබිනට් ඇමැති රමේෂ් පතිරණ මහතා ද මේ අවස්ථාවට සහභාගී විය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය.

'ජනපති ගෝඨාභය රාජපක්ෂ, අගමැති මහින්ද රාජපක්ෂ, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන, බැසිල් රාජපක්ෂ මහත්වරුන් ඇතුළු රජයට සම්බන්ධ සියලු දෙනාටම මා මුලින්ම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම සෞභාග්‍යයේ දැක්ම සමඟ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයෙන් විදේශ විනිමය උපයා රටේ ආර්ථිකයට දායකත්වයක් ලබා දෙන්නට, දුප්පත්කම නැති කරන්නට රමේෂ් පතිරණ කැබිනට් ඇමැතිවරයා ඇතුළු ඇමැතිවරුන් තිදෙනකුට විෂයයන් භාරදී මේ දැක්වූ සහයෝගයට මා ස්තුතියි. අවුරුදු හැත්තෑවක් නිදහස ලැබී කෝටි දෙක හමාරකට ආසන්න ජනතාවක් ජීවත් වන රටේ ලක්ෂ හැත්තෑවක් වේලක් කාලා, වේල් දෙකක් බඩගින්නේ ඉන්නවා නම් අප මේ මොන දේශපාලනය කළත් වැඩක් නෑ. ගේ හදගන්න බැරිව, ගෙදරට වැසිකිළියක් නැතිව, ගෙදරට කාමර දෙකක් හදා ගන්න බැරිව ජනතාව ඉන්නවා නම් අප මොන දේශපාලනය කළත් වැඩක් නෑ. දරිද්‍රතාවෙන් ඉහළට ගිය වෙලාවක, ජනතාවගේ ආර්ථිකය කඩා වැටුණු වෙලාවක එයින් ගොඩ ඒමට දැවැන්ත දායකත්වයක් මේ අමාත්‍යාංශය යටතේ ඉදිරියේදී ලබා දෙන්න පුළුවන් වෙයි. විශේෂයෙන් අපත් සමඟ පාර්ලිමේන්තුවේ සමකාලීන මිතුරන් ලෙස 2010 දී පාර්ලිමේන්තුවට පත් වූ රමේෂ් පතිරණ මහතා හොඳ ඇමැතිවරයෙක්, ඉතා හොඳ උගත් වෛද්‍යවරයෙක්. ජාතක වක්කුඹුර, කතක හේරත් මහත්වරුන්ටත් මේ අභියෝගය භාර දී තිබෙනවා. පුළුල් දැක්මක් තිබෙන ලේකම්වරයෙක් සහ රාජ්‍ය නිලධාරීන් පිරිසක් අපට සිටිනවා.

"අපට තිබෙන්නේ ඉදිරි කාලයේදී වැඩ කරන්න. මේ රටට විදේශ විනිමය ගෙනෙන ප්‍රධාන අංශවලින් එකක් තමයි වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය. අනෙක් අංශ ඇහලුම් ක්ෂේත්‍රය. අපේ රටේ කාන්තාවන් පිරිසක් මැද පෙරදිග මෙහෙකාර සේවය කරමින් පුදුම දුකක් විඳිනවා. එයින් රටට විදේශ විනිමය ගේනවා. මේ ගැහැන් අවධානය යොමු කළ යුතුයි. ඒ වගේ පුන්තලම් දිස්ත්‍රික්කයේ පොල් ත්‍රිකෝණයට අයත් පොල් ආශ්‍රිත කර්මාන්ත දියුණු කර, පොල් වගාව වැඩි කර, පොල් ඉඩම් ආරක්ෂා කර, නව ප්‍රභේද හඳුන්වා දී, ඒ ආශ්‍රිත කර්මාන්ත තව තවත් දියුණු කළ යුතුයි. එක් කාලයකදී මේ රටේ ප්‍රධානතම විදේශ විනිමය උපයන අංශයක් වුයේ රබර් කර්මාන්තය. රබර් පිටරටින් ගනෙ ඒම අවම කර, අපේ රබර් නිෂ්පාදනය වැඩි කර, රබර් කර්මාන්තය තංවන්න පුළුවන් තම් ඒක ලොකු දෙයක්. උතුරු නැගෙනහිර පළාත් ආශ්‍රිත තල් කර්මාන්ත දියුණුවට තල් සංවර්ධන අධිකාරිය, මණ්ඩලය වගේම ආයතන වෙනම පිහිටුවා ඒ ප්‍රදේශවල ජනතාව සම්බන්ධ කරගෙන එම කර්මාන්ත දියුණු කිරීම ඊළඟ අරමුණයි. කුරුණෑගල, හලාවත වැවිලි සමාගම්වලින් උපරිම ප්‍රයෝජනය ගෙන ජනතාවට අවශ්‍ය කරන කෝමාරිකා, කහ, ගම්මිරිස්, අන්නාසි වැනි යටි වගාවන් දියුණු කරන්නට අප බලපොරොත්තු වෙනවා. අපේ අමාත්‍යාංශය යටතේ සත්ත්ව ගොවිපොළ ප්‍රවර්ධනයටත් කටයුතු යොදා තිබෙනවා. මෙතැන සිට සියලු දෙනාගේම සහයෝගය මා බලාපොරොත්තු වෙනවා. සෞභාග්‍යයේ දැක්ම ඉදිරියට ගෙන යෑමට අප කටයුතු කරනවා."

ජායාරූපය - සමන් ශ්‍රී වෙදගේ

ඉදිරි වසර දහයේදී සියයට 80ක් පුනර්ජනනීය බලයෙන් විදුලිය නිපදවනවා

රාජ්‍ය ඇමැති දුමින්ද දිසානායක

සන්ධ්‍යා කරුණාරත්න

ඉදිරි වසර දහයේදී සියයට 80ක් පුනර්ජනනීය බලයෙන් විදුලිය නිපදවන ලෙසට ජනාධිපතිවරයා ලබා දුන් වගකීම ඒ ආකාරයෙන්ම ඉටු කිරීමට පියවර ගන්නා බව සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය ඇමැති දුමින්ද දිසානායක මහතා පැවැසුවේය.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව පැවැසුවේ ඊයේ (18) විදුලිබල අමාත්‍යාංශ පරිශ්‍රයේදී නව ධුරයේ වැඩ භාර ගනිමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය.

"දේශීය කර්මාන්ත ව්‍යාපෘති නගාසිටුවීමට පෞද්ගලික අංශයේ ව්‍යාපාරිකයන්ගේ සහ විද්වතුන්ගේ සහාය අපේක්ෂා කරනවා. 2030 වන විට සියයට 80ක් පුනර්ජනනීය බලයෙන් විදුලිය නිපදවීමේ වගකීම ජනාධිපතිවරයා විසින් භාරදී තිබෙනවා. මේ වසර පහ සඳහා ගෘසට් පත්‍රයකින් එම කාර්යය පවරා තිබෙනවා. 2020 සිට 2025 දක්වා සිදු කළ යුතු කාර්යයන් එහි සඳහන් කර තිබෙනවා. පුනර්ජනනීය බලය නිෂ්පාදනයේදී එය සම්ප්‍රේෂණය කිරීමේ බලය තිබුණේ විදුලිබල මණ්ඩලයට. එම නිසා විදුලිබල මණ්ඩලයේ පූර්ණ සහාය අප බලාපොරොත්තු වෙනවා. මෙරට ඉතිහාසයේ සියයට සියයක්ම පුනර්ජනනීය බලයෙන් විදුලිය නිෂ්පාදනයට අප ආරම්භයක් ලබා දුන්නා. ලෝකයේ වෙනත් රටවල් පුනර්ජනනීය බලය භාවිත කළේ පසුකාලීනව. පුනර්ජනනීය බලයට ආරම්භයක් ලබා දුන්නත් එය ඉදිරියට ගෙන යෑමට අපොහොසත් වුණා. දෙවෙයේ සරදමට වගේ විදුලිය ජනනය කිරීමට පුනර්ජනනීය බලය නැවත යොදාගැනීමට සිදු වෙලා. ජනාධිපතිවරයාගේ අපේක්ෂාව අනුව ඉදිරි වසර දහයේ පුනර්ජනනීය බලය සියයට 80ක් දක්වා ඉහළ නැංවීමට අවශ්‍ය සියලු කාර්යයන් සිදු කරනවා. ඒ සඳහා සියලු දෙනාගේ සහාය අවශ්‍යයි. පෞද්ගලික ව්‍යාපාර අංශය මේ කාර්යයට වඩාත් වැදගත් වෙනවා. දේශීය කර්මාන්තයට තාක්ෂණය ගෙන ඒම සඳහා ඔවුන්ට අප ආරාධනා කරනවා. මේ ක්ෂේත්‍රය කෙරෙහි හොඳ දැනුමක් සහ කැමැත්තක් තිබෙන පුද්ගලයන් බොහෝ පිරිසක් රටේ සිටිනවා. අප සමඟ එක් වන ලෙස ඔවුන්ට ආරාධනා කරනවා.

පුනර්ජනනීය බලයෙන් විදුලිය නිෂ්පාදනයට බොහෝ අය බලා සිටියත් අතරමඟ නැවතුණු විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේ අමාත්‍යාංශය මට භාර දෙන විට ජනාධිපතිවරයා මතක් කළේ මේ ගැටලුවලට විසඳුමක් ලබා දෙන ලෙසයි. පුනර්ජනනීය විදුලිය නිෂ්පාදනය සඳහා වන ඇමැතිවරයා ලෙස මට ලබාදීමට හැකි උපරිම ශක්තිය ලබා දෙනවා. දැනට නැවතී තිබෙන ව්‍යාපෘතිවලට නායකත්වය ලබාදීම මා සිදු කරනවා. පුනර්ජනනීය විදුලිය නිපදවීමට විශාල මුදලක් වැය වෙනවා. දෙස් විදෙස් රටවලින් ද සහාය ලබා ගැනීමට අපේක්ෂා කරනවා."

විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම, පරිසර ඇමැති මහින්ද අමරවීර, කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්වරු ද මේ අවස්ථාවට සහභාගි වූහ.

ජායාරූපය - සාලිය රූපසිංහ

ජනතා සේවයට සද්භාවයෙන් එකතු වන විපක්ෂයේ ඕනෑම මන්ත්‍රීවරයකු ආණ්ඩුවට භාරගැනීමට සූදානම්

රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත

මහින්ද අලුත්ගෙදර

සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙළට ශක්තියක් වෙමින් රට ගොඩනැඟීමට සහ ජනතාවට සේවය කිරීමට සද්භාවයෙන් දායකවීමට හැකි විපක්ෂයේ ඕනෑම මන්ත්‍රීවරයකු ආණ්ඩුවට භාරගැනීමට සූදානම් බව කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත මහතා අවධාරණය කරයි.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව පැවැසුවේ දිණමිනට අදහස් දක්වමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය.

"කුමන දේශපාලන පක්ෂය නියෝජනය කළත් රට ගොඩනැඟීම සහ ජනතාවට සේවය කිරීමට ප්‍රමුඛතාව ලබා දිය යුතුයි. වරදන, වරප්‍රසාද පිළිබඳව බලාපොරොත්තු නොවිය යුතුයි. එසේ පැමිණෙන සෑම විපක්ෂ මන්ත්‍රීවරයකු සම්බන්ධයෙන්ම සුබවාදීව සිතා බලනවා. ඒ අයගේ සහයෝගය ද ආණ්ඩුවට අපේක්ෂා කරනවා. මේ දක්වා මෙරට දේශපාලන ඉතිහාසයේ සිදුව තිබෙන්නේ තනතුරු, වරදන, වරප්‍රසාද අපේක්ෂාවෙන් මන්ත්‍රීවරුන් පක්ෂ විපක්ෂ වශයෙන් මාරුවීමයි. එවැනි පිරිසක් සමඟ රටක් ගොඩනැඟිය නොහැකියි. නමුත් යම් අයකුට රට ගොඩනැඟීමට බලාපොරොත්තුවක් තිබෙන්නේ නම් ඒ සඳහා තනතුරු අවශ්‍ය නෑ.

යම් මන්ත්‍රීවරයකුට තනතුරක් නිබුණත් නැතත් වන්මන් ආණ්ඩුවේ වැඩපිළිවෙළට සහාය දෙමින් රටේ සහ ජනතාවගේ හෙට දවස වෙනුවෙන් වැදගත් තීන්දු තීරණගැනීමට සහාය විය හැකියි. 2015 ජනවාරි මස අට වැනි දා පැවති ජනාධිපතිවරණයෙන් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පරාජයට පත් වුණා. පසුව 'කළ යුත්තේ කුමක් ද - මහින්ද සමඟ නැඟිටීමු' සම්මන්ත්‍රණ මාලාව මා විසින් මුලින්ම ආරම්භ කළා. එය අලුත්ගම නගර ශාලාවෙන් 2015 ජනවාරි මස 31 වැනි දා සිට ආරම්භ කළා.

මේ රට යළි ගොඩනැඟීමට මහින්ද රාජපක්ෂ නැමති දැවැන්ත වෘක්ෂයේ දායකත්වය අවශ්‍ය බව තේරුම් ගත් නිසා මේ වැඩසටහන කළුතර දිස්ත්‍රික්කය පුරා ක්‍රියාත්මක කළා. කෙසේ නමුත් මට ලැබී තිබෙන වැදගත් විෂයයට නව අරුතක් එක් කරමින් රට ගොඩනැඟීමට උපරිම ශක්තිය ලබා දෙනවා. රටට ගැළපෙන සහ රට වෙනුවෙන් යමක් කළ හැකි ජනාධිපතිවරයකුගේ නායකත්වය අද වන විට ලැබී තිබෙනවා."

නව ව්‍යවස්ථාවක් ගෙන ඒමට කඩිනමින් කටයුතු කරන්න

දේශ හිතෛෂී ජාතික ව්‍යාපාරයේ ලේකම් ජනපතිගෙන් ඉල්ලයි

උපාලි කරුණාරත්න

19 වන ව්‍යවස්ථා සංශෝධනයේ වෙනසක් කිරීමට හදිසි වත්තේ නැතිව නව ව්‍යවස්ථාවක් ගෙන ඒමට කඩිනමින් කටයුතු කරන ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගෙන් ඉල්ලා සිටින බව දේශ හිතෛෂී ජාතික ව්‍යාපාරයේ ලේකම් වෛද්‍ය වසන්ත බණ්ඩාර මහතා මහතා පැවැසීය.

ඒ මහතා මේ බව ප්‍රකාශ කළේ ඊයේ (18) කොළඹදී පැවති මාධ්‍ය හමුවකට සහභාගි වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

"මහජනතාව අනුමත කරන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ආවොත් සමඟි ජනබලවේගයට මෙන්ම ජනතා විමුක්ති පෙරමුණට ද එය මඟහැරිය නොහැකියි. 19 වන සංශෝධනයේ ගැටලු පිළිබඳව අප බුද්ධිමතුන් සමඟ සාකච්ඡා කළා. ඔවුන්ගේ මතය වන්නේ 19 වන සංශෝධනය කිරීමට ගෙන ඒමට නියමිත 20 වන සංශෝධනයෙන් අනතුරක් විය හැකි බවයි. සංශෝධන අවස්ථාවේ බෙදුම්වාදී බලවේගවලට යම් සංශෝධන ඇතුළු කිරීමේ අනතුරක් තිබෙන බවයි. එසේ කියන්නේ ආණ්ඩුව පිළිබඳව සැකයකින් නොවේ. ආණ්ඩුවට තුනෙන් දෙකේ බලය ලබාගැනීමට උතුරු නැගෙනහිර කුඩා දේශපාලන පක්ෂ එකතුවක් අවශ්‍යයි. ඔවුන් මේ 20 වන සංශෝධනය ගෙන ඒමේදී විවිධ සංශෝධන ඉදිරිපත් කරයි කියා අප සිතනවා.

ජනාධිපතිවරයා සහ අගමැතිවරයා එකම පක්ෂයක සිටින නිසා 19 සංශෝධනයේ තිබෙන ගැටලු දැන් ඇති වන්නේ නෑ. මේ නිසා 19 සංශෝධනය කිරීමට හදිසි නොවිය යුතුයි. 19 වෙනස් කරන්න ගොස් ආණ්ඩුව තම ප්‍රතිරූපයට හානි කර ගත්තොත් නව ව්‍යවස්ථාවක් ගෙන ඒමේදී ගැටලු ඇති වන්න පුළුවන්. නව ව්‍යවස්ථා සංශෝධනය අවුරුද්දකින් අවසන් කරන්න පුළුවන්. අපේ රටේ බුද්ධිමතුන්, නීතිඥයන් විශාල පිරිසක් සිටිනවා. නව ව්‍යවස්ථාවක අවශ්‍යතාව පිළිබඳව මේ වන විට රටේ සංවාදයක් ඇති වී තිබෙනවා."

වෛද්‍ය ගුණදාස අමරසේකර මහතා

"රටේ උද්ගත වී ඇති යම් යම් ගැටලු පිළිබඳව මේ රටේ බුද්ධිමතුන් අදහස් දක්වීම ඉතා වැදගත්. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ වන විට ගැටලුවක් බවට පත්වී තිබෙනවා. මෙය සම්පූර්ණයෙන් ඉවත් කරන්නේ නැතිව සංශෝධනයක් කිරීම පිළිබඳව මේ වන විට කතාබහ වෙනවා. මෙයට අප තරයේ විරුද්ධයි. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට ජනාධිපතිවරණයේදී සහ පසුගිය මහ මැතිවරණයේදී අති බහුතරයක් ජනතාව ජන්දය ලබා දුන්නේ 19 වන සංශෝධන කරන්න නොවේ, මේ රටේ ගැටලු විසඳීමට නව ව්‍යවස්ථාවක් ගෙන ඒමට."

නීතිඥ කල්‍යාණන්ද තිරාණගම මහතා

"19 සංශෝධනයට පැලැස්තර දමා 20 සංශෝධනය ගෙන ඒම ඉතාම භයානක දෙයක් විය හැකියි. විවිධ පාලකයන් තම බලය ආරක්ෂා කරගැනීමට මෙන්ම එන්. ජී. ඕවල අවශ්‍යතාවලට ව්‍යවස්ථා සංශෝධන සිදු කළ ආකාරය එහි අතීතය දෙස බැලීමේදී අපට පෙනී යනවා. ව්‍යවස්ථා සංශෝධන සිදු විය යුත්තේ ජනතාවගේ අවශ්‍යතාව අනුවයි. පසුගිය මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ බෙදීම් ඇති නොවුණා නම් තුනෙන් දෙක බලය පිළිබඳ ගැටලු ඇති වෙනවා. මෙය අප තේරුම් ගත යුතුයි. ඒ නිසා අප කඩිනමින් නව ව්‍යවස්ථාවක් ගෙන එන්න ඕනෑ. මෙයට මහජනතාවගේ අනුමැතිය ලබා ගත යුතුයි. ව්‍යවස්ථාවේ තිබෙන දෙය ජනතාව දැන ගත යුතුයි."

ලිවිසැරිය

LIVI SARIYA

FAX-112 429 220

සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ නියැළෙමින්, ලේඛකයකු හා සන්නිවේදකයකු ලෙස සමාජ මෙහෙවරක නියැළෙන වෛද්‍ය ශාන්ත හෙට්ටිආරච්චිගේ නවතම කෘතිය 'හොරට කරකැවෙන මෙරට සරසවිය' පිළිබඳ කතුවරයා සමඟ කළ සංවාදයකි.

උප සංස්කෘතියක් බලෙන් පැටවිය යුතු නෑ

● වෛද්‍ය ශාන්ත හෙට්ටිආරච්චි

● ඔබ මීට පෙර ඉදිරිපත් කළ කෘතිවලට වඩා ආන්දෝලනාත්මක කෘතියක් ලෙස, මෙරට විශ්වවිද්‍යාල පද්ධතියේ අවගාමී තත්ත්ව හා යම් පරිහානිමය ලක්ෂණ පෙන්වා දෙන, 'හොරට කරකැවෙන මෙරට සරසවිය' කෘතිය හැඳින්විය හැකියි. ඊට බලපෑ පසුබිම කෙබඳු ද?

ලේඛකයකු හැටියට මා අතින් ලියැවෙන 17 වැනි කෘතිය තමයි, 'හොරට කරකැවෙන මෙරට සරසවිය'. මෙය යම් ආයතනික පද්ධතියක් තුළ සිදුවන දේට අදළව අප දුටු ඇත්ත බොහොම අවංකව රටට, සමාජයට හෙළිදරව් කිරීමක්. දශක හතරක පමණ වන ලේඛන ජීවිතය තුළ, පුවත්පත් ඔස්සේ තිරු ලිපි මඟින් සමාජයේ විවිධ පුද්ගලයන්, ආයතන ආදිය ගැන වරින්වර සාකච්ඡා කළා. ඒ ලිපි පසුකාලීනව කෘති වශයෙනුත් පළ වුණා. '90.8 ආඩම්බරය', 'සිව්වැනි මානය 01', 'අහසේ තරු හා දවසේ තරු', සිව්වැනි මානය 02' එබඳු කෘති. මේවා සමාජයේ සුබසෙත වෙනුවෙන් කතා කළ අවස්ථා. හැබැයි, මෙය ඊට වඩා වෙනස් අවස්ථාවක්. අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය ගැන මෙතෙක් කල් කිසිවකුත් කතා නොකළ දේ මේ කෘතියෙන් එළියට එනවා. මේ කෘතියේ අසත්‍ය දේ කිසිවක් නැති නිසා, මට යම් යම් කාරණා සැඟවීමට අවශ්‍ය වුණේ නෑ. මා ලැබූ අත්දැකීම් ඔස්සේ තමයි මේ කාරණා සටහන් වෙන්නෙ.

අප දන්න ඇත්ත අපේ හිතේ තියාගෙන සිටීමෙන් රටට, සමාජයට සුගතියක් වෙන්නෙ නෑ. ඒ නිසා මේ කාරණා සමාජයේ අවධානයට ලක් කරන්න මට ඕන කළා. ඒ නිවැරැදි නොවන යම් යම් දෑ වෙන්නෙ තම තමන්ගේ පුද්ගලික ඕනෑ-එපාකම් මත බව මෙහිදී මා දුටු දෙයක් තමයි. ඇත්ත කතා කරනකොට, යම් යම් පුද්ගලයන්ට සිත් අමනාපකම් ඇති විය නොහැකිද කියන කාරණය මෙතැනදී මතු වෙනවා. හැබැයි, මට එය වැදගත් වුණේ නෑ. මට වැදගත් වුණේ, සමාජයට යහපතක් වෙනවා නම් එයයි. මේ වැරැදි යම් පමණකින් හෝ නිවැරැදි වනවා නම් මා සිතුවේ ඒ ගැනයි. මෙහි හුඟක් දුරට ඇතුළත් වෙන්නෙ අට වසරක කාල සීමාව තුළ විශ්වවිද්‍යාල පද්ධතියට සෘජුව සම්බන්ධව සිටීමින්, මම අත්දැකපු දේවල්. මම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී තනතුර දරමින් විශ්වවිද්‍යාලය තුළ කිරීමට වැයම් කළ වෙනසත් සමඟ මට දැනුණු දේ තමයි මේ.

● මේ ඇතැම් කාරණා අනිතයටත් සම්බන්ධයි?

1978 - 1983 වකවානුවේ මම කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ශිෂ්‍යයෙක්. අප නිකම්ම ශිෂ්‍යයෝ වුණේ නෑ. මම ශිෂ්‍ය සභාව නියෝජනය කරමින් ශිෂ්‍ය නායකයකු ලෙසත් කටයුතු කළා. විශ්වවිද්‍යාලයේ විවිධ සංවිධානවල නිලතල දරමින් ක්‍රියාත්මක වුණා. 1984 දී වෛද්‍ය වෘත්තියට පිවිසීමෙන් පසුවත් ඒ සම්බන්ධය කැඩුණේ නෑ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ මා දැරූ විවිධ තනතුරුත් සම්මාදම්ණත් කෙරෙනවා. විශ්වවිද්‍යාලය තුළ සිටි වසර අට තුළ මමත් ඒ සම්මාදම් මණ්ඩල ඉදිරියේ අදහස් පළ කළා. ඒත්, මේවා කවමදාකවත් නිවැරැදි වෙන්නෙ නෑ. මේ කෘතියෙ එක් තැනක මම සාකච්ඡා කරනවා 'තනතුරු කරපටි නැතිව පොර පිටි වන සරසවි' ගැන. මෙය බේදවාචකයක්. උප කුලපති ධුරය, පීඨාධිපති ධුරය වගේ මේ තනතුරු සඳහා ඇතිවන පොරයෙදි මේ අය හැසිරෙන්නෙ සමාජයේ නූගත් පිරිස් හැසිරෙන විදිහටයි. කොහොම හරි මේ තනතුරුවලට පත් වුණාට පස්සේ, ඒ පුද්ගලයා වටා අතලොස්සක් එකතු වෙනවා. ඊට පසුව ප්‍රධානියා හැසිරෙන්නෙ පොදු කාරණාවලට වඩා අතලොස්සේ වුවමනාවලට අවශ්‍ය විදිහටයි. විශ්වවිද්‍යාලය තුන්-හතර දෙනෙක්ගෙ උරුමයක් බවට පත්වන තත්ත්වයක් තියෙනවා. මේ තත්ත්වයත් වෙනස් විය යුතුයි.

විශ්වවිද්‍යාල පද්ධතිය ගැන සාකච්ඡා කරන විට නවකවදය මඟහැරිය නොහැකි මාතෘකාවත් බවට පත්වෙලා තියෙනවා. මේ ගැන මොන විදිහටද අවධානය යොමු වෙන්නේ?

නවකවදය කියන කාරණයෙදී එය නැවැත්වීමට අවශ්‍ය නීති ප්‍රතිපාදන දැනට වසර ගණනාවක් තිස්සේ තියෙනවා. 1998 අංක 20 දරන පනත මඟින් අධ්‍යාපන ආයතනවල සිදුවන නවකවදය ඇතුළු හිංසාකාරී ක්‍රියා තහනම් කර තිබෙන්නෙ. මේ පනතෙ පැහැදිලිවම ඒ ඒ වැරැදි සඳහා දඬුවම් දක්වා තියෙන්නෙ. නවකවදයට අදළව දෙවසරකට නොවැඩි සිරදඬුවම් පවා පැමිණවිය හැකියි. ලිංගික බලපෑමක් සිදු වුණොත්, සිර දඬුවම දස වසරකට නොවැඩි එකක්. ඒත් පසුගිය වසර ගණනාවක් පුරා සිදුවුණ දේ බලද්දී මේ නීති හරියාකාරව ක්‍රියාත්මක වුණාද කියන එක අපට ප්‍රශ්නයක්. අනෙක, නවකවදය කියන දේ දැනට සෑම විශ්වවිද්‍යාලයකම එකම මට්ටමකින් නෙවෙයි තියෙන්නෙ. එකම විශ්වවිද්‍යාලයක වුණත් ඒ ඒ පීඨවල මේ තත්ත්වය හරි වෙනස්. නිදසුනක් ලෙස ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ නවකවදයක් ඇත්තේම නෑ. විද්‍යා පීඨයේ වුණත් එහෙමයි. නවකවදයක් නෑ. යම් යම් පීඨවල තමයි එවැනි තත්ත්වයක් තියෙන්නෙ. ඇතැම් විශ්වවිද්‍යාල බලධාරීන් නවකවදය ගැන ශිෂ්‍ය සංගම්වලටම චෝදනා කරන තත්ත්වයක් අප දකිනවා. ශිෂ්‍ය සංගම්වලට, ශිෂ්‍ය ක්‍රියාකාරීන්ට නවකවදය දැනට ඇති පීඨවලින් ඉවත් කිරීමේ හැකියාව ඇති බව මම දන්නවා. මෙතැන ඇති ප්‍රශ්නය, මේ උප සංස්කෘතිය බලෙන් පැටවීමයි. උප සංස්කෘතියක් එලෙස බලෙන් පැටවීමේ අවශ්‍යතාවක් නෑ වගේම, එය සිදු නොවිය යුතුයි.

අනවශ්‍ය වියදම් ලෙස සමාජය දකින ඇතැම් අවස්ථා වගේම පරිසරය ගැන නොතකා හැරීම් පවා ඔබ විශ්වවිද්‍යාල පද්ධතිය තුළත් දකිනවා?

හොඳ දේවල් කතා කළත් ඒවා ක්‍රියාවෙන් පෙන්විය යුතු බව කියනවා. විශ්වවිද්‍යාලයෙන් නොයෙක් වැඩමුළු ඇතැම් විට තරු පංති හෝටල්වල තේවාසික වැඩමුළු වශයෙනුත් පැවැත්වෙනවා. පරිසරය සුරැකීම, හරිත පරිසරයක් වගේ බරපතළ කාරණා විශාල වියදමක් දරලා සාකච්ඡා කරනවා. සැලසුම් හදනවා. හැබැයි විශ්වවිද්‍යාලය තුළ මේවා ක්‍රියාත්මක වෙන්නෙ නෑ, ඒ පරිසරය රැකෙන්නෙ නෑ. ගොඩනැගිලි නම් ඉදිවෙනවා. පරිසරය ගැන මීට වඩා සංවේදීව කටයුතු කළ යුතු තැනක් තමයි විශ්වවිද්‍යාලය කියන්නෙ.

මෙය කෘතියක් ලෙස සමාජගත කිරීමේදීත් මොන විදිහේ ප්‍රතිචාර ද ලැබෙන්නේ?

කෙටි කාලයක් තුළ දැනටමත් බොහොම හොඳ ප්‍රතිචාර ලැබෙමින් තියෙනවා. මේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිදුවන තිවැරැදි විය යුතු ඇතැම් කාරණා සම්බන්ධයෙන් ඒවා තිවැරැදි කර ගැනීමට යම් උත්තේජනයක් දීමට අපේ ජීවිත කාලය තුළ හැකි වුණාය කියන සතුට අපට තියෙනවා.

විශ්වවිද්‍යාල පද්ධතිය බාහිර සමාජයේම පිළිබිඹුවක්. සමාජයේ වගේම ඒවායෙන් පරිහානියත් ඇති වීම යම් දුරකට අවධානයට ලක් වෙනවා. මේ තත්ත්වය ඔබ නිරීක්ෂණ කරන්නෙ කොහොමද?

ඒ ඒ විශ්වවිද්‍යාල බලධාරීන් පත් වීමේ ක්‍රමවේදය වුණත් ඒ තරම් සතුටුදායක නෑ. ඒ නිසා තනතුරු ලබා ගැනීමේදී මේවා පොරපිටි වෙනවා. මේවා කිහිප දෙනෙක්ගෙ පෞද්ගලික අවශ්‍යතා මත මෙහෙයවෙන තත්ත්වයක් අප දකිනවා. මේ තත්ත්වය වෙනස් විය යුතුයි. එය, නිර්මාණශීලී හා උපායශීලී ප්‍රවේශය ලෙස හඳුනා ගත හැකියි. ශිෂ්‍යයන්ගෙ මෙවැනි වැරැදිවලට දඬුවම් නියම කරන්නෙ විනය කමිටුව. මෙතැනදී වෙන්න ඕන තඩුකාරයෙක් වගේ ක්‍රියා කරමින් දඬුවම් දීම නෙමෙයි. හේතුව සොයාගෙන යන විට ඒ තත්ත්වයට මේ ශිෂ්‍යයන් පත් වුණේ කොහොමද කියලා දැනගන්න පුළුවන්. ඇතැම් විට මේ ශිෂ්‍යයන් විශ්වවිද්‍යාල ප්‍රවේශයේදී උසස් පෙළ ඉහළම ලකුණු ලැබූ අය. මෙවැනි ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලයට ආවහම මෙහෙම වෙන්නෙ ඇයි? බොහෝ අය සිතන්නේ මෙවැනි බුද්ධිමත් දරුවෝ ඇයි මෙහෙම වෙන්නෙ කියලා. ඒත්, ඇත්ත නම්, ඒ අයට ඇති සමාජ අවබෝධය හොඳ මට්ටමක නොතිබීමයි.

● විශ්වවිද්‍යාල පද්ධතිය ගැන සාකච්ඡා කරන විට නවකවදය මඟහැරිය නොහැකි මාතෘකාවත් බවට පත්වෙලා තියෙනවා. මේ ගැන මොන විදිහටද අවධානය යොමු වෙන්නේ?

නවකවදය කියන කාරණයෙදී එය නැවැත්වීමට අවශ්‍ය නීති ප්‍රතිපාදන දැනට වසර ගණනාවක් තිස්සේ තියෙනවා. 1998 අංක 20 දරන පනත මඟින් අධ්‍යාපන ආයතනවල සිදුවන නවකවදය ඇතුළු හිංසාකාරී ක්‍රියා තහනම් කර තිබෙන්නෙ. මේ පනතෙ පැහැදිලිවම ඒ ඒ වැරැදි සඳහා දඬුවම් දක්වා තියෙන්නෙ. නවකවදයට අදළව දෙවසරකට නොවැඩි සිරදඬුවම් පවා පැමිණවිය හැකියි. ලිංගික බලපෑමක් සිදු වුණොත්, සිර දඬුවම දස වසරකට නොවැඩි එකක්. ඒත් පසුගිය වසර ගණනාවක් පුරා සිදුවුණ දේ බලද්දී මේ නීති හරියාකාරව ක්‍රියාත්මක වුණාද කියන එක අපට ප්‍රශ්නයක්. අනෙක, නවකවදය කියන දේ දැනට සෑම විශ්වවිද්‍යාලයකම එකම මට්ටමකින් නෙවෙයි තියෙන්නෙ. එකම විශ්වවිද්‍යාලයක වුණත් ඒ ඒ පීඨවල මේ තත්ත්වය හරි වෙනස්. නිදසුනක් ලෙස ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ නවකවදයක් ඇත්තේම නෑ. විද්‍යා පීඨයේ වුණත් එහෙමයි. නවකවදයක් නෑ. යම් යම් පීඨවල තමයි එවැනි තත්ත්වයක් තියෙන්නෙ. ඇතැම් විශ්වවිද්‍යාල බලධාරීන් නවකවදය ගැන ශිෂ්‍ය සංගම්වලටම චෝදනා කරන තත්ත්වයක් අප දකිනවා. ශිෂ්‍ය සංගම්වලට, ශිෂ්‍ය ක්‍රියාකාරීන්ට නවකවදය දැනට ඇති පීඨවලින් ඉවත් කිරීමේ හැකියාව ඇති බව මම දන්නවා. මෙතැන ඇති ප්‍රශ්නය, මේ උප සංස්කෘතිය බලෙන් පැටවීමයි. උප සංස්කෘතියක් එලෙස බලෙන් පැටවීමේ අවශ්‍යතාවක් නෑ වගේම, එය සිදු නොවිය යුතුයි.

● අනවශ්‍ය වියදම් ලෙස සමාජය දකින ඇතැම් අවස්ථා වගේම පරිසරය ගැන නොතකා හැරීම් පවා ඔබ විශ්වවිද්‍යාල පද්ධතිය තුළත් දකිනවා?

හොඳ දේවල් කතා කළත් ඒවා ක්‍රියාවෙන් පෙන්විය යුතු බව කියනවා. විශ්වවිද්‍යාලයෙන් නොයෙක් වැඩමුළු ඇතැම් විට තරු පංති හෝටල්වල තේවාසික වැඩමුළු වශයෙනුත් පැවැත්වෙනවා. පරිසරය සුරැකීම, හරිත පරිසරයක් වගේ බරපතළ කාරණා විශාල වියදමක් දරලා සාකච්ඡා කරනවා. සැලසුම් හදනවා. හැබැයි විශ්වවිද්‍යාලය තුළ මේවා ක්‍රියාත්මක වෙන්නෙ නෑ, ඒ පරිසරය රැකෙන්නෙ නෑ. ගොඩනැගිලි නම් ඉදිවෙනවා. පරිසරය ගැන මීට වඩා සංවේදීව කටයුතු කළ යුතු තැනක් තමයි විශ්වවිද්‍යාලය කියන්නෙ.

● මෙය කෘතියක් ලෙස සමාජගත කිරීමේදීත් මොන විදිහේ ප්‍රතිචාර ද ලැබෙන්නේ?

කෙටි කාලයක් තුළ දැනටමත් බොහොම හොඳ ප්‍රතිචාර ලැබෙමින් තියෙනවා. මේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිදුවන තිවැරැදි විය යුතු ඇතැම් කාරණා සම්බන්ධයෙන් ඒවා තිවැරැදි කර ගැනීමට යම් උත්තේජනයක් දීමට අපේ ජීවිත කාලය තුළ හැකි වුණාය කියන සතුට අපට තියෙනවා.

ධම්මික සෙනෙවිරත්න

මතක සිත්තම්

මහාචාර්ය රිසිමන් අමරසිංහාපදානය හෙවත් සිය සිරිත



මහාචාර්ය රිසිමන් අමරසිංහයෝ සිය චරිතාපදානය රටට දෙති. කවර හෙයින් ද යත්, එයින් කියවන්න වුනට රටට, ලොවට වැඩ සඳහා යි. "අමරසිංහාපදානය" යන වදන විසන්ධි කළ විට "අමරසිංහ + අපදානය" ලෙසින් සිටී, 'අපදාන' යන පාලි වදනෙහි අරුත චරිතය, යහපත් ක්‍රියා යන්නයි. සුත්තපිටකයෙහි තිස් වැනි කොටසට අයත් චූළ්දක නිකායෙහි දස තුන් වැනි පොත 'අපදාන' නම්. එහි සිවු කොටසකි. ඒ නම් බුද්ධාපදාන, පච්චේකබුද්ධාපදාන, ථෙරාපදාන සහ ථෙරී අපදාන යනුයි.

සිංහල සාහිත්‍යාවලියෙහි 'සිරිත් කවි' පවතිනත් (චරිත කථා - Biographies) 'සිය සිරිත්' හෙවත් 'ස්වාපදාන' තුබුණු බවක් නොපෙනේ. 'සිරිත් කවි' ගණයට එළු අත්තනගලු වංශය, පැරැකුම්බා සිරිත, වැලිවිට සඟරජ සිරි, ඇහැළේපොළ වර්ණනාව ආදී ග්‍රන්ථ වැටේ.

කොළඹ යුගයෙහි ලියැවුණු දෙන් බාරොත් ජයතිලක සිරිත ආදි පොත්හි දූ සැබෑ පුද්ගල පුවත් ඇතුළත් වී ඇතැයි නොසිතේ. එයට හේතු පවතී. තමා හා සම්බන්ධ සෑම සිදුවීමක්ම ඇත්තේ ඇති හැටියට දන්නේ තමාම පමණක් බැවිනි.

'සිය සිරිත්' කතා අතර අව්‍යාජ තොරතුරු හියුබන් දිසානායක කිවිසුරුණන්ගේ 'ගිය මා ළමා කල' අති උතුම් දේවධර්මාචාර්ය ෆූන්ක් මාකස් රදගුරු හිමියන්ගේ 'සටහන් සමරුව' සහ කේ. ජයතිලකයන්ගේ පූංචි පැලේ ගස වෙනා (පනස් වසරක මතක සටහන්) පොත්හි වෙයි. ඒ අතින් මහාචාර්ය රිසිමන් අමරසිංහයන්ගේ 'මතක සිත්තම්' තෙත්තියෙහි මැ සිටී. ඒ ඇයි?

තමා ජීවත් වන සමාජය ද; තමා ඇසුරට පත් පුද්ගලයන් ද තමාට ඇති කළ නොයෙක් පහත් නොපහත් බලපෑම් ද ඇත්තේ හැටියට විවරණය කර ඇති බැවිනි. සමාජීය සාහිත්‍යමය අධ්‍යයනය පිළිබඳව ද ආචාර්ය උපාධිධරයකු වන මහාචාර්ය අමරසිංහයෝ සිය 'මතක සිත්තමෙන්' සමාජය පිළිබඳ සැබෑ තතු ද අපූරුවට සිත්තම් කරති. විශ්වකීර්තියට පත් ප්‍රවීණ ලේඛකයකු බැවින් ඔහු සිය කෘතිය මඟින් අපදාන සාහිත්‍යයට මහඟු මැණිකක් එක් කරති.

මේ කෘතිය විවේචනයට ප්‍රවේශයක් ලෙස එහි අන්තර්ගත භාෂා ව්‍යවහාරය ගැන ද විමසා බැලිය යුතුය. අමරසිංහයෝ භාෂා විශාරද පඬිවරයකු නිසා ද; ප්‍රබල ස්මෘති ශක්තියෙන් අනූනයකු බැවින් ද කිවමනා අර්ථය සපුරා ම සිතෙහි රඳවමින්, ඒ අර්ථය උපමායෙන් අලංකාර කෙරෙමින්, උදහරණයෙන් ඉදුරා සනාථ කෙරෙමින්, ආප්ත වාක්‍යයෙන් ලස් ඔබ්බමින් එළිදෙරි කෙරෙති. ඒ මතු ද නොවේ. දෙතුන් වචනයක බස්නා අර්ථය වචන සහස්‍රයක බස්වා පුළුල් කොට කියන්නට ද සමත් වෙති. මෙසේ සමාසව්‍යාස දෙක්හි චතුරතාව මේ පොතින් දැකිය හැකියි.

මේ කෘතිය ව්‍යාකරණය අකුරටම රකිමින් පැබෑදුණෙන් දුහුනතට ද මහත් වැඩදයි වේ. 'කුමාරසම්භව' මහා කාව්‍යයෙහිලා කාලිදාසයෝ මෙසේ කියති.

"සංස්කාරවත්‍යෙව ගිරා මනිෂි" - පඬිවරයා සංස්කරණ ඇති වචනයෙන් හොබනාක් වැන්න යනුයි. පඬිවරයෙක් වේ නම්, ඔවුන්ගේ බස ව්‍යාකරණානුකූලව තුබුව මනා වෙයි. ව්‍යාකරණානුකූල, සංස්කරණ ඇති බස ලියන කියන විට එයින් ඒ පඬිවරයා බබළන්නේ යැ යනු කාලිදාසයන් කියන සැටිය වෙයි. 'මතක සිත්තමෙන්'ද රිසිමන් අමරසිංහයෝ බබළත්ම ය!

'මතක සිත්තම්' පිටු තුන්සිය අනූ සතරකින් (394) සමන්විත මේ අපදානය කොටස් දසයෙකින් සැදුණේ යැ. පරිච්ඡේද තුන්දසයෙකින් (13) සැරසුණේය.

මෙහි සියලු පරිච්ඡේද එකිනෙක විවේචනය කිරීම සුනිසි වුවද, අපදානයක් ලිවිය යුත්තේ කෙසේ දැයි පාඨකයාට මහපෙන්වීමක් වශයෙන් එයින් කිහිපයක් පමණක් විමසම්හ.

'ස්වාපදාන යටගියාව' අති ශ්‍රේෂ්ඨ කරුණු පිඬුවෙකි. මහාචාර්ය අමරසිංහයන් එහිලා පෙර පර දෙදිගම ස්වාපදාන සාහිත්‍යය අලලති. "ළමා විය" රසවත් සමාජ විද්‍යාත්මක විග්‍රහයෙකි. අමරසිංහ සූරීන්ගේ ළමා විය තිසිපරිදි හැඩගැන්වීමට සිය මාපියන් පෑ අනුහස වත්මන් සමාජයට ද මාර්ගෝපදේශයෙකි. එහිලා සිය ගුරුන්ගේ ඇසුර ද, එයින් කළ බලපෑම් ද මනෝවිද්‍යාත්මක අංශයෙන් අද ද උගත හැකි පාඩම් වෙයි.

මහාචාර්ය අමරසිංහයන් අතිදක්ෂ ඇදුරුවරයකු බව ප්‍රකට සත්‍යයෙකි. ගුරු වෘත්තියට පිවිසීමේදී කළ මං ඇඟිරුම් අමරසිංහයන්ගේ දිරිය දහස් ගුණයෙන් වර්ධනය කළ අයුරු කියවන විට එය පාඨකයාට 'ණයට ගත හැකි' අයුරු පොහොසත් බව දක්වයි.

"සරසවි දේවිය හමුවීම" පරිච්ඡේදයෙහි ඇතුළත්ව ඇත්තේ මහාචාර්ය අමරසිංහයන් සරසවි අධ්‍යයනයට පිවිසීම පිළිබඳ විසිතුරු තොරතුරුය. එහිලා මහාචාර්ය සෙනරත් පරණවිතාන, කොළඹ සරසවියේ ඉතිහාස අංශාධිපති මහාචාර්ය ටී. බී. එච්. අබයසිංහ ආදි විද්වතුන් මහාචාර්ය අමරසිංහයනට ගුරු වූ සුපුවත්ත එහිදී ද ඇතැම් මහඳුරුකුගෙන් එල්ලවුණු කෙනෙහිලිකම් පිළිබඳ ශෝකාත්තයක් ද විස්තර කැරේ. බාධක දුටු තැන එය මැඩ ඉදිරියටම යාමේ අයෝමය විර්යය පාඨකයාට මතු වැඩම සලසයි.

අමරසිංහයෝ තිති අධ්‍යාපනය ද ලැබූහ. එහිදී ඔවුනට ගුරු වූ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ, ආචාර්ය සුනිල් කුරේ සූරීන්ගේ ඇසුර සඳහන් 'යුක්තියේ දෙවඟන (රෝම) සහ තේමිස් (ග්‍රීක) දෙවඟන ඇසුර' නමැති පරිච්ඡේදය ගුරු-ගෝළ සබඳතාව පිරිහෙන වත්මන් යුගයට අමරණීය ආදර්ශයෙකි.

"විවාහ ජීවිතයයි. සමාජ ජීවිතයයි" පරිච්ඡේදයෙන් අමරසිංහයන් සිය යුග දිවිය පිළිබඳ තොරතුරු සාකච්ඡා කරති. සිය යුගදිවියේ ද සමාජ ජීවිතයේ ද සාර්ථකත්වය ගැන අමරසිංහයන් පවසන දෑය අද සමාජයට මහඟු උපදේශයෙකි. ඔබම කියත්වා!

"මා සිතූ හැම දෑ මැ මම ලැබිමි. එ ද මහත් නොතිත් තැතිති. උගත්කම, ධනය, ගේ-දොර, ඉඩම්, යාන-වාහන ඇ හැමැ ලදිමි. එබැවින් පෙරළා හැරී බලන විටැ මට ඇති වන සතුට වදනිත් විස්තර නොකළ හැකියි. මා මෙතෙක් කළ දැනුදු කරන ශාස්ත්‍රීය, සමාජ සේවා දෙසැ බලන විට ඇති වන 'දිව්‍යමය ප්‍රීතිය' අහෝ! අත් අය නොමැ ලබන්නේ කවර හෙයින් ද යි සිතා මම තිබඳ දෙමිනස් වෙමි. යළි යළිදු කියැ යුත්තේ ඔවුනට 'පිත් මඳ' බවයි.

මහාචාර්ය රිසිමන් අමරසිංහයන්ගේ ඉතා තෘප්තිමත් ජීවිතය, අතෘප්ති කර දිවි මගේ ගිලී ගිඳුනා කවරකු හට වුව ද මහත් දිරිය දෙන්නකි. 'මතක සිත්තම්' දුනුන, ප්‍රවීණ හැමට මහඟු අත්පොතකි. ගිහියනට මතු නො ව පැවිද්දනට ද ඉදිරි මඟ දක්වන පහන් කනුවෙකි. මෙය සෑම පුස්තකාලයකම වේ නම් අහෝ ඉන් සිදුවන අමරණීය මහ මෙහෙය කෙසේ නම් පවසම් ද?

අනුරාධපුර ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ බෞද්ධ හා පාලි අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
පාතේගම ඤාණිස්සර හිමි

අජරාමර බුදු පියා

බුදුන් වහන්සේ අරබයා ලියවුණු භක්ති ගීත රාශියකි. ඉන් ඇතැම් ගීතයක බුදුන් වහන්සේ හැඳින්වීමට 'බුදු' යන පදයට මුලින් 'අජරාමර' යන පදය දක්නට ලැබේ.

'අජරාමර බුදු පියා'

'අජරාමර' යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක්දැයි මේ ගීත රචකයා නොදන්නා බවක් පෙනේ. 'අජරාමර' යන පදය සෑදී ඇත්තේ 'අජර' හා 'අමර' යන පද දෙක සන්ධි කිරීමෙනි.

අජර - අමර - අජරාමර

මේ දෙ පදය යෙදෙන්නේ නිර්වාණයේ ස්වභාවය හැඳින්වීමට ය. නිර්වාණයෙහි 'ජරාවක්' නැත. එහෙයින් 'අජර' යග නිර්වාණයෙහි 'මරණයක්' නැත. එහෙයින් 'අමර' ය. බුදුන් වහන්සේ වැයම් කළේ සසරෙහි දුක් විඳින මිනිසා ජාති, ජරා, ව්‍යාධි හා මරණ යනාදියෙන් නිදහස් කොට 'අජර අමර' වූ නිවනට හෙවත් මොක්ෂපුරයට යැවීමට බව 'ගංගාරෝහණ වර්ණනාව' ලියූ කවියා මෙසේ කියයි.

'සසර සයුර සරනා සව් සතා යා
අජර අමර මොක් පුර ලම් සිතා යා'

'අජරාමර' යන්නෙන් වෙසෙසා හැඳින්වෙන්නේ නිර්වාණයෙහි ස්වභාවය බව මෙයින් පැහැදිලි ය. එබැවින් එය 'බුදු පියා' යන්නට මුලින් යෙදිය නොහැකි ය. අවශ්‍යම තම් 'අජරාමර ලෝකය' ගැන සඳහන් කළ හැකි යග බුදුන් වහන්සේ හැඳින්වීමට 'අජරාමර ලෝක සිවංකර' යන පාඨය සිංහල සාහිත්‍යයෙහි යෙදී ඇත.

එබැවින් 'අජරාමර බුදු පියා' යන්න වෙනුවට 'අජරාමර ලෝ පියා' යනුවෙන් යෙදීම වඩාත් උචිත ය.

මහාචාර්ය ජේ.බී. දිසානායක

පුංචි මැජික්කාරි

පරිවර්තනය - උපාලි උබයසේකර
ප්‍රකාශනය - සමයවර්ධන පොත්හල (පෞද්ගලික සමාගම)
මිල -රු. 260/-



මෙය, රෝල්ඩ් ඩාල් විසින් රචිත, 'The Magic Finger' කෘතියේ සිංහල පරිවර්තනයයි. මේ කෘතිය මැජික් නිර්මාණ කළ හැකි කුඩා දරියක කතා නායිකාව ලෙස යොදු ගනිමින් හාස්‍යෝත්පාදක කතාවක් ලෙස නිර්මාණය කර ඇත. පන්තියේ ගුරුතුමිය මේ දැරියට තරවටු කිරීම නිසා දැරිය මැජික් ඇඟිල්ලේ බලයෙන් ගුරුතුමියට රැවුළක් හා වලිගයක් එන්නට සලැස්සුවා ය. එසේම ශ්‍රේෂ්ඨ මහත්තයා සහ ඔහුගේ බිරිය ඇතුළු පවුලේ සැමට අත් වෙනුවට පිහාටු එන්නට සැලසීම සඳහා මැජික් ඇඟිල්ලේ බලය යොදු ගත්තාය. මේ ආදි හාස්‍යජනක සිද්ධි කිපයක්ම ඇතුළත් කරමින් ලියැවී ඇති මේ පොතේ, ඒ ඒ අවස්ථාවලට ගැළපෙන ආකාරයට ලොව ප්‍රමුඛ පෙළේ චිත්‍ර ශිල්පියෙකු වන ක්වින්ටන් බ්ලේක් තිර්මාණය කළ චිත්‍ර පිටුවක් පාසා ඇතුළත් කර ඇත. මෙය පාසල් පුස්තකාල පොතක් වශයෙන් අනුමත කර ඇත. රසවත් කතාවකි. සරල මෙන්ම ළඟන්නාසුළු බස් වහරක් උපයෝගී කර ගනිමින් පරිවර්තනය කර ඇත. කුඩා දරුවන්ට අපූර්ව රසාස්වාදයක් ගෙන දෙන අමුතු කතාවකි. සුන්දර ළමාවියේ සුන්දරත්වය ප්‍රතිමූර්තිමත් කරන ළමා කතාවකි. ළමයින්ට මෙන්ම, වැඩිහිටියන්ට වුව අපූර්ව රසාස්වාදයක් ලද හැකි කතාවකි.

සුවදිවි සටහන්

කර්තෘ - චමිලා අල්විස්
ප්‍රකාශනය - සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
මිල - රු.450/=



හෙළ වෙදකමෙහි කාන්තා රෝග සඳහා ඇති ප්‍රතිකාර ක්‍රම සහ චිකිත්සා මේ කෘතියට අන්තර්ගත වී ඇත. කාන්තා ඔබේ නිවැරදි ඉරියව් ගැටලු රැසක් මඟහරවයි, කාන්තාවන් විරූපි කරනා පොලිසිස්ටික් රෝගයට ආයුර්වේදයෙන් විසඳුම්, දැනුවත් විය යුතු රක්ත ප්‍රදරය, සුලභ නමුත් සඟවන රෝගයක්, දරුඵල පමා නොකර එන්ඩොමෙට්‍රියෝසිස් රෝගය ජය ගන්නට ආයුර්වේදයෙන් ප්‍රතිකාර, ආයුර්වේදයට අනුව විවාහය සඳහා සුදුසුකම් සපුරා ගනිමු, ඔසප්වීම ආශ්‍රිතව සිදුවන ශාරීරික මානසික වෙනස්කම්, දරුඵල අහිමි කරවන ශරීර ස්වභාවය, මදසරුභාවය, දරුඵල සහ පිළිසිඳගැනීමේ විද්‍යාත්මක පසුබිම, දෙළදුක, ආර්තවහරණයේ ලක්ෂණ, ආයුර්වේදයේ දකින ගැබිනි බව, ගැබිනි සමයට ආයුර්වේදයෙන් උපදෙස්, දරු ප්‍රසූතියෙන් පසුව මව් කිරි දීමේදී ඇතිවන ගැටලු සඳහා ආයුර්වේදයෙන් පිළියම් වැනි මාතෘකා 26කින් මේ කෘතියසකස් වී ඇත. කාන්තාවන්ට කියවා දැනුම මෙන්ම රෝග පිළිබඳ අවබෝධයක් ලද හැකි මහඟු කෘතියකි. සරල බස් වහරක් උපයෝගී කර ගනිමින්, නිසි ආයුර්වේද උපදෙස් ඉදිරිපත් කරමින් රචනා කරන ලද්දකි.

මෝජුව

කර්තෘ - මහාචාර්ය කරුණාතිස්ස අතුකෝරල
ප්‍රකාශනය - සූරිය ප්‍රකාශකයෝ
මිල - රු.480/

ගමේ පන්සල
අපි හදමු
gamepansala@lakehouse.lk

ගල්කන්ද රාජමහා ලෙන් විහාරයට නිදන් හොරුන්ගේ බැල්ම

පුරාවිද්‍යා නිලධාරීන්ගේ අවධානය පිණිසයි

සතර දෙසින්
pronews@lakehouse.lk
ප්‍රාදේශීය පුවත්

දබරුල්ලේ ගුණානන්ද හිමි

සේන වී. ගමගේ
ඇඹිලිපිටිය සමූහ

මාතර දිස්ත්‍රික්කයේ දෙයියන්දර ප්‍රදේශයේ මුහුදු මට්ටමේ සිට අඩි 250ක් උසැති කඳු මුදුනක මීමන ගල්කන්ද රාජමහා ලෙන් විහාරය පිහිටා තිබේ. මෙය ඉදි කර ඇත්තේ ක්‍රි.පූ. 90දී, එනම් අදට වසර දෙදහසකට පමණ පෙර රජ කළ වළගම්බා රජු විසිනි. ගල්කන්ද මැද පිහිටි විශාල ගල් පර්වතයෙහි කටාරම් කොටන ලද ගුහාවකි. දිග අඩි 18-20ත් අතර සැතපෙන පිළිම වහන්සේ තමක් හා තවත් පිළිම වහන්සේලා ඉදි කර ඇති අතර දේව රූප ද වේ.

අක්කර 200ක් පමණ මෙම ලෙන් විහාර භූමියට අයත්ව තිබුණ ද මේ වන විට නිදන් සොරුන්ට බිලි වී ඇත. මෙම ස්ථානය සංරක්ෂණය කර ආරක්ෂා කර දෙන ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇතත් ඒ සඳහා මේ වන තෙක් කිසිදු පියවරක් ගෙන නැත. මහා වනාන්තරයට යටව තිබූ මෙම මීමන ගල්කන්ද රාජමහා ලෙන් විහාරයට ස්ථිර වාසය සඳහා භික්ෂූන් වහන්සේ නමක් ලෙස 1984දී වැඩම කරන්නේ දෙහිගස්පේ ආනන්ද හිමියෝය. කුඩා ආවාසයක් සාදාගෙන අති දුෂ්කර දිවියක් ගත කරමින් උන්වහන්සේ අද දක්වාම වැඩසිට ඇත. පසුව උන්වහන්සේගේ ශිෂ්‍ය දබරුල්ලේ ගුණානන්ද හිමියෝ මෙම ස්ථානය ජනජනයාට සුවපහසු ලෙස ආගමික කටයුතු කර ගැනීම සඳහා සංවර්ධනය කර ඇත. ගිරි මුදුනේ ඉදි කළ දර්ශනීය චෛත්‍යය, සංඝාවාසය, ශ්‍රී සුමඟ දහම් පාසල, ගුණෝදය පෙර පාසල ආදිය ද ඒ අතර වේ.

2018/12/01 දින ගුණානන්ද හිමියෝ අපවත් වීමෙන් පසු උන් වහන්සේගේ ශිෂ්‍ය හිමිවරුන් වන දෙයියන්දර මහා විද්‍යාලයේ ආචාර්ය ශාස්ත්‍රපති තඹලපැලැස්සේ තිලකානන්ද හිමි සහ ශාස්ත්‍රපති නුගේගල යායේ ජිනානන්ද හිමි වැනි විහාරස්ථානයේ දියුණුව උදෙසා කටයුතු කරමින් සිටිති. විහාරාධිපති තඹලපැලැස්සේ තිලකානන්ද හිමියන් මේ වන විට එහි වැඩසිටින අතර විහාරාධිකාරී නුගේගල යායේ ජිනානන්ද හිමියෝ රටවල් රැසක විවිධ



තඹලපැලැස්සේ තිලකානන්ද හිමි

භාෂාවලින් භාවනා වැඩසටහන්, ධර්ම වැඩසටහන් කරමින් බොදු ජනතාව වෙනුවෙන් සම්බුද්ධ ශාසනයට මහා මෙහෙවරක් සිදු කරමින් කැනඩාවේ ඔටාවා බෞද්ධ මධ්‍යස්ථානයේ වැඩ සිටිති. වත්මන් විහාරාධිපති තඹලපැලැස්සේ තිලකානන්ද හිමියෝ මෙම ස්ථානයට අඩුවක්ව පැවැති බෝධීන් වහන්සේ සඳහා අනුරාධපුර ජය ශ්‍රී මහ බෝසම්දුන්ගේ අංකුරයක් ඉකුත්ද මහ පෙරහරින් වැඩම කරවා රෝපණය කරවූහ. ඉතා අනුහස් සතර මහා දේවාල ද පිහිටා ඇති අතර මේ වන විට විවිධ පළාත්වල ජනිජනයා තම බාරහාර ඔප්පු කිරීම සඳහා ද පැමිණෙති.

මීමන ගල්කන්ද රාජමහා ලෙන් විහාරස්ථානයේ සිට කිලෝමීටර 25ක් දුරට ගැටබරු දෙවොල දක්වා උමං මාර්ගයක් ද පිහිටා ඇත. එය වළගම්බා රජුගේ ආරක්ෂිත යුද උපක්‍රමයක් ලෙස ද පොත්පත්වල සඳහන් වන අතර මෙය රජ්ජුරු බණ්ඩාර දෙවියන්ගේ අඩවිය ලෙස සැලකේ. දේව කන්තලව්වෙහිද ගැටබරුවට, එළමල්දෙණියට, මීමන කන්දට යනුවෙන් ද කියැවේ. මෙවන් පුරාවෘත්තාන්තයක් ද ඇති වසර 2000ක් ඇතට දිවයන පෞරාණික ස්ථානයේ විහාර, පිළිම, ලෙන්, ඉපැරණි චිත්‍ර ගරා වැටීමට ලක්ව පමණක් නොව ස්ථානගත කර ඇති පුරාවස්තු, සෙල්ලිපි, ගල් සලකුණු ආදිය ද මේ වන විට සොර සතුරන්ට මෙන්ම ස්වාභාවික විපත්වලට ද ලක්ව ඇත. මෙය මතු පරපුර සඳහා සංරක්ෂණය කිරීම බලධාරීන්ගේ ජාතික වගකීමකි.

බෞද්ධ සේවා මධ්‍යස්ථානයේ කොත නිරාවරණය හෙට

ප්‍රියන්ත සුමනසේන
මාතලේ දිස්ත්‍රික් සංචාරක

පූජ්‍ය අම්පිටියේ ධම්මකිත්ති නාහිමිපාණන් වහන්සේගේ අනුශාසනා පරිදි හෙට (20) මාතලේ කොහොබිලිවෙල බෞද්ධ සේවා මධ්‍යස්ථානයේ චෛත්‍ය රාජයාණන් වහන්සේගේ කොත නිරාවරණය කිරීමට නියමිතය.

කළුතර කටුකුරුන්දේ පදිංචි වෙළෙඳ ව්‍යාපාරික ලලිත් සුමනසේකර මහතාගේ සහ එම මැතිණියගේ ධන පරිත්‍යාගයෙන් ඉදි කළ චෛත්‍ය රාජයාණන් වහන්සේගේ කොත් වහන්සේ පැලඳවීම හෙට (20) පෙ.ව. 9.00ට ද ධාතූන් වහන්සේලා තැන්පත් කිරීම පෙ.ව. 10.20ට ද කොත නිරාවරණය ප.ව. 1.00ට ද ශ්‍රී ලංකා රාමඤ්ඤ මහ නිකායේ අනුනායක ධුරන්දර අතිපූජ්‍ය මාතලේ ධම්මකුසල නාහිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සිදු කිරීමට නියමිතය.

මෙම අවස්ථාව සඳහා අස්ගිරි මහ විහාර පාර්ශ්වයේ මාතලේ දිසාවේ ප්‍රධාන සංඝනායක මහෝපාධ්‍යාය පූජ්‍යපාද කොස්ගොල්ලේ සීලරතන හිමිපාණන් වහන්සේ, මල්වතු මහ විහාර පාර්ශ්වයේ මාතලේ දිසාවේ ප්‍රධාන සංඝනායක පූජ්‍යපාද මහලකොටුවේ විමලධම්ම හිමිපාණන් වහන්සේ, අමරපුර මහ නිකායේ මාතලේ දිසාවේ ප්‍රධාන සංඝනායක ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය ආචාර්ය පූජ්‍යපාද ඔලගන්වත්තේ චන්ද්‍රසිරි නාහිමිපාණන් වහන්සේ, ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ මාතලේ දිසාවේ දිසා පාලක ධුරන්දර පූජ්‍යපාද දන්කන්දේ ඤාණදස්සි නාහිමිපාණන් වහන්සේ ඇතුළු ස්වාමීන් වහන්සේලා පනස්නමක් විෂයයෙහි දහවල් දානය පුණ්‍යකර්මයෙන් පින්කම අවසන් වේ.

ශ්‍රී සුනන්දාරාම විහාරයේ වාහල්කඩට මුල්ගල් තබයි

එස්. ජී. උඹේපාල
කැබිතිගොල්ලෑව සමූහ

හිරල්ලුගම ශ්‍රී සුනන්දරාම විහාරාස්ථානයේ වාහල්කඩ සඳහා මුල් ගල් තැබීම පසුගියද (17) සිදු කෙරිණි. එම උත්සවයේදී හිරල්ලුගම ශ්‍රී සුනන්දරාම විහාරාධිපති පූජ්‍ය හිරල්ලුගම විජයරතන ස්වාමීන් වහන්සේ මෙසේ පැවසූහ.

"අද වන විට දහමට සමීප වන පිරිස අඩු වීමක් දක්නට නිබෙනවා. එහි ප්‍රතිඵල මේ වන විට පුවත්පත් රූපවාහිණියෙන් අපි දක්නවා. පියා අතින් දුව දූෂණය වෙනවා, පුතා අතින් මව දූෂණය වෙනවා. සහෝදරයා හඳුනන්නේ නෑ. නෑදෑයා හිතවතා හඳුන්නනේ නෑ. අපේ පැරණි සිරිත් විරිත්වලට පයින් ගහලා මිනිසුන් විනාශය ළඟා කරගන්න හැටි අපි දකිනවා. අපේ තිලෝගුරු ගෞතම බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් මාර්ගය, දේශනා කළ දහම වැලඳගත් පුද්ගලයන් ජීවිතය හැමදම ජය ගත්තවා. හොඳ සිරිත් විරිත් ඉගෙන ගත්තවා. ජාතියක් වශයෙන් ආගමක් වශයෙන් නොවේ. සමස්තයක් වශයෙන් මම ඉල්ලා සිටිනවා මේ රට මුළුමහත් ලෝකයාගේම අවධානය යොමු වුණු රටක්. ඒ රටේ දැහැමින් පිරි සමාජයක් නිර්මාණය කරන්න කටයුතු කළ යුතුයි."

ඉදි වෙමින් පවතින හිරල්ලුගම ශ්‍රී සුනන්දරාම විහාරස්ථානයේ වාහල්කඩ සඳහා පින් කැමති සැමට සහයෝගය දැක්විය හැකියි. ඒ සඳහා උදව් උපකාර කළ හැකි අය සිටී නම් 0718572548 (විහාරාධිපති) දුරකතන අංකයට දැනුම් දෙන ලෙස හිරල්ලුගම විජයරතන ස්වාමීන් වහන්සේ මතක් කර සිටිති.

රැඳවුවන් සම්පූර්ණ මිනිසුන් කරන මහර බන්ධනාගාරයේ පුස්තකාලය

රාගම සමූහ

සාහිත්‍ය මාසයට තව ඇත්තේ දින කිහිපයකි. හෙළබසින් මෙන්ම තවත් භාෂා කිහිපයකින් සාහිත්‍ය මාසයේදී සුපුරුදු ලෙස ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය පැවැත්වේ. "කියවීම මිතිසා සම්පූර්ණ කරයි" යන්න නොඇසූවකු අප අතර නැත. කියවීමෙහිලා සමාජය උනන්දු කරවීමේ පාඨයක් ලෙස මේ කියමන යොදු ගැනෙන්නේ ඉතා සුලබවය. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන් ප්‍රචලිත නොවූ දුරාතීතයේ පටන් අද දක්වා ම ද ලිඛිත මාධ්‍ය ඔස්සේ දැනුම සම්ප්‍රේෂණය කරවීම දක්නට ලැබේ. එකරුණෙහිලා ඇති වැදගත්කම ඉස්මතු කරලීමට යථෝක්ත පාඨය සමාජගත කෙරෙන්නට ඇත.

දැනුදු බොහෝ දෙනකු සෙසු ලෝකයේ දැනුම, කුසලතා, තොරතුරු, අත්දැකීම් බෙදා හදා ගන්නට කියවීම භාවිත කරනු ලබයි. අන්තර්ජාලය ඔස්සේ පවා පුවත් ආදිය කියවීම අපට හුරුපුරුදු වූවකි. ඇතැම්හු නව කතා, කෙටි කතා, පරිවර්තන කෘති, අනුවර්තන කෘති, ප්‍රබන්ධ ආදිය කියවති. ඒ වෙනුවෙන් කාලය ද වැය කරති. මේ සියල්ලෙන් 'කියවීම' ජීවිත සාර්ථකත්වයට බෙහෙවින් රුකුල් දෙන්නක් බවට ලෝකය ම විශ්වාස කරන බවක් පෙනේ.

ලෝකය හා සම්බන්ධතා පැවැත්වීමට නොහැකි අය සම්පූර්ණ මිනිසකු නොවනු ඇත. එම අඩුපාඩුව සම්පූර්ණ කරමින් විවිධ වැරදි සඳහා බන්ධනාගාරගතව සිටින රැඳවූවන්ගේ කියවීමේ රුචිකත්වය වෙනුවෙන් මෙන්ම ඔවුන්ගේ පුනරුත්ථාපන ක්‍රියාවලිය වඩාත් අර්ථවත් කිරීමට මහර බන්ධනාගාරයෙන් ලැබෙන්නේ මනා පිටිවහලකි. ඒ රැඳවූවන් සඳහා විවෘත මහර බන්ධනාගාරයේ පුස්තකාලයයි.

මීට වසර කිහිපයකට පෙර ආරම්භ කර ඇති මෙම පුස්තකාලය මහර බන්ධනාගාරයේ හිටපු අධිකාරිවරුන්ගේ උපදෙස් මත වරින් වර වැඩි දියුණු වී ඇති අතර වත්මන් මහර බන්ධනාගාර අධිකාරී ජගත් චන්දන වීරසිංහ මහතාගේ උපදෙස් හා මහපෙත්වීම මත පුනරුත්ථාපන නිලධාරිනී එන්. කේ. ගුණවර්ධන මහත්මියගේ ප්‍රධානත්වයෙන් මේ වන විට මෙහි පරිපාලන කටයුතු සිදු වේ.

මෙම පුස්තකාලයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් රචිත ග්‍රන්ථ 4000කට අධික ප්‍රමාණයක් සහ බෞද්ධ, හින්දු ඇතුළු ආගමික ග්‍රන්ථ 1500කට අධික සංචිතයක් පවතින අතර මහර බන්ධනාගාරයේ රඳවා සිටින සිරකරුවන් හා සැකකරුවන් හට මෙම පුස්තකාලය හරහා පොත් කියවීමට අවස්ථාව සලසා දී තිබේ. ශ්‍රී ලංකා රතුකුරුස සංවිධානය හා තවත් ආයතන රැසක් මෙම පුස්තකාලය සඳහා පොත් සපයා දී ඇති අතර විවිධ විෂය ක්ෂේත්‍ර රැසක් ආවරණය වන පරිදි මෙහි පොත් ඇත. රැඳවූවන් පොත් කියවීම සඳහා විශාල උනන්දුවක් දක්වන බවත් විශේෂයෙන් පසුගිය කොරෝනා සමයේදී හූදෙකලා වී සිටි මහර රැඳවූවන් වැඩි වශයෙන් පොත්පත් කියවීමට නැඹුරු වූ බවත් අප සමඟ අදහස් දක්වමින් මහර බන්ධනාගාර අධිකාරී ජගත් චන්දන වීරසිංහ මහතා ප්‍රකාශ කළේය.

ගිරිහඬු සෑ කේශ ධාතු පූජා පින්කම් මාලාව

ගිරිහඬු සෑරදු

පූජ්‍ය දෙවිනුර චන්දිම හිමි

ඒ. ටී. එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

ලොව ප්‍රථම චෛත්‍ය නිර්මාණය ලෙස සැලකෙන බුදුරදුන්ගේ ජීවමාන කේශ ධාතු නිදන්ගත ත්‍රිකුණාමලය තිරියායේ වැඩසිටින ගිරිහඬු සෑරදුන් උදෙසා වාර්ෂිකව පැවැත්වෙන 'කේශ ධාතු පූජා පින්කම් මාලාව' අගෝස්තු 25 වැනි දින සිට 30 වැනි දින දක්වා එම සෑරදුන් අබියසදී පැවැත්වීමට නියමිතය.

අගෝස්තු 25 වැනිදායින් ආරම්භ කර 30 වැනිදා දක්වා සෑම දිනකම පෙරවරු 06.00ට සහ පස්වරු 06.00ට කේශ ධාතු පූජා පෙරහර හා කේශ ධාතු පූජා වන්දනාව සිදු කරන බව ගිරිහඬු සෑ විහාරාධිපති ගුරු උපදේශක සද්ධර්ම කීර්ති ශ්‍රී ශාස්ත්‍රපති දෙවිනුවර චන්දිම අමරපුර මහ නිකායේ තැඟෙනහිර දෙපළාතේ ප්‍රධාන සංඝනායක හිමියෝ පැවසූහ.

මීට අමතරව අගෝස්තු 25 හා 30 යන දෙදින තුළ මහා සංඝරත්නය උදෙසා උදේ හා දහවල් සංඝගත දක්ෂිණාවක් ද පැවැත්වීමට නියමිත අතර අගෝස්තු 30ද පෙරවරු 08.00ට දේව දානයක්ද පිරිනැමීම සිදු කරන බව විහාරාධිපති හිමියෝ පැවසූහ. මෙම පින්කම් මාලාවට සමගාමීව අපවත් වී වදළ ගන්දර ආතන්ද හිමිපාණන් වහන්සේගේ ගුණානුස්මරණය ද සිදු කිරීමට නියමිතව ඇත.

මහ සමන් දේවාල පෙරහර සම්ප්‍රදායට මුල්තැන දෙමින්

රූපිකා කේ. බණ්ඩාර
කුරුවිට සමූහ

සබරගමුව මහ සමන් දේවාලයේ 795 වැනි ඇසළ මහා පෙරහර හෙට (20) කප් සිටුවීමෙන් ආරම්භ කිරීමට නියමිතය. විසි වැනි දින සිට විසිතුන් වැනි දින දක්වා කුඹල් පෙරහරද විසිහතර වැනි දින සිට විසිඅට වැනි දින දක්වා විදි පෙරහරද විසිනව වැනි දින සිට සැප්තැම්බර් දෙවැනි දින දක්වා රන්දේලි පෙරහරද 03 වැනි දින සිරිත් පරිදි රතඹලා ඇල්ල තොටුපළෙන් දිය කැපීම චාරිත්‍රානුකූලව සිදු කර දහවල් පෙරහර පවැත්වීමෙන් පසුව තිමාවට පත්වේ.

සාම්ප්‍රදායික හා ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් සෞඛ්‍ය උපදෙස්වලට අනුව අවම කලාකරුවන් පිරිසකගේ සහභාගිත්වයෙන් මෙවර පෙරහර පැවැත්වීමට කටයුතු යොදු තිබෙන බව රත්නපුර දිස්ත්‍රික් ලේකම් මාලනී ලොකුපෝතාගම මහත්මිය පැවසීය. ප්‍රධාන පූජ්‍ය ස්ථානවල හා දේවාලවල මෙවර පෙරහර පවත්වන ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් උපදෙස් දී තිබෙන බව ද වන්දනා ගමන් ආඥු පනත යටතේ මෙම පෙරහර රාජ්‍ය උත්සවයක් බවට පත් කිරීමෙන් පසුව පවත්වන ප්‍රථම පෙරහර බව ද ලොකුපෝතාගම මහත්මිය පවසා සිටියාය. සබරගමුව මහ සමන් දේවාලයේ බස්නායක නිලමේ මිගාර ජයසුන්දර මහතා පවසා සිටියේ මෙවර පෙරහර සෞඛ්‍ය නීතිරීති අනුව යම් යම් සීමාවන්ට යටත්ව පැවත්වුවද අභිමානවත්ව හා උත්කර්ෂවත්ව සිදු කරන බවයි.

'ඇමෙරිකානුවන් සිත්ගත් ධම්මවංශ හාමුදුරුවෝ' කෘතිය දොරට වඩී

එස්. ජී. විජේරත්න
කටුගස්තොට සමූහ

යටිහලගල ශ්‍රී සුමනාරාමය හා දෙඩම්වල ශ්‍රී සුභද්‍රාරාම විහාරයන්හි විහාරාධිපති අති පූජ්‍ය දම්බරාවේ ධම්මාලංකාර නායක හිමිපාණන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය ඇමෙරිකා එක්සත් ජනපදයේ ෆ්ලොරිඩා බෞද්ධ මධ්‍යස්ථානයේ නිර්මාතෘවර රාජකීය පණ්ඩිත පූජ්‍යපාද බැද්දේගම ධම්මවංශ මාහිමිපාණන් වහන්සේගේ චරිතාපදානය ඇසුරින් ප්‍රවීණ ගත්කතුවර නිමල් සේදර මහතා විසින් රචිත 'ඇමෙරිකානුවන් සිත්ගත් ධම්මවංශ හාමුදුරුවෝ'කෘතිය දෙරට වැඩුම හා පිළිගැන්වීමේ මහෝත්සවය මෙම මස 22 වැනි දින පස්වරු 02.30ට දෙඩම්වල ශ්‍රී සුභද්‍රාරාම විහාරස්ථානයේදී ගිහිපැවිදි විසින් සම්භාවනීය පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත්වීමට නියමිතය.

දිව්‍ය සත්ප්‍රසාද ලැබීම

ආර්. ඇම්. කරුණාතිලක
උඩුබද්දාව සමූහ

උඩුබද්දව ශුද්ධ වූ ජොහානාදර්ක දේවස්ථානයේ ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද ලැබීමේ දේව මෙහෙයක් පසුගියද (16) එම මිසම් පාලක ගරු පේරම් පෙරේරා පියතුමාගේ අවවාද අනුශාසනා මත උත්කර්ෂවත්ව පැවැත්විණි. ඉනෝකා සාවිත්‍රි මහත්මියගේ සහ සචිනි මධුෂිකා මෙණෙවියගේ පුහුණු කිරීම්වලින් අනතුරුව පැවැති මෙම දේව මෙහෙය අවසානයේ ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද ගත් දරු දැරියන් පේරම් පෙරේරා පියතුමා සහ ගුරු මහත්මීන් සමඟ සමූහ ඡායාරූපයකට පෙනිසිටි අයුරුයි මේ.

කාබනික ආහාර වගාවේ අගයයි මේ කියන්නේ

රෝහණ ආරියරත්න - හම්බන්තොට විශේෂ

හම්බන්තොට දිස්ත්‍රික්කයේ කාබනික වගාව ප්‍රචලිත කිරීමත් සිය සාමාජික ප්‍රජාවගේ ගෙවතු වගා සංවර්ධනය කර වස විසෙන් තොර ආහාර වර්ග වගා කිරීමත් අරමුණු කොට ගෙන හම්බන්තොට සමාජ නියාමක සංවර්ධන පදනම මගින් "නූතන කාබනික කෘෂි තාක්ෂණය ප්‍රචලිත කිරීම" යන මැයෙන් කාබනික වගාවේ ඇති වැදගත්කම පිළිබඳ එම ආයතනයේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ දින දෙකක පුහුණු වැඩමුළුවක් පසුගියද පැවැත්විණි.

මෙම පුහුණු වැඩමුළුවේ සම්පත් දායක ලෙස දැනට කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදේශකවරයකු ලෙස කටයුතු කරනු ලබන හා සබරගමුව විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයකු ලෙස කටයුතු කරනු ලබන පී.අයි. යාපා මහතා විසින් සිදු කරනු ලැබිණි.

එහිදී එක් දිනක් ක්ෂේත්‍රය තුලදී ප්‍රායෝගික ක්‍රියාකාරකම්ද සහිතව පුහුණුවක් ලබා දීම සිදු කරනු ලැබූ අතර එමගින් කොම්පෝස්ට් පොහොර, දියර පොහොර වර්ග සාදා ගන්නා ආකාරයන් පිළිබඳ දැනුවත් කිරීම් සිදු කරනු ලැබිය.

මෙම වැඩමුළුව සඳහා මූල්‍ය දායකත්වය ඉපෙක්ප් (ve effecp) ආයතනය මගින් ලබා දීම සිදු කරනු ලැබූ අතර සමාජ නියාමක සංවර්ධන පදනමේ සේවක සේවිකාවන් 65 දෙනකුට පමණ මෙම වැඩමුළුවවේදී පුහුණුව ලබා දීම සිදු කෙරිණි. ඔහුන් විසින් ඉදිරි කාලයේදී ක්ෂේත්‍ර කටයුතු වලට සහභාගී වී සිය සාමාජිකයින්ට අදාළ දැනුවත් කිරීම් සිදු කිරීමට සැලසුම් කර ඇත,

සතර දෙසින්
pronews@lakehouse.lk
ප්‍රාදේශීය පුවත්

හදිසි ගින්නකින් වතු නිවාස වලට හානි

ආර්. රාජමන්ත්‍රී - වැලිමඩ සමූහ

අඹේවෙල මාර්ටිං වතුයායේ පසුගියද හටගත් හදිසි ගින්නකින් වතු නිවාස 14 හා වෙළෙඳසලක් මුලුමනින්ම විනාශයට පත්ව පුද්ගලයන් 64 කු අවතැන්ව ඇතැයි වැලිමඩ පොලීසිය පවසයි.

මෙසේ හදිසියේ හට ගත් ගින්න විදුලි කාන්දුවකින් හට ගන්නට ඇති බවට සැකකරන බවත් දඩි නියගය හා සුළං තිසා කඩිනමින් ගින්න පැතිර යාමට හේතුවී ඇතැයිද මෙසේ ගින්න හේතුවෙන් සියලුම දේපළ විනාශයට පත්ව ඇති බවත් මෙසේ අවතැන්වූ පිරිස් වතුයායේ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ තාවකාලිකව පදිංචි කිරීමට වැලිමඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාල ආපදා කළමනාකරණ ඒකකය සමග පියවර ගත් බවත් පොලීසිය පැවසීය

'මැන්ඩි' සමඟ අයෙක් දැලේ

දිලිප් නිශ්ශංක - බලපිටිය සමූහ

රුපියල් කෝටි විස්සක් පමණ වටිනා මැන්ඩි තමැති මත්ද්‍රව්‍ය කිලෝ දෙළහක් සමඟ තිස් පස් හැවිරිදි පුද්ගලයකු අත්අඩංගුවට ගත් බව අම්බලන්ගොඩ පොලීසිය පවසයි.

පොලිස්පතිතුමාට ලද තොරතුරක් මත ක්‍රියාත්මක වූ ගල්කිස්ස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සහ දෙහිවල පොලිස් අධිකාරීවරයාගේ ද උපදෙස් මත සිදු කළ වැටලීමෙන් සැකකරු අත්අංගුවට ගත් බව පොලිසිය පවසයි. සැකකරු පොලිස් අත්අඩංගුවට පත්ව ඇත්තේ අම්බලන්ගොඩ පටබැඳිමුල්ල වෙරළ මාවතේදීය. මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ අම්බලන්ගොඩ කලුවඩුමුල්ල පදිංචි බහුදින යාත්‍රා හිමිකරුවෙකි.

මේ මැන්ඩි මත්ද්‍රව්‍ය රාත්‍රී සමාජ ශාලා වල සාද සඳහා භාවිතා කරන බවද පොලිසිය පවසයි. මෙම සැකකරු බල-පිටිය වැඩබලන මහේස්ත්‍රාත් සංජය කොඩිතුවක්කු මහතා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව 21 ද දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට නියෝග කළේය. පොලිසිය සැකකරු ඉදිරිපත් කරමින් පැමිණිල්ල මෙහෙයවීය.

සැමගේ සහායෙන් ගින්න මැඩ පවත්වයි

ඇම්.පී. සරත් - පොලොන්නරුව දිසා සමූහ

හිතුරක්ගොඩ පාළුවැව දුම්රිය මාර්ග රක්ෂිතයේ ඇතිවූ ගින්නකින් අක්කර 10ක පමණ ගස් වැල් විනාශ වී ඇත.

පැතිර යමින් තිබූ ගින්න ප්‍රදේශවාසීන් හිතුරක්ගොඩ පොලිසිය යුද හමුදාව සිවිල් ආරක්ෂක අංශය එක්වී ගින්න නිවා දමා ඇත. ගින්න ඇති වූයේ කෙසේද යන්න පිළිබඳව හිතුරක්ගොඩ පොලිසිය පරීක්ෂණ කටයුතු කර ගෙන යයි.

කඩය කඩා මුදල් සහ රන් බඩු සොරාගෙන

කළුතර මධ්‍යම සමූහ

දකුණු කළුතර විජේරත්නවත්ත ප්‍රදේශයේ වෙළෙඳසලක් රාත්‍රී කාලයේ බිඳ රුපියල් 35දහක් වටිනා මුදල් හා දේපළ සොරාගෙන යාමේ සිද්ධියක් පිළිබඳ දකුණු කළුතර පොලිසිය පරීක්ෂණ පවත්වයි.

මහවිදුහලාගේ කැලුම් පෙරේරා යන අය විසින් කරන ලද පැමිණිල්ලට අනුව මේ පිළිබඳ පරීක්ෂණ ආරම්භ කොට තිබේ.

නිවසේ උඩු මහලේ දෙරටුව කඩා ඇතුළු වී මෙම සොරකම සිදු කර ඇති බව ඔහු පොලිසියට ප්‍රකාශ කර ඇත.

රන් බඩු කොල්ලකෑ යුවළ අසු වේ

රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

යාපනයේ නල්ලූර් කෝවිලේ වාර්ෂික මංගල්ල සමයේදී බැතිමතුන්ගේ රන් භාණ්ඩ කොල්ලකෑමට පැමිණ සිටි සංවිධානාත්මක යුවළක් යාපනය පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

මඩකලපුවේ සිට පැමිණ ඇති මෙම යුවළ යාපනය නල්ලූර් කෝවිලේ පූජාව පැවැත්වෙන අවස්ථාවේදී වයෝවෘද්ධ කාන්තාවකගේ ගෙලෙහි බැඳ තිබූ පවුම් හතරක් පමණ බරැති රන් මාලයක් කඩාගෙන පලාගොස් තිබේ. මේ අවස්ථාවේදී පොලිස් නිලධාරීන් පිරිසක් කොල්ලකරු අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමෙදී ඔහුගේ බිරිය පිළිබඳව තොරතුරු හෙළි වී ඇත.

කහ වෙළෙඳාම ජාවාරමක් කරගෙන

එච්.එල් ද සොයිසා - ලංකාපුර සමූහ

කොරෝනා වසංගතය මුවාවෙන් පාරිභෝගික භාණ්ඩ වැඩි මිලට විකුණන වෙළෙන්දන්ට කහ වෙළෙඳාම කප්රුකක් කර ගැනීමට රජය ඉඩදී ඇතැයි පොලොන්නරුව ජනතාව චෝදනා කරති.

කොරෝනා වසංගතයේ අවදානම් කාලය ලෙස හැඳින් වූ ජූනි හා ජූලි මාසවලදී පොලොන්නරුවේ කහ ග්රෑම් 100ක් රු:150/=කට අලෙවි කළත් පොලොන්නරුව,හිඟුරක්ගොඩ නගරවල අද කහ ග්රෑම් 100 ක් රු:500/= දක්වා ඉහළ ගොස් ඇතැයි ඔවුහු පෙන්වා දෙති.

මෙම නගර වල කහ අලෙවි කරන වෙළෙඳසල් හිමියන් පාරිභෝගිකයන් මිලදී ගන්නා දුව්‍ය වලට බිල්පත් නිකුත් කිරීමේදී එයට කහ මිල ඇතුළත් නොකර එම මුදල වෙනම අය කර ගන්නා බවද පවසන පාරිභෝගිකයෝ වෙළෙන්දන්ගේ මේ ජාවාරම නතර කිරීමට රජය වහාම වෙළෙඳ පොළට අවශ්‍ය කහ තොග නිකුත් කිරීමට කටයුතු කළයුතු යැයි කියා සිටිති.

මත් ජාවාරම් කළ කතක් ඇතුළු 5ක් අත්අඩංගුවේ

සනත් ගමගේ - ලුණම සමූහ

ගනුදෙනු ඊයි කෑෂ් ක්‍රමයට

අම්බලන්තොට නගරය හා ඒ අවට ප්‍රදේශ රැසකට මත් කුඩු විකිණීමේ ජාවාරමේ යෙදී සිටි කාන්තාවක් ඇතුළු පුද්ගලයන් පස් දෙනකු මත් කුඩු ග්‍රෑම් 3 යි මිලි ග්‍රෑම් 75 ක් සමඟ අත්අඩංගුවට ගැනීමට හැකි වූ බව අම්බලන්තොට පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ජගත් විජේගුණරත්න මහතා කිය.

ඉකුත් 15 සහ 16 යන දෙදින තුළදී අම්බලන්තොට නගරය හා ඒ අවට වලවටත්ත බොරලැස්ස, යන ප්‍රදේශයේ සිදු කළ වැටලීමක දී 24 හැවිරිදි කාන්තාවක් ඇයගේ නිවෙසේ දීම මත් කුඩු සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

අදාළ කාන්තාව අත්අඩංගුවට ගනු ලැබූ අවස්ථාවේදී ඇය සන්තකයේ තිබී හෙරොයින් මත්කුඩු ග්රෑම් 1යි මිලිග්‍රෑම් 310 ක් සොයා ගැනීමට පොලිසියට හැකිවී ඇති අතර ඇය සන්තකයේ තිබූ ජංගම දුරකතන දෙකක්ද පොලිස් භාරයට ගැනිනි. ඉන් එක් ජංගම දුරකතනයකට පැමිණී පෞද්ගලික බැංකු කෙටි පණිවිඩයකට අනුව පොලිස් නිලධාරීන් ඇයගේ බැංකු ගිණුම පරීක්ෂාවට ලක්කර තිබූ අතර ඒ වන විට එම ගිණුමේ ලක්ෂ 28ක තැන්පත් මුදලක් තිබී ඇති අතර ඊයි කෑෂ් ක්‍රමයට මත්කුඩු ලබාගත්නා විවිධ පුද්ගලයන් එම ගිණුමට මුදල් බැර කිරීමෙන් අනතුරුව මත්කුඩු සැපයීම සිදු කර තිබෙන බවට පොලිසිය තොරතුරු අනාවරණය කර ගැනීමට හැකිවී ඇත.

එමෙන්ම අම්බලන්තොට දෙහිගහලන්ද ප්‍රදේශයේදී මත්කුඩු පැකට් කරමින් සිටියදී හෙරොයින් ග්‍රෑම් 1 යි මිලිග්‍රෑම් 940 ක් සමඟ අත්අඩංගුවට ගත් අනෙක් සැකකරුවන් තිදෙනා සමඟ ඔවුන් සතුව තිබී මෙම මත්ද්‍රව්‍ය සඳහා කලවම් කරන ලද යම් රෝගයක් සඳහා දෙනු ලබන ඖෂධ පෙති විශේෂයක් ද සොයාගත් බවත් පසුව ඔවුන්ගෙන් කළ ප්‍රශ්න කිරීමේදී ඔවුන්ට මෙම මත්ද්‍රව්‍ය ව්‍යාපාරය කරගෙන යාම සඳහා මුදල් සැපයූ වලස්මුල්ල ප්‍රදේශයේ වයස අවුරුදු 20ක පමණ යෝගට් ව්‍යාපාරිකයකු හා ඔහුට අයත් කුඩා ලොරි රථයක්ද පොලිස් භාරයට ගැනීමට පොලිසිය සමත් වී ඇත.

අම්බලන්තොට පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ජගත් විජේගුණරත්න මහතාගේ උපදෙස් මත පොලිස් සැරයන්වරුන් වන 255 පද්මසිරි, 55971 ගුණරත්න, 38721 නිමල්,4451 විරසිංහ, පො.කො 89404 අනුජ ,92980 සමත්, කා.පො.කො 8941මනෝහාරි ,7674 දීපිකා යන නිලධාරීහු මෙම වැටලීමට සහභාගී වූහ.

නර්තන තරගාවලියෙන් මලින්සාට දෙවනතැන

පසුගියද පැවැත්වුණු බස්නාහිර පළාතේ සණස නර්තන තරගාවලියෙන් දෙවන ස්ථානය දිනාගැනීමට ජේ.ඒ.මලින්සා මුතුමිණී දියණිය සමත් වූවාය. මෙම නර්තන තරඟාවලිය බස්නාහිර පළාත් සණස ප්‍රාදේශීය බල මණ්ඩලය මගින් පවත්වන ලදී

වන අලින්ගෙන් අස්වනු හානි

රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

වවුනියාවේ සේමමඩු ප්‍රදේශයට කඩා වැදුණු වන අලි රංචුවක් එම ගම්මානයේ ගොවීන්ගේ නිවෙස් වල තිබූ වී තොගයක්ම කා දමා තිබේ.

වන අලි නිවෙස් වල ජනෙල් වලින් ගොස්, නිවෙස් වල තිබූ වී තොග කා දැමූ බව පවසන සේමමඩු ප්‍රදේශයේ ගොවීන් වන අලින්ව පලවා හැරීමට අලි වෙඩි දැමූ අවස්ථාවේදී ගම්මුන් පසුපස ඔවුන් එලවා ගෙන පැමිණ ගම්මුන් බිය කොට වී කා දැමූ බවද කියා සිටියහ.

මේ වසරේ ගතවූ මාස අට ඇතුළත වන අලි පහර දීම නිසා මේ ප්‍රදේශයේ එක් අයකු මියගොස් තවත් හතර දෙනකු තුවාල ලැබූ බව කියන ගම්වාසීන් ,මේ තත්ත්වය නිසා ගම්මුන්ට වන අලින් පලවා හැරීමට විශාල බියක් ඇති බවද කියා සිටිති.

වන අලි රංචු මේ දිනවල ජලය සොයමින් ගම් හරහා වැව් වලට මහදවල් යන අතරවාරයේදී ගොවීන්ගේ වගාවන්ට හා නිවෙස් වල ගොඩ ගසා ඇති වී තොග වලට හානි සිදු කරන්නට පටන්ගෙන තිබේ.

යුධගනාව -අම්බලන්පොත පාරේ අබලන් තැන් පිළියම් කරමු

ජී. අයි. ආර් ගරුසිංහ -චැල්ලවාය විශේෂ

පවුල් දහස් ගණනක් දෛනිකව ප්‍රයෝජනයට ගන්නා බුත්තල යුධගනාව සිට අම්බලන්පොත හංදිය දක්වා ඇති කිලෝමීටර් දහයකට අධික දුරක් සහිත කාපට් මාර්ගයෙ බොහෝ ස්ථාන වළවල් හැරි දැඩිලෙස අබලන් ව ඇතැයි ප්‍රදේශවාසිහු පසති.

ගල් ප්‍රවාහන කරන ටිපර් රථ මෙන්ම දැව ප්‍රවාහනය කරනු ලබන ලොරි හේතුවෙන් මෙම මාර්ගය විශාල වශයෙන් අබලන්වීමට බලපා ඇතැයි පෙන්වාදෙන ප්‍රදේශවාසීන් මෙම මාර්ගයේ අබලන් වූ ස්ථාන දහයක් පමණ ඇති බැවින් ඒවා යථාත්තවයට පත්කරදෙන්නැයි මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉල්ලා සිටිති .

කෝ කාපු සර්පයා?

කේ. ප්‍රියංකර කළුපහන - වනාතවිල්ලුව සමූහ

දෙයියෝ සාක්ෂි

පූත්තලම ප්‍රදේශයේ එක්තාරා ග්‍රාමීයක රෝහලකට, හදිසියේ සර්පයකු දෂ්ට කිරීමෙන් ළමයකු ඇතුළත් කිරීමට පැමිණි මොහොතේ තිවැසියන් මුහුණු දුන් අකරතැබ්බයක් පිළිබඳවයි මේ.

පූත්තලම ප්‍රදේශයේ ගොවි ජනපදයක සවස් කාලයේ මිදුලේ සෙල්ලම් කරමින් සිටි 13 හැවිරිදි වියේ පිරිමි දරුවකු දෙසට ඇදී හා සර්පයකු පැගීමෙන් කලබලයට පත් තිවැසියන් සර්පයකු දෂ්ට කළා යැයි සිතා වහාම මීටර් 500ක් පමණ දුරින් පිහිටි ග්‍රාමීය රෝහලට දරුවාද රැගෙන ප්‍රතිකාර සඳහා පැමිණ තිබේ.

එම අවස්ථාවේදී අදාළ රෝහල තුළ වෛද්‍යවරයා සිට නොමැති අතර තිල තිවසේ වෛද්‍යවරයා විවේක ගනිමින් සිට ඇති බව වාර්තාවේ. රෝහලේ රෝහල් කම්කරු කාන්තාවක් වන ඇය රෝගී දරුවා වෙත දුවගෙනවිත් ඇයි...ඇයි...මොකද...මොකද යනුවෙන් අසන්නට විය.

අනේ මෙයාට සර්පයෙක් කාලා වගේ මිසී යැයි තිවැසියෙක් පිළිතුරු දුනි. කෝ...කාපු සර්පයා මරලා ගෙනාවදැයි ඇසූ රෝහල් සාත්තු සේවිකාවට ලැබුණේ නැහැ යන පිළිතුරය.

පසුව අදාළ රෝහල් සාත්තු සේවිකාව රෝහලේ බිත්තියේ සවිකර තිබූ විශාල නාමපුවරු සොයන්නට විය. කෝ අර තයි බෝඩ් එක. කෝ අර තයි බෝඩ් එක යනුවෙන් පසුව තිදිමරගාතේ සිටි තවත් සාත්තු සේවිකාවක් කුතහලයෙන් මෙන් මොන තයි බෝඩ් එකදැයි විමසන්නට විය.

පසුව ඇය කියා සිටියේ මේ ළමයට සර්පයෙක් කාලා ලු ඩොක්ටර් එන්න කලින් අපි සර්පයාව හොයා ගන්න ඕනෙ.

ඉක්මනට ගිහිල්ලා සර්ප බෝඩ් එක ගේන්න යනුවෙන් තිදිමර ගාතේ සිටිය අනෙක් සාත්තු සේවිකාවට ඇය අන කළාය. පසුව තිදිමරගාතේ සිටි අනෙක් සාත්තු සේවිකාව විවේකාගාරයට දිව ගොස් රාත්‍රී කාලයේ මොවුන් පාළුව කාන්සිය මගහරවා ගැනීමට විනෝදයට ඉන්තං යොදු ගන්නා සර්ප පංච ලැල්ල රැගෙන එන්නට විය.

පසුව රෝගී දරුවාට එම සෙල්ලම් සර්ප ලැල්ල පෙන්වා පුතේ කොයි එකාද ඔයාට හැපුවෙ කියන්න යනුවෙන් කියන්නට විය අසාධ්‍ය තත්ත්වයේ සිටි දරුවා ද බකස් යනුවෙන් කොක් හඩලා සිනා සෙන්නට විය.

තියුණු ආයුධයකින් ගෙල කපා අනියම් බිරිය මරලා

සේන වේරගම
කලවාන සමූහ

කලවාන දෙල්ගොඩ ගෝණුලකන්ද ප්‍රදේශයේදී පුද්ගලයකු විසින් සිය අනියම් බිරියගේ ගෙල තිවෙස තුළදීම කපා 17 වනද රාත්‍රියේදී ඝාතනය කර ඇතිබව කලවාන පොලීසිය කියයි.

මෙලෙස ඝාතනයට ලක්ව ඇත්තේ එම ප්‍රදේශයේ පදිංචිව සිටි ලියනගේ දේන අනුලාවති නමැති 48 හැවිරිදි එක්දරු මවක් බව පොලීසිය පැවසීය දීර්ඝ කාලයක සිට ආරවුල් ඇතිව පොලීසියට පැමිණිලි ලැබී ඇති බවත් ගෘහස්ත ප්‍රවණ්ඩත්වය යටතේ නඩුපවරා උසාවි නියෝගය අනුව දෙදෙනා ඉඩමේ වෙන් වෙන්ව නිවාස තනා ජීවත්ව ඇති බවද පොලීසිය පැවසීය . රාත්‍රියේ ඇති වූ බහින්බස් විමක් නිසා මෙම සිදුවීම සිදුව ඇති බවත් පසුව ඝාතනයට ලක් වූ කාන්තාව 1990 ගිලන් රථයකින් කලවාන මූලික රෝහල වෙත ඇතුළත් කර ඇති අතර ඒ වන විටත් ඇය මියගොස් සිටි බවත් ඝාතනය තියුණු ආයුධයකින් ගෙල කපා සිදුකර ඇතිබවත් ඝාතනය සම්බන්ධයෙන් සැමියා පොලිස් අත්අඩංගුවට ගෙන ඇති බවත් පොලීසිය පැවසීය.

සිද්ධිය සම්බන්ධයෙන් කලවාන පොලීසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්. කේ.සී.එස් දයාවංශ මහතාගේ උපදෙස් මත අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක අමරපාල පොලිස් පරීක්ෂක රංජිත්, උප පොලිස් පරීක්ෂක හරිස්චන්ද්‍ර, උප පොලිස් පරීක්ෂක ගමඇතිගේ ,මහත්වරු පරීක්ෂණ පවත්වති.



කෑගල්ලේ හෙක්ටයාර් 1067ක කාබනික වී වගා

විපුල එස් කුමාරතුංග
රඹුක්කන උතුර සමූහ

කාබනික වී ගොවිතැනට ගොවීන් හුරුකිරීමේ ජාතික වැඩසටහන යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ඉදිරි මහ කන්නයේ දී සියලුම ගොවිජන සේවා බලප්‍රදේශ ආවරණය වන පරිදි හෙක්ටයාර් 1067ක් වගා කිරීමට පියවර ගෙන තිබේ.

මෙම වැඩසටහන යටතේ වී ගොවිතැන සඳහා කාබනික පොහොර යොදා ගනිමින් පැරණි සහ නව වී ප්‍රභේද හඳුන්වා දෙමින් වගා කිරීම් සිදු කිරීමට සැලසුම් කර තිබෙන බව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් මහින්ද එස් විරසූරිය මහතා පැවසීය.

මෙම වැඩසටහන නියමු ව්‍යාපෘතියක් ලෙස තෝරා ගත් ගොවිජන සේවා බල ප්‍රදේශ කීපයක හෙක්ටයාර් 23ක නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කිරීමට පියවර ගැනීමත් සමඟ ගොවීන්ගේ ඉල්ලීමට අනුව ඉදිරියේ දී මහ කන්නයේ දීහෙක්ටයාර් 1067 වගා කිරීමට සැලසුම් කර තිබෙන බව හෙතෙම වැඩිදුරටත් පැවසීය.

පොලිස් අණ නොතකා කුඩු රැගෙන පලා ගිය තරුණයෝ 5ක් කොටු

ඩබ්ලිව්.පී. ධර්මසේන - මාතර සමූහ

පොලිස් අණ නොතකා පලාගිය ත්‍රිරෝද රථයක සිටි තරුණයන් 05 දෙනකු හෙරොයින් ග්‍රෑම්7යි මිලිග්‍රෑම් 330ක් සමඟ අත්අඩංගුවට ගැනීමට මාතර කොට්ඨාස දූෂණ මර්ධන අංශයේ නිලධාරීන්ට හැකිවී ඇත. සැකකරුවන් අතර හෙරොයින් ජාවාරම සම්බන්ධයෙන් මහාධිකරණයෙන් ඇප ලැබූ අයෙක්ද සිටින බව හෙළිවේ. මාතර වල්ගම හන්දියේ හෙරොයින් ජාවාරමක් සිදුවන බවට පසුගිය දින මාතර කොට්ඨාස දූෂණ මර්ධන අංශයේ නිලධාරීන්ට ලැබුණු තොරතුරක් මත ස්ථානාධිපති උපපොලිස් පරීක්ෂක මෙන්ඩිස්, උප පොලිස් පරීක්ෂක ප්‍රියංකර , යන මහත්වරුන් ප්‍රමුඛ නිලධාරීන් වල්ගම හන්දියට පැමිණෙනවාත් සමඟ එහි තතර කර තිබූ ත්‍රිරෝද රථයක් පොලිස් කැබරථයට වෙට්ටුවක් දමා පලාගොස් ඇත. මෙම අවස්ථාවේ ත්‍රිරෝද රථය පසු පස හඹාගිය පොලිස් කැබරථය කිලෝමීටර් 05 ක් දුරකට පසුපස හඹාගොස් මාතර ඉසදින් නගරයේදී ත්‍රිරෝද රථය නවතාගෙන පරීක්ෂා කිරීමේදී එහි සිටි තරුණයන් පස්දෙනාගේ යට ඇඳුම්වල සඟවාගෙන සිටි හෙරොයින් ග්‍රෑම් 7- මිලි ග්‍රෑම් 330ක් අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරුවන් අවුරුදු 33, 24, 23, 21, 20, යන වයස්වල පසුවෙන්නත් වන අතර මාතර, පොල්ගේන, වල්ගම යන ප්‍රෙදශවල පදිංචි කරුවෝ වෙති. වයස අවුරුදු 33 ක් වූ සැකකරු හෙරොයින් ජාවාරමක් සම්බන්ධයෙන් මාතර මහ අධිකරණයේ පවරා ඇති නඩුවකින් ඇප ලබා පැමිණි විශසම අනෙකුත් තරුණයන් සිව් දෙනා සමඟ ගාල්ල ප්‍රදේශයෙන් හෙරොයින් ගෙනැවිත් ජාවාරම් කර ඇති බව පොලීසිය හෙළි කරගෙන ඇත.

පොල් ගෙඩි 5978ක් දෙවියන් ඉදිරියේ බිඳ දමති

රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

යාපනය නල්ලූර් කෝවිලේ 17 ද පැවති විශේෂ පූජාවේදී බැතිමතුන් විසින් පොල් ගෙඩි 5978ක් දෙවියන් ඉදිරියේ බිඳ දමා තිබේ.

කතරගම දෙවියන් උදෙසා වූ බාර ඔප්පු කිරීම සඳහාත් දිනපතාම කෝවිලේ කපුරු දල්වා පොල් බිඳීම චාරිත්‍රක් වීමත් නිසා බැතිමතුන් මේ අන්දමට පොල් බිඳ තිබේ.

මේ දිනවල නල්ලූර් කෝවිලේ වාර්ෂික මංගල්‍යයේ අවසන් විශේෂ පූජා පැවැත්වෙන අතර අගෝස්තු මස 20 වෙනිදා පැවැත්වෙන විශේෂ දේව පූජාවෙන් පසුව නල්ලූර් කෝවිලේ වාර්ෂික මංගල්‍යය අවසන් වෙයි.

හෙරොයින් සහ මාවා සමඟ 12ක් කළුතරදී අල්ලයි

ප්‍රියදර්ශනී කහවල - ඉංගිරිය මධ්‍යම සමූහ

කාන්තාවක්ද ඇතුළුව මත්ද්‍රව්‍ය ළඟ තබාගෙන සිටි පුද්ගලයන් පස් දෙනෙක් සහ වරෙන්තුකරුවන් හත් දෙනකු ඇතුළුව සැකකරුවන් දෙළොස් දෙනකු අත්අඩංගුවට ගැනීමට දකුණු කළුතර පොලීසිය සමත්ව තිබේ.

මත්ද්‍රව්‍ය සන්තකයේ තිබී අත්අඩංගුවට පත්වූ පස්දෙනා අතුරින් තිදෙනකු සන්තකයේ තිබී ඇත්තේ 'මාවා' නමැති මත්ද්‍රව්‍ය බවත්, ඉන් එක් අයකු කාන්තාවක් වන බවත් පොලීසිය පවසයි.

මත්ද්‍රව්‍ය ළඟ තබාගෙන සිටි අනෙක් සැකකරුවන් දෙදෙනා සන්තකයේ තිබී හෙරොයින් මිලිග්‍රෑම් 1200ක් හා මිලිග්‍රෑම් 1100ක් පොලිස් භාරයට ගෙන ඇති අතර, කළුතර වත්තමුල්ල ප්‍රදේශයේ සිදුකළ විශේෂ සෝදිසි මෙහෙයුමකදී මෙම පුද්ගලයන් අත්අඩංගුවට පත්ව ඇත.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ උපදෙස් මත කළුතර මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක සුනෙත් ශාන්ත ඇතුළු නිලධාරිහු සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුරටත් පරීක්ෂණ පවත්වති.

සැකකරුවන් කළුතර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

බලපත්‍ර නැතිව ගිනිඅවියක් සහ පතොරොම් ළඟ තබාගත්තැයි සැකකරුට ඇප

ඒ.පී. දයාචන්ද්‍ර - උඉරුබොක්ක විශේෂ

බලපත්‍රයක් නොමැතිව බෝර 12 පතොරොම් තුවක්කුවක් සහ එයට යොදන ජීව උණ්ඩ 07ක් සමඟ අත්අඩංගුවට ගත් පුද්ගලයකු මොරවක මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මොරවක වැඩබලන මහෙස්ත්‍රාත් සී.එස්. දිසානායක මහතා විසින් සැකකරු රුපියල් පනස්දහසක ශරීර ඇපයක් මත මුදහරින ලෙසට නියෝග කළේය.

ඇප තැබීමෙන් පසු අගොස්තු 25 දින අධිකරණයේ පෙනී සිටින ලෙසට සැකකරුට නියෝග කෙරිණි. මෙසේ ශරීර ඇප මත මුදහරිනු ලැබුවේ බෙංගමුව දෙකද්දණ්ඩ පදිංචි ලියනගේ චන්දසිරි සමරනායක (59) යන අයයි.

උඉරුබොක්ක පොලිස් ස්ථානාධිපති ප්‍ර. පො.ප.සමරවික්‍රම මහතාගේ උපදෙස් අනුව පැමිණිල්ල වෙනුවෙන් පො.සැ.56012 පේමරත්න මහතා අධිකරණයට කරුණු දැක්වීය.

මුහුදුකුඩැල්ලන් ඇල්ලූ ධීවරයෝ දෙදෙනෙක් අත්අඩංගුවට

ඒ.ටී.එම්.ගුණානන්ද -ත්‍රිකුණාමලය විශේෂ

කිත්තියා මුහුදේ වලංගු මෙහෙයුම් බලපත්‍රයක් නොමැතිව පෙරේදා (17) අලුයම නීති විරෝධී ලෙස කිමිදුම් කටයුතුවල යෙදී මසුන් හා මුහුදු කුඩැල්ලන් ඇල්ලූ ධීවරයන් දෙදෙනකු අත්අඩංගුවටගත් නාවික හමුදා වෙරළාරක්ෂක බළකාය කිමිදුම් උපකරණ ,මසුන් මුහුදු කුඩැල්ලන් සමඟ එන්ජිම සහිත යාත්‍රාව වැඩිදුර පරීක්ෂණ සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට භාරදෙනු ලැබිය.

මාළු කිලෝ ග්‍රෑම් 20ක් හා මුහුදු කුඩැල්ලන් 22ක් සමඟ ඔක්සිජන් සිලින්ඩර් අටක් සමඟ කිමිදුම් උපකරණ මෙසේ අත්අඩංගුවට ගෙන තිබුණි.

සැකකරුවන් කිත්තියා ප්‍රදේශයේ පදිංචිකරුවන් වන අතර විමර්ශන අවසන් වූ විගස සැකකරුවන්ට එරෙහිව ත්‍රිකුණාමල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරණ බව සහකාර ධීවර අධ්‍යක්ෂ ඒ.එස්.සේනාරත්න මහතා පැවසීය.සහකාර ධීවර අධ්‍යක්ෂවරයාගේ උපදෙස් මත ධීවර නිලධාරි ඉෂර කම්කාතම්ගේ මහතා වැඩිදුර පරීක්ෂණ පවත්වාගෙන යයි.

නව මන්ත්‍රී නිපුණ නිල්වලා උදහානය නිරීක්ෂණයේ

ජයසිරි පේදුරුආරච්චි - ගන්දර සමූහ

මාතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ නව සභාපතිවරයා ලෙස පත් කෙරුණු පාර්ලිමේන්තු මන්ත්‍රී නිපුණ රණවක මහතා සිය ධූරයේ වැඩ භාර ගැනීම 17 දින පෙරවරුවේ යෙදුණු සුභ මොහොතින් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී සිදුකෙරිණි.

වඩ භාරගැනීමෙන් අනතුරුව රණවක මහතා මිලියන 1500 ක පිරිවැයක් දැරීමට යෝජිත, වර්ථමානය වන විට පළමු කොටස නිමකර අතහැර දමන ලද මාතර නිල්වලා ගඟබඩ උද්‍යානයේ නිරීක්ෂණ චාරිකාවකට සහභාගි විය.

මෙම අවස්ථාවට මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී චිරසුමන වීරසිංහ මහතා ඇතුළු නිලධාරීහු එක්ව සිටියහ.

වලගෙදර කදුරුවත්ත ඇළ අබලන්

මීගහතැන්න සමූහ

මතුගම , වලගෙදර ගොවිජනසේවා බල ප්‍රදේශයට අයත් වලගෙදර කදුරුවත්ත ඇළ වසර දහයක කාලයක් තිස්සේ වල් බිහිව,අබලන්වීම හේතුවෙන් ගොවි පවුල් 300කට පමණ බත සැපයූ කුඹුරු අක්කර 200කට ගැටලු මතුව ඇතැයි ප්‍රදේශයේ ගොවිහු කියති. වලගෙදර,ගල්මත්ත, කුරුදිප්පිට, වලගෙදර උතුර ග්‍රාමසේවා වසම් හතරක වතුරාව වෙල්යාය, මැටි මුල්ල, හීන් උඩුමුල්ල,වලගෙදර මිල්ල ගහවත්තයාය ඇතුළු කුඹුරුයාය රැසක ට ජලය ලබා ගැනීම සහ ජලය බැසයෑමට ඇත්තේ කදුරුවත්ත ඇළ බව ගොවි සංවිධාන නියෝජිතයෝ කියති.

බිම්බෝම්බ ඉවත් කරද්දී දෙබරු ඇනලා

රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

මුලතිව් මාන්කුලම් අම්බගාමම් ප්‍රදේශයේ බිම්බෝම්බ ඉවත් කරමින් සිටි පිරිසකට දෙබරුන් දෂ්ට කිරීම නිසා බරපතළ තුවාල ලැබූ තුන් දෙනකු 17ද මාන්කුලම රෝහලට ඇතුළත් කොට තිබේ.

මේ කණ්ඩායම බිම්බෝම්බ ඉවත් කරමින් සිටියදී ගසක තිබූ දෙබර කුඩුවක් ඇවිස්සීම නිසා දෙබරුන් දෂ්ට කිරීමට පටන් ගෙන තිබේ.

මාන්කුලම රෝහලට ඇතුළත් කරන ලද රෝගීන් තුන් දෙනාගෙන් එක් අයකුගේ තත්ත්වය බරපතළ බව මාන්කුලම රෝහලේ වෛද්‍යවරයෙක් පැවසීය.

මැද්ඤොක්කා වවන්න වැඩි උනන්දුවක්

නිමල් විජයතුංග - ඇහැළියගොඩ විශේෂ

මීට මාස කිහිපයකට ඉහතදී රුපියල් 60-70 අතර මිල ගණන් වලට අලෙවි වූ මඤ්ඤෙක්කා කිලෝවක මිල මේ වන විට රුපියල් 130 දක්වා ඉහළ ගොස් ඇත් අතර ගැමි ජනතාව වෙනදටත් වඩා උනන්දුවකින් මෙම අල වර්ගය වගා කිරීමට පෙලඹී සිටින බවක් පෙනී යයි.

ටිකට් පතේ ඉතිරි මුදල් දෙන්නේ නැතිලු

ප්‍රසන්න පත්මසිරි - ඌව පළාත් සමූහ

බිබිල-ලුණුගල දක්වා ලංගම බස් රථවල ගමන් කරන මහීන් ටිකට්පත සඳහා ගෙවන මුදලේ ඉතිරි මුදල් නැවත නොදෙන හා මුදල සඳහන් නොවන ටිකට් පත් දෙන කොන්දෙස්තරවරුන් සිටින බවට මඟී ජනතාව චෝදනා කරති.

බිබිල-කොළඹ දක්වා ගමන් කරන බස් රථ වලින් ලුණුගලට පැමිණෙන මහීන්ට රුපියල් 47ක් වන ටිකට් පත සඳහා රුපියල් 50ක් කොන්දෙස්තරවරයාට මඟියා ලබා දුන් පසු කිසි විටෙක ඉතිරි රුපියල් 3ක මුදල නොදෙන බවත් මඟියාට ලබාදෙන ටිකට් පතේ මුදලක් සඳහන් නොවන බවත් මඟීහු කියති.

පැලියගොඩ කේරළ ගංජා ජාවාරම් කළ සිවිදෙනෙක් කොටු

රාගම සමූහ

ඉන්දියාවට පලාගොස් එහි සැඟව සිටින 'තොටළඟ වාසු' නැමැත්තා මෙහෙයවූ කේරළ ගංජා ජාවාරමක් වැටලූ පැලියගොඩ පොලිසිය සැකකරුවන් සිවිදෙනකු අත් අඩංගුවට ගෙන ඇත.

පසුගිය 12 වැනිද පැලියගොඩ මත්ස්‍ය වෙළෙඳසල ඉදිරිපිටදී කේරළ ගංජා කිලෝ 1 ග්‍රෑම් 900ක් සමඟ අත්අඩංගුවට ගත් සැකකරුවකුගෙන් අනාවරණය කර ගත් තොරතුරු ඔස්සේ මේ සැකකරුවන් සිවුදෙනා සමඟ ඔවුන් ජාවාරමට යොදගත් ඇක්වා වර්ගයේ සුඛෝපභෝගී වාහන දෙකක්, යතුරුපැදියක්, ජංගම දුරකතන හතක් සහ රුපියල් එක්ලක්ෂ විසිපන්දහසක මුදල් පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන තිබේ. සැකකරුවන් ඊයේ (18) කොළඹ අලුත්කඩේ අංක 5 අධිකරණයට ඉදිරිපත් කර වැඩිදුර විමර්ශන කිරීම සඳහා රැඳවුම් නියෝග ලබාගන්නා බව පොලිසිය පැවැසීය.

කවුඩුල්ල වැවේ මසුන් අල්ලන්න ගිය දෙදෙනකු වන අලියාගෙන් බේරෙන්න වැවට පැනලා

ඩබ්ලිව්. ඒ්. පියතිලක - මැදිරිගිරිය සමූහ

කවුඩුල්ල වැවට මසුන් ඇල්ලීමට ගිය මිතුරන් දෙදෙනකුට වන අලියකු පහර දීමට පැමිණීම හේතුවෙන් දිවි බේරා ගැනීමට වැවට පැන එක් අයකු දියේ ගිලී පෙරේදා (17) පස්වරුවේ මියගොස් ඇති අතර අනෙක් පුද්ගලයා දිවි බේරාගෙන ඇතැයි මැදිරිගිරිය පොලිසිය පවසයි.

සිද්ධියෙන් මියගොස් ඇත්තේ හිඟුරක්ගොඩ, කවුඩුල්ල, 31 කොලණීය ප්‍රදේශයේ පදිංචිව සිටි ගොඩයලාගේ සුගත් අබේකොන් නැමැති 46 හැවිරිදි දෙදරු පියෙකි.

පොලිසිය කළ විමර්ශන අනුව මියගිය තැනැත්තාගේ මිතුරකු සමඟ පෙරේදා (17) පෙරවරුවේ තිවෙසින් පැමිණ ඇත්තේ කවුඩුල්ල වැවට මසුන් ඇල්ලීමට පැමිණෙන බව පවසමිනි. පසුව දෙදෙනා එක්ව කවුඩුල්ල වැවේ වගවලාන නමින් හඳුන්වන ස්ථානයේ මසුන් අල්ලමින් සිට තිබේ. ඒ අවස්ථාවේ පසු පසින් වන අලියකු පහරදීමට පැමිණ ඇති අතර මොවුන් දෙදෙනාට දිව යෑමට දිසාවක් නොමැති නිසා වැවට පැන දිවි බේරා ගැනීමට උත්සාහ කර තිබේ.

ඒ අවසථාවේ එක් තැනැත්තෙක් වැවෙන් ගොඩ වී පසු පසින් පැමිණි පුද්ගලයා පෙන්නට නොසිටි නිසා කෑ ගසා කතා කර තිබේ. ධිවරයින් එම ස්ථානයට ගොස් දියේ ගිලී සිටි පුද්ගලයාගේ මළ සිරුර ගොඩට ගෙන තිබේ.

මරණය පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණය පොලොන්නරුව මහ රෝහලේ සිදු කිරීමට නියමිතව තිබිණි.

මේ සම්බන්ධයෙන් කවුඩුල්ල ජාතික උද්‍යානයේ පාලක ප්‍රදීප් කුමාර හෙට්ටි ආරච්චි මහතා මෙසේ පැවැසීය. මසුන් ඇල්ලීම සිදු කළ යුත්තේ වන සතුන් නොඑන වේල්ල ප්‍රදේශවලයි. එහෙත් මේ අය විසින් කවුඩුල්ල ජාතික උද්‍යානයේ කිසිදු පුද්ගලයකුට ඇතුළුවීම සපුරා තහනම් කර ඇති ස්ථානයකට ගොස් තමයි මේ අනතුර සිදුව තිබෙන්නේ.

වයෝවෘද්ධ මවකගේ නැති වූ රන්මාලය සොයා දෙයි

ඇයි.එම්.වී.සී. ගුණසේකර - ඇල්පිටිය සමූහ

ඇල්පිටිය නවදගල උප තැපැල් කාර්යාලයෙන් ගොවි විශ්‍රාම වැටුප් ලබාගැනීමට පැමිණි වැඩිහිටි මාතාවකගේ නැති වූ රුපියල් ලක්ෂ දෙක හමාරක් පමණ වටිනා රත් දම්වැලක් සොයාදීමට එම උප තැපැල් ස්ථානාධිපතිනී ඉරෝෂා කුමුදිනී මහත්මියට හැකියාව ලැබිණි. නවදගල සිරිපුර ලියනගෙවත්ත පදිංචි හැත්තෑ පස් හැවිරිදි සෝමා විජේරත්න මහත්මිය පසුගිය මාසයේ ගොවි විශ්‍රාම වැටුප් ලබා ගැනීමට නවදගල උප තැපැල් කාර්යාලයට පැමිණි අවස්ථාවේ ඇයගේ ගෙල පැලඳි රුපියල් ලක්ෂ දෙක හමාරක් පමණ වටිනා රත් දම්වැල නැති වී ඇත. විජේරත්න මහත්මිය මේ බව උප තැපැල් ස්ථානාධිපතිවරිය වෙත දැනුම් දීමෙන් අනතුරුව උප තැපැල් ස්ථානාධිපතිනිය මේ පිළිබඳ සොයා බලද්දී අසළ වෙළෙඳසලක සේවය කරන එස්.එච්.රාජ් නලීන් කුමාර මහතා ඒ අසළ පාරේ තිබී අහුලා තිබූ රත් දම්වැල උප තැපැල් ස්ථානාධිපතිනිය වෙත භාරදී තිබේ.

රත්නපුර ගොවීන් 31944කට සහනාධාර පොහොර

රූපිකා කේ. බණ්ඩාර - කුරුවිට සමූහ

රත්නපුර දිස්ත්‍රික්කයේ කුඹුරු වගාකර ඇති ගොවීන් 31944 දෙනකු සඳහා රජයේ පොහොර සහනාධාර වැඩසටහන යටතේ පොහොර නිකුත් කර තිබෙන බව රත්නපුර ගොවිජන සංවර්ධන සහකාර කුමාරි ගමගේ මහත්මිය සඳහන් කරයි. මේ පොහොර ලබාදී ඇත්තේ කුඹුරු අක්කර 31563.61ක් සඳහා බව ද මේ යටතේ යූරියා මෙට්‍රික් ටොන් 1981.34ක් ද, ටී.එස්.පී. මෙට්‍රික් ටොන් 286.85ක් ද, එම්.පී. මෙට්‍රික් ටොන් 882.27ක් වශයෙන් නිකුත්කර තිබේ. සෞභාග්‍ය ගෙවතු සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර කොට්ඨාස 467කම ගෙවතු 84154ක් සංවර්ධනය කර ඇත.

උස්වැල්ල රක්ෂිතයේ තක්කාලි වගාවක් අස්සේ කංසා වවලා

සී. ගමගේ - සොරණාතොට සමූහ

කොස්ලන්ද උස්වැල්ල රක්ෂිතයේ තක්කාලි වගාවක් අතර කංසා වගාවක් වටලා පුද්ගලයකු පසුගියද (16) අත්අඩංගුවට ගත් බව කොස්ලන්ද පොලීසිය පවසයි .

කොස්ලන්ද පොලීසියට ලැබුණු තොරතුරක් මත නිලධාරීන් සැනපුම් 6ක් පමණ දුර පාගමනින් බලහරුව උස්වැල්ල රක්ෂිතයේ දුෂ්කර මාර්ගයක ගොස් වැටලීම සිදුකරන විටත් සැකකරු තක්කාලි වගාව අතරේ තිබූ කංසා වගාවට සාත්තු කරමින් සිටි බවද පොලීසිය සඳහන් කළේය.

වතුර මෝටරයක් සහ පාපැදියක් සොරාගත් තිදෙනෙක් දැලේ

ලංකින්ද නානායක්කාර - ඉමදුව සමූහ

අක්මීමන යක්ගහ ප්‍රදේශයේ තිවෙසක තිබූ වතුර මෝටරයක් සහ පාපැදියක් සොරකම් කිරීමේ සිද්ධියට සම්බන්ධ සැකකරුවන් තිදෙනකු ඊයේ (18) අත්අඩංගුවට ගත් බව අක්මීමන පොලීසිය පවසයි.

මොවුන් වතුර මෝටරය සහ පාපැදිය විකුණා තිබියදී පොලීසිය මඟින් සොයාගෙන ඇත. පාපැදිය රුපියල් 3000ක මුදලකට විකුණා තිබූ බව ද පොලීසිය පවසයි. මෙකී මුදල් වියදම් කොට සැකකරුවන් මත්කුඩු පානය කොට ඇති බව පොලීසිය පවසයි. සැකකරුවන් අද (19) අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

පාර දෙපස අපද්‍රව්‍ය දැමූ ලොරි රියැදුරු රිමාන්ඩ්

කේ. විජේසිරි නිශ්ශංක - කරල්ලියද්ද සමූහ

මඩවල-වත්තේගම ප්‍රධාන මාර්ගය දෙපසට රාත්‍රී කාලයේදී ගව මස් කඩයක ඉවත දමන අපද්‍රව්‍ය හොරෙන් ගෙනැවිත් දමමින් සිටි ලොරි රියැදුරකු පිළිබඳ ප්‍රදේශවාසීන් ලබාදුන් තොරතුරක් මත එම රියැදුරා වත්තේගම පොලීසිය මඟින් අත්අඩංගුවටගෙන ඇත.

මඩවල නගරයේ ගවමස් වෙළෙඳසලක ඉවතලන අපද්‍රව්‍ය අඩංගු පොහොර උර අටක් මඩවල සිට වත්තේගම නගරය දක්වා මඟ දෙපසට විසි කරමින් සිටි ලොරි රථයක් පිළිබඳ එම මාර්ගය දෙපස තිවෙස්හිමියන් වත්තේගම පොලීසියට රාත්‍රී කාලයේදී කරන ලද පැමිණිල්ලක් සම්බන්ධව වත්තේගම පොලීසිය රාත්‍රී කාලයේදීම කරන ලද හදිසි වැටලීමකින් පසු සැකකරු අත්අඩංගුවට ගෙන තිබේ.

සැකකරු බී වර්තාවක් මඟින් තෙල්දෙණිය අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු තෙල්දෙණිය වැඩ බලන මහෙස්ත්‍රාත් ස්වර්ණා කරල්ලියද්ද මහත්මිය සැකකරු 17 වැනිදා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට නියෝග කළාය.

කුකුළු හොරකමේ ගිය දෙදෙනකුට වැඩ වරදී

ඒ්. ටී. කහදුගොඩ - විරකැටිය සමූහ

හම්බන්තොට සාමෝදගම නිවෙසකින් රුපියල් 68000ක් වටිනා කුකුළන් 11ක් සහ දේපළ සොරාගත් බව කියන සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගත් බව හම්බන්තොට පොලීසිය පවසයි.

මේ සොරකම සම්බන්ධයෙන් තුවාන් මොහොමඩ් තවුසාඩ් බක්කම් යන අය විසින් පොලීසියට කරන ලද පැමිණිල්ලට අනුව පරීක්ෂණ පැවැත්වූ පොලීසිය හම්බන්තොට සුනාමි ගම්මානයේ පදිංචි සැකකරුවන් ළඟ තිබී සොරකම් කරන ලද කුකුළන් සහ දේපල ද සොයා ගෙන තිබේ. අත්අඩංගුවට පත් සැකකරුවන් පසුගියද (16) හම්බන්තොට මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

කිරිඳිවැල සති පොළේ කාන්තා මළ සිරුරක්

ජී.එස්. තැලිගම - කිරිඳිවැල සමූහ

කිරිඳිවැල සති පොළේ ආරම්භයේ පමණ සිට වසර 40ක පමණ කාලයක් කුඩ අලුත්වැඩියා කිරීමේ ස්වයං රැකියාවෙහි නියුතුව සිටි කාන්තාවක පසුගියද (16) රාත්‍රී එම සතිපොළේම නිදි සිටියදී මිය ගොස් සිටින බව සතිපොළේ වෙළෙන්දන් හඳුනාගෙන ඇත. ඇය කොහේ සිට පැමිණි අයෙක්ද, කාගේ කවුද, වයස, නම, ගම හෝ කිසිවක් කිසිවකු නොදනී.

පෙර දින රාත්‍රී 08.30ට පමණ ආපනශාලාවකින් ආහාර රැගෙන ආ බව සමහරුන් දැක තිබේ. සතිපොළේ ලැල්ලක් යට ඇය රාත්‍රිය ගතකරන අතර ඇගේ ආරක්ෂාවට ඒ අසල සුනඛයකු සිටින බව ද පොළේ වෙළෙන්දේ පවසති. කිරිඳිවැල පොලීසිය මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා චතුපිටිවල රෝහලට ගෙන යෑමට නියමිතව තිබිණි.

සත්‍ය දෙසින්
pronews@lakehouse.lk
ප්‍රාදේශීය පුවත්

අළුගොල්ල රක්ෂිතයේ ගිනිනකින් අක්කර තුනක ප්‍රදේශයක් විනාශයි

ප්‍රසන්න පත්මසිරි - උඟව පළාත් සමූහ

බදුල්ල අළුගොල්ල කඳු රක්ෂිතයේ පෙරේදා (17) රාත්‍රී හටගත් ගිනිනකින් අක්කර තුනක පමණ ප්‍රදේශයක් මේ වන විට මුළුමනින්ම ගිනිගෙන දැවී ගොස් ඇති බව ප්‍රදේශවාසීහු පවසති.

සෑම වසරකම නියං කාලවලදී ගිනි ගැනීම් සිදුවන බවත් ගිනි ගැනීමෙන් වනයේ විශාල ප්‍රමාණයක්

ගිනිනට හසුවී යටි රෝපණය වන මානම් ඉදුක් ඇතුළු ශාක විනාශ වී යන බව ද කියති.

මේ දිනවල ප්‍රදේශයට පවතින අධික සුළං තත්ත්වය හේතුවෙන් ගිනි ඉක්මණින් පැතිරී යන බවත්

රාත්‍රී කාලයේ හටගත් ගිනි පැය කිහිපයකින් තිවී ගිය බවත් ගම්වාසීහු පැවැසූහ.

හිතුලම්පිටිය ළමා නිවාසයේ දරුවන්ට අඩු සැලකිලි: සේවකයකුගෙන් පොලීසියට පැමිණිල්ලක්

ආර්. එල්. දියගහගේ - අහංගම සමූහ

ගාල්ල කිතුලම්පිටියේ පිහිටි ළමා නිවාසයේ රඳවා සිටින ළමයින්ගේ සුබ සාධන කටයුතු පාලකවරයා නිසි පරිදි නොකරන බවට එම ළමා නිවසයේ සේවකයකු විසින් පැමිණිලි කර ඇතැයි ගාල්ල පොලීසිය පවසයි.

මේ රැඳවුම් නිවාසයේ ළමයින් පොල් ගස්වලට නංවා පොල් කඩවන බවත් එම දරුවන්ට තුවාලයක් හෝ වෙනත් අසනීපයක් වූ විට ප්‍රතිකාර ලබා නොදෙන බවත් එම පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් වේ.

බත්ධනාගාරගත කිරීමට නොහැකි බාලවයස්කාර දරුවන් තිදෙනෙක් අධිකරණ නියෝග මත පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ දැනට මේ ළමා නිවාසයේ රඳවා තබා ඇත.

මේ පැමිණිල්ල පිළිබඳ දකුණු පළාත් පරිවාස හා ළමාරක්ෂණ සේවා කොමසාරිස් මහේෂ් කරුණාතායක මහතාගෙන් විමසූ විට කියා සිටියේ රැඳවුම් නිවාසයේ පාලකවරයා සහ මේ සේවකයා අතර ඇති පෞද්ගලික ගැටුමක් මත මේ පැමිණිල්ල කර ඇති අතර එම සේවකයා පිළිබඳ මේ වන විට අමාත්‍යාංශය මඟින් පරීක්ෂණයක් සිදු කරමින් පවතින බවයි.

පොලිස් රියෙන් පනින්න ගිය සැකකරු තුවාල ලබා රෝහලේ

ඒ්.ජී. දයාචන්ද්‍ර - උඟරුබොක්ක විශේෂ

පොලිස් නිලධාරීන්ගේ නීත්‍යානුකූල සිර භාරයේ සිටි සැකකරුවකු නීත්‍යානුකූල අත්අඩංගුවෙන් පලා යෑමට තැත් කළ අවස්ථාවේ පොලිස් කැබ් රථයෙන් පැනීමේදී කාපට් පාරේ හිස වැදීම හේතුවෙන් බරපතල තුවාල ලබා කරාපිටිය ශික්ෂණ රෝහලේ තේවාසිකව ප්‍රතිකාර ලබයි.

සැකකරු සම්බන්ධයෙන් උඟරුබොක්ක පොලීසිය මොරවක මහෙස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් පසු මොරවක මහෙස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු ශශිකා මිතුනආරච්චි මෙණෙවිය සැකකරු ලබන 25 දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙසටත් ගාල්ල බන්ධනාගාර නිලධාරීන්ගේ ආරක්ෂාව යටතේ තව දුරටත් ප්‍රතිකාර ලබාදෙන ලෙසට නියෝග කළාය.

අම්මා බලන්න මහලු මඩමට නොපැමිණි දරුවෝ මරණ සහතිකයට පොර කති

සීගිරිය විශේෂ

සිටි දරුවන් එකොළොස් දෙනකු මෙලොවට බිහි කළ මවක් දඹුල්ල වැඩිහිටි නිවාසයේදී මිය යෑමෙන් පසු මළගමට හෝ නොපැමිණි දරුවන් තිදෙනකු මවගේ මරණ සහතිකය ඉල්ලා වැඩිහිටි නිවාසයේ පාලිකාවට ඇවිටිලි කරන පුවතක් දඹුල්ලෙන් වාර්තා විය.

දඹුල්ල වැඩිහිටි නිවාසයේ දිවි ගෙවමින් සිටි දඹුල්ල කණ්ඩලම ප්‍රදේශයේ පදිංචි හපුආරච්චිගේ කුසුමාවති නැමැති හැත්තෑ හැවිරිදි එකොළොස් දරු මවක් පසුගියද මෙසේ මිය ගොස් තිබිණි.

මේ මව වැඩිහිටි නිවාසය සිටියදී මිය යන්නට මාස කිහිපයකට ඉහතදී තම දරුවන්ට පැමිණ තමා ව බලා යන්නයි ඉල්ලීමක් ද කළා ය. ඒ පුවත ද අප පසුගිය මව්වරුන්ගේ දිනය ද අපි පළ කළෙමු.

ඇය දරුවන් පැමිණෙන තුරු මග බලා සිටිමින් අවසානයේ දී මිට දින කිහිපයකට ඉහත දී මිය ගිය බව වැඩිහිටි නිවාසයේ පාලිකාව කිවාය.

සිය මවගේ හදිසි වියෝව සම්බන්ධයෙන් වැඩිහිටි නිවාසයේ පාලිකාව දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරීන් මෙම දරුවන් හට දැනුම් දුන්නද ඔවුන් සිය මවගේ මළ ගමට නොපැමිණි අතර මවගේ දේහය දඹුල්ල පොදු සුසාන භූමියේ සමාජ සේවා අංශය මගින් මිහිදන් කර තිබිණි. මව මියගොස් දින කිහිපයක් ගතවෙද්දී ඇයගේ උසස් රැකියාවල නියුතු පුතකු සහ දියණියන් දෙදෙනකු පැමිණ සිය මවගේ මරණ සහතිකය තමාට අවැසි බව පාලිකාවට ඇවිටිලි කිරීම සහ විවිධාකාරයෙන් මරණ සහතිකය ලබා ගැනීමට දැඩි උත්සාහ කරන බව වාර්තා වේ.

කෙසේ වෙතත් වැඩිහිටි නිවාසයේ පාලක මණ්ඩලය මෙතෙක් දරුවන් තිදෙනාට මවගේ මරණ සහතිකය ලබා දී නොමැති අතර අනෙක් දරුවන්ගේ ඉල්ලීම සහ ඔවුන්ගේ කැමැත්ත අකමැත්ත සොයා බලා ඇයගේ මරණ සහතිකය ලබා දීමට තීරණය කර තිබේ.

කරාපිටිය රෝහලේ ජෙනරේටරයක් පුපුරලා

එස්. දියගහගේ - දකුණු පළාත් සංචාරක

කරාපිටිය රෝහලේ ජෙනරේටර් යන්ත්‍රයක් පෙරේදා (17) දහවල් පුපුරා යෑමෙන් රෝහලේ එක් කොටසක වැඩ කටයුතු අඩාලවී තිබේ.

පෙරේදා (17) දහවල් විදුලි බලය ඇනහිටීම නිසා රෝහලේ තිබෙන විශාල ප්‍රමාණයේ ජෙනරේටර් හයක් ක්‍රියාත්මක කර තිබූ අතර පුපුරා ගොස් ඇත්තේ මෘත ශරීරාගාරය අසල ඇති කිලෝ වොට් 500ක විදුලිජනක යන්ත්‍රයකි.

පිපිරීම සිදුවන අවස්ථාවේ ඒ අසල සිටි රෝහල් සේවකයන් පැවසුවේ ශබ්දයක් සමඟ පිපිරීම සිදුවූ අතර සුළු ගිනිතක් ද හටගත් බවය. එවිට වහාම ගිනි නිවා එහි තිබූ ඩීසල් බැරල් ඉවතට ගත් බවත් ඔවුහු පැවැසූහ. මේ සම්බන්ධයෙන් රෝහල් අධ්‍යක්ෂ සම්පත් රණවීර මහතාගෙන් විමසූ විට කියා සිටියේ රෝහලේ අත්‍යවශ්‍ය කටයුතුවලට බාධාවක් සිදුවී නොමැති බවය.

ලුහුඬු දැන්වීම්

රථවාහන

මෝටර් කාර් රථ

106

විකිණීම

WP KF - 0033 Proton Sarry Car ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 0770107270, 0774789216 සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. *046007*

WP KQ - 5316 Perodua viva Elite Car. ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 0770107270, 0774789216 සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. *046015*

ටයර් සහ ට්‍යුබ්

128

විකිණීම

ටයර් ට්‍යුබ් ෆෝක්ලිෆ්ට් ගල් සහ හුලං ටයර් 600x9, 700x12, 650x10 වගකිම් සහිත වැඩි මුදලක් ගෙවන්නේ ඇයි. 155, මවුන්ටයර්, කොළඹ 14. 0773134060, 0112344524. 1000x20 DAG පිරවීමට දුන් නොගත් ටයර් ඩැග් ගාස්තු පමණි. බස් රථ හිමියන්ට විශේෂ මිල. *045589*

රැකී රක්ෂා

ඇබෑර්තු

322

මේසන්වරු / වඩුබාස්වරු

මේසන් බාස්වරු / අත්උදව්කරුවන් අවශ්‍යයි. ආහාර / නවාතැන් සපයනු ලැබේ. 0777311468 (0718475041) *044842*

ඇබෑර්තු

318

රියදුරු

කොළඹ 02 හි පහත භාණ්ඩ නිශ්කාෂණ සමාගමකට පහත සඳහන් ඇබෑර්තු ඇත. බර වාහන රියදුරු (අඩි 20 සහ අඩි 40) - මහපොළ සහතිකය සහිත පොලිස් වාර්තාව සහිත වලංගු බර වාහන රියදුරු බලපත්‍රය සහිත. අමතන්න. 0773429747. Email : murali@monamilines.com *045394*

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ M-05, පණ්ඩුලගම, අනුරාධපුර ලිපිනයෙහි පදිංචි **චන්ද්‍රානි කුමාරගේ** වන මම මින් ඉදිරියට **චන්ද්‍රානි හෙට්ටිආරච්චි** නමින් හඳුන්වන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

චන්ද්‍රානි හෙට්ටිආරච්චි

විවිධ

විවිධ දේ

431

විකිණීම

Brand new cold room එකක් විකිණීමට ඇත. විමසන්න. 0777178468 *046194*

නම වෙනස් කිරීම

හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංක (90) සිරිබෝපුර ග්‍රාම නිලධාරී වසමේ අංක 144, කෙයාර් නිවාස, සිරිබෝපුර ලිපිනයේ පදිංචි **සමරරත්නප්පුලි කොඩිකාර කංකානම්ගේ සෝමසිරි සුනිල්** වන මම මෙතැන් පටන් **සමරරත්න කොඩිකාර කංකානම්ගේ සුනිල් සෝමසිරි** යනුවෙන් හැඳින කරන බව ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

කොළඹ දිස්ත්‍රික්කයේ මාලිගාවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නො. 64, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 ලිපිනයේ පදිංචි **කළුහාර උසුලාවති** නමින් හැඳින්වූ මා මෙතැන් පටන් **හිද්දදුර රාහි ද සොයිසා** නමින් හඳුන්වනු ලබන බව උතුම් වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මෙයට,

හිද්දදුර රාහි ද සොයිසා

IRCON INTERNATIONAL LIMITED, SRI LANKA

(A Government of India undertaking)

Tender Notice

NIT - 06 / 2020, dated 19.08.2020

Tender for and on behalf of IRCON International Limited is invited from bidders meeting qualifying requirements for the work of Clearing & Forwarding, Transportation of Pre-stressed Concrete Sleepers, switches and other railway track materials from Colombo Port to various locations between Maho to Vavuniya including loading, unloading and stacking, in connection with "Up gradation of Railway Line from Maho to Omanthai under Indian Line of Credit - Track Rehabilitation & Ancillary works".

Estimated Quantity	: 56,784 MT
Last date and time of bid submission	: 10.09.2020 at 15.30 Hrs.

Further details & Tender documents may be purchased by the eligible bidders from Office of General Manager, IRCON International Limited, Near Medawachchiya Railway Station, Mannar Road A-14, Medawachchiya on working days till 31.08.2020 between 9.30 to 17.00 Hrs. (Tel No. 025-3133578)

Cost of Tender Document (Non Refundable) : LKR 50,000

General Manager
IRCON International Ltd,
Sri Lanka

බලශක්ති අමාත්‍යාංශය

ලංකා ඛනිජ තෙල් (නීතිගත) සංස්ථාව

දින දීර්ඝ කිරීමේ දැන්වීමයි

මුතුරාජවෙල හි, කෘෂි රසායන නිෂ්පාදන යන්ත්‍රාගාරය හා ගුදම සඳහා (මෙසනයින් මැදි මහල් කොටස ඇතුළුව), යන්ත්‍රාගාරය හා ගබඩාව සඳහා ගොඩනැගිල්ලක් සැලසුම් නිර්මාණය කර, ඉදිකිරීම

B/35/2020

ඉහත ශීර්ෂය යටතේ, මෙම පුවත්පතේ පළවූ දැන්වීම කෙරෙහි, දැනටමත් ලංසු ලිපිලේඛන මිලදීගෙන ඇති, අපේක්ෂිත ලංසුකරුවන්ගේ අවධානය, ලංකා ඛනිජ තෙල් (නීතිගත) සංස්ථාව විසින්, මෙයින් ආරාධනය කර යොමුකරනු ලැබේ. ලංකා ඛනිජ තෙල් (නීතිගත) සංස්ථාව වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) හි, සභාපති විසින්, ඉහත කී දැන්වීමට පහත සඳහන් සංශෝධන ඇතුළත් කරනු ලබන බව, මෙයින් දන්වා සිටිනු ලැබේ.

2020-08-21 වන දින, පැය 1400 ට අවසන් වීමට තීරණය කරනු ලැබූ, ලංසු ඉදිරිපත් කළයුතු අවසාන දිනය හා වේලාව, දැන්, 2020-09-04 වන දින පැය 1400 දක්වා දීර්ඝ කරනු ලැබ ඇති බව දන්වා සිටිනු ලැබේ.

ඒ අනුව, ලංසු ලිපිලේඛන තිකුත් කරනු ලබන අවසාන දිනය හා වේලාව, 2020-09-03 දින පැය 1500 දක්වා වන අතර, ලංසු සුරක්ෂණ ඇපකරය, ලංසු භාර ගන්නා අවසාන දින සිට දින 121 ක්, (එනම් 2021-01-02 වන දින දක්වා) වලංගුවිය යුතුය.

පෙර පළවූ පුවත්පත් දැන්වීමේ දී ඇති අනෙකුත් සියලු තත්ත්වයන් හා නියමයන් සහ කොන්දේසි නොවෙනස්ව පවතී.

සිදුවිය හැකිව තිබූ අපහසුතාවයන් සම්බන්ධතාව ලංකා ඛනිජ තෙල් (නීතිගත) සංස්ථාව, සිය කණගාටුව පළකර සිටී.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
බාරේ/කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා),
ප්‍රසම්පාදන හා ගබඩා අංශය,
1 වන මහල, ලංකා ඛනිජ තෙල් (නීතිගත) සංස්ථාව,
අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.
දුරකථන : 0094 11 5455331
ෆැක්ස් : 0094 11 5455424

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

කාර්මික තාක්ෂණ ආයතනය

01. **ආරක්ෂක සේවය** - Sup/SD/20/66

සහ

02. **ජැනිටෝරියල් සේවය** - Sup/SD/20/67 **සඳහා ලංසු දැන්වීමයි.**

ජාතික තරඟකාරී ලංසුකරණය

2020 / 2021 වසර සඳහා කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 363, කොළඹ 07, විද්‍යා මාවත අංක 120/4 ඒ සහ මාලබේ, තලාහේන, හල්බරාව උද්‍යානය, අංක 503 ඒ පිහිටි කාර්මික තාක්ෂණ ආයතනයේ පරිශ්‍රයන් හි පැය විසි හතර පුරාම ආරක්ෂක සේවාව පවත්වාගෙන යාම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති ආරක්ෂක සමාගම් වෙතින්

සහ

කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 363, කොළඹ 07, විද්‍යා මාවත අංක 120/4 ඒ, සහ මාලබේ, තලාහේන, හල්බරාව උද්‍යානය, අංක 503 ඒ පිහිටි කාර්මික තාක්ෂණ ආයතනයේ ජැනිටෝරියල් සේවාව පවත්වාගෙන යාම සඳහා අපේක්ෂිත ලංසුකරුවන් වෙතින් පහත සඳහන් අය විසින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

තෝරාගනු ලබන සේවා සපයන්නන් කාර්මික තාක්ෂණ ආයතනය විසින් නියම කරනු ලබන කාල සීමාවක් සඳහා කාර්මික තාක්ෂණ ආයතනය සමග ගිවිසුමකට ඇතුල් විය යුතුය.

ආරක්ෂක සේවාව සඳහා - රු. 6,500/- ක ජැනිටෝරියල් සේවාව සඳහා - රු. 2,500/- ක ආපසු ගෙවනු නොලබන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව මාලබේ, තලාහේන, හල්බරාව උද්‍යානයේ අංක 503ඒ හි පිහිටි කාර්මික තාක්ෂණ ආයතනයේ සැපයුම් අංශයෙන් හෝ කොළඹ 07, විද්‍යා මාවතේ අංක 120/4ඒ හි පිහිටි කාර්මික තාක්ෂණ ආයතනයේ අයකැමි වෙතින් සම්මත ලංසු ආකෘති ලබා ගත හැකිය. ටෙන්ඩර් ආකෘති 2020-08-19 වෙනි දින සිට 2020-09-07 වෙනි දින දක්වා පෙ.ව. 9.00 සහ ප.ව. 3.00 අතර නිකුත් කරනු ලැබේ.

සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන, 2020-09-08 වෙනි දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් අය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ මාලබේ, තලාහේන, හල්බරාව උද්‍යානයේ අංක 503ඒ හි කාර්මික තාක්ෂණ ආයතනයේ මානව සම්පත් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැකිය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ

01. ආරක්ෂක සේවාව - Sup/SD/20/66
02. ජැනිටෝරියල් සේවාව - Sup/SD/20/67

යනුවෙන් සඳහන් කළ යුතුය.

ලංසු භාරගැනීම අවසන් වූ වහාම මාලබේ, තලාහේන, හල්බරාව උද්‍යානයේ අංක 503 ඒ හි පිහිටි කාර්මික තාක්ෂණ ආයතනයේදී එම අවස්ථාවට පුද්ගලිකව පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ.

ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

වැඩබිම් සංචාරය සහ වැඩිදුර විස්තර සඳහා කරුණාකර සැපයුම් අංශය අමතන්න. (දුරකථන : 011-2797314 / 0112797315)

අදළ ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කිරීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනයේ සැපයුම් අංශයේ තබා ඇත.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
කාර්මික තාක්ෂණ ආයතනය,
අංක 503ඒ, හල්බරාව උද්‍යානය,
තලාහේන,
මාලබේ.

කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව

2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

උපලේඛනය

භාණ්ඩ හා සේවා සැපයීම	ලියාපදිංචි ගාස්තුව
01. සියලුම ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ	1,000.00
02. මුද්‍රිත පෝරම හා ලේඛන	1,000.00
03. කාර්යාල උපකරණ, ලී බඩු, වානේ ගෘහ භාණ්ඩ, ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ, ක්‍රීඩා උපකරණ හා වෙනත් උපකරණ	1,000.00
04. විදුලි උපකරණ, විදි පහන් උපකරණ හා සියලුම අමතර කොටස්	1,000.00
05. ජල සැපයුම් උපකරණ	1,000.00
06. සෞඛ්‍ය හා සනීපාරක්ෂක උපකරණ	1,000.00
07. පුස්තකාල පොත්	1,000.00
08. සියලුම වර්ගයේ වාහන අමතර කොටස් (මෝටර් ග්‍රේඩරය සහ JCB යන්ත්‍රය ඇතුලුව)	1,000.00
09. කොන්ක්‍රීට් භාණ්ඩ, තියුම් පයිප්ප, කොන්ක්‍රීට් කණු, සිමෙන්ති ගල් ඇතුළු පෙරනිමි කොන්ක්‍රීට් නිෂ්පාදන	1,000.00
10. මුද්‍රණ යන්ත්‍රවල තීන්ත (ටෝනර් / කාට්ටිලේජර්)	1,000.00
11. තීන්ත වර්ග හා ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය උපාංග	1,000.00
12. ටයර් හා ට්‍යුබ්	1,000.00
13. කර්ටන් රෙදි හා කොකු වර්ග හා උපාංග	1,000.00
14. යකඩ කම්බි, වානේ කම්බි, කටු කම්බි ඇතුළු ලෝහ භාණ්ඩ හා කම්කරු ආවුද	1,000.00
15. ගැල්වනයිස් පයිප්ප සහ අමතර කොටස්	1,000.00
16. ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය දැව වර්ග	1,000.00
17. රෙදිපිලි හා තිල ඇඳුම් සැපයීම	1,000.00
වෙනත් සේවාවන්	
01. වාහන අලුත්වැඩියා හා සේවා කිරීම	1,000.00
02. මුද්‍රණ කටයුතු (ලදුපත් හා මුද්‍රිත පොත්)	1,000.00
03. යතුරු ලියන / අනුපිටපත් යන්ත්‍ර / රෝනියෝ යන්ත්‍ර / ෆැක්ස් යන්ත්‍ර / වායු සම්කරණ යන්ත්‍ර අලුත්වැඩියාව	1,000.00
04. රබර් මුද්‍ර, කැපීම	1,000.00
05. නාම පුවරු ඇඳීම, සංඥා පුවරු ඇඳීම	1,000.00
06. බැනර් ඇඳීම	1,000.00
07. පරිගණක දඩාංග සැපයීම	1,000.00
08. බර වාහන, යන්ත්‍රෝපකරණ සහ සැහැල්ලු වාහන කුලියට සැපයීම	1,000.00
09. ළමා උද්‍යාන සඳහා සෙල්ලම් බඩු සැපයීම	1,000.00
10. විවිධ වර්ගවල ගල් සැපයීම	1,000.00
11. පැළ වර්ග, පොහොර ඇතුළු උද්‍යාන අලංකරණය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම	1,000.00
12. රජය පිළිගත් කොන්ත්‍රාත්කරුවන්	
a. රුපියල් 1,000,000 දක්වා	1,000.00
b. රුපියල් 1,000,000 ට වැඩි	1,500.00

01. අයදුම්පත බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ **2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම** යනුවෙන් සටහන් කර 2020.10.10 දිනට පෙර "**ලේකම්, කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව**" ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැක.

02. ලියාපදිංචි කරන ලැයිස්තුවට බාහිරව මිල ගණන් කැඳවීමට හා මිලදී ගැනීමට ප්‍රාදේශීය සභාවට අයිතිය ඇත. මිල ගණන් කැඳවනු ලබන අවස්ථාවේදී එය ඉදිරිපත් කිරීමට හෝ ඇතැවුම් කරන අවස්ථාවේදී එය සැපයීමට අපොහොසත් වන හා ලබාදෙනු ලබන ආදර්ශ පරීදි සැපයීම නොකරන අයගේ ලියාපදිංචිය නැවත දැනුවත් කිරීමකින් තොරව අවලංගු කරනු ඇත.

03. සැපයුම් හා කොන්ත්‍රාත් නියම කරන කාලය තුළ ඉටුකිරීමට අපොහොසත් වන අයගේ ලියාපදිංචිය අවලංගු කෙරේ.

04. කොන්ත්‍රාත්කරුවන් වලංගු ICTAD ලියාපදිංචි සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය.

05. සියලුම ගෙවීම් චෙක්පත් මගින් හා මුදලින් කළ හැකි අතර, එක් එක් සැපයුම සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතුය.

ඩබ්. බී. නිමල් ජයසිරි බණ්ඩාර,
සභාපති,
කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව.
දුරකථන : 032-2267917

---

40 වන වර්ෂය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම

ඉහත වැඩසටහන සඳහා සිසුන් බඳවා ගැනීමට 2020.08.02 සිට 2020.09.15 දක්වා අයදුම්පත් නිකුත් කරනු ලැබේ. මෙම වැඩසටහන සිංහල දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

කාල සීමාව - අවුරුදු 04 (3, 4, 5 සහ 6 වැනි මට්ටම්)

3 වන මට්ටම

- එක් එක් මධ්‍යස්ථානය සඳහා ඉගෙනුම් මාධ්‍යය අනුව බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව පහත දැක්වෙන අතර අධ්‍යයන වැඩසටහන එම මධ්‍යස්ථානවලදී පමණක් පැවැත්වේ.
- අධ්‍යයන වැඩසටහන සඳහා අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ තමන් ඉල්ලුම් කළ මධ්‍යස්ථාන සඳහා පමණි.
- කිසිදු හේතුවක් නිසා එම තෝරාගත් මධ්‍යස්ථානය සහ මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

මධ්‍යස්ථානය	බඳවා ගනු ලබන උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව		
	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	ඉංග්‍රීසි මාධ්‍යය
කොළඹ	100	30	40
මහනුවර	40	30	30
මාතර	30	-	-
යාපනය	-	30	-
අනුරාධපුරය	40	-	-
කුරුණෑගල	20	-	-
ගම්පහ	40	-	-
ගාල්ල	20	-	-
අම්බලන්ගොට	20	-	-
රත්නපුර	20	-	-
බණ්ඩාරවෙල	30	20	-
මඩකලපුව	-	40	-
අම්පාර	30	30	-
ත්‍රිකුණාමලය	-	20	-
හැටන්	-	30	-
පුත්තලම	-	20	-
කළුතර	20	-	-
පොළොන්නරුව	20	-	-
කිලිනොච්චිය	-	20	-
මහනුවර	-	20	-
සබරගමු	20	-	-
මුලතිව්	-	20	-
වවුනියා	-	20	-

තෝරාගැනීමේ පරීක්ෂණය

- සියලුම අයදුම්කරුවන්, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන පරිගණක ආශ්‍රිත තෝරාගැනීමේ පරීක්ෂණය (Computer based selection test) සඳහා පෙනී සිටිය යුතුය.
- මෙම තෝරා ගැනීමේ පරීක්ෂණය 2020 සැප්තැම්බර් මස 26 සහ 27 දෙදින තුළ පවත්වනු ලබන අතර මඟ පෙනී සිටීමට අපේක්ෂා කරන මධ්‍යස්ථානය, දිනය සහ වේලාව විභාග ප්‍රවේශ පත්‍රය බාගත කරගන්නා අවස්ථාවේදී ඔබ විසින් සඳහන් කළ යුතුය.
- අයදුම්කරුවන් හට තෝරාගැනීමේ පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැකි වන්නේ තමන් විසින් තෝරාගත්, සහ විභාග ප්‍රවේශ පත්‍රයේද සඳහන් වන විභාග මධ්‍යස්ථානයේදී, අදාළ දිනයේදී සහ අදාළ වේලාවේදී පමණකි.

අනුගමන විමේ සුදුසුකම් - 3 වන මට්ටම

1. අයදුම්පත් භාර ගන්නා දිනට අවුරුදු 18 ට නොඅඩු විම සහ
2. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පවත්වාගෙන යනු ලබන පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩසටහන සමඟ ම සිටීම. හෝ
3. අධ්‍යයන පොදු සහතිකපත්‍ර උසස් පෙළ විභාගයෙන් අවම වශයෙන් විෂයයන් දෙකකින් සමඟ ම සිටීම සහ අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් භාෂාව සහ ගණිතය ඇතුළු ව විෂයයන් හයකින් සමඟ ම සිටීම. හෝ
4. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන පදනම් පාඨමාලා පළමු සහ දෙවන මට්ටම් වැදී අවම වශයෙන් සම්මාන 54 ක (2017/2018 අධ්‍යයන වර්ෂයෙට පෙර) සම්මාන 36 ක (2017/2018 අධ්‍යයන වර්ෂයට පසු) සහතික පාඨමාලා ප්‍රමාණයකින් සමඟ ම සිටීම සහ අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් භාෂාව සහ ගණිතය ඇතුළු ව විෂයයන් හයකින් සමඟ ම සිටීම හෝ
5. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ මඟින් පවත්වනු ලබන ජාතික ගිරුෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව ලබා සිටීම. හෝ
6. රජයේ ගුරුවිද්‍යාල මඟින් ප්‍රදානය කරනු ලබන ගුරු පුහුණු සහතිකය ලබා සිටීම

5 වන මට්ටම

මෙම වැඩසටහන සිංහල හා මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

අනුගමන විමේ සුදුසුකම් - 5 වන මට්ටම

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පවත්වාගෙන යනු ලබන සුදු ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (තුන්වන මට්ටම හා හතරවන මට්ටම) සමත් ව සහතිකය ලබා තිබීම.

- සිසුන් (තුන්වන මට්ටම හා හතරවන මට්ටම) හැදෑරිය හැකි මාධ්‍යයෙන්ම පස්වන මට්ටම සහ හයවන මට්ටම හැදෑරිය යුතුය.
- සුදුසුකම් ලත් අයදුම්කරුවන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන තෝරාගැනීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනීසිටිය යුතුයි. (අයදුම් පත්‍රය මෙය සම්බන්ධව බඳවා ගැනීමට අනුමත මෙය සම්බන්ධවට වඩා වැඩි වුවහොත්)

අයදුම් කළ යුතු ආකාරය :

අයදුම් කිරීම අන්තර්ජාලයෙන් පමණි

අයදුම්පත් ගාස්තුව රුපියල් 600/= (3වන මට්ටම)

අයදුම්පත් ගාස්තුව රුපියල් 350/= (5වන මට්ටම)

https://payment.ou.ac.lk වෙබ් අඩවියට පිවිසීම මඟින් ඔබට මෙම වැඩසටහන සඳහා අයදුම් කළ හැකිය.

අයදුම් කිරීම : 2020.08.02 සිට 2020.09.15 දක්වා

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2020.09.15

ඔබට මේ පිළිබඳ විස්තර ඇතුළත් අන්තර්ජාල https://www.ou.ac.lk වෙබ් අඩවියට පිවිසීම මඟින් ලබා ගත හැකිය.

අයදුම්පත් ගාස්තුව ගෙවීම ඔබගේ ඩෙබිට්/ක්‍රෙඩිට් බැංකු කාඩ්පත හා / මඟින් සිදුකළ හැක.

ඩෙබිට්/ක්‍රෙඩිට් කාඩ්පත් නොමැති අයදුම්කරුවන් අයදුම්පත් ගාස්තුව ළඟම ඇති විවෘත විශ්ව විද්‍යාලයේ ප්‍රාදේශීය/අධ්‍යයන මධ්‍යස්ථානයකට මුදල් මඟින් ගෙවිය හැක. අන්තර්ජාලය ඔස්සේ අයදුම් කිරීම පිළිබඳව තොරතුරු ළඟම ඇති විවෘත විශ්ව විද්‍යාලයේ ප්‍රාදේශීය/අධ්‍යයන මධ්‍යස්ථානයන්ගෙන් පහත සඳහන් පරිදි ලබාගත හැක.

අන්තර්ජාලයෙන් අයදුම් කිරීම සම්බන්ධව තොරතුරු සහ පහසුකම් ලබාගැනීම සඳහා විවෘත විශ්ව විද්‍යාලයේ ප්‍රාදේශීය සහ අධ්‍යයන මධ්‍යස්ථාන වෙත පැමිණෙන්න.

කොළඹ(හාවලා), මහනුවර(පොල්ගොල්ලා), මාතර(තුසේ), අනුරාධපුරය, මඩකලපුව, යාපනය, බදුල්ල, කුරුණෑගල, අම්බලන්ගොඩ, අම්පාර, බණ්ඩාරවෙල, ගාල්ල, අම්බලන්ගොට, කළුතර, සබරගමු, පොළොන්නරුව, කොණරාගල, රත්නපුරය, වවුනියාව, හැටන්, ත්‍රිකුණාමලය, කිලිනොච්චිය, මුලතිව්, කුරියාපිටිය, මාතලේ, ගම්පහ සහ පුත්තලම.

වැඩිදුර විස්තර සඳහා
මහජන සම්බන්ධතා අංශය,
හාවලා, කුඹේගොඩ
රජයේ නිවාඩු දිනවල හැර අනෙකුත් සියලු දිනවල උදේ 9.00 සිට සවස 3.00 දක්වා
අනෙකුත් ඕනෑම අධ්‍යාපනයකින් ඉවත්වූ, සදදා සහ රජයේ නිවාඩු දිනවල හැර උදේ 9.00 සිට සවස 3.00 වන තෙක්.
(දුරකථන අංක : 0112881399/0112881400/0112881256)

රෙජිස්ට්‍රාර්, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, හාවලා, කුඹේගොඩ.

දිනමිණ රේඩියෝ ගුරුවරයා

අංක 8 I පත්‍රය මිනිත්තු 45

2020 වසරේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මගින් ඉදිරිපත් කරන රේඩියෝ ගුරුවරයා වැඩසටහන් මාලාව ඇසුරින් සකස් කරන ලද පෙර පුහුණු ප්‍රශ්න පත්‍රය

★ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

✱ අකුරුවල අඩුවක් නොමැති වාක්‍ය තෝරන්න.

(01) (i) මම සැමට කිකරු දරුවෙක් වෙමි
(ii) මම සැමට හොඳ මතුරෙක් වෙමි
(iii) මම සැමට සතුට බෙදා දෙමි

(02) (i) අහස පුරා ඒ මේ අත සරංගල් පාවෙයි
(ii) ළමයි සරංගලයක් හැදීමට තීරණය කරති
(iii) සරුංගලය ඉහළ අහසේ පාවී යයි

✱ 03 - 04 සම්බන්ධයක් නොදක්වන පින්තූර අඩංගු පිළිතුර තෝරන්න.

(03)

(04)



(05) 13 රෝම සංඛ්‍යාවෙන් දැක්වෙන්නේ,

1. xii 2. iii 3. xiii

(06) 0, 1, 4, 9 යන සංඛ්‍යා හැඳින්වීමට වඩාත් සුදුසු වන්නේ,

1. ඔත්තේ සංඛ්‍යා 2. හතරැස් සංඛ්‍යා 3. ත්‍රිකෝණ සංඛ්‍යා

(07) පෙ.ව. 12.35 සම්මත වේලාවෙන් දැක්වෙන්නේ,

1. පැය 12.35 2. පැය 00:35 3. පැය 24:35

(08) එක ළඟ දින 31 බැගින් ඇති මාස දෙකකි

1. ජූනි - ජූලි 2. අගෝස්තු-සැප්තැම්බර් 3. දෙසැම්බර් - ජනවාරි

(09) සාමාන්‍ය ඔරලෝසුවක දිග කටුවෙන් දැක්වෙන්නේ,

1. පැය 2. මිනිත්තු 3. දවස්

✱ පහත දැක්වෙන කවිය කියවා 7 - 8 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මාල පොටක් පොඩි නංගිට හදා දෙන්න පුළුවනි මට
නූල් පටක් අරන් අතට හිමින් ගියා ගහ ගාවට

(10) මේ ලෙස කතා කරන්නේ,

1. අයියා කෙනෙකි 2. අක්කා කෙනෙකි 3. අයියා හෝ අක්කා කෙනෙකි

(11) මේ ලෙස කතා කරන අයට සිටිය හැකි අඩුම නංගිලා ගණන,

1. එකයි 2. දෙකයි 3. තුනයි

(12) කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ

(i) නොගැළපෙන අයට තනතුරු වරප්‍රසාද ලැබීම
(ii) සුරතල් සතුන්ට ආදරය කිරීම
(iii) සතුන්ට කරුණාව දක්වීම හොඳ කරුණක් බව

(13) වඩාත් හොඳින් ගැළපෙන යන අදහසට උචිත යෙදුම වන්නේ,

(i) රයිගමයයි ගම්පොළයයි වගේ
(ii) පරංගියා කෝට්ටේ ගියා වගේ
(iii) මඩේ හිටවපු ඉන්න වගේ

✱ හිස්කොටු තුළ ඇති ගණිතකර්මයට සමාන පිළිතුරු තෝරන්න.

(14) [4 + 6] × 5 = 50

(i) [270 - 250] (ii) [100 × 1] (iii) [99 - 89]

(15) 73 + [100 × 0] = 73

(i) [4 + 4] (ii) [99 + 1] [25 × 0]

✱ පහත බිත්තිය දෙස බලන්න. එහි කොටසක් ගැළවී ඇත.



(16) නැවත බිත්තිය සැකසීමට අවශ්‍ය ගඩොල් ගණන වන්නේ,
(i) 10 (ii) 7 (iii) 12



(17) මෙහි ඇති මුළු ගඩොල් ගණන කීයද?
(i) 14 (ii) 22 (iii) 24

✱ මේ ඉරිඇදි වචන කිහිපය වෙනුවට යෙදිය හැකි එකම එක වචනය තෝරන්න.

(18) **අවුරුදු සියයක කාලයකටවත්** එය කළ නොහැකි කටයුත්තකි.
(i) සහශ්‍රයකටවත් (ii) දශකයකටවත් (iii) සියවසකටවත්

(19) කලක් වියළි කලාපය **ජනයාගෙන් පිරී ඉතිරී ගිය** ප්‍රදේශයක් විය.
(i) ජනාකීර්ණ (ii) සංකීර්ණ (iii) ජනාශූන්‍ය

(20) කොමඩු ගෙඩියක් 5 දෙනෙකුට බැගින් ගෙඩි 40 බෙදා දිය හැකි පිරිස
1. 8 2. 200 3. 800

(21) ඇපල් ගෙඩි 7 රුපියල් 210/- වූයේ නම් ගෙඩි 3 මිල රුපියල්,
1. 630 2. 90 3. 70

(22) ක්‍රිස්තු වර්ෂ 2019 සාමාන්‍ය වසරකි. දින 365 කි. එම වසරේ හරි මැද යෙදෙන්නේ කවදා ද?
1. ජූනි 30 2. ජූලි 01 3. ජූලි 02

(23) පහත වසරවල් අතරින් අධික අවුරුද්දක් වූයේ කිනම් වසර දෙක ද?
1. 1974 / 1978 2. 1972 / 1976 3. 1983 / 1987

✱ සංඛ්‍යා රටාව අවබෝධකර හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.

(24) 6 (4) → 36 (16)
(i) 10
(ii) 5
7 (- -) → 49 (25)
(iii) 20

(25)

4	3	7	- - -	6	4	8	9
12		35		24		72	

(i) 5
(ii) 6
(iii) 8

(26) ඉරිදා දින පහක් ඇති මාර්තු මාසයක එම දින පහේ එකතුවේ උපරිම අගය කීයද?
(i) 90 (ii) 85 (iii) 80

(27) සෙනසුරාදා දින පහක් ඇති අප්‍රියෙල් මාසයක එම දින පහේ එකතුවේ උපරිම අගය කියද?
(i) 75 (ii) 80 (iii) 85

(28) උඩ සිට බලන විට පෙනෙන අන්දම,



(29) මේ ඇටවුම A පැත්තෙන් බලන විට පෙනෙන්නේ,



(30) ඉරිදා දින පහක් ඇති පෙබරවාරි මාසයකි. එම වසරට ඇති දින ගණන විය යුත්තේ,

(i) 365 (ii) 366 (iii) 365 පැය 4 යි

(31) මීටර් 10 ක් දිගට මීටර් 20 ක් පළලට බිත්තියක තීන්ත ගෑම සඳහා ලීටර් 4 ක් වැය වේ. මීටර් 5 ක් දිගට මීටර් 10 ක් පළලට තීන්ත ගෑම සඳහා වැයවන තීන්ත ප්‍රමාණය ලීටර්

(i) 4 (ii) 2 (iii) 1

(32) මාලා උදේ පාසල් යමින් සිටිය දී ඇගේ සෙවණැල්ල ඇගේ වම් අත දෙසට වැටී තිබුණේ නම් ඇය ගමන් කරන්නේ කුමන දිශාවකට ද?
(i) උතුර (ii) දකුණ (iii) නැගෙනහිර

මෙහි ඉතිරි කොටස හෙට (20) පත්‍රයේ

රේඩියෝ ගුරුවරයා ආචාර්ය මණ්ඩලය - ප්‍රියන්ත කේ ගීගනගේ මහතා - කොළඹ ආනන්ද විද්‍යාලය, ශ්‍යාමලී ප්‍රියංගිකා කුමානායක මිය - කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, සුභානි පල්ලෙවෙල මිය - කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, ගයනි දේවරාජ මිය - කොළඹ ලුම්බිණි විද්‍යාලය, මංජුල උස්හෙට්ටි මහතා - ප්‍රාථමික පුහුණු (විද්‍යාපීඨ) සහ ශාස්ත්‍රවේදී (පේරාදෙණිය විශ්ව විද්‍යාලය),

රේඩියෝ ගුරුවරයා සෑම බදාදා සහ බ්‍රහස්පතින්දා දිනකම ප.ව. 4.00 – 5.30 දක්වා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ, ස්වදේශීය සේවය සහ විදුල ළමා ගුවන්විදුලියෙන් (තරංග මාලා 91.7 FM / 91.9 FM) ප්‍රචාරය වන අතර වැඩසටහනට අදාළ ප්‍රශ්න පත්‍රය සෑම බදාදා සහ බ්‍රහස්පතින්දාවකම දිනමිණ සමග ඔබට ලබා ගත හැකිය.නිෂ්පාදනය - සුමනා අබේසිංහ සහ සුභානි වැලිවිට

ශ්‍රී ලංකා තැපැල් සේවය
DARAZ සමග එකඟතාවට

ශ්‍රී ලංකාවේ විශාලතම අන්තර්ජාලගත අලෙවි අවකාශය වන DARAZ පාරිභෝගිකයන් විසින් මිලදී ගත් භාණ්ඩ ආපසු භාරදීමේ ක්‍රියාවලිය වඩාත් පහසු කරන්නට ශ්‍රී ලංකා තැපැල් සේවය සමග අවබෝධතා ගිවිසුමකට එළඹෙ තිබේ. DARAZ වෙනුවෙන් එහි කළමනාකාර අධ්‍යක්ෂ රබිල් ප්‍රනාන්දු සහ ශ්‍රී ලංකා තැපැල් සේවය වෙනුවෙන් තැපැල්පති රංජිත් ආරියරත්න යන මහත්වරු පසුගියදා ශ්‍රී ලංකා තැපැල් මූලස්ථානයේදී ඒ සඳහා වන අවබෝධතා ගිවිසුමට අත්සන් තැබූහ. DARAZ ශ්‍රී ලංකා තැපැල් අවබෝධතා ගිවිසුමේ පළමු අදියරේදී මුළු දිවයිනම ආවරණය වන පරිදි තෝරාගත් තැපැල් කාර්යාල 650 කදී DARAZ භාණ්ඩ ආපසු භාරගැනීමේ කටයුත්ත සිදුකෙරෙන අතර ඉදිරියේදී ශ්‍රී ලංකා තැපැල් දීප ව්‍යාප්ත කාර්යාල 2500 – 3000 ක ප්‍රමාණයකදී මෙම සේවාව ක්‍රියාත්මක වනු ඇත.

DARAZ වෙබ් අඩවියේ https://bit.ly/returnsdropo වෙත පිවිසීමෙන් ඔබට ළඟම තැපැල් කාර්යාලය තෝරාගනිමින් මිලදීගත් කිලෝ 3 දක්වා බරකින් යුතු භාණ්ඩ, දිවයින පුරා තැපැල් කාර්යාල 650 කදී ආපසු භාරදීමේ පහසුකම දැන් ක්‍රියාත්මකය. මෙහිදී ආපසු භාර දෙන භාණ්ඩ නිෂ්පාදකයාගේ මුල් තත්ත්වයෙන්ම පැවතිය යුතු අතර පාරිභෝගික හා නිෂ්පාදක දෙපාර්ශවය අතර විශ්වාසනීයත්වය සුරක්ෂිත කිරීම සඳහා පාරිභෝගිකයාගේ විස්තර හා සම්බන්ධ කරගත හැකි දුරකතන අංකයක් ලබාදීම අනිවාර්ය වේ. ලැබෙන භාණ්ඩ පැය 48ක් ඇතුළත ශ්‍රී ලංකා තැපැල් සේවය විසින් DARAZ වෙත යොමු කරනු ලබයි.

සොඳුරු කැදැල්ලකට පාර කියන 'කැදැල්ල'

චානක පෙරේරා

සම්පත් ෆොන්සේකා

පසුගිය සතියෙහි කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව පරිශ්‍රය කලකින් එහි සක්‍රීය ස්වභාවයට පත්ව පැවතිණි. කොරෝනා හේතුවෙන් එහි පැවති සියලු උත්සව කටයුතු මෙන්ම ප්‍රදර්ශන ආදිය දින නියමයක් නොමැතිව කල් තැබීමට සිදුවීම ඊට හේතුවයි. "කැදැල්ල" ප්‍රදර්ශනය පැවති වාතාවරණය වෙනස් කරමින් අති සාර්ථක ලෙස සෞඛ්‍ය නිර්දේශයට යටත්ව පැවැති අතර අභියෝග ජයගැනීම පිළිබඳව මෙන්ම පුරෝගාමිත්වය පිළිබඳ ආදර්ශයක් සපයන අවස්ථාවක් ලෙස මෙම ප්‍රදර්ශනය සාර්ථක ලෙස පැවැත්වීම හැඳින්විය යුතුමය. මෙසේ වෙළෙඳ ප්‍රදර්ශනයක් සංවිධානය කිරීමේ අභියෝගය භාරගත් ආයතනය වන්නේ ඒෂියා එක්ෂිබිෂන් ඇන්ඩ් කන්වෙන්ෂන් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයයි.

මෙරට අත්දැකීම් බහුල හා ප්‍රමුඛ පෙළේ සංවිධාන ශක්තියකින් හෙබි ඒෂියා එක්ෂිබිෂන් ආයතනය කොරෝනා අභියෝගය හමුවේ වුවද විධිමත්ව ප්‍රදර්ශනය සංවිධානය කර තිබීම හේතුවෙන් එය අති සාර්ථක ප්‍රදර්ශනයක් බවට පත්වී තිබිණි.

මේ පිළිබඳව ඒෂියා එක්ෂිබිෂන් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී ටිරෝන් චන්ද්‍ර සේකර මහතා පවසා සිටියේ "මේ ප්‍රදර්ශනය මේ තරම් සාර්ථක වෙයයි අප තුළ පවා පැවතියේ සැකයකි. අපට වුවමනා වුණේ ආරම්භයක් දිම පමණයි. මෙ ආයතන රැසක් ප්‍රදර්ශනය සඳහා එක්වුණේ අප සමඟ කටයුතු කර ඇති අත්දැකීම් නිසයි. ඇතැම් ව්‍යවසායකයින් මීට සම්බන්ධ වුණේ අත්හද බැලීමේ අදහසින්. නමුත් කැදැල්ල ප්‍රදර්ශනයට හොඳ ප්‍රතිචාර ලැබුණා. පාරිභෝගිකයින් වගේම සම්බන්ධවූ ව්‍යාපාරිකයින් තෘප්තිමත් වූ ප්‍රදර්ශනයක් සංවිධානය කිරීමට අපිට හැකි වුණා."

කොරෝනා හේතුවෙන් ආර්ථිකයට සිදු වූ පසුබැම් බොහෝය. ක්‍රමයෙන් එම පසුබැම් මඟහැර ආර්ථිකය නිසි මාවතට ප්‍රවේශ කරවීමට නම් මෙබඳු වෙළෙඳ ප්‍රදර්ශන මහත් රුකුලකි.

ප්‍රදර්ශනයට සම්බන්ධ වූ ව්‍යවසායකයින් කීප දෙනකු සමඟ අපි සංවාදයේ නිරත වීමු.

නිරන්තරයෙන් සෙනඟ ගැවසෙන ප්‍රදර්ශන කුටි අතර ස්වර්ණ මහල් පරිශ්‍රය විශේෂිත විය.

නෙත් සිත ඇදබැඳ ගැනීමට සමත් නිමාවන්ගෙන් යුතු රත් අහරණ නිසාම පමණක් නොව පාරිභෝගික උද්‌යෝගයද එහි නිරන්තරයෙන් දැකගත හැකිවිය. අප හා සංවාදයට එක් වූයේ එහි ශාඛා කළමනාකරු වන චානක පෙරේරා මහතායි. " ඉදිරි 21,22,23 දිනයන්හීදී වෙනත් ක්ෂේත්‍රයක අත්දැකීම් ලබා ගැනීමට ඇති කැමැත්ත නිසයි. මේ ව්‍යාපාරය ආරම්භ කරලා වසර දෙකක් පමණ වෙනවා. නමුත් එහි දියුණුවක් අත්කර ගැනීමට අපි සමත්වී තිබෙනවා. මේ වනවිට නව පරපුරේ ඉල්ලීම පවතින්නේ ශාඛමය අමුද්‍රව්‍යවලට වඩා ස්ටිල් වැනි අමුද්‍රව්‍ය සඳහායි. ඒ නිසාම අපි ඒ අංශයටයි වැඩි නැඹුරු වීමක් තිබෙන්නේ. කාර්යාල,මහල් නිවාස, ආදී ඕනෑම ස්ථානයක් අලංකාරව සැකසීම සඳහා කටයුතු කරනවා.

කොරෝනා කාලේ ව්‍යාපාර කටයුතු තරමක් පසුබැස්සත් අපි නැවතත් වැඩ ආරම්භ කළා. කැදැල්ල ප්‍රදර්ශනයෙන් හොඳ අත්දැකීම් ලැබිය හැකි වුණා. ඇතැම් මෙන්ම අපගේ ව්‍යාපාරයට සම්බන්ධ කර හැකි නවත් ව්‍යවසායකයින්, නිෂ්පාදකයින් රාශියක් හඳුනා ගැනීමටත් මෙය කදිම අවස්ථාවක් වුණා."

ප්‍රදර්ශන භූමියේ වැඩි වශයෙන් පාරිභෝගිකයින් රැඳී සිටි ස්ථාන අතර සීකෝ ඉන්ටර් නෑෂනල් පුද්ගලික සමාගම විසින් පවත්වාගෙන ගිය පියෝ ප්‍රදර්ශන පරිශ්‍රය විශේෂිතය. එහිදී පාරිභෝගිකයන් සඳහා විශේෂ දැනුවත් කිරීමේ දේශන පවත්වාගෙන යනු දැකගත හැකිවිය .

ප්‍රචාරනයන්ට තොරවටී වඩාත් සෞඛ්‍ය ආරක්ෂිත ජල පිරිපහදු යන්ත්‍රයක් හඳුනා ගැනීම පිළිබඳව මෙහිදී දැනුවත් කිරීම් සිදු කෙරෙනු දැකගත හැකිවිය.

මෙම ප්‍රදර්ශන භූමියේ පැවති විශේෂත්වය නම් පියෝලයිෆ් ජල පිරිපහදු යන්ත්‍රයක් මිලදී ගැනීමේදී ජීවිත රක්ෂණයකට හිමිකම් ලැබීමයි. සීකෝ ඉන්ටනෑෂනල් හි සභාපති රවීන්ද්‍ර ජයනාත් පවසා සිටියේ මෙරට ජනතාවට පිරිසිදු ජලය පානය කිරීමේ අවස්ථාව උදාකිරීම සිය ආයතනයේ ඉදිරි දක්ම බවයි. . පෙර ආපදා කළමනාකරණයේ වැදගත්කම පිළිබඳව සඳහන් කළ ඒ මහතා පැවසුවේ වතුගඩු රෝගයෙන් මෙරට ජනතාව මුදා ගැනීම වෙනුවෙන් ආයතනයක් වශයෙන් කැපවෙන බවයි.

ප්‍රදර්ශන භූමියේ කැපී පෙනෙන ස්ථාන අතර සම්පත් සෝෂා විශාල වපසරියක වඩාත් අභිමානවත් අයුරුන් විරාජමානව සිටිනු දැක ගතහැකි විය. එහි අධිපති සම්පත් ෆොන්සේකා දේශීය නිෂ්පාදකයෙකු සේම ස්වඋත්සාහයෙන් හා දිරියෙන් යුතුව ව්‍යවසායකයෙකුවූ ආදර්ශවත් ව්‍යවසායකයෙකි. කැදැල්ල ප්‍රදර්ශනය තම ව්‍යාපාරික දිවියේ සංධිස්ථානයක් බවයි ඔහු පවසන්නේ ව්‍යාපාරික ප්‍රදර්ශන ලොව සංවර්ධනයේ සුවිශේෂී අංගයකි. එය තවමත් අපරටට ආගන්තුක වුවද මෙවැනි ප්‍රදර්ශන ඒ සඳහා පුරෝගාමී මෙහෙවර ඉටුකරනු ඇත

සටහන
බුද්ධිකා බ්‍රාහ්මණගේ

රාජා ජුවලර්ස් වෙතින් ආකර්ෂණීය වට්ටම්

ශ්‍රී ලංකාවේ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ කීරුළ පැළඳි රජු ලෙස අවිවාදයෙන් පිළිගැනෙන රාජා ජුවලර්ස් සිය ළබැඳි පාරිභෝගිකයන් වෙත ආකර්ෂණීය වට්ටම් රැසක් තිළිණ කරයි. ඒ අනුව බම්බලපිටිය, මිගමුව හා මහනුවර පිහිටි රාජා ජුවලර්ස් ස්වර්ණාභරණ මාලිගා වෙත පැමිණෙන ඔබට රත් ආභරණ සඳහා 15%ක වට්ටමක්ද, මුතු, මැණික් හා ගල් ඇල්ලූ ආභරණ සඳහා 35%ක වට්ටමක්ද, දියමන්ති ආභරණ සඳහා 50%ක වට්ටමක්ද හිමි කර ගත හැකිය. සිත් සතන් ඇද බැඳ ගන්නා නවීන මෝස්තරවලින් සපිරි අතර්ඝ තත්ත්වයේ අලංකාර ස්වර්ණාභරණ රැසක් ඔබගේ සිතැඟි පරිදි ඇදගිය නොහැකි ආකර්ෂණීය වට්ටම් සහිතව මිල දී ගැනීමට ඔබත් අදම රාජා ජුවලර්ස් වෙත පිය මනිත්ත.

අලෙවියෙන් පසු සේවාවෙහි විශිෂ්ටත්වය සම්බන්ධයෙන් තම දැරූ රාජා ජුවලර්ස් රත්කම්වල මතා පළපුරුද්දක් ඇති 400කට අධික සේවක මණ්ඩලයක් මගින් පාරිභෝගික අවශ්‍යතාව ඉක්මවා යන දකුම් කළු මෝස්තර නිර්මාණය කරයි. 1928දී කොළඹ චැතැම් වීදියේ ඊ. ඒ. ප්‍රනාන්දු මහතා ආරම්භ කළ ඊ. ඒ. ප්‍රනාන්දු ජුවෙලර්ස් අති සාර්ථක ගමනක යෙදුණු අතර 1962දී ඔහු පුත් රාජා ප්‍රනාන්දු මහතා තවත් පියවරක් ඉදිරියට තබමින් එය රාජා ජුවෙලර්ස් ලෙස නම් කළේය. ඉන් පසු රාජා ප්‍රනාන්දු මහතාගේ දරුවන් වන තුන්වැනි පරපුර නියෝජනය කරන අශෝක එලියපුර සහ අතුල එලියපුර මහත්වරු රාජා ජුවෙලර්ස් සීමිත වගකීම් සහිත සමාගමක් වශයෙන් ලියාපදිංචි කළහ. මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සංවිධාන කළ ජනාධිපති රාජ්‍ය සම්මාන උළෙලේදී ශ්‍රී ලංකාවේ විශිෂ්ටම ස්වර්ණාභරණ නිෂ්පාදකයා, ඉහළම ප්‍රමිති මුද්‍ර, තැබූ ස්වර්ණාභරණ ආයතනය, විශිෂ්ටම රත් ආභරණ නිර්මාණය සහ පළපුරුදුම මැණික් කැපීමේ ශිල්පියා සඳහා වන ජනාධිපති රත් සම්මාන සතරකින් පිදුම් ලබමින් ස්වර්ණාභරණ ලොවේ කීරුළු පැළඳි රජු ලෙස නැවතත් අභිෂේක ලබන්නට රාජා ජුවලර්ස් සමත් විය.

සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් වෙතින් ද සොයිසා කාන්තා රෝහලට වායුසමන යන්ත්‍ර

සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් නවත් එක් ප්‍රජා සත්කාරක ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම කාන්තා රෝහලක් වන කොළඹ ද සොයිසා කාන්තා රෝහලේ ශල්‍යාගාරයට දීර්ඝ කාලයක් අඩුපාඩුවක් ලෙස පැවැති වායුසමීකරණ යන්ත්‍රයක් පසුගියදා පරිත්‍යාග කළේය. ශ්‍රී ලංකාවේ වෙසෙන ග්‍රාමීය බිම් මට්ටමේ ජනතාවගේ සුබසිද්ධිය උදෙසා කෑප වී ක්‍රියා කරන දිවයිනේ ප්‍රමුඛතම ප්‍රජා මූල සංවිධානයක් ලෙස සණස ව්‍යාපාරය පසුගිය වසංගත කාලයේ දී සණස සහත අත්වැල ව්‍යාපෘතිය තමින් ප්‍රජා සත්කාර ව්‍යාපෘති ගණනාවක් දිවයින පුරා ක්‍රියාත්මක කරමින් ජනතාවට ඉමහත් සේවයක් සිදු කළේය.

සණස නායක විශ්ව ප්‍රසාදිනී ආචාර්ය පී. ඒ. කිරිවත්දෙණිය මැතිතුමන්ගේ සණස ප්‍රතිපත්ති සහ ව්‍යාපාරවලට එහා ගිය උදර වූ සමාජ වගකීම යන සංකල්පය අනුව යමින් මේ පරිත්‍යාගය සිදු කළ බව මේ අවස්ථාවට සම්බන්ධ වෙමින් සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වසන්ත පෙරේරා මහතා පැවැසීය. පුරා වසර 28ක් රක්ෂණ ක්ෂේත්‍රයේ දැවැන්තයකු ලෙස තම දරා සිටින සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් සමාගම සාමාන්‍ය ගෘහි ජනතාවට මුහුණ පෑමට සිදු වන හදිසි අනතුරුවලදී සහනයක් ලබා දීමේ වැඩපිළිවෙළක් වශයෙන් ආරම්භ විය. 1991 ඔක්තෝම්බර් මස සමස්ත ලංකා අන්‍යෝන්‍ය රක්ෂණ සංවිධානය අල්මාවෝ නමින් මසකට රුපියල් 5 – 20 වැනි සුළු මුදලක් අය කරමින් දැවැන්ත රක්ෂණායතනයකට මූලික අඩිතාලම දැමූ අතර 2005දී සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා ද 2013 දී ජීවිත රක්ෂණ කටයුතු සඳහා ද බලපත්‍ර හිමි කර ගනිමින් වර්තමානය වන විට සුවහසක් ශ්‍රී ලාංකිකයන්ගේ රැකවරණය වෙනුවෙන් කටයුතු කරමින් සිටියි.

සංචාරක හා ගුවන් සේවා අමාත්‍යාංශය

ලංසු තැබීම සඳහා ආරාධනයයි

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම

ලංසු අංකය : 178/T/2019

රත්මලාන ගුවන් තොටුපොළෙහි යාත්‍රාංගනය සහ නැගෙනහිර බැහැරුම් පථය පුනරුත්ථාපනය කිරීම

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් රත්මලාන ගුවන් තොටුපොළෙහි යෝජිත යාත්‍රාංගනය සහ නැගෙනහිර බැහැරුම් පථය පුනරුත්ථාපනය කිරීම පිණිස මුද්‍ර, තැබූ ලංසු, සුදුසුකම්ලත් යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ගෙන් මෙයින් කැඳවනු ලැබේ.

මෙකී ඉදිකිරීම් වැඩවලට අඩංගු වනුයේ නැගෙනහිර බැහැරුම් පථය පළල් කිරීම (දළ වශයෙන් පළල මීටර් 25 කින් සහ දිග මීටර් 400 කින්) සහ පවතින බැහැරුම් පථය පුනරුත්ථාපනය කිරීම (දළ වශයෙන් වර්ග මීටර් 4200 කින් යුක්තව) හා පවත්නා කාණු පද්ධතිය වෙනස් කිරීමද ඇතුළුව වන අතර, එම සියලු ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය සහ කම්කරු ශ්‍රමය සපයා ගනිමින්, අදළ පිරිවිතර අනුව, ප්‍රමාණ සම්මික්ෂණ පත්‍රයේ සඳහන් පරිදි හා ඉංජිනේරු සැලසුම් අනුව එය ඉදිකළ කළ යුතු වේ.

එම කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කාල පරිච්ඡේදය දින 270 කි.

ව්‍යාපෘති ස්ථානය : රත්මලානහි පිහිටි, රත්මලාන ගුවන් තොටුපොළ වේ.

ලංසු පවත්වාගෙන යනු ලබන්නේ ජාතික තරගකාරී ලංසු ඉදිරිපත් කිරීමේ පටිපාටියට අනුව වේ.

කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලබනුයේ යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන් වන අතර, අසාධුගත කොන්ත්‍රාත් නාම ලැයිස්තුවේ නම අඩංගු නොවූ අයෙකු / ආයතනයක් විය යුතුයි. තවද මෙම ලංසුකරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) - (මින් පෙර ICTAD නමින් හැඳින්වූ) C3 හෝ ඊට ඉහල ශ්‍රේණියක (මහාමාර්ග ඉදිකිරීම් සඳහා) ලියාපදිංචි වූ අදළ මාදිලියේ ඉදිකිරීම් කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇති කොන්ත්‍රාත්කරුවන් විය යුතුයි.

මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2020.08.17 වන දින සිට 2020.09.25 වන දින දක්වා ඕනෑම රාජකාරී දිනයක පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා කාලය තුළ කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ, සැපයුම් දම කළමනාකරණ අංශයේ, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ආපසු නොගෙවනු ලබන රුපියල් 30,000.00 ක් (තිස් දහසක් පමණි) මුදලින් ගෙවීමෙන් සහ ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. එම ලංසු ලිපි ලේඛන, ඉහත සඳහන් ලිපිනයේදී ගාස්තුවකින් තොරව පරීක්ෂා කර බැලිය හැක.

ලංසු සුරැකුම් වෙනුවෙන් ලංසුකරුවන්, එක් ලංසුවක් සඳහා **රුපියල් විසි ලක්ෂයක් පමණක් (රුපියල් 2,000,000.00)** මුදලින් හෝ ලංසු තොරතුරු ලේඛනයේ 02 වන කොටසේ 17.2 වගන්තිය යටතේ සඳහන් ආයතනයකින් ලබාගත් ඉල්ලුම මත වූ ලංසු බැඳුම්කරයක් සමඟ එකී ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

2020.09.03 වන දින පෙ.ව. 10.30 ට රත්මලානේ, රත්මලාන ගුවන් තොටුපෙළෙහි, ප්‍රධාන ගුවන් තොටුපොළ කළමනාකාර කාර්යාලයේ සම්මන්ත්‍රණ කාමරයේදී පැවැත්වෙන පූර්ව ලංසුකරණ රැස්වීමට සහභාගි වන ලෙස සියලුම ලංසුකරුවන්ට හා ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට මෙයින් ආරාධනා කරනු ලැබේ.

සම්පූර්ණ කරන ලද ලංසු 2020.09.29 වන දින ප.ව. 02.00 ට පෙර, කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, රක්ෂණ මන්දිරයේ, 6 වන මහලෙහි, ප්‍රසම්පාදන අංශයේ, සංචාරක හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC), සභාපති යන ලිපිනයට, අතින් ගෙනවිත් හෝ ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුයි. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ විගස ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරිපිට එකී ලංසු විවෘත කරනු ලැබේ.

මේ පිළිබඳව, වැඩි විස්තර කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ, සිවිල් ඉංජිනේරු (සැලසුම් හා නිර්මාණ) අංශයේ, අංශ ප්‍රධානී වෙතින් දුරකථන අංක 011-2263500/02 සහ ෆැක්ස් අංක 011-2251356 ඔස්සේ ලබාගත හැක.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව
සංචාරක හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
ප්‍රසම්පාදන අංශය,
6 වන මහල, රක්ෂණ මන්දිරය, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම

ලංසු අංකය : 002/T/2020

කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළට නවතම මගී බඩු බහාලුම් අත්කරත්ත (Passenger Baggage Trolleys) 1,000 ක් සැපයීම හා පිළිගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

2020 මාර්තු මස 11 වන දින, 2020 ජූනි මස 29 වන දින සහ 2020 ජූලි මස 27 වන දින 'දිනමිණ' පුවත්පත්වල පළ කරන ලද ඉහත ලංසු කැඳවීමට අදළ පුවත්පත් දැන්වීම්වලට වැඩිමනත් වශයෙනි.

ලංසු තැබීමේ අවසන් දිනය 2020 අගෝස්තු මස 26 වන බදාදා දින ප.ව. 2.00 දක්වා දීර්ඝ කරන ලදී.

අනෙකුත් දෑ නොවෙනස්ව පවතී.

සභාපති,
සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ,
කටුනායක

ඇමැතිවරයකු වැඩ භාර ගන්නා දවසක වැඩිම ජන ගැගක්

ක්‍රීඩා ඇමැති නාමල් වැඩට බසියි

ප්‍රින්ස් ගුණසේකර

ශ්‍රී ලංකාවේ 18 වැනි ක්‍රීඩා ඇමැතිවරයා ලෙස නාමල් රාජපක්ෂ මහතා ක්‍රීඩා අමාත්‍යාංශයේදී ඊයේ වැඩ ආරම්භ කරයි.

මහා සංඝ රත්නයේ පිරිත් සජ්ඣායනා මැද සියලු ආගමික පූජ්‍ය ප්‍රසාදීන් වහන්සේලාගේ ආශීර්වාද සහිතව ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැතිවරයා ලෙස නාමල් රාජපක්ෂ මහතා ධුරයේ වැඩ භාරගත් අතර, එම අවස්ථාවට අගමැති මහින්ද රාජපක්ෂ මහතා හා ශිරන්ති රාජපක්ෂ, ලිමිති වීරසිංහ මහත්මිත් ඇතුළු විශාල පිරිසක් එක්ව සිටියහ. මෙහි විශේෂත්වය වන්නේ ඇමැති නාමල් රාජපක්ෂ මහතා වැඩ භාර ගන්නා මොහොතේ එය දැක බලා ගැනීමට හා සුබ පැතුම් එක් කිරීමට දහස් ගණන් පිරිසක් ක්‍රීඩා අමාත්‍යාංශයේ ඩන්කත් වයිටි ශ්‍රවණාගාරයේ හා ක්‍රීඩා අමාත්‍යාංශ පරිශ්‍රයේත් ඉන් පිටතත් රැස්ව සිටීමය. ක්‍රීඩා ඇමැතිවරයකු වැඩ භාර ගනිද්දී මෙවැනි විශාල පිරිසක් එක් වූ පළමු අවස්ථාව ලෙස මෙය ඉතිහාසයට එක් විය.

මැති ඇමැතිවරුන්, අමාත්‍යාංශ නිලධාරීන්, ක්‍රීඩා සංගම් නිලධාරීන්, ක්‍රීඩක ක්‍රීඩිකාවන්, කලාකරුවන් ඇතුළු විශාල පිරිසක් මෙන්ම ඇමැති නාමල් රාජපක්ෂ මහතාට ආදරය කරන සාමාන්‍ය ජනතාව ද විශාල වශයෙන් අමාත්‍යාංශ භූමියට රැස්ව සිටියහ. අති විශාල පිරිසක් එක්ව සිටීම හේතුවෙන් මාධ්‍ය වෙත අදහස් දැක්වීමට ද අපහසු වූ අතර, ඒ සඳහා වෙනම විශේෂ අවස්ථාවක් සලසා දෙන බව ක්‍රීඩා අමාත්‍යාංශ මාධ්‍ය ඒකකය පැවැසීය.

නව කැබිනට් මණ්ඩලය එෙතිහාසික මහනුවර මගුල් මඩුවේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉදිරියේ පසුගියද, දිවුරුම් දුන් අතර, නාමල් රාජපක්ෂ මහතා ක්‍රීඩා හා තරුණ කටයුතු භාර ඇමැතිවරයා ලෙස පත් විය.

ශ්‍රී ලංකා රගර් පිලේ හිටපු නායකයකු හා ප්‍රබල ක්‍රීඩකයකු ද වන නාමල් රාජපක්ෂ මහතා ජාතික කණ්ඩායමක් නියෝජනය කළ ශ්‍රී ලංකාවේ පළමු ක්‍රීඩා ඇමැතිවරයා බවට පත් විය. එබැවින් නව ක්‍රීඩා ඇමැතිවරයා ශ්‍රී ලාංකේය ක්‍රීඩාවේ නැවුම් බලාපොරොත්තුවක් බවට පත්ව තිබේ.

හෙතෙම වයස 19න් පහළ ජාතික රගර් පිලේ ද නායකත්වය දැරීය. ගල්කිස්ස සාන්ත තොමස් විදුහලෙන් අධ්‍යාපනය ලැබූ ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා විදුහල් රගර් කණ්ඩායමේ ද නායකයා විය. ශ්‍රී ලංකාවේ වෘත්තීය රගර් ක්‍රීඩාව ආරම්භ කරමින් කාල්ටන් සත් සාමාජික රගර් තරඟාවලිය ඇතුළු තරඟාවලි රැසක් සංවිධාන කිරීමට ඒ මහතා කටයුතු කළේය.

නීතිඥවරයකු ද වන ඒ මහතා වසර දහයක පමණ කාලයක සිට අඛණ්ඩව පාර්ලිමේන්තුව නියෝජනය කොට අත්දැකීම් ලැබූවෙකි.

ජායාරූප - සුලෝචන ගමගේ

රාජ්‍ය ඇමැති තේනුකත් වැඩ අරඹයි

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති තේනුක විදනගමගේ මහතා ද ඊයේ ක්‍රීඩා අමාත්‍යාංශයේදී සිය රාජකාරී ආරම්භ කළ අයුරු. මේ අවස්ථාවට තරුණ කටයුතු හා ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ, අමාත්‍යාංශ ලේකම් අනුරාධ විජේකෝන් මහත්වරුන් ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

පැරිස් මැරතන් තරගය අවලංගුයි

ජාත්‍යන්තර මැරතන් තරග බිමේ වාර්ෂික පැවැත්වෙන තරගයක් වන ප්‍රංශයේ පැරිස් මැරතන් තරගය මේ වසරේ නොපැවැත්වීමට සංවිධායකයන් තීරණය කර තිබේ.

ලොව පුරා වසංගතයක් බවට පත්ව ඇති කොරෝනා වයිරසය හේතුවෙන් පසුගිය අප්‍රේල් මස 5 වැනිදු පැවැත්වීමට නියමිතව තිබූ මේ තරගය දෙසැම්බර් මස 15 වැනිදු දක්වා කල් දමීමට සංවිධායකයන් මින් පෙර කටයුතු කර තිබිණි. මේ තරගය අවලංගු නොකොට පැවැත්වීමට උත්සහ කළ ද ක්‍රීඩකයන්ට මුහුණුදීමට සිදු වන ගැටලු සහ වර්තමානයේ ලොව පුරා පවතින තත්ත්වය සැලකිල්ලට ගනිමින් මෙවර තරගය නිල වශයෙන් අවලංගු කිරීමට තීරණය කළ බව සංවිධායකයෝ පවසති.

SINCE 1978 42nd
OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020
Recognizing talent, inspiring greatness.
Sri Lanka Telecom Mobitel

42 වන ඔබ්සවර් - මොබිටෙල්
වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**
ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**
ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : .....
අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐
සමස්ත ලංකා ක්‍රීඩිකාව: .....
(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)
පාසල : .....
ඔබේ නම : .....
ලිපිනය : .....
ජංගම දුරකථන අංකය : .....

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.
ප්‍රථම ත්‍යාගය : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
තෙවන ත්‍යාගය : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

කොන්දේසි :
1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරඟයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

දිනය 2020-08-22 **අංකය** 24

UNLIMITED Facebook Instagram Twitter LinkedIn
රු. 99 + බදු අදාළ වේ | සක්‍රිය කිරීමට අමතන්න #170#
Sri Lanka Telecom Mobitel

වැන්ටේජ් සභාපති කුසලාන තරගාවලියේ යුද - රෙඩ් ස්ටාර් පාපන්දු කණ්ඩායම් ඉදිරියට

ප්‍රින්ස් ගුණසේකර

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය මෙහෙයවන වැන්ටේජ් සභාපති කුසලාන පාපන්දු තරගාවලියේ යුද හමුදාව හා රෙඩ් ස්ටාර් අතර, කොළඹ සුගතදාස පිටියේ ඊයේ පැවැති තරගයෙන් ගෝල් 1-0 ක ජයක් යුද හමුදාව හිමි කර ගත්තද අවසානයේ දෙපිලම අර්ධ අවසන් වටයට සුදුසුකම් ලබා ගත්හ. මේ තරගාවලියේ 'සී' කාණ්ඩයේ මූලික වටයේ තරග තිමාවෙද්දී රෙඩ් ස්ටාර් පිල හා යුද හමුදාව තරග දෙක බැගින් ජය වාර්තා කොට තිබීම හේතුවෙන් කණ්ඩායම් දෙකම අර්ධ අවසන් වටයේ සිටිති.

මේ 'සී' කාණ්ඩයේම ක්‍රීඩා කළ සෝන්ඩර්ස් - සුපර් සන් අතර, තරගයේදී දෙපිලම ගෝල් 14ක් වාර්තා කිරීම කැපී පෙණුනි. මේ තරගාවලියේ කණ්ඩායම් දෙකක් තරගයකදී වාර්තා කළ වැඩිම ගෝල් ගණන මෙය වීම විශේෂත්වයකි.

රීඩ් මාවත තුරඟ තරග පිටියේ ඊයේ පැවැති සෝන්ඩර්ස් - සුපර් සන් අතර, තරගයෙන් ගෝල් 9-5ක ජයක් සෝන්ඩර්ස් පිල වාර්තා කළ ද දෙපිලම තරගාවලියෙන් ඉවතට ගියහ.

රීඩ් මාවත තුරඟ තරග පිටියේ ඊයේ පැවැති සෝන්ඩර්ස් - සුපර් සන් අතර තරගයේ අවස්ථාවක්.

සෝන්ඩර්ස් පිල ඊයේ දිනයේ අණසක පැතිරවීමට සමත් වුවද කලින් පැවැති තරගයක් පරාජයට පත් වී අතෙක් තරගය ජය පරාජයෙන් තොරව තිමා කළ හෙයින් ලකුණු සටහනේ තෙවැනි තැනට පත් විය. එහෙත් අර්ධ අවසන් වටයට කාණ්ඩ 5න් තෙවැනි ස්ථානයේ සිටින හොඳම කණ්ඩායම් 3ක් තෝරා ගත්තා හෙයින් සෝන්ඩර්ස් පිලට ප්‍රමාද වී හෝ ඉදිරියට යෑමේ අවස්ථාව විවර විය හැක.

යුද හමුදාව හා රෙඩ් ස්ටාර් අතර, තරගයේ ආර්.ජේ. බර්නාඩ් 39 වැනි මිනිත්තුවේදී වාර්තා කළ ගෝලයක් සමඟ පළමු භාගයේදී යුද හමුදාවේ ගෝල් 1-0ක් ලෙස පෙරමුණ ගත්තේය.

සෝන්ඩර්ස් හා සුපර් සන් අතර, තරගයේදී සුපර් සන් පිල ප්‍රබල ප්‍රහාරයකට ලක්වූ අතර, පළමු භාගයේ ලකුණු තත්ත්වය ගෝල් 6-0ක් විය. සෝන්ඩර්ස් වෙනුවෙන් 22, 40 හා 69 මිනිත්තුවලදී මොහොමඩ් කුර්ෂිඩ් ගෝල් වාර්තා කළ අතර, 4 වැනි හා 69 වැනි මිනිත්තුවලදී ඩී ද සිල්වා, 25 වැනි මිනිත්තුවේදී සුන්දරරාජ් තිරේෂ්, 30 වැනි මිනිත්තුවේදී සී. අබේසේකර හා 41 වැනි මිනිත්තුවේදී එස්. පෙරේරා ගෝල් වාර්තා කළහ.

සුපර් සන් ගෝල් පහ වාර්තා කිරීමේදී 50 වැනි මිනිත්තුවේදී මොහොමඩ් රිෆ්කාත්, 70 වැනි මිනිත්තුවේදී පී. සරුජාත් හා 84, 87 හා 92වැනි මිනිත්තුවලදී මොහොමඩ් ෂාෂාත් පිට පිට ගෝල් 3ක් සටහන් කළහ.

ගිණුම් නොදීම හා ඡන්දය නොපැවැත්වීම:

පාපැදි සංගම් ලොක්කෝ 3ක් අද විශේෂ පරීක්ෂණ කමිටුව හමුවට

ප්‍රින්ස් ගුණසේකර

ශ්‍රී ලංකා පාපැදි සම්මේලනයේ පසුගිය වසර 2ක ගිණුම් වාර්තා විගණනය නොකිරීම හා තිලවරණය නොකැඳවීම සම්බන්ධයෙන් තිදහසට කරුණු විමසීම උදෙසා එම සම්මේලනයේ සභාපති එන්. කරුණාරත්න, ලේකම් නිහාල් කුලසේකර හා භාණ්ඩාගාරික සේනක රණසිංහ යන මහත්වරු අද ක්‍රීඩා අමාත්‍යාංශයේ විශේෂ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියට කැඳවයි.

ගිණුම් වාර්තා විගණනය නොකිරීම හා තිලවරණය නොකැඳවීම සම්බන්ධයෙන් තමන් සතු සියලු ලිපි ලේඛන සමඟ සහභාගී වන ලෙස සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ ආර්.බී. වික්‍රමසිංහ මහතාගේ අස්සනින් යුතු ලිපියකින් දැනුම්දී තිබේ.

මේ සම්බන්ධ පරීක්ෂණයට පසුගිය 4 වැනිදු පැමිණෙන ලෙස දැනුම්දී තිබුණ ද ශ්‍රී ලංකා පාපැදි සම්මේලනයේ තිලධාරීන්ගේ ඉල්ලීමක් සලකා අද දිනය ලබාදී ඇත. එබැවින් අද ලබාදී ඇති අවස්ථාව අවසන් දිනය බවත් පරීක්ෂණය සඳහා සහභාගී නොවන්නේ නම් ශ්‍රී ලංකා පාපැදි සම්මේලනයේ පසුගිය වසර දෙකක කාලයේ කටයුතු කළ සභාපති එන්. කරුණාරත්න, ලේකම් නිහාල් කුලසේකර හා භාණ්ඩාගාරික සේනක රණසිංහ යන මහත්වරුන් වරද පිළිගත්තා සේ සලකා ඔවුන්ට එරෙහිව ක්‍රීඩා පතත හා ක්‍රීඩා රෙගුලාසි ප්‍රකාරව නීතිමය පියවර ගන්නා බව ද සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂවරයා ලිඛිතව දැනුම්දී ඇත.

'ගිණුම් වාර්තා විගණනය නොකිරීම හා තිලවරණය නොකැඳවීම සම්බන්ධයෙන් වන වරදකදී ක්‍රීඩා පතත හා ක්‍රීඩා රෙගුලාසි ප්‍රකාරව ජාතික ක්‍රීඩා සංගමයක සභාපති, ලේකම් හෝ භාණ්ඩාගාරිකවරයකු වශයෙන් ධුරයක් දරා සිටි තැනැත්තකු වේ නම්, එවැනි පුද්ගලයකු යම් ජාතික ක්‍රීඩා සංවිධානයකට තෝරා පත් කර ගනු ලැබීමට හෝ එසේත් නැත්නම් ගෙවීම් ලබන හෝ නොලබන යම් ධුරයක් දැරීමට හෝ ගෙවීම් ලබන හෝ නොලබන යම් තනතුරක් දැරීමට හෝ යම් ජාතික ක්‍රීඩා සංගමයක කමිටුවක සාමාජිකයකු වීමට හෝ ජාතික ක්‍රීඩා සංගමයක අනුබද්ධ ක්‍රීඩා සමාජයක හෝ සංවිධානයක නාමිකයකු වීමට හෝ නුසුදුස්සකු විය යුතුය' යන්න දක්වා තිබේ.

එබැවින් ශ්‍රී ලංකා පාපැදි සම්මේලනයේ සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික ගිණුම් වාර්තා විගණනය නොකිරීම හා තිලවරණය නොකැඳවීම සම්බන්ධයෙන් වරදකරු වුවහොත් ඔවුන්ට ඉදිරි තිලවරණයේදී නාම යෝජනා ලබාදීම තහනම් වේ. කෙසේ වුවද මේ පිළිබඳ ශ්‍රී ලංකා පාපැදි සම්මේලනයේ සභාපති එන්. කරුණාරත්න මහතාගෙන් 'දිනමිණ' කළ විමසීමකදී පැවැසුවේ බොහෝ වොදනා එල්ල වී ඇත්තේ තාක්ෂණික දෝෂ හේතුවෙන් බවයි.

"ගිණුම් වාර්තා සැකසීම භාණ්ඩාගාරිකගේ වගකීමක්. සභාපති හැටියට මා සාමූහිකව බොහෝ දෙයට බැඳී සිටිනවා. අවසන් විගණන වාර්තා සැකසීමේදී හා තිලවරණය නොකැඳවීමේදී අප යම් යම් තැන්වල සිර වී තිබෙනවා. අමාත්‍යාංශය අපට ලක්ෂ 15ක් විතර දෙන්න තිබෙනවා. ඒවා ලැබෙනකම් අප ණය කරුවන්ට වගකියමින් සිටිනවා. පසුගිය දකුණු ආසියා ක්‍රීඩා උළෙලේදී ගුවන් ප්‍රවේශපත්‍ර විස්තර අප අමාත්‍යාංශයෙන් ඉල්ලා තිබෙනවා. ඒවා ලැබී නෑ. මේ තත්ත්වය අලුත් ඇමැතිතුමා හමු වී සාකච්ඡා කරනවා" කරුණාරත්න මහතා පැවැසීය. ශ්‍රී ලංකා පාපැදි සම්මේලනයේ ගිණුම් වාර්තා සැකසීම සම්බන්ධ වගකීම ඇති භාණ්ඩාගාරික සේනක රණසිංහ මහතා ජාතික ඔලිම්පික් කමිටුවේ භාණ්ඩාගාරිකවරයාව සිටි අතර, පසුව ඔහු එම තනතුරෙන් ද ඉවත් විය.

ධනංජයගේ තුන් ඉරියව් දස්කම් අපතේ යයි

නිරෝෂාන් ප්‍රියංකර

ධනංජය ද සිල්වා දක්වූ තුන් ඉරියව් දස්කම් අපතේ යමින් මුවර්ස් ක්‍රීඩා සමාජය සමඟ පැවැති අන්තර් සමාජ පළමු පෙළ ක්‍රිකට් තරඟාවලියේ පළඟ ශූරතා වටයේ තරඟයෙන් දුවිඩ සංගම් පිලට ලකුණු 44ක පරාජයක් අත් විය.

මොරටුව ද සොයිසා ක්‍රීඩාංගණයේ පැවැති තරඟයේදී මුවර්ස් පිල පළමු ඉනිමට ලකුණු 206ක් රැස් කළ අතර, දුවිඩ සංගම් පිලට ලබාගත හැකි වූයේ ලකුණු 178ක් පමණි. ලකුණු 28ක් ඉදිරියෙන් දෙවැනි ඉනිම ඇරඹූ මුවර්ස් පිල ලකුණු 171කට දැවී ගියේ ජයග්‍රහණය සඳහා ප්‍රතිවාදීන්ට ලකුණු 200ක ඉලක්කයක් ලබා දෙමිනි. එම ඉලක්කය හඹා ගිය දුවිඩ සංගම් පිලට සියල්ලන් දැවී ලබාගත හැකි වූයේ ලකුණු 155ක් පමණි.

දුවිඩ සංගම් පළමු ඉනිමේදී නොදැවී ලකුණු 95ක් රැස් කළ ධනංජය ද සිල්වා පන්දුවෙන් දස්කම් දක්වමින් මුවර්ස් පළමු ඉනිමේ කඩුලු 7ක් සහ දෙවැනි ඉනිමේදී කඩුලු 5ක් බිඳ දැම්මේය. පළමු පෙළ තරඟ බිමේ ඉනිම හොඳම පන්දු යැවීම ලෙස ලකුණු 59කට කඩුලු 7ක් දවාගත් 28 හැවිරිදි ධනංජය දෙවැනි ඉනිමේදී ලකුණු 50කට කඩුලු 5ක් බිඳ දැම්මේ තරඟයක හොඳම (109/12) පන්දු යැවීම ද සටහන් කරමිනි. ඒ සමඟින් පළමු පෙළ කඩුලු 100 (111) ඉක්මවා යෑමට ද ඔහුට හැකි විය.

මුවර්ස් ක්‍රීඩා සමාජය වෙනුවෙන් විශිෂ්ට පන්දු යැවීමක නිතර වූ ප්‍රවීන් ජයවික්‍රම ද සිය පළමු පෙළ තරඟ දිවියේ ඉනිමක මෙන්ම තරඟයක ද හොඳම පන්දු යැවීම සටහන් කර ගත්තේය. පළමු ඉනිමේදී ලකුණු 53කට කඩුලු 5ක් බිඳ දැමූ ඔහු දෙවැනි ඉනිමේදී ලකුණු 91කට කඩුලු 6ක් දවා ගත්තේය.

පළඟ ශූරතා වටය යටතේ එන්.සී.සී පිටියේ පැවැති බදුරලිය - මිගමුව සහ කෝල්ට්ස් පිටියේ පැවැති ලන්කත් - එස්.එස්.සී තරඟ ජය පරාජයෙන් තොරව තිමාවට පත් විය.

මේ තරඟවලදී කැපී පෙනෙන පිතිකරු බවට පත් වූයේ ලන්කත් ක්‍රීඩා සමාජයේ චානක රුවන්සිරිය.

පසුගිය සතියේ මිගමුව ක්‍රීඩා සමාජයට එරෙහිව සිය පළමු පෙළ හොඳම ඉනිම (124) දියත් කළ 30 හැවිරිදි රුවන්සිරි මේ තරඟයේදී එය තවත් ඉදිරියට ගෙන යමින් ලකුණු 165ක් රැස් කිරීමට සමත් විය. සිය පළමු පෙළ තරඟ දිවියේ 68 වැනි තරඟයට ක්‍රීඩා කළ ඔහු, ඊයේ රැස් කළේ 6 වැනි ශතකයයි. දසුන් ශානක (එස්.එස්.සී) සහ දුෂාන් හේමන්ත (බදුරලිය) ද ශතකයක් රැස් කළ අතර, උපුල් ඉන්ද්‍රසිරි කඩුලු 10ක් බිඳ දමමින් (මිගමුව) පන්දුවෙන් දස්කම් දක්වූහ.

වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 19 වැනිදා බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

අංක 84

ප්‍රොබේට් නිලධරයා විසින් පළ කළ යුතු දැන්වීම

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 529 (2) වන වගන්තිය යටතේ දැන්වීම

මේ උපලේඛනයේ විස්තර කර ඇති මියගිය තැනැත්තන්ගේ බුදලය සම්බන්ධයෙන් අන්තිම කැමති පත්‍රය ඔප්පු කිරීමට / ප්‍රොබේට් බලපත්‍රය / අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය / උරුමය පිළිබඳ සහතික නිකුත් කිරීම සඳහා පහත දැක්වෙන ඉල්ලුම් ඉදිරිපත් කර ඇති බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

අන්තිම කැමති පත්‍රයක් ඔප්පු කළේ යයි ප්‍රකාශ කරන්නා වූ ආඥාවක් සිදු කිරීමට හෝ අන්තිම කැමති පත්‍රයක් අමුණා හෝ එසේ නොමැතිව ප්‍රොබේට් බලපත්‍ර හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ප්‍රදානය කිරීමට හෝ පෙත්සමේ නම් කර ඇති තැනැත්තාට උරුමය පිළිබඳ සහතික නිකුත් කිරීමට විරෝධතා ඇති යම් තැනැත්තෙකු විසින් එම විරෝධතා ලිඛිතව දිවුරුම් පෙත්සමක් මගින් සනාථ කර පහත දැක්වෙන අදාළ දිසා අධිකරණය විසින් නියම කරනු ලබන දිනයක දී හෝ ඊට පෙර ගොනුකරනු ලැබිය යුතුය.

උපලේඛනය

ත්‍රිකුණාමලය දිසා අධිකරණය

විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020/09/25

උපලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණයේ ලියා ලියාපදිංචි කිරීමේ අංකය	මියගිය තැනැත්තාගේ නම	මියගිය තැනැත්තා අන්තිම කැමති පත්‍රයක් තබා මිය ගියේද යන වග	ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ලිපිනය
T/166/20	කුලන්දවේලු මහාලිංගම් සහ පත්මාදේවි මහාලිංගම්	නැත	මහාලිංගම් දීපහරන් නො.96, තිරුඥානසම්බන්ධර් වීදිය, ත්‍රිකුණාමලය. -පෙත්සම්කරු-

දිනය : 2020-06-30 ප්‍රොබේට් නිලධාරි - ත්‍රිකුණාමලය දිසා අධිකරණයේදීය.

තෙල්දෙණිය දිසා අධිකරණය

විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020.09 මස 25 වන දින

උප ලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණයේ ලියා පදිංචි කිරීමේ අංකය	මිය ගිය තැනැත්තාගේ නම හා ලිපිනය	මිය ගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇත්ද	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
ටි/6/20	අබේකෝන් වාසල මුතුකුඩේ වලව්වේ සෙනරත් බණ්ඩාර අමුණුගම, අංක 07, මාලිගාතැන්නේ, ලේවැල්ලගම, ගුන්නෑපාන.	නැත	අබේකෝන් වාසල මුතුකුඩේ වලව්වේ දීප්ති බණ්ඩාර අමුණුගම. අංක 07, මාලිගාතැන්නේ, ලේවැල්ලගම, ගුන්නෑපාන.

දිනය: 2020.06.17 ප්‍රොබේට් නිලධාරි - තෙල්දෙණිය දිසා අධිකරණයේදීය.

මල්ලාකම් දිසා අධිකරණය

විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020.09 මස 22 වන දින

උප ලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණයේ ලියා පදිංචි කිරීමේ අංකය	මිය ගිය තැනැත්තාගේ නම හා ලිපිනය	මිය ගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇත්ද	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
T/20/2020	කන්දයියා ශිවා සාමි බාලක්‍රිෂ්ණන්.	නැත	බාලක්‍රිෂ්ණන් වනිදමනි (බිරිඳ) අච්චුවේලි පොලිස් ස්ථානය අසල, සංගානවිදි අච්චුවේලි

දිනය: 2020.06.30 ප්‍රොබේට් නිලධාරි - මල්ලාකම් දිසා අධිකරණයේදීය.

මහනුවර දිසා අධිකරණය

විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020.10 මස 26 වන දින

උපලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණයේ ලියාපදිංචි කිරීමේ අංකය	මියගිය තැනැත්තාගේ නම හා ලිපිනය	මියගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇත්ද	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
DTS 14/2020	වැල් අරුමගේ ගුණසිරි ප්‍රනාන්දු # 463, පේරාදෙණිය පාර, ගැටඹේ, මහනුවර.	නැත	වැල් අරුමගේ ධර්මසිරි ප්‍රනාන්දු # 463, පේරාදෙණිය පාර, මහනුවර.

දිනය: 2020.07.08 ප්‍රොබේට් නිලධාරි - මහනුවර දිසා අධිකරණයේදීය.

ගම්පහ දිසා අධිකරණය

විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020.09 මස 22 වන දින

උප ලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණයේ ලියා පදිංචි කිරීමේ අංකය	මිය ගිය තැනැත්තාගේ නම හා ලිපිනය	මිය ගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇත්ද	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
T/26/2020	විතාන ආරච්චිගේ සිසිර කුමාර අංක 36/3, කැන්දලියද්දපාළුව, ගණේමුල්ල.	නැත	සූරියප්පෙරුම විදනලාගේ නිශාන්ති, අංක 36/3, කැන්දලියද්දපාළුව, ගණේමුල්ල.

දිනය: 2020.06.16 ප්‍රොබේට් නිලධාරි - ගම්පහ දිසා අධිකරණයේදීය.

යාපනය දිසා අධිකරණය

විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020 සැප්තැම්බර් මස 25 වන දින

උපලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණ ලියාපදිංචි කිරීමේ අංකය	මියගිය තැනැත්තාගේ නම හා ලිපිනය	මියගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇද්ද	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
යාපනය දිසා අධිකරණ බුදල් නඩු අංක 62/2020	වේලුප්පිල්ලේ තංකවඩිවේලු සහ භාර්යාව ඥානපූපති සිව අම්මන් කෝවිල්, කෝණ්ඩාවිල් බටහිර.	ඔව්	බාලසුන්දරම් සිවයොගන් 'සිවා', කොණ්ඩාවිල් බටහිර, පාසල් පටුමග.

දිනය: 15-06-2020 ප්‍රොබේට් නිලධාරි - යාපනය දිසා අධිකරණයේදීය.

අනුරාධපුර දිසා අධිකරණය

විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020-09-23

උපලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණයේ ලියාපදිංචි අංකය	මියගිය තැනැත්තාගේ නම	මියගිය තැනැත්තා අන්තිම කැමති පත්‍රයක් තබා මියගියේද යන වග	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
TS/00145/20	අවුසදහාමිගේ බන්දුල.	නැත	වඩුගේ ජීවනි ප්‍රියංගිකා ප්‍රනාන්දු වැලියමඔය හංදිය, යාපනය පාර, රඹෑව.

දිනය: 2020-06-12 ප්‍රොබේට් නිලධාරි - අනුරාධපුර දිසා අධිකරණයේදීය.

බද්දේගම දිසා අධිකරණය

විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020-09 මස 24 වන දින

උපලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණ ලියාපදිංචි කිරීමේ අංකය	මියගිය තැනැත්තාගේ නම හා ලිපිනය	මියගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇද්ද	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
බද්දේගම දිසා අධිකරණය T/12	කාරියවසම් තාරිගම පටබැඳිගේ විජේරත්න 'සම්පත්', අලුත් පහල, මාපලගම (මධ්‍යම), ගාල්ල.	නැත	කාරියවසම් තාරිගම පටබැඳිගේ අමිල සම්පත් සම්පත්, අලුත් පහල, මාපලගම (මධ්‍යම), ගාල්ල.

දිනය: 2020-06-17 ප්‍රොබේට් නිලධාරි - බද්දේගම දිසා අධිකරණයේදීය.

මහනුවර දිසා අධිකරණය

විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020.09 මස 24 වන දින

උපලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණයේ ලියාපදිංචි කිරීමේ අංකය	මියගිය තැනැත්තාගේ නම හා ලිපිනය	මියගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇත්ද	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
DTS 0062/19	මකුල්ලොලුව වලව්වේ බන්දුල තිල් කුමාර මකුල්ලොලුව අංක 238, ඉඩමේගම, වැගල්ලගම.	නැත	හේරත් මුදියන්සේලාගේ දිල්රුක්ෂි නයනා කුමාරි මකුල්ලොලුව. අංක 238, ඉඩමේගම, වැගල්ලගම.

දිනය: 2020.07.07 ප්‍රොබේට් නිලධාරි - මහනුවර දිසා අධිකරණයේදීය.

ගම්පහ දිසා අධිකරණය

විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020.09 මස 24 වන දින

උප ලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණයේ ලියා පදිංචි කිරීමේ අංකය	මිය ගිය තැනැත්තාගේ නම හා ලිපිනය	මිය ගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇත්ද	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
19/2020/ බුදල්	වත්තිආරච්චිගේ කුමුදු ඉන්දික තිරෝෂන්, අංක 58, අමුණුකුඹුර, වතුරුගම.	ඔව්	රත්නායක කලුආරච්චිගේ සිලිලා ශාන්තශීලි හෙවත රත්නායක කලු ආරච්චිගේ ඩිලිලා ශාන්ත සීලිත් අංක 58, අමුණුකුඹුර, වතුරුගම.
17/2020/T	මාලා ප්‍රියංවද ගුණවර්ධන, අංක 138/8, ඇවරිවත්ත පාර, හෙයියන්තුඩුව	නැත	මීගහවත්තගේ අනිල් සිරිලාල් ගුණවර්ධන, අංක 138/8, ඇවරිවත්ත පාර, හෙයියන්තුඩුව.
1309/බුදල්	කත්තොට රාළලාගේ ඉන්ද්‍රජිත් සිරිමෙවන් සත්දනායක, 117, තම්මිට, මාකෙවිට.	නැත	ධම්මිකා ප්‍රියදර්ශනී විට්ටහච්චි 117, තම්මිට, මාකෙවිට.

දිනය: 2020.06.02 ප්‍රොබේට් නිලධාරි - ගම්පහ දිසා අධිකරණයේදීය.

කුරුණෑගල දිසා අධිකරණය

විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020.09 මස 22 වන දින

උප ලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණයේ ලියා පදිංචි කිරීමේ අංකය	මිය ගිය තැනැත්තාගේ නම හා ලිපිනය	මිය ගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇත්ද	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
අංක 7853/T	රහුමාන් තම්බි මීරාසහිබෝ හෙවෙත් රහුමාන් තම්බි මීරා සයිබු හෙවත් මොහමඩ් රාහුමන්තම්බි මීරා සයිබ් හෙවත් මීරාසාහිබුමරයික්කා අංක 66, පැරකුම්බා විදිය, කුරුණෑගල.	නැත	මීරා සහිබු මොහමඩ් මිඩ්ලාජ් අංක 66 පැරකුම්බා විදිය, කුරුණෑගල.
7861/T (බුදල්)	රත්හොට් පේඩිගේ සෝමරත්ත	නැත	රංහොට් පේඩිගේ සුරංග ජීවා සෝමරත්න, 178/3, බරත්දන, හිඳගොල්ල, කුරුණෑගල.

දිනය: 2020.07.02 ප්‍රොබේට් නිලධාරි - කුරුණෑගල දිසා අධිකරණයේදීය.

අනුරාධපුර දිසා අධිකරණය

විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020 - 09 මස 23 වන දින.

උපලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණ ලියාපදිංචි කිරීමේ අංකය	මියගිය තැනැත්තාගේ නම හා ලිපිනය	මියගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇද්ද	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
T/143/2020	රත්නායක මුදියන්සේලාගේ කිරි මුදියන්සේ හෙවත් රත්නායක මුදියන්සේලාගේ මුදියන්සෙ. නො.28, දකුණු ඉවුර, පේමඩුව	ඇත	හේරත් මුදියන්සේලාගේ ඉන්දික රොෂාන් හේරත් නො.28, දකුණු ඉවුර, පේමඩුව.

වර්ෂ 2020 ක් වූ 06 මස 29 වන දි දීය. ප්‍රොබේට් නිලධාරි - අනුරාධපුර දිසා අධිකරණයේදීය.

බණ්ඩාරවෙල දිසා අධිකරණය

විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020.09 මස 23 වන දින

උප ලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණයේ ලියා පදිංචි කිරීමේ අංකය	මිය ගිය තැනැත්තාගේ නම හා ලිපිනය	මිය ගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇත්ද	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
T/126	තංගයියා මහේෂ්වරි	නැත	කුණ්ඩෘමලෙයි රාහුලන් අංක 19, "ලක්ෂ්මි ස්ටෝර්ස්" ප්‍රධාන විදිය, හපුතලේ.
T/127	ගාර්දියේ පුංචිහේවාගේ උපාලි විරරත්න	නැත	චූලා චන්ද්‍රිකානි මහවඩුගේ අංක 02, දියතලාව පාර, කිරිඳිඇල්ල, බණ්ඩාරවෙල.

දිනය: 2020.06.23 ප්‍රොබේට් නිලධාරි - බණ්ඩාරවෙල දිසා අධිකරණයේදීය.

බලපිටිය දිසා අධිකරණය

විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020.09 මස 16 වන දින

උප ලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණයේ ලියාපදිංචි කිරීමේ අංකය	මියගිය තැනැත්තාගේ නම හා ලිපිනය	මිය ගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇත්ද	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
තෙස්තමේන්තු / 04	නිහාල් කොඩිතුවක්කු	නැත	සුමල් සාලින්ද කොඩිතුවක්කු, අංක 8 ඒ, පටබැඳි ගෙදරවත්ත, දෙවට 1, අම්බලන්ගොඩ. පෙත්සම්කරු

දිනය: 2020.06.25 ප්‍රොබේට් නිලධාරි - බලපිටිය දිසා අධිකරණයේදීය.

ඇඹිලිපිටිය දිසා අධිකරණය

විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020 - 09 මස 16 දින.

උපලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණය ලියාපදිංචි කිරීමේ අංකය	මියගිය තැනැත්තාගේ නම සහ ලිපිනය	මියගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇද්ද	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
බුදල් 31/19 (දිසා අධිකරණය, ඇඹිලිපිටිය)	හුංකිරි ආරච්චිලැගේ පුංචි මැණිකේ. සිද්ධ වත්ත පාර, ගොඩකවෙල.	නැත	ගබ්වෙල බලංගොඩගේ නාලිකා චන්ද්‍රකාන්ති පත්තිල. සිද්ධ වත්ත පාර, ගොඩකවෙල.

දිනය: 2020-06-17 ප්‍රොබේට් නිලධාරි - ඇඹිලිපිටිය දිසා අධිකරණයේදීය.

යාපනය දිසා අධිකරණය

විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020.09 මස 25 වන දින

උපලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණයේ ලියා පදිංචි කිරීමේ අංකය	මියගිය තැනැත්තාගේ නම හා ලිපිනය	මියගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇත්ද	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
බුදල්/61/2019	පුන්‍යමූර්ති තෙයිවේන්තිරම් තල්ලූර්, යාපනය.	නැත	තෙයිවේන්තිරම්, තලිනිකාන්ත්, 64, සෙම්මනි පාර, තල්ලූර්, යාපනය.

දිනය: 2020.06.29 ප්‍රොබේට් නිලධාරි - යාපනය දිසා අධිකරණයේදීය.

ගම්පහ දිසා අධිකරණය

විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020.09 මස 23 වන දින

උප ලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණයේ ලියා පදිංචි කිරීමේ අංකය	මිය ගිය තැනැත්තාගේ නම හා ලිපිනය	මිය ගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇත්ද	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
1308/T	ගාසින් ආරච්චිගේ සුගතදස බෙම්මුල්ල, පෙරේරා ස්ටෝර්ස්	නැත	ගාසින් ආරච්චිගේ උදය කුමාර අංක 60/1, බණ්ඩාරවත්ත, ගම්පහ
1295/ බුදල්	හිඟුරන්ගොඩගේ ජෝශප් බෙනඩික් පෙරේරා අංක 76, මඩම පාර, හැඳල, වත්තල.	නැත	හිඟුරන්ගොඩගේ හිලරි ඩෙරික් ලලෙන්ද්‍ර පෙරේරා අංක 76, මඩම පාර, හැඳල, වත්තල

දිනය: 2020.06.16 ප්‍රොබේට් නිලධාරි - ගම්පහ දිසා අධිකරණයේදීය.

අංක 84
ප්‍රොබේට් නිලධරයා විසින් පළ කළ යුතු දැන්වීම
සිවිල් නඩු විධාන සංග්‍රහයේ 529 (2) වන වගන්තිය යටතේ දැන්වීම

මේ උපලේඛනයේ විස්තර කර ඇති මියගිය තැනැත්තන්ගේ බූදලය සම්බන්ධයෙන් අන්තිම කැමති පත්‍රය ඔප්පු කිරීමට / ප්‍රොබේට් බලපත්‍රය / අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය / උරුමය පිළිබඳ සහතික නිකුත් කිරීම සඳහා පහත දැක්වෙන ඉල්ලුම් ඉදිරිපත් කර ඇති බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

අන්තිම කැමති පත්‍රයක් ඔප්පු කළේ යයි ප්‍රකාශ කරන්නා වූ ආඥාවක් සිදු කිරීමට හෝ අන්තිම කැමති පත්‍රයක් අමුණා හෝ එසේ නොමැතිව ප්‍රොබේට් බලපත්‍ර හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ප්‍රදානය කිරීමට හෝ පෙත්සමේ නම් කර ඇති තැනැත්තාට උරුමය පිළිබඳ සහතික නිකුත් කිරීමට විරෝධතා ඇති යම් තැනැත්තෙකු විසින් එම විරෝධතා ලිඛිතව දිවුරුම් පෙත්සමක් මගින් සනාථ කර පහත දැක්වෙන අදාළ දිසා අධිකරණය විසින් නියම කරනු ලබන දිනයක දී හෝ ඊට පෙර ගොනුකරනු ලැබිය යුතුය.

උපලේඛනය

හිගුරක්ගොඩ දිසා අධිකරණය
විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2020.09 මස 15 වන දින

උප ලේඛනය

I තීරය	II තීරය	III තීරය	IV තීරය
දිසා අධිකරණයේ ලියා පදිංචි කිරීමේ අංකය	මිය ගිය තැනැත්තාගේ නම හා ලිපිනය	මිය ගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇත්ද	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය
41/බු/20	සව්සිරි ගෙදර කිරිබණ්ඩා	ඔව්	සව්සිරි ගෙදර පොඩි අප්පුහාමි අංක 1306, විජයපුර, දියසෙන්පුර.
37/බූදල්/ 19	උක්කු බංඩාගේ බංඩා අංක 827/ඒ, ට්‍රැක් 08, දිවුලන්කඩවල.	ඔව්	බස්නායක මුදියන්සේලාගේ අබේසිංහ අංක 143, මහසෙන්ගම, මොරගස්වැව.
වත්තල ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් අංශ පරිගණකගත කිරීම සඳහා අවශ්‍ය කරන මෘදුකාංග පද්ධතියක් මෙහි සඳහන් කොන්දේසි වලට යටත්ව මිලදී ගැනීමට ටෙන්ඩර් කැඳවනු ලැබේ. ටෙන්ඩර් අයදුම්පතක් රු. 1,000/- මුදලක් ගෙවා 2020.09.02 දින ප.ව. 3.00 ට පෙර වත්තල ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැකිය. මුල් පිටපතක් හා අනු පිටපතක් සහිත වූ ටෙන්ඩර්පත් සම්පූර්ණ කර වෙන් වෙන් වශයෙන් 2020.09.04 පෙ.ව. 10.00 දක්වා ඉදිරිපත් කළ යුතු අතර, 2020.09.04 දින පෙ.ව. 11.00 ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

ඔබගේ මිල ගණන් වෙන වෙනම **සභාපති, වත්තල ප්‍රාදේශීය සභාව, හැඳල** යන ලිපිනයට නියමිත වේලාවට පෙර ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හැකිය. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුය.

කොන්දේසි :

01. ප්‍රාදේශීය සභාවක් සඳහා කාර්යාල කටයුතු, පරිගණක ගත කිරීමේ මෘදුකාංගයක් සකස් කිරීම පිළිබඳව වසර 5 කට වැඩි පළපුරුද්දක් තිබීම.
02. සාර්ථකව පළාත් පාලන ආයතන 10 කට වැඩි ප්‍රමාණයක මූලික විෂයන් පරිගණක ගත කිරීම ක්‍රියාත්මක කර තිබීම.
03. වත්තල ප්‍රාදේශීය සභාව තුළ දැනට පවතින මෘදුකාංග පද්ධතිය හා සම්බන්ධ කර හැකි විය යුතුය.
04. මෘදුකාංග පද්ධතිය Cloud Based විය යුතුය. දත්ත පද්ධතිය MYSQL විය යුතුය.
05. අවශ්‍ය කරන මෘදුකාංග පද්ධති.

මෙහි සඳහන් මෘදුකාංග පද්ධති අන්තර්ජාලීය සේවා ලෙස (ඉල්ලුම් කිරීම / මුදල් ගෙවීම / සේවය සැපයීම / වෙන් කිරීම්) සකසා තිබිය යුතුය.

01	අන්තර්ජලීය වෙබ් අඩවියක් හරහා වරිපනම් ගෙවීම
02	අන්තර්ජලීය වෙබ් අඩවියක් හරහා කඩ කුලී ගෙවීම
03	අන්තර්ජලීය වෙබ් අඩවියක් හරහා ව්‍යාපාර බදු ගෙවීම
04	අන්තර්ජලීය වෙබ් අඩවියක් හරහා පැමිණිලි කළමනාකරණය
05	අන්තර්ජලීය වෙබ් අඩවියක් හරහා උත්සව ශාලා වෙන් කිරීම / මුදල් ගෙවීම
06	අන්තර්ජලීය වෙබ් අඩවියක් හරහා ආදහනාගාර වෙන් කිරීම / මුදල් ගෙවීම
07	අන්තර්ජලීය වෙබ් අඩවියක් හරහා ක්‍රීඩා පිටි වෙන් කිරීම / මුදල් ගෙවීම
08	අන්තර්ජලීය වෙබ් අඩවියක් හරහා වරිපනම් සහතිකයක් නිකුත් කිරීම
09	අන්තර්ජලීය වෙබ් අඩවියක් හරහා නොපරවා ගැනීමේ සහතිකයක් ඉල්ලුම්කිරීම/මුදල් ගෙවීම
10	අන්තර්ජලීය වෙබ් අඩවියක් හරහා විථී රේඛා සහතිකයක් ඉල්ලීම් කිරීම හා මුදල් ගෙවීම
11	අන්තර්ජලීය වෙබ් අඩවියක් හරහා ගස් වල අතු හා වෙනත් කසළ ඉවත් කිරීම
12	අන්තර්ජලීය වෙබ් අඩවියක් හරහා ව්‍යාපාරික ස්ථාන වලින් කසළ ඉවත් කිරීම

06. මෘදුකාංග පද්ධතිය ටෙන්ඩරය ඉදිරිපත් කරන අවස්ථාව වනවිට නිර්මාණය කර ඇති වැඩසටහනක් විය යුතුය.
07. පළාත් පාලන විෂය පිළිබඳ පිළිගත හැකි දැනුමක් හා අවබෝධයක් ඇති ආයතනයක් විය යුතුය.
08. සුදුසු ආයතනයක් තෝරා ගැනීමේදී පළපුරුද්ද, මෘදුකාංගයේ ගුණාත්මක භාවය සහ පසු සේවා පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන බව සලකන්න.

2020.08.11 දින
වත්තල ප්‍රාදේශීය සභාව.

සභාපති,
වත්තල ප්‍රාදේශීය සභාව.

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වන වගන්තිය යටතේ සීලෙක්ස් ඇග්‍රි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම එහි නම **කිංග්ස්බෲ ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ්** වශයෙන් දෙදහස් විස්ස (2020) ජූලි මස හයවන (06) දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ. සමාගම ලියාපදිංචි අංකය පීවී 00215120 දරන අතර, එහි ලියාපදිංචි ලිපිනය නො. 65/10, පාක් වීදිය, කොළඹ 02 වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,
සමාගමේ ලේකම්

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ දැන්වීමයි

2007 අංක 07 දරන සාමගම් පනතේ 8 වන වගන්තිය යටතේ එල් ටී එල් ග්ලෝබල් ඉංජිනියරිං සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම එහි නම **සිලෙක්ස් ග්ලෝබල් ඉංජිනියරිං සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්** වශයෙන් දෙදහස් විස්ස (2020) ජූලි මස තිස් එක් වන (31) දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කොට ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ. සමාගමේ ලියාපදිංචි අංකය PV73576 වන අතර, ලියාපදිංචි ලිපිනය පාක්ලන්ඩ් 17 වන මහල, නො. 33, පාක් වීදිය, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,
සමාගමේ ලේකම්.

1964 අංක 28 දරන අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ

7(1) වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය : 8/3/5/4

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4/3/9/2013/HW/369

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම රජයට ලබාගැනීමට බලාපොරොත්තු වේ. වැඩි විස්තර සඳහා 2020 ජූලි මස 03 වැනි දින දරන අංක 2182/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ (III) කොටස බලන්න.

උපලේඛනය

දිස්ත්‍රික්කය	: මාතලේ
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	: මාතලේ
ග්‍රාම නිලධාරී කොට්ඨාසය	: ඊ 349 ඒ, පඩිවිට වෙලගම
ගම	: පඩිවිට වෙලගම (කොට්ඨාස අංක 11 - කුඹියන්ගොඩ) මාතලේ මහ නගර සභා සීමාව තුළ
ඉඩමේ නම	: මාතලේ - උඩුපිහිල්ල මාර්ගය දෙපස ඇති ඉඩම් (කුඹියන්ගොඩ පාර)
කැබලි අංකය	: කැබලි අංක 1 සිට 41 දක්වා
මූලික පිඹුරු අංකය	: මා 1768
ප්‍රමාණය	: හෙක්ටයාර් 0.2587

කේ. පී. කේ. එල්. පී. මධුවන්ති
ප්‍රාදේශීය ලේකම්,
මාතලේ

2020 අගෝස්තු මස 14 දින
මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදිය.

නම වෙනස් කිරීම

දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ [illegible] පාර අංක 50/1 හි වසන පදිංචි [illegible] වන මම අද සිට [illegible] යන නාමය භාවිතා කරන බවට ශ්‍රී ලංකා රජයටත් මහජනතාවටත් මෙයින් දන්වමි.

[illegible]

දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : **සීල් ද ඩීල් (පීවීටී) එල්ටීඩී**
සමාගමේ අංකය : පීවී 00223498
ලියාපදිංචි කාර්යාලය : අංක 37, ටෙම්ප්ලර්ස් චතුරස්‍රය, ද සොයිසා මාවත, ගල්කිස්ස.
සංස්ථාගත කළ දිනය : 2020 ජූනි 29

සමාගමේ ලේකම්

තැපැල් දෙපාර්තමේන්තුව

2021 වර්ෂයේ සමරු මුද්දර නිකුත් කිරීම වෙනුවෙන් යෝජනා ලබාගැනීම

2021 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සමරු මුද්දර සඳහා සුදුසු තේමාවන් සලකා බැලීමට යෝජනාවන්, මුද්දර ප්‍රතිපත්තියේ 7.1 ඡේදය ප්‍රකාරව මෙයින් කැඳවනු ලැබේ.

ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් සිදුවීම්, සංවත්සර සැමරුම්, සම්භාවනීය පුද්ගලයන්, ස්වභාව සෞන්දර්ය, ක්‍රීඩා, ජාතික අභිමානය පෙන්නුම් කෙරෙන සහ සංස්කෘතික අවස්ථාවන් පිළිබිඹුවන තේමාවන් මේ යටතේ යෝජනා කළ හැකිය. අදාළ යෝජනාව සමග එහි වැදගත්කම පිළිබඳව කෙටි විස්තරයක්, සංවත්සර දිනයන් හා අදාළ යෝජනාව සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු පිළිබඳ ලිඛිත සාක්ෂි සමග යෝජනාකරුගේ නම, ලිපිනය, දුරකථන අංකය, විද්‍යුත් ලිපිනය හා අත්සන සහිතව ඉදිරිපත් කළ යුතුය.

සියලුම යෝජනාවන් 2020 සැප්තැම්බර් මස 30 වෙනි දිනට ප්‍රථම ලැබෙන සේ **අධ්‍යක්ෂ, මුද්දර කාර්යාංශය. තැපැල් මූලස්ථානය, අංක 310, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ** 01000 යන ලිපිනයට එවිය යුතු වේ.

අවසන් දිනෙන් පසුව ලැබෙන යෝජනාවන්, 2021 වර්ෂයේදී මුද්දර නිකුත් කිරීම සඳහා සලකා නොලබන බව කාරුණිකව දන්වමි.

රංජිත් ආරියරත්න,
තැපැල්පති,
තැපැල් මූලස්ථානය,
අංක 310, ඩී.ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 01000.

මහජන බැංකුව

ටෙන්ඩර් දැන්වීමයි

මහජන බැංකුව සඳහා බාහිර ආයතන හරහා ආරක්ෂක සේවාවන් ලබා ගැනීමේ ටෙන්ඩරය - 2020 / 2023

ටෙන්ඩර් අංකය - P-060/2020

2020.11.01 දින සිට 2023.10.31 දින දක්වා මහජන බැංකුවේ ප්‍රධාන කාර්යාලය හා ඒ අවට පිහිටි දෙපාර්තමේන්තු / ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය සහ ඊට අයත් ශාඛා සඳහා බාහිර ආයතන හරහා ආරක්ෂක සේවාවන් ලබා ගැනීම වෙනුවෙන් පෞද්ගලික ආරක්ෂක ආයතනයන්ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

01	ප්‍රධාන කාර්යාලය හා ඒ අවට දෙපාර්තමේන්තුව
02	අම්පාර ප්‍රාදේශිකය
03	අනුරාධපුරය ප්‍රාදේශිකය
04	බදුල්ල ප්‍රාදේශිකය
05	මඩකලපුව ප්‍රාදේශිකය
06	ගාල්ල ප්‍රාදේශිකය
07	ගම්පහ ප්‍රාදේශිකය
08	හම්බන්තොට ප්‍රාදේශිකය
09	යාපනය ප්‍රාදේශිකය
10	කළුතර ප්‍රාදේශිකය
11	මහනුවර ප්‍රාදේශිකය
12	කෑගල්ල ප්‍රාදේශිකය

13	කුරුණෑගල ප්‍රාදේශිකය
14	මාතලේ ප්‍රාදේශිකය
15	මාතර ප්‍රාදේශිකය
16	මොණරාගල ප්‍රාදේශිකය
17	නුවරඑළිය ප්‍රාදේශිකය
18	පොළොන්නරුව ප්‍රාදේශිකය
19	පුත්තලම ප්‍රාදේශිකය
20	රත්නපුරය ප්‍රාදේශිකය
21	ත්‍රිකුණාමලය ප්‍රාදේශිකය
22	වන්නි ප්‍රාදේශිකය
23	බටහිර කලාප - 1 ප්‍රාදේශිකය
24	බටහිර කලාප - 11 ප්‍රාදේශිකය

වෙනත් කොන්දේසි :

01. ටෙන්ඩර් අයදුම්පත් 2020.08.19 දින සිට 2020.09.08 දින දක්වා බැංකු වැඩ කරන දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා කොළඹ 02, කිව් පාර, 30/101, පිහිටි මහජන බැංකුවේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි අතර, ඒ සඳහා එක් ටෙන්ඩර් අයදුම්පතක් වෙනුවෙන් ආපසු නොගෙවනු ලබන රු. 1,500/- ක ගාස්තුවක් සැපයුම් දෙපාර්තමේන්තුව නමින් පවත්වාගෙන යන මහජන බැංකු ගිණුම් අංක 204100120011913 ට දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවක තැන්පත් කොට එහි අනුපිටපත, අදාළ ආයතනයේ අයදුම් ලිපියක් සමග සැපයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.
02. නිසි පරිදි සකස් කරන ලද ටෙන්ඩර් පත් සමග රු. 500,000/- වටිනාකමට පිළිගත් වාණිජ බැංකුවකින් මහජන බැංකුව නමට (මහජන බැංකුව හැර) ලබා ගත් බැංකු ඇපකරයක්, බැඳුම්කරයක්, බැංකු ගෙවීම් ඇණවුමක් හෝ බැංකු අණකරයක් ඉදිරිපත් කළ යුතු අතර, එම ඉදිරිපත් කරන ඇපකරය, බැඳුම්කරය, ගෙවීම් ඇණවුම් හෝ බැංකු අණකරය ටෙන්ඩරය විවෘත කරන දින සිට දින 180 කට වලංගු විය යුතුවේ. පුද්ගලික චෙක්පත් භාර ගනු නොලැබේ.
03. 2020.09.09 දින ප.ව. 2.00 ට ටෙන්ඩර් විවෘත කරනු ලබන අතර, ඊට පෙර ලැබෙන පරිදි මුද්‍ර සහිතව සකසන ලද ටෙන්ඩර් පත් මහජන බැංකුව, සැපයීම් දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු අතර, නැතහොත් ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුවේ. එම වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් විවෘත නොකරම ප්‍රතික්ෂේප කරනු ලැබේ.
04. 2016 / 2017, 2017 / 2018 හා 2018 / 2019 යන මුදල් වර්ෂ සඳහා විගණනය කරන ලද ගිණුම් වාර්තා, ගිණුම් සඳහා ඇති සටහන් සහ විගණන මතයද ටෙන්ඩර් අයදුම්පත් සමග අනිවාර්යෙන්ම ඉදිරිපත් කළ යුතුය.
05. සියලුම හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ කිසිදු හේතුවක් නොදක්වා ටෙන්ඩරයක ඕනෑම කොටසක් හෝ පිළිගැනීමේ අයිතිය මහජන බැංකුව සතුවේ.
06. මේ සම්බන්ධව වැඩි විස්තර ප්‍රධාන කළමනාකාර (සැපයීම්) මහජන බැංකුව, සැපයීම් දෙපාර්තමේන්තුව වෙතින් පහත සඳහන් දුරකථන අංක මගින් ලබාගත හැක.

ප්‍රධාන කළමනාකාර (සැපයීම්),
මහජන බැංකුව,
සැපයීම් දෙපාර්තමේන්තුව,
30/101, කිව් පාර, කොළඹ 02.

දුරකථන අංක - 2439577, 2439578
ෆැක්ස් අංක - 2439576
වෙබ් අඩවිය - www.peoplesbank.lk

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA - Brand Finance Rating

සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම (LECO)

රැකියා ඇබෑර්තු

ශ්‍රී ලංකාවේ බෙදා හැරීමේ උපයෝගිතා සමාගමක් වන සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම ශාඛා හතක් මගින් මීගමුව සිට ගාල්ල දක්වා වෙරළබඩ තීරය ආවරණය කෙරෙන මෙහෙයුම් ප්‍රදේශයක් ලෙස පාරිභෝගික ජනතාව 500,000 කට වැඩි ප්‍රමාණයක් සඳහා සේවය සලසන අතර, කාර්ය මණ්ඩලය 1500 කින් සමන්විත වේ. අප ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. විදුලි ඉංජිනේරු

අධ්‍යාපන සුදුසුකම්	පිළිගත් රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිව් අවුරුදු විදුලි ඉංජිනේරු උපාධිය හිමිකර ගෙන තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) ආශ්‍රිත සාමාජිකයකුවීම හෝ එම ආයතනය විසින් පිළිගත් වෙනත් ඕනෑම සුදුසුකමක් හිමිකරගෙන සිටීම.
වයස	2020.08.31 දිනට අවුරුදු 40ට අඩු විය යුතුය.

02. කාර්මික නිලධාරී 11 ශ්‍රේණිය

අධ්‍යාපනික හා වෘත්තීමය සුදුසුකම්	ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සහිතව අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත්වීම සමග පහත දැක්වෙන එක් සුදුසුකමක් සතුව තිබිය යුතුය. (අ) ජාතික තාක්ෂණවේද ඩිප්ලෝමාව (විදුලිබල) - NDT (ආ) උසස් ඩිතොක ඩිප්ලෝමාව - ඉංජිනේරු (විදුලි) - HNDE (ඇ) ජාතික පාඨමාලාව - ඉංජිනේරු විද්‍යාව (විදුලි ඉංජිනේරු) - NDES (ඈ) තාක්ෂණවේදය පිළිබඳ ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු) - Dip. Tech. (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය) (ඉ) සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් උසස් ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු) - City & Guilds (ප්‍රායෝගික හා සිද්ධාන්ත පූර්ණ සහතිකය)
වෙනත් සුදුසුකම්	පරිගණක සාක්ෂරතාව සහ ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ දැනුම.
වයස	2020.08.31 දිනට අවුරුදු 40ට අඩු විය යුතුය.

03. පරිපාලන නිලධාරී

අධ්‍යාපනික හා වෘත්තීමය සුදුසුකම්	අ.පො.ස. (උ.පෙළ) විෂයයන් 4/3 ක් සමත්වීම. (අදාළ වන පරිදි) සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ (CIPM / NIBM) සඳහා පිළිගත් ආයතනයකින් ලබාගත් ඩිප්ලෝමාවක් **හෝ** උපාධියක් හෝ මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ වෙනත් සමාන ඉහළ සුදුසුකමක්.
පළපුරුද්ද	ලිපිකරු හා සමාන්තර ශ්‍රේණියක වසර 10ක පළපුරුද්ද.
වෙනත් සුදුසුකම්	පරිගණක තාක්ෂණවේදය සමග කම්කරු නීතිය හා කාර්මික සබඳතා පිළිබඳ දැනුම.
වයස	2020.08.31 දිනට අවුරුදු 40ට අඩු විය යුතුය.

04. නිවාඩු නිකේතන භාරකරු

අධ්‍යාපන සුදුසුකම්	දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සිංහල භාෂාව / දෙමළ භාෂාව හා ගණිතය විෂයයන්ද ඇතුළුව විෂයයන් හය (06) කින් සමත්වීම.
පළපුරුද්ද	නිවාඩු නිකේතන භාරකරු තනතුරක වසර 05ක පළපුරුද්දක් තිබීම.
වෙනත් සුදුසුකම්	දේශීය හා විදේශීය ආහාරපාන පිළියෙල කිරීම, අමුත්තන් පිළිගැනීම සහ නිවාඩු නිකේතනයක නඩත්තු කටයුතු පිළිබඳව මනා හැකියාවක් තිබීම.
වයස	2020.08.31 දිනට අවුරුදු 45ට අඩු විය යුතුය.

තෝරාගත් අයදුම්කරුවන්ට ආකර්ෂණීය වැටුප් සමග ආන්තික ප්‍රතිලාභ රැසක් හිමිවේ.

කරුණාකර ඔබගේ විස්තරාත්මක ජීවදත්ත ඇතුළත් අයදුම්පත්, සහතිකවල පිටපත් සමග ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා ඇමතුම් අංක සහිතව, 2020.08.31 වන දින හෝ ඊට පෙර පහත සඳහන් අය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

අයදුම් කරනු ලබන තනතුරු නාමය අදාළ අයදුම්පතෙහි හා කවරයෙහි වම් ඉහළ කෙළවරෙහි සඳහන් කළ යුතුය.

LECO

මානව සම්පත් හා පරිපාලන අංශ ප්‍රධානී
සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම,
3 වන මහල, ඊ.එච්. කුරේ ගොඩනැගිල්ල,
411, ගාලු පාර, කොළඹ 03.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

JICA අරමුදල් සපයනු ලබන නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය

(ණය අංකය : SLP 116)

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය

උඟව පළාත

ලංසු සඳහා ආරාධනයයි - අදියර I

දිනය : **2020.08.19**
ණය ගිවිසුම් අංකය : **SLP116**
IFB අංකය : **SL-P116/UP/RR/2019/01**
IFB අංකය : **SL-P116/UP/RR/2020/02**
IFB අංකය : **SL-P116/UP/AW/2020/01**
IFB අංකය : **SL-P116/UVA/GW-PW/2020/01**

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය වෙතින් නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ පිරිවැය අරභයා ණය මුදලක් ලැබී ඇත. එම මුදලින් කොටසක් බදුල්ල දිස්ත්‍රික්කයේ මීගහකිවුල සහ හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම, ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දකැටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ වාරිමාර්ග පද්ධති වැඩිදියුණු කිරීම සහ ඌව සහ නැගෙනහිර පළාත්වල තෝරාගත් උප ව්‍යාපෘති පෙදෙස්හි භූගත ජලය ඇද ගැනීම සංවර්ධනය කිරීම සඳහා පරීක්ෂා කර බැලීම සහ ක්‍රියාත්මක කොට පෙන්වීම ඇතුළුව ජලය ලබාදෙන ළිං ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තු යටතේ සුදුසු ගෙවීම් සිදු කිරීම සඳහා යොදු ගැනීමට අපේක්ෂා කෙරේ.

02. ජපන් ODA ණය යටතේ ප්‍රසම්පාදනය සඳහා අදළ වන මාර්ගෝපදේශ ප්‍රකාර වූ පරිපාටි මගින් ලංසු මෙහෙයවනු ලබන අතර, ණය ගිවිසුමේ නිර්ණය කොට ඇති යෝග්‍යතාපූර්ණ ප්‍රභව රටවල සියලුම ලංසුකරුවන් සඳහා විවෘතව පවතී.

03. ඌව පළාත් සභාව වෙනුවෙන් පළාත් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් ව්‍යාපෘති සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුදු, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

i. SL-P116/UP/RR/2019/01

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ I වන අදියරේ කොටසක් ලෙස ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් අග්ගලා උල්පත පාර යන තමින් යුත් ප්‍රජා ප්‍රවේශ මාර්ග කි.මී. 3.95 ක් වැඩිදියුණු කිරීම සඳහා වන ඉදිකිරීම් සහ නිමා කිරීම්. පස් කර්මාන්ත, නව මාර්ගයේ උප අඩිතාලම සහ නව කොන්ක්‍රීට් පදික වේදිකාව, පවතින ඇස්ෆෝල්ට් මාර්ගය අලුත්වැඩියා කර මතුපිටින් ඇස්ෆෝල්ට් කොන්ක්‍රීට් යෙදීම, මීමී 600 ක වැරගැන්වූ කොන්ක්‍රීට් පයිප්ප යෙදූ බෝක්කු 02 ක් ප්‍රතිසංස්කරණය කිරීම, නව මී. 3 X මී. 2 ක වැරගැන්වූ කොන්ක්‍රීට් පෙට්ටි බෝක්කුවක්, කොන්ක්‍රීට් හරස් කාණු සහ මී. 20 ක් පමණ දිග කොන්ක්‍රීට් රැඳවුම් බිත්තියක් ප්‍රතිසංස්කරණය කිරීම මෙම කර්මාන්තයේ අඩංගු වේ.

ii. SL-P116/UP/RR/2020/02

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ I වන අදියරේ කොටසක් ලෙස ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවට අයත් අම්ලගම පාර (හල්දමුල්ල - කරතවගම පාරෙන් හැරී) සහ ජන උදනගම (A 4 පාරෙන් හැරී) පාර තමින් වූ ප්‍රජා ප්‍රවේශ මාර්ග කි.මී. 4.13 ක් වැඩිදියුණු කිරීම සඳහා වන ඉදිකිරීම් හා නිමාකිරීම්. පස් කර්මාන්ත, නව මාර්ගයේ උප අඩිතාලම සහ නව කොන්ක්‍රීට් පදික වේදිකාව අම්ලගම පාරේ මීමී 600 ක වැරගැන්වූ කොන්ක්‍රීට් පයිප්ප බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම, මීමී 600 වැරගැන්වූ කොන්ක්‍රීට් පයිප්ප බෝක්කු 09 ක් ප්‍රතිසංස්කරණය කිරීම, මී 1 X මී 1 ක වැරගැන්වූ කොන්ක්‍රීට් පෙට්ටි බෝක්කු 02 ක් ප්‍රතිසංස්කරණය කිරීම, මීමී 900 ක වැරගැන්වූ කොන්ක්‍රීට් පයිප්ප බෝක්කුවක් අලුතින් ඉදිකිරීම සහ මීමී 600 ක වැරගැන්වූ කොන්ක්‍රීට් පයිප්ප බෝක්කු 03 ක් පළල් කිරීම, ජන උදගම පාරේ බෝක්කු 04 ක් ප්‍රතිසංස්කරණය කිරීම, නව බෝක්කු 02 ක් සහ කොන්ක්‍රීට් හරස් කාණු ඉදිකිරීම මෙම කර්මාන්තයේ අඩංගු වේ. තවද මී. 20 ක් පමණ දිග කොන්ක්‍රීට් රැඳවුම් බිත්තියක්ද ඉදිකළ යුතුය.

iii. SL-P116/UP/AW/2020/01

කන්දකැටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇටන්වෙල, බෝපිටිය, පල්ලේවෙල, බංජනපිටිය ග්‍රාමයන්හි වාරිමාර්ග පද්ධති වැඩිදියුණු කිරීම සඳහා වන ඉදිකිරීම් හා නිමා කිරීම්. ඇටන් වෙල වැව, බංජනපිටිය අමුණ සහ ඇළමාර්ගය සහ මහන්තේවෙල අමුණ පුනරුත්ථාපනය කිරීම මෙම කර්මාන්තයේ අඩංගු වේ. තවද, වැව් කණ්ඩිය වැඩිදියුණු කිරීම, කොන්ක්‍රීට් රේඛිය ඇළ මාර්ග, සොරොව්, අමුණු සහ පද්ධතියේ අනෙකුත් ආශ්‍රිත වාරිමාර්ග ව්‍යුහයන් ඉදිකිරීම ද මෙයට ඇතුළත් වේ.

iv. SL-P116/UVA/GW-PW/2020/01

පරීක්ෂණ ළිං ඇතුළු ජලය ලබාදෙන ළි ඉදිකිරීම, ආරක්ෂිත ජල අස්වැන්න විශ්ලේෂණ සහිතව ජල ප්‍රභවයන් තහවුරු කිරීම, භූමි පිහිටීමට සුදුසුවන පරිදි අවශ්‍ය පෙරහන කට්ටලය ඇතුළු ළිං ආවරණය සවි කිරීම. මෙය, ඌව සහ නැගෙනහිර පළාත්වල තෝරාගත් උප ව්‍යාපෘති පෙදෙස් හි භූගත ජලය ඇද ගැනීම සංවර්ධනය කිරීම සඳහා වේ. ලංසු ක්‍රියාවලියට ප්‍රවේශ වීම සඳහා ලංසුකරු පහත සඳහන් නිර්ණායකයන් සපුරා තිබිය යුතුය.

ඉහත කර්මාන්ත සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය සලකා බැලීම සඳහා ලංසු ලිපිලේඛනයේ පෙන්වා ඇති සපුරාලිය යුතු නිර්ණායකයන් පහත වගුගත කොට ඇත.

අනු අංකය	පැකේජ අංකය	ආපසු ගෙවනු නොලබන ගාස්තුව	ලංසු ඇපකරය	CIDA ලියාපදිංචිය	මූල්‍ය තත්ත්වය	මූල්‍ය සම්පත්	ඉදිකිරීම් පළපුරුද්ද
I	SL-P116/UP/RR/2019/01	ලංකා රු. 12,500	ලංකා රු. මිලියන 1.0 ක් එය ලංසු විවෘත කරනු ලබන දිනයේ සිට දින 118 ක් වලංගු විය යුතුය.	මහාමාර්ග ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සී 4 අවම CIDA ශ්‍රේණිය සහ ශ්‍රී ලංකාවේ සමාගම් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයේ පිටපතක් හෝ වලංගු ව්‍යාපාර ලියාපදිංචි සහතිකය සහ PCA 3 ආකෘතිය.	පසුගිය වසර 10 තුළ වැඩිම වාර්ෂික පිරිවැටුම සහිත වසර 3 ක වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුමේ අවම සාමාන්‍යය ලංකා රු. මිලියන 95 ක් විය යුතුය.	දුවශීලවත්කම් හෝ ණය පහසුකම් වල අවම වටිනාකම ලංකා රු. මිලියන 22 ක් විය යුතුය.	පසුගිය වසර 10 තුළ සමාන ස්වභාවයේ අවම වශයෙන් කොන්ත්‍රාත් 02 ක් (එක් එක් කොන්ත්‍රාත් වටිනාකම අවම වශයෙන් මිලියන 30) සාර්ථකව නිමා කොට තිබිය යුතුය.
II	SL-P116/UP/RR/2020/02	ලංකා රු. 20,000	ලංකා රු. මිලියන 2.7 ක් එය ලංසු විවෘත කරනු ලබන දිනයේ සිට දින 118 ක් වලංගු විය යුතුය.	මහාමාර්ග ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සී 4 අවම CIDA ශ්‍රේණිය සහ ශ්‍රී ලංකාවේ සමාගම් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයේ පිටපතක් හෝ වලංගු ව්‍යාපාර ලියාපදිංචි සහතිකය සහ PCA 3 ආකෘතිය	පසුගිය වසර 10 තුළ වැඩිම වාර්ෂික පිරිවැටුම සහිත වසර 3 ක වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුමේ අවම සාමාන්‍යය ලංකා රු. මිලියන 200 ක් විය යුතුය.	දුවශීලවත්කම් හෝ ණය පහසුකම් වල අවම වටිනාකම ලංකා රු. මිලියන 45 ක් විය යුතුය.	පසුගිය වසර 10 තුළ සමාන ස්වභාවයේ අවම වශයෙන් කොන්ත්‍රාත් 02 ක් (එක් එක් කොන්ත්‍රාත් වටිනාකම අවම වශයෙන් මිලියන 65) සාර්ථකව නිමා කොට තිබිය යුතුය.
III	SL-P116/UP/AW/2020/01	ලංකා රු. 10,000	ලංකා රු. 600,000.00 එය ලංසු විවෘත කරනු ලබන දිනයේ සිට දින 118 ක් වලංගු විය යුතුය.	වාරිමාර්ග සහ ජලාපවහන ඇළමාර්ග ක්ෂේත්‍රයේ සී 5 අවම CIDA ශ්‍රේණිය සහ ශ්‍රී ලංකාවේ සමාගම් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයේ පිටපතක් හෝ වලංගු ලියාපදිංචි සහතිකය සහ PCA 3 ආකෘතිය	පසුගිය වසර 10 තුළ වැඩිම වාර්ෂික පිරිවැටුම සහිත වසර 3 ක වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුමේ අවම සාමාන්‍යය ලංකා රු. මිලියන 50 ක් විය යුතුය	දුවශීලවත්කම් හෝ ණය පහසුකම් වල අවම වටිනාකම ලංකා රු. මිලියන 10 ක් විය යුතුය.	පසුගිය වසර 10 තුළ සමාන ස්වභාවයේ අවම වශයෙන් කොන්ත්‍රාත් 02 ක් (එක් එක් කොන්ත්‍රාත් වටිනාකම අවම වශයෙන් මිලියන 17) සාර්ථකව නිමා කොට තිබිය යුතුය.
IV	SL-P116/UVA/GW/PW/2020/01	ලංකා රු. 4,000.00	ලංකා රු. 300,000.00 එය ලංසු විවෘත කරනු ලබන දිනයේ සිට දින 118 ක් වලංගු විය යුතුය.	ශ්‍රී ලංකාවේ ජල සම්පත් මණ්ඩලය විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයේ පිටපත සහ සමාගම් ලියාපදිංචි සහතිකය සහ PCA 3 ආකෘතිය. (මෙම ලංසුව සඳහා 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් සමග ලියාපදිංචි වී සිටීම)	පසුගිය වසර 10 තුළ වැඩිම වාර්ෂික පිරිවැටුම සහිත වසර 3 ක වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුමේ අවම සාමාන්‍යය ලංකා රු. මිලියන 10 ක් විය යුතුය	දුවශීලවත්කම් හෝ ණය පහසුකම් වල අවම වටිනාකම ලංකා රු. මිලියන 3 ක් විය යුතුය.	2010 වර්ෂයේ ජනවාරි මාසය පටන් පසුගිය වසර 10 තුළ අවම වශයෙන් සමාන වර්ගයේ කොන්ත්‍රාත් දෙකක් සාර්ථකව නිමා කොට තිබීම. (ලිඛිත සාක්ෂි අමුණා තිබිය යුතුය)

වගුව - (1)

04. මේ සඳහා උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වැඩිදුර තොරතුරු බදුල්ල, බණ්ඩාරනායක මාවත, අංක 37/2, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ පළාත් ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඌව පළාත් - RIDEP) කාර්යාලයෙන් ලබාගත හැකි අතර, එම කාර්යාලයේදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය. දුරකථනය : 055 - 2232490, ඊමේල් - ridepuva@gmail.com

05. වගුව (1) හි ඉහත 03 වන කොටසේ සඳහන් කොට ඇති ආපසු ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව ඉහත ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.

ගෙවීම් මුදලින් සිදුකළ යුතුය. ලංසු ලිපිලේඛන 2020 අගෝස්තු 19 වෙනි දින සිට 2020 සැප්තැම්බර් 08 වෙනි දින දක්වා සාමාන්‍ය රාජකාරී දිනයන්හි පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර ඉහත සඳහන් ලිපිනය වෙතින් ලබාගත හැකිය.

06. ලංසුකරුවන් සඳහා වන උපදෙස්වල සහ කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසිවල විධිවිධාන, කුඩා කර්මාන්තවල ප්‍රසම්පාදනය සඳහා වන ජපන් ODA ණය යටතේ ඇති සම්මත ලංසු ලිපිලේඛනවල විධිවිධාන වේ.

07. මුදු, තබන ලද, මුල් පිටපත සහ අනු පිටපත වෙන් වෙන් වශයෙන් කවරවල බහා "මුල් පිටපත" සහ "අනු පිටපත" ලෙස සඳහන් කර එම කවර දෙක නැවත මුදු, තබන ලද තනි කවරයක බහා එහි වම් පස ඉහළ කෙළවරේ "..... පැකේජ අංකය සඳහා ලංසුව (ඉහත වගුවේ සඳහන් පරිදි)" සඳහන් කර 2020 සැප්තැම්බර් 09 වෙනි දින ප.ව. 1.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි "පළාත් ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඌව පළාත් - RIDEP), ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය, අංක 37/2, බණ්ඩාරනායක මාවත, බදුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ ඉහත සඳහන් ස්ථානයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හැකි අතර, ඉහත වගුවේ (1) 03 වන කොටසේ සඳහන් ආකාරයේ ලංසු ඇපකරයක් ලංසු සමග අමුණා එවිය යුතුය. එම ලංසු ඇපකරය, ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වූ සහ බලය පවරනලද බැංකුවක් විසින් නිකුත් කරන ලද කොන්දේසි රහිත සුරක්ෂණයක් විය යුතුය.

08. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ශ්‍රී ලංකාව, බදුල්ල, රජ වීදියේ ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ.

09. පූර්ව ලංසු රැස්වීම් සැප්තැම්බර් 03 වෙනි දින බදුල්ල, බණ්ඩාරනායක මාවතේ අංක 37/2 හි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ පළාත් ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඌව පළාත් RIDEP) කාර්යාලයේ සම්මන්ත්‍රණ කාමරයේදී පහත සඳහන් පරිදි පැවැත්වේ.

IFB අංකය : SL-P116/UP/RR/2019/01 - 09.30 පැය
IFB අංකය : SL-P116/UP/RR/2020/02 - 09.30 පැය
IFB අංකය : SL-P116/UP/AW/2020/01 - 11.30 පැය
IFB අංකය : SL-P116/UVA/GW-PW/2020/01 - 13.00 පැය

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
ඌව පළාත් සභාව,
රජ වීදිය, බදුල්ල.

ඊමේල් : chiefsecuva@gmail.com / ridepuva@gmail.com
දුරකථනය : 055-2232490
ෆැක්ස් : 055-2232490
දිනය : 2020/08/19

සී/ස ස්වාධීන රූපවාහිනී සේවය

පාවිච්චි කරන ලද ඉසුසු ඩබල් කැබ් රථය (ලියාපදිංචි අංක : 253-5334) විකිණීම සඳහා මිල ගණන් කැඳවීම

ටෙන්ඩර් අංකය ITN/Q/93/2019

සී/ස ස්වාධීන රූපවාහිනී සේවය විසින් පාවිච්චි කරන ලද ඉසුසු ඩබල් කැබ් රථය (ලියාපදිංචි අංක : 253-5334) විකිණීම සඳහා මුදු, තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

01. වාහන වර්ගය - ඉසුසු ඩබල් කැබ්
02. ලියාපදිංචි අංකය - 253 -5334
03. නිෂ්පාදිත වර්ෂය - 1999
04. එන්ජින් ධරිතාව - 2499 CC

බත්තරමුල්ල වික්‍රමසිංහපුර සී/ස ස්වාධීන රූපවාහිනී සේවයේ ප්‍රධාන කාර්යාලයීය පරිශ්‍රයේදී ඉහත වාහනය **2020 සැප්තැම්බර් මස 02 දින** දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පරීක්ෂා කර බැලිය හැකිය.

අදළ මිල කැඳවුම්පත් රු. 1,080.00 (8% වැට් බදු සමග) ක ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් හා රු. 5,000.00 ක ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුවක් බත්තරමුල්ල, වික්‍රමසිංහපුර පිහිටි සී/ස ස්වාධීන රූපවාහිනී සේවයේ කළමනාකරු (සැපයුම්) වෙතට මුදලින් ගෙවීමෙන් ලබා ගත හැක. එසේ ලබා ගත් මිල කැඳවුම්පත් මගින් පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර, මිල කැඳවුම්පත් **2020 සැප්තැම්බර් මස 02** වෙනි දින දක්වා සතියේ සාමාන්‍ය වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලබා ගත හැක.

මිල ගණන් භාර ගැනීම අවසන් වන **2020 සැප්තැම්බර් මස 03** දින ප.ව. 2.00 ට පෙර මුදු, තබන ලද මිල ගණන් සභාපති, ප්‍රසම්පාදන කමිටුව, සී/ස ස්වාධීන රූපවාහිනී සේවය, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම ලිපිනයෙහි පිහිටි ඉදිරි ආරක්ෂක අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම කළ යුතු අතර, මිල කැඳවුම්පත් බහා එවන ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරෙහි **"මිල කැඳවුම් අංක අයිටීඑන් /ක්‍යූ/93/2019"** යනුවෙන් සඳහන් කළ යුතුය.

2020 සැප්තැම්බර් මස 03 දින ප.ව. 2.30 ට ඉහත ලිපිනයෙහි පිහිටි ඉංජිනේරු අංශ කාර්යාලයේදී මිල ගණන් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගි විය හැක. එදින එම වේලාවෙන් පසු යොමු කරනු ලබන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මේ පිළිබඳ පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-2774424 මගින් ප්‍රවාහන නිලධාරිගෙන් හෝ දුරකථන අංක 011-2775493 මගින් කළමනාකරු (සැපයුම්) වෙතින් විමසිය හැක.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
සී/ස ස්වාධීන රූපවාහිනී සේවය,
වික්‍රමසිංහපුර,
බත්තරමුල්ල.

දකුණු පළාත් සභාව

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා සුදුසුකම්ලත් ගරාජ ලියාපදිංචි කිරීම - 2021 වර්ෂය

දකුණු පළාත තුළ ලියාපදිංචි කර ඇති වෙළඳ වාහන සඳහා 2021 වසරට යෝග්‍යතා සහතික නිකුත් කිරීම පිණිස ව්‍යාපාරයක් වශයෙන් ලියාපදිංචි වී ඇති ගරාජ හිමියන්ගෙන් හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝවලින් අයදුම්පත් කැඳවනු ලැබේ.

(01) අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) **මූලික සුදුසුකම්**
(අ) ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය
(ආ) බදු ගෙවීම් පිළිබඳ සහතිකය

(ii) **භෞතික පහසුකම්**
(අ) අවම වශයෙන් අඩි 20 ක් දිග, අඩි 2 ½ ක් පළල සහ අඩි 4 ½ ක් ගැඹුරුති වාහන පරීක්ෂා කිරීමේ වළක් හෝ සමාන පහසුකම් සැපයෙන වේදිකාවක් හෝ ඔසවනයක් තිබීම. (එම ස්ථානයට වාහන පහසුවෙන් රැගෙන ඒමේ හැකියාව හා පරීක්ෂාව සඳහා ප්‍රමාණවත් ආලෝකය තිබිය යුතුය.)
(ආ) තිරිංග පරීක්ෂා කිරීමේ උපකරණ
(ඇ) ප්‍රධාන ලාම්පු මැනුම් උපකරණ (නාහිගත කිරීම)
(ඈ) වාහනයේ යට කොටස, සුක්කානම් සන්ධි, තිරිංග කේබල් ආදිය සහ දිරාගිය කොටස් පරීක්ෂා කිරීමට උපයෝගී කරගනු ලබන උපකරණ සහ අනෙකුත් යාන්ත්‍රික මෙවලම්.

(iii) **සහතික කිරීමේ නිලධාරියා පහත දක්වෙන අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.**
(අ) ජාතික තාක්ෂණ ඉංජිනේරු ඩිප්ලෝමා (යාන්ත්‍රික) (NDT) සහතිකය සහ මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ වසර 03 ක පළපුරුද්ද **හෝ**
(ආ) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (යාන්ත්‍රික) (HNDE) සහතිකය සහ මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ වසර 03 ක පළපුරුද්ද **හෝ**
(ඇ) ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (යාන්ත්‍රික) (NDES) සහතිකය සහ මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ වසර 03 ක පළපුරුද්ද **හෝ**
(ඈ) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ මෝටර් කාර්මික ශිල්පය පිළිබඳ සිවි (04) අවුරුදු (පූර්ණකාලීන) පාඨමාලා සහතිකය සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ වසර 07 ක පළපුද්ද **හෝ**
(ඉ) ඉහත සුදුසුකම්වලට අනුරූප NVQ LevelV වන මට්ටමේ යාන්ත්‍රික ඩිප්ලෝමා පාඨමාලාවක් සමඟ මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ වසර 5 ක පළපුරුද්ද **හෝ**
(ඊ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ IV ශ්‍රේණියේ ඩිපෝ ඉංජිනේරුවෙකු වශයෙන් වසර 10 ක පළපුරුද්ද **හෝ**
(උ) ඉහත සුදුසුකම්වලට අනුරූපව විදේශ පාඨමාලාවන් සමඟ මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ වසර 5 ක පළපුරුද්ද

(iv) සහතික කිරීමේ නිලධාරියා සතුව වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.

(v) යෝග්‍යතා සහතික අත්සත් කිරීම සඳහා එක් නිලධාරියෙකුට බලය ලබා දෙන්නේ උපරිම එක් ආයතනයකට පමණි.

(vi) රජයේ හෝ රජයට අනුබද්ධිත සංස්ථාවක / සමාගමක / මණ්ඩලයක හෝ වෙනත් පුද්ගලික ආයතනයක පූර්ණකාලීනව සේවයේ නියුතු අයවලුන් පුද්ගලික අංශයේ ගරාජයන්වල සහතික කිරීමේ නිලධාරීන් ලෙස සේවයේ යෙදවිය නොහැක.

(vii) ඉහත සුදුසුකම් වලට අමතරව සහතික කිරීමේ නිලධාරියා මෙම කටයුතුවලට අදළව උසාවියෙන් වැරදිකරුවෙකු නොවූ අයෙකු විය යුතු අතර, අවුරුදු 60 නොඉක්ම වූ අයෙකු විය යුතුය. අවුරුදු 60 ඉක්ම වූ අයෙකු නම් ඔහු මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුතු බවට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

සැ.යු. :-

විශේෂ කොන්දේසිය

- ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන නව අයදුම්කරුවන් ඉහත සුදුසුකම් සපුරා තිබීම අනිවාර්ය වේ.
- යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා දැනටමත් ලියාපදිංචි වී ඇති, ඉහත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සඳහා පෙර වර්ෂවල සලකා බලනු ලැබූ සුදුසුකම් තවදුරටත් අදළ වේ. එහෙත් ඉදිරි වර්ෂ 01 ඇතුළතදී යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් ඉහත සුදුසුකම් සපුරාගත යුතුය.

(02) අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

(අ) ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක්
(ආ) සහතික කිරීමේ නිලධාරියාගේ සුදුසුකම් දැක්වෙන සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් (පෙර වර්ෂවල ඉදිරිපත් කරනු ලැබූ ඡායා පිටපත් සලකා බලනු නොලැබේ.)
(ඇ) රු.1000.00 ක ආපසු නොගෙවන තැන්පත් මුදලක් මෙම කාර්යාලයට ගෙවා ලබාගන්නා මුදල් භාරගැනීමේ කුවිතාන්සිය
(ඈ) පරීක්ෂණ මණ්ඩලයට ළඟා විය හැකි පරිදි ගරාජය පිහිටා ඇති ස්ථානය නිශ්චිතව පෙන්නුම් කරන නගර මධ්‍යයේ සිට ඊට ළඟා විය හැකි මාර්ගය දැක්වෙන දළ සිතියමක් (මාර්ග විස්තරය කෙටියෙන්)
(ඉ) යෝග්‍යතා සහතික නිකුත් කිරීමේ කටයුතු සම්බන්ධයෙන් උසාවියෙන් වරදකරුවෙකු නොවූ බවට දිවුරුම් ප්‍රකාශය
(ඊ) අවුරුදු 60 ඉක්ම වූ අයෙකු නම් මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුතු බවට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකය

අදළ අයදුම්පත් සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා මෙම කාර්යාලයෙන් ලබා ගත හැකිය. අයදුම්පත සඳහා රු.1000.00 ක ආපසු නොගෙවන මුදලක් තැන්පත් කළ යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවර **"යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා ගරාජ ලියාපදිංචි කිරීම - 2021"** යනුවෙන් සඳහන් කර පහත ලිපිනයට 2020 සැප්තැම්බර් මස 15වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ආර්. යූ. අයි.දිසානායක, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්,
දකුණු පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව,
අංක 15 ඒ, පහළ ඩික්සන් පාර, ගාල්ල.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය
මාර්ග සංවර්ධන අධිකාරිය

ලංසු කැඳවීම (IFB)

1. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් **ගම්පහ දිස්ත්‍රික්කයේ** පහත දැක්වෙන **විශාපෘති සඳහා** සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රාතබන ලද ලංසු කැඳවනු ලැබේ.

කොන්ත්‍රාත් අංකය	කොන්ත්‍රාත්තුවේ නම	ඉංජිනේරු ඇස්තමේන්තුව (තක්සේරුකර ගොනුමල) / රු. මිලියන	ලංසු ආරක්ෂණය රු. මිලියන	කාලය (කැලැන්ඩර දින)	CIDA ශ්‍රේණිය හා ක්ෂේත්‍රය
RDA/DC/WP/GOSL/2020/16	ඉඹුල්ගොඩ - වැලිවේරිය මාර්ගය (කි.මී.0+100-3+000) පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම. - B 161	143.9	1.7	365	C3 හෝ ඊට ඉහළ ශ්‍රේණි - මහාමාර්ග
RDA/DC/WP/GOSL/2020/17	ඉඹුල්ගොඩ - වැලිවේරිය මාර්ගය (කි.මී.3+000 - 4+420) පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම. - B 161	110.3	1.3	365	C4 හෝ ඊට ඉහළ ශ්‍රේණි - මහාමාර්ග

2. වැඩබිම් නිශ්කාශනය, බිම් වැඩ, උප පාදම, පාදම් සහ මාර්ග උරහිස්,තාර ඇතිරීම, බෝක්කු සහ කාණු ඉදිකිරීම මෙම වැඩ සටහනට අයත් වේ.
3. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසුකරණ පරිපාටියට අනුව සිදුකරනු ලැබේ.
4. කොන්ත්‍රාත්තුව සඳහා සුදුසුකම් ලැබීමට, ලංසුකරුවන් එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා ඉහත වගුවේ දක්වා ඇති CIDA ශ්‍රේණියන්හි, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර තිබිය යුතුයි.
5. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ව්‍යාපෘති අධ්‍යක්ෂ (බස්නාහිර පළාත), මාර්ග සංවර්ධන අධිකාරිය, 1 වන මහල, "සෙත්සිරිපාය", බත්තරමුල්ල (දුරකථන : 011 - 2876800 සහ ෆැක්ස් : 011 - 2877226) මගින් වැඩිදුර තොරතුරු ලබාගැනීම සහ පහත සඳහන් කාර්යාලය මගින් කාර්යාල වේලාව තුළ දී සිදු ගාස්තුවකින් තොරව ලංසු ලේඛන පරීක්ෂා කළ හැකිය.

   අධ්‍යක්ෂ (ඉදිකිරීම්)
   මාර්ග සංවර්ධන අධිකාරිය
   3 වන මහල, "මහනැගුම මහමැඳුර"
   ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
   දුරකථන : 011 - 2864388 ෆැක්ස් : 011 - 2861821
6. පූර්ව ලංසු රැස්වීම **2020.08.27** වන දින **10.00 පැයට** ව්‍යාපෘති අධ්‍යක්ෂ (බස්නාහිර පළාත), මාර්ග සංවර්ධන අධිකාරිය, පළමුවන මහල, "සෙත්සිරිපාය", බත්තරමුල්ල යන කාර්යාලය තුළදී පැවැත්වීමෙන් අනතුරුව වැඩබිම් පරීක්ෂාව සිදුකෙරේ.
7. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් **2020.08.19** වන දින සිට **2020.09.08** වන දින දක්වා **9.00** පැයේ සිට **15.00** පැය දක්වා කාලය තුළ **රු.20,000 ක (වැට් බදු රහිත)** ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් සමග ලිඛිත අයදුම්පතක් බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 216 දරන ස්ථානයේ, "මහනැගුම මහ මැඳුරේ", 03 වන මහලේ පිහිටි අධ්‍යක්ෂ (ඉදිකිරීම්) වෙත ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත සම්පූර්ණ ලංසු අයදුම්පත් කට්ටලයක් ලබාගත හැක. 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ශේෂ පත්වන නියෝජිතයන් සහ ලංසුකරුවන් පමණක් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු ය.
8. සෑම ලංසුවක්ම **2021.01.05** වන දින දක්වා ලංසු ආරක්ෂණයකින් වලංගු විය යුතුය.
9. සම්පූර්ණ කළ ලංසු පිටපත් දෙකකින් යුක්තව **2020.09.09** වන දින **14.00** පැයට හෝ ඊට පෙර සභාපති, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව, අධ්‍යක්ෂ ජෙනරාල් බාරේ, මාර්ග සංවර්ධන අධිකාරිය, පළමුවන මහල, "මහනැගුම මහමැඳුර" අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට භෙතවීස් භාරදිය යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ විගස ලංසුකරුවන් හෝ ඔවුන් විසින් තෝරා එවූ නියෝජිතයන් ඉදිරියේ එකී ලංසු විවෘත කරනු ලැබේ.
10. සෑම ලංසුවක්ම **2020.12.09** වන දින දක්වා වලංගු විය යුතු ය.

සභාපති
මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව
මාර්ග සංවර්ධන අධිකාරිය
01 වන මහල, "මහනැගුම මහමැඳුර"
අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල

වැවිලි අමාත්‍යාංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2021 ජනවාරි මස සිට මාර්තු මස දක්වා වෙළඳ සල්පිල් සහභාගිත්වය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ (SLTB) **"50% වෙළඳ සල්පිල් සහනාධාර යෝජනා ක්‍රමය"** යටතේ 2021 පළමුවන කාර්තුවේ ජාත්‍යන්තර වෙළඳ සල්පිල්වලට සහභාගි වීම පිණිස ලියාපදිංචි ශ්‍රී ලංකා තේ අපනයන සමාගම් වලින් අයදුම් පත් කැඳවනු ලැබේ. **"සිංහ ලාංඡනය"** සහතිකය සහ සනාථ කළ පසුගිය සාධන වාර්තා සහිත අපනයන සමාගම් මෙම යෝජනා ක්‍රමය යටතේ අයදුම් කිරීමට සුදුසුකම් ලබයි. අපනයන සමාගම් තෝරා ගැනීම පිළිබඳ අවසාන තීරණය ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පත්කරනු ලබන සාමාජික මණ්ඩලය මගින් සුවිශේෂී ආකාරයෙන් සිදු කෙරෙනු ඇත.

"50% වෙළඳ සල්පිල් සහනාධාර යෝජනා ක්‍රමය" යටතේ වියදම්වලට ප්‍රදර්ශන ඉඩකඩ, ඉදිකිරීම් පිරිවැය සහ මූලික උපකරණ පිරිවැය ඇතුළත් වේ. ඉතිරි වියදම් තෝරා ගනු ලබන සහභාගිවන්නන් විසින් දැරිය යුතුය. තෝරාගනු ලබන තේ අපනයන සමාගම්වලට ඔවුන්ගේ පරිමාව මත පදනම්ව පහත සඳහන් පරිදි යෝජනා ක්‍රමය මගින් පහසුකම් සලසනු ඇත.

අපනයනකරුගේ තරාතිරම	යෝජනා ක්‍රමය යටතේ හිමිකම්
සියලුම අපනයනකරුවන් (මහා / මධ්‍යම / කුඩා පරිමාණ)	ඉඩකඩ අවකාශය සහ කුටිය ඉදිකිරීමේ සම්පූර්ණ පිරිවැයෙන් 50% ක්
කුඩා පරිමාණ	SLTB කුටිය යාබදව තොරතුරු කවුළුව සහ වෙනත් මූලික පහසුකම් නොමිලේ සපයනු ඇත.

අපනයනකරුගේ පරිමාණය

මහා පරිමාණය : 2019 වසර තුළ වාර්ෂිකව තේ කිලෝ මිලියනයකට වැඩි ප්‍රමාණයක් අපනයනය කර තිබීම.
මධ්‍යම පරිමාණය : 2019 වසර තුළ වාර්ෂිකව තේ කිලෝ 500,000 මිලියන 1 අතර ප්‍රමාණයක් අපනයනය කර තිබීම.
කුඩා පරිමාණය : 2019 වසර තුළ වාර්ෂික තේ කිලෝ 500,000 කට අඩු ප්‍රමාණයක් අපනයනය කර තිබීම.

වෙළඳ සල්පිල් ලැයිස්තුව - 2021 (1 වන කාර්තුව)

අනු අංකය	සල්පිලේ නාමය	රට	සල්පිල දිනය	අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය
01	ප්‍රොඩෙක්ස්පො මොස්කව් 2021	රුසියාව	2021 පෙබරවාරි 8-12	2020 ඔක්තෝබර් 15
02	ගල්ෆුඩ් - ඩුබායි 2021	එක්සත් අරාබි එමීර් රාජ්‍යය	2021 පෙබරවාරි 21 - 25	2020 සැප්තැම්බර් 15
03	ෆුඩෙක්ස් ටෝකියෝ 2021	ජපානය	2021 මාර්තු 9-12	2020 ඔක්තෝබර් 30

ප්‍රදර්ශනයන් පිළිබඳ විස්තර හා අයදුම්පත ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ (SLTB) වෙබ් අඩවිය www.srilankateaboard.com මගින් ලබාගත හැකිය. යථා පරිදි සම්පූර්ණ කළ අයදුම්පත, අදාළ ඉසව් සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර **අධ්‍යක්ෂ (ප්‍රවර්ධන), ශ්‍රී ලංකා තේ මණ්ඩලය, 574, ගාලු පාර, කොළඹ 03.**

විද්‍යුත් තැපැල : promotion@pureceylontea.com වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

අධ්‍යක්ෂ (ප්‍රවර්ධන),
ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
නො. 574, ගාලු පාර, කොළඹ - 03.
දුරකථනය : 0112587814, ෆැක්ස් : 0112587341
වෙබ් අඩවිය : www.srilankateaboard.com
විද්‍යුත් තැපැල : promotion@pureceylontea.com

බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා රේන්ද විකිණීම - 2021

බලංගොඩ අංක 01 රා තැබෑරුම

ඉහත සඳහන් රා තැබෑරුමේ රා රේන්ද විකිණීම 2020.09.14 වන සඳුද පෙ.ව. 10.30 ට බලංගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේදී ටෙන්ඩර් මගින් විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමි.

වැඩි විස්තර සඳහා 2020 අගෝස්තු මස 7 වන දින අංක 2188 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය බලනු මැනවි.

එච්. එම්. එච්. බණ්ඩාර
ප්‍රාදේශීය ලේකම්,
බලංගොඩ.

2020 අගෝස්තු මස 12 වන දින
බලංගොඩ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේදී.

ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ, කවුඩුපැලැල්ල, වල්ලිවෙල දරණ ස්ථානයේ පදිංචි **හේරත් මුදියන්සේලාගේ සිරිල් අබේසිංහ** (ජා.හැ. අංකය 671601248 V) වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාවට මෙසේ ප්‍රකාශ කර සිටිමි. මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් රාජත් ප්‍රදීප්ලු මහතා විසින් ලියා සහතික කරන ලද අංක 2024 හා 2018/04/25 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් පත් කළ මාගේ ඇටෝර්නි බලකරු මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ, පලාපත්වල, රෝස් හවුස් අංක 467/47 දරණ ස්ථානයේ පදිංචි **සංකරසිංහලේ ප්‍රසාද්** ජා.හැ. **අංකය 158268000119V**) යන අයට ලබා දී තිබූ විශේෂ ඇටෝර්නි බලපත්‍රය හා ඇටෝර්නි බලය අද දින සිට අවලංගු කරන ලද බවයි.

හේරත් මුදියන්සේලාගේ සිරිල් අබේසිංහ
2020/07/25

ඩෙස්මෝ (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය PV 102542
2007 අංක 07 දරන සමාගම් පනතේ පරිවාස කිරීමේ නියෝගය සහ සංයිය ආවරකරුවන් පත්වීමේ දැන්වීම

සමාගමේ නම		ඩෙස්මෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය	:	අසෝකාරාම පාර, කුන්දෙනිය, දික්වැල්ල
උසාවිය	:	බස්නාහිර පලාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවල්)
නඩු අංකය	:	HC (CIVIL) 74/2019/CO
නියෝගය දුන් දිනය	:	2020 ජනවාරි 29
පෙත්සම ඉදිරිපත් කල දිනය	:	2019 සැප්තැම්බර් 25
සංයිය ආවරකරුවන්ගේ නම	:	පිංගබදගේ එක්සිට් අරුණ ජයවිකුම සහ පෙරාඩි ඊවානස්ගේ ඔෙවිඩ්
ලිපිනය	:	සංයිය ආවරකරුවෝ 3 වන මහල, නො 11, කාසල් පටුමග, කොළඹ 04
පත්වීමේ දිනය	:	2020 ජනවාරි 29

දිස්ත්‍රික් මහ රෝහල පොළොන්නරුව

ලංසු ආරාධනය සංශෝධනය කිරීම

(ජාතික තරගකාරී ලංසු කැඳවීම)

පොළොන්නරුව දිස්ත්‍රික් මහ රෝහලේ හෙද නේවාසිකාගාරය සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ මිලදී ගැනීම, ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියාවන්, Prosthetist & Orthotist (සෘජු කරණ හා අංගාදේශක) ඒකකය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම, කසළ මලු සැපයීම හා ආපනශාලා පවත්වාගෙන යාම 2020 – 2021 ට අදාළ සැපයුම්කරුවන් /කොන්ත්‍රාත්කරුවන් පත් කර ගැනීමට අදාළ ප්‍රසම්පාදන දැන්වීම.

I. 2020.08.07 දින, දිනමිණ, ඩේලි නිවුස් හා තිනකරන් පුවත් පත්වල පළ කරන ලද උක්ත ප්‍රසම්පාදන දැන්වීම හා බැඳේ.
II. එම ප්‍රසම්පාදන දැන්වීම පහත පරිදි සංශෝධනය කෙරේ.

01. කාන්තා හෙද නේවාසිකාගාරය සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ මිලදී ගැනීම

අංකය	ප්‍රසම්පාදනයේ නම	ප්‍රමාණය	ලොට් අංක	ලිපි ගොනු අංකය	ලංසු සුරැකුම් ගාස්තුව
I	ලී අල්මාරි	40	01	DGHP/ACC/F8/08-01/2020	65,000.00
II	කණ්ණාඩි මේස	20			
III	ලී කෑම මේස	06	02	DGHP/ACC/F8/08-02/2020	12,000.00
IV	කෑම මේස පුටු	80			

02. ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියා

අංකය	කොන්ත්‍රාත්තුවේ / කාර්යයේ නම	ලිපි ගොනු අංකය	ලංසු සුරැකුම් ගාස්තුව (රුපියල්)	ICTAD ශ්‍රේණිය
I	නව වෛද්‍ය වාට්ටු සංකීර්ණය (බී) සිට ප්‍රධාන ඖෂධ ගබඩාව දක්වා කොරිඩෝව සකස් කිරීම	DGHP/ACC/F8/20 – 05 / 2020	190,600.00	C7 සහ C 6 පමණි
II	බාහිර රෝගී දන්ත සායනය හා මෘත ශරීරාගාරය අතර රථ ගාල පුළුල් කිරීම	DGHP/ACC/F8/20 – 06 /2020	110,550.00	C7 සහ C 6 පමණි

03. Prosthetist & Orthotist (සෘජු කරණ හා අංගාදේශක) ඒකකය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම

අනු අංකය	අයිතමය	ප්‍රමාණය	ලොට් අංකය	ලිපි ගොනු අංකය	ලංසු සුරැකුම් වටිනාකම (රුපියල්)
01	Vacuum Pump & Suction Unit	01	01	DGHP/ACC/F8/43 – 01 /2020	125,000.00
02	Tube Enveloping Suction	01			
03	Oven (Inside 100X110X40 cm)CRE	01			
04	Router Orbital Sander 2 Speed	01			
05	Welding Mirror	01	02	DGHP/ACC/F8/43 – 02 /2020	70,000.00
06	Oscillating Electrical Saw	01			
07	Dust Collector Unit	01			
08	Vacuum Cleaner	01	03	DGHP/ACC/F8/43 – 03 /2020	2,500.00
09	High Speed Sewing Machine	01			
10	Bench Grinder	01			

04. සැපයීම් - කසළ මලු

විස්තරය	වාර්ෂිකව අවශ්‍ය ප්‍රමාණය	ලිපි ගොනු අංකය	ලංසු සුරැකුම් වටිනාකම (රුපියල්)
1. 2020 / 2021 වර්ෂය සඳහා අප ද්‍රව්‍ය බැහැර කරනු ලබන මලු සැපයීම ● කහ පාට බෑග් ● කළු පාට බෑග් ● තැඹිලි පාට බෑග් ● කොළ පාට බෑග්	 75,000 75,000 50,000 50,000	DGHP/ACC/F8/03 -GB/2020	50,000.00

05. ආපනශාලා පවත්වාගෙන යාම - 2020 - 2021

අනු අංකය	විස්තරය	ලිපි ගොනු අංකය	ලංසු සුරැකුම් ගාස්තුව (රුපියල්)
01	ආපනශාලා පවත්වාගෙන යාම – 2020 – 2021	DGHP/ACC/F8/42/2020	24,000.00

01. එක් අයිතමයක් සඳහා ලංසු ලියවිලි ගාස්තුව රුපියල් 3,500.00
02. ආපනශාලා පවත්වාගෙන යාම 2020-2021 කොන්ත්‍රාත්තුවට පමණක් අදාළ පෙර ලංසු කැඳවීමේ රැස්වීමක් (Pre Bid Meeting) 2020.08.27 දින ප.ව.02.00 ට පොළොන්නරුව දිස්ත්‍රික් මහ රෝහලේ මෛත්‍රීපාල සිරිසේන ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.
03. ලංසු ලියවිලි ලබා ගැනීමේදී, ලංසු ලියවිලි ගාස්තුව වශයෙන් මෙම රෝහලේ ගණකාධිකාරී වෙත මුදල් ගෙවා ලබා ගත් ලදුපත සමග අදාළ ආයතනයේ ලිපි ශීර්ෂය සහිත ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කළ යුතුය.
04. ජාතික තරගකාරී ලංසු කැඳවීම යටතේ ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියාවන් සඳහා මිල ගණන් කැඳවීමේදී රුපියල් මිලියන 50 ට අඩු ඉදිකිරීම් සඳහා ප්‍රාදේශීය වරණය වශයෙන් 05% ක් සහ CIDA වරණය , රාජ්‍ය මුදල් චක්‍රලේඛ 4/2016 (II) ට අදාළව ලබා දීමට කටයුතු කෙරෙනු ඇත. (Regional Preference)
05. ලංසු කාණ්ඩ වශයෙන් ඉදිරිපත් කොට ඇති අතර, එම කාණ්ඩයේ සියලුම අයිතම සඳහා මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර, අයිතම කාණ්ඩ වශයෙන් ඇගයීමට ලක් කෙරේ. එසේම කාණ්ඩයක් සඳහා ලංසු ඉදිරිපත් කිරීමේදී ආදේශක සඳහා මිල ගණන් ඉදිරිපත් නොකළ යුතුය.
06. වැඩිමනක් තොරතුරු ලංසු ලියවිලිවල සඳහන් වේ.
07. උනන්දුවක් දක්වන හා සුදුසුකම්ලත් ලංසුකරුවකු / නියෝජිතයකු හෝ නම් කළ අයකු විසින් පහත සඳහන් දෑ ඉදිරිපත් කිරීමෙන් මිල දී ගනු ලබන සම්පූර්ණ ලංසු කට්ටලයක් මගින් පමණක් මුද්‍ර, තැබූ ලංසු ඉදිරිපත් කළ යුතු වේ.
    I. අධ්‍යක්ෂ දිස්ත්‍රික් මහ රෝහල වෙත, අදාළ ආයතනයේ ලිපි ශීර්ෂය සහිතව ඉදිරිපත් කරනු ලබන ලිඛිත අයදුම්පතක්.
    II. ඉහතින් සඳහන් පරිදි ආපසු ගෙවනු නොලබන ගාස්තු, මුදලින් පොළොන්නරුව දිස්ත්‍රික් මහ රෝහලේ ගණකාධිකාරී වෙත ගෙවා ලබා ගත් ලදුපත.
08. පොළොන්නරුව දිස්ත්‍රික් මහ රෝහලේ ගණකාධිකාරී දුරකථන අංක 027-2225780 හෝ 027-2222261 (දිගු අංක -362) වෙතින් ලංසුකරුවන්ට වැඩිමනක් තොරතුරු ලබා ගත හැකි අතර, ප්‍රසම්පාදන ලිපි ලේඛන 2020.09.02 දින දක්වා පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා කාලය තුළ, රාජකාරි දිනවල පමණක් පොළොන්නරුව දිස්ත්‍රික් මහ රෝහලේ "පිරිවැය කළමණාකරණ හා ප්‍රසම්පාදන ඒකකය" වෙතින් ලබා ගත හැකි අතර, ලංසු ලේඛන ද එම වේලාවන් තුළදී නොමිලයේ පරීක්ෂා කළ හැක.
09. ප්‍රසම්පාදන ලියවිලි බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයිතමයේ නම පැහැදිලිව සඳහන් කළ යුතු අතර, පිටපත් දෙකකින් යුක්තව සකස් කරන ලද, මුද්‍ර, තැබූ ලංසු **"සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, දිස්ත්‍රික් මහ රෝහල, පොළොන්නරුව"** ලිපිනයට තැපැලෙන් එවීමෙන් හෝ පොළොන්නරුව දිස්ත්‍රික් මහ රෝහලේ ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇතිඋක්ත අයිතමයේ නම සඳහන් ප්‍රසම්පාදන පෙට්ටියේ බහාලමින් **2020.09.03 දින ප.ව. 02.00** ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ලංසු භාර ගැනීම අවසන් වූ වහාම, (එදින ප.ව. 02.00 ට) ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින් ඉදිරියේ ඒවා විවෘත කෙරෙනු ඇත.
10. ලංසු විවෘත කිරීමේ අවස්ථාව සඳහා ආයතනය නියෝජනය කෙරෙමින් නියෝජිතයකු සහභාගි වන්නේ නම්, ඒ බැව් සනාථ කෙරෙන ලියවිල්ලක්, අදළ ආයතයේ ලිපි ශීර්ෂය මගින් ඉදිරිපත් කළ යුතුය.
11. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධව රෝහල් ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
දිස්ත්‍රික් මහ රෝහල, පොළොන්නරුව.
2020.08.17

වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 19 වැනිදා බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.